255 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 255 - இல. 11
Volume 255 - No. 11

2017 නොවැම්බර් 07වන අඟහරුවාදා
2017 நவம்பர் 07, செவ்வாய்க்கிழமை
Tuesday, 07th November, 2017

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන**
කථානායකතුමාගේ සහතිකය
2017 නොවැම්බර් 09වන දින විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙළ
2018 අය වැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව**

**සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව**

**විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :**
සැපයුම අඩු වීම නිසා පවතින ඉන්ධන අර්බුදය
ඉන්ධන හිඟය

**වරප්‍රසාද:**
අතිරේක සොලිසිටර් ජෙනරාල් යසන්ත කෝදාගොඩ මහතා මහ බැංකු බැඳුම්කර කොමිසම හමුවේ කරන ලද ප්‍රකාශය

**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි

**පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**කල් තැබීමේ යෝජනාව:**
දෘෂ්‍ය කලාවේදී විශේෂ උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை
2017 நவம்பர் 09ஆம் தின விசேட பாதுகாப்பு ஒழுங்குகள்
2018ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புகள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழு

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**அரசாங்க சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**அரசாங்க மனித உரிமைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**தேசிய பெறுகை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**கணக்காய்வு சேவைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**நிலையியல் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
குறைந்தளவு விநியோகத்தினால் நிலவும் எரிபொருள் நெருக்கடி
எரிபொருள் பற்றாக்குறை

**சிறப்புரிமை:**
மேலதிக சொலிசிட்டர் ஜெனரல் யசந்த கோதாகொட அவர்கள் மத்திய வங்கி பிணைமுறி பற்றிய ஆணைக்குழு முன் தெரிவித்த கூற்று

**நீதித்துறை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**குற்றச் செயல்களைத் தடுத்தல் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**உள்ளூர் அதிகாரசபைகள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
கட்புலக் கலை விசேட பட்டதாரிகளுக்கு ஆசிரியர் நியமனங்களை வழங்கல்

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Speaker's Certificate
Special Security Arrangement on 09th November, 2017
Select Committee to Discuss the Heads of Expenditure of Ministries Selected from the Budget Estimates of 2018: Nomination of Members

AUDITOR-GENERAL'S REPORT

PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

PERFORMANCE REPORT OF THE HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

PROGRESS REPORT OF THE NATIONAL PROCUREMENT COMMISSION

PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

QUESTION BY PRIVATE NOTICE:
Fuel Crisis Due to Short Supply
Fuel Shortage

PRIVILEGE:
Statement made by Additional Solicitor General Yasantha Kodagoda Before the Commission on Central Bank Bond Issue

JUDICATURE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

PREVENTION OF CRIMES (AMENDMENT) BILL:
Read a Second and the Third time, and passed

LOCAL AUTHORITIES (SPECIAL PROVISIONS) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Teaching Appointments for Visual Arts Special Degree Holders

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2017 නොවැම්බර් 07වන අඟහරුවාදා***

*2017 நவம்பர் 07, செவ்வாய்க்கிழமை*

*Tuesday, 07th November, 2017*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**

**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,

MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை

SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2017 ඔක්තෝබර් 24වන දින "දේශීය ආදායම්" නමැති පනත් කෙටුම්පතෙහි ද, 2017 නොවැම්බර් 02වන දින "ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි ද ම'විසින් සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### II

### 2017 නොවැම්බර් 09වන දින විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙළ
2017 நவம்பர் 09ஆம் தின விசேட பாதுகாப்பு ஒழுங்குகள்

SPECIAL SECURITY ARRANGEMENT ON 09TH NOVEMBER, 2017

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

2017 නොවැම්බර් 09වැනි බ්‍රහස්පතින්දා ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2018 වර්ෂය සඳහා අය වැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන කලින් වසරවලදී සිදු කළ ආකාරයටම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.

- 2017 නොවැම්බර් මස 08වැනි බදාදා සහ 09වැනි බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරිද ඇතුළු සමස්ත පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලම ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.
- 2017 නොවැම්බර් මස 09වැනි බ්‍රහස්පතින්දා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බවද දන්වනු කැමැත්තෙමි.

(අ) මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රථ ගාල වසා තබන බැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථ ගාල් වෙත යොමු කරනු ලැබේ.

(ඇ) තම කලත්‍රයා කැටුව පැමිණෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාර්ය මණ්ඩල පිවිසුමේදී තම වාහනයෙන් බැස පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලට පිවිසිය හැකිය.

(ඈ) ගැලරියට පැමිණෙන ආරාධිත අමුත්තන් වෙනුවෙන් ජයන්තිපුර පිවිසුමේ සිට මහජන පිවිසුම දක්වා විශේෂ ප්‍රවාහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන බැවින්, කලත්‍රයා හැර තමන් කැටුව පැමිණෙන වෙනත් ආරාධිත අමුත්තන් වෙතොත් ජයන්තිපුර පිවිසුමේදී එම ප්‍රවාහන සේවාව වෙත යොමු කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

(ඉ) එදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී, හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ද, අමුත්තන් කැටුව පැමිණීමෙන් වැළකී සිටින ලෙස ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින්ම තම රථය පදවා ගෙන එන්නේ නම්, එම මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාල වෙත ධාවනය කර ගාල් කරවීම පිණිස මන්ත්‍රී පිවිසුමෙහි, කාර්ය මණ්ඩල පිවිසුමෙහි සහ මහජන පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් යොදවනු ලැබේ.

(උ) රථ වාහන පොලිසිය සහ සමීප පොලිස් ස්ථාන මඟින් විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) ඉහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

### III

### 2018 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
2018ஆம் ஆண்டுக்கான வரவு-செலவுத் திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்

SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF 2018: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ස්ථාවර නියෝගය 97 සහ 2017 ඔක්තෝබර් මස 17 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගත් යෝජනාව ප්‍රකාරව 2018

[ගරු කථානායකතුමා මහතා]

වර්ෂයේ ඇය වැය ඇස්තමේන්තුවලින් තෝරා ගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය සඳහා මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගරු මහින්ද සමරසිංහ මහතාගේ සභාපතිත්වය ඇතිව ම' විසින් නම් කරනු ලැබ ඇති බව දන්වනු කැමැත්තෙමි.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIII කොටස සහ තුන්වැනි කාණ්ඩයේ IX කොටස; සහ
- 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ II සහ III කොටස් සහ තෙවැනි කාණ්ඩයේ II කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි,“එකී වාර්තා මුද්‍රණය කළ යුතුය යැයි” මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
## அரசாங்க சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 55(5) ව්‍යවස්ථා ප්‍රකාරව 2017 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා (2017.04.01 - 2017.06.30) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.

## සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017 වර්ෂයේ පළමු කාර්තුව (2017.01.01 - 2017.03.31) සහ දෙවන කාර්තුව (2017.04.01 - 2017.06.30) සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව සහ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 30 වගන්තිය

ප්‍රකාරව 2017 වර්ෂයේ පළමු කාර්තුව සඳහා (2017.01.01 - 2017.03.31) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
## தேசிய பெறுகை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PROGRESS REPORT OF THE NATIONAL PROCUREMENT COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා (2017.04.01 - 2017.06.30) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.

## විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## கணக்காய்வுச் சேவைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2017 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා (2017.04.01 - 2017.06.30) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare and Kandyan Heritage)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 17 දිනැති අංක 2032/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 30 දිනැති අංක 2021/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 30 දිනැති අංක 2025/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 19 දිනැති අංක 2028/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 26 දිනැති අංක 2029/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 31 දිනැති අංක 2030/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 01 දිනැති අංක 2030/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(x) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 15 දිනැති අංක 2032/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 23 දිනැති අංක 2033/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xiii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 08 දිනැති අංක 2035/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xiv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 02 දිනැති අංක 2039/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(xv) 2016 අංක 24 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2017.09.01 සිට 2017.09.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන මම ඉදිරිපත් කරමි.

එම නියමයන් සහ පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව බැලුවත්, සම්ප්‍රදාය අනුව බැලුවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට මේ ගරු සභාවට එන්න තිබෙන අයිතිය ආරක්ෂා කරන්න ඔබතුමා බැඳී සිටිනවා. අත් අඩංගුවේ සිටියත්, රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියත් ඒ අයිතිය ආරක්ෂා කර දෙන්න ඔබතුමා බැඳී සිටිනවා. මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට අද වන විට ඉන්ධන අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා; පෙට්‍රල් හිඟයක් ඇතිවෙලා තිබෙනවා. අයිඕසී සමාගමේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් අද ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ගරු ඇමතිතුමා ඒකට පිළිතුරු දෙයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හරි, ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. ඉන්ධන නැති ප්‍රශ්නය නිසා; පෙට්‍රල් නැති ප්‍රශ්නය නිසා අද මන්ත්‍රීවරු බොහොමයකට මේ පාර්ලිමේන්තුවට එන්න බැරිවෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මම දන්නවා. මට තේරෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ අයට පාර්ලිමේන්තුවට එන්න තිබෙන අවස්ථාව හදන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අද වැඩි දෙනකුට එන්න බැහැ. පිට පළාත්වල ඉන්ධන නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පුළුවන් තරම් ඒ ගැන සාකච්ඡා කර තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කරයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
වෙනදාට කරත්තයෙන් එනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2014 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම, 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 10 වගන්තිය යටතේ 2017 නැව් නියෝජිතයන්ගේ, නැව්බඩු ගෙන යන්නන්ගේ, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ගේ සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ගේ (ගාස්තු ව්‍යූහ) නියෝග සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 17 දිනැති අංක 2041/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

එම නියෝග ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ (3) උපවගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ විශේෂ ආනයන බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 02 දිනැති අංක 2039/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සම්බන්ධයෙන් ස්ථාවර නියෝග පිළිබඳ වාර්තාව එම කාරක සභාවේ කටයුතුද ඇතුළුව මම පිළිගන්වමි.

ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාව අපගේ පාර්ලිමේන්තුවට ඓතිහාසිකව වැදගත් අවස්ථාවක්. 1993 පෙබරවාරි මස 06 වැනි දින දක්වා සංශෝධිත 1979 මැයි මස 01 වැනි දින සිට දශක හතරකට ආසන්න කාලයක් පුරාවට පාර්ලිමේන්තුවේ දැනට ක්‍රියාත්මකව පවතින ස්ථාවර නියෝග කාලීන වත්මන් ව්‍යවස්ථාදායක අවශ්‍යතාවන්ට අනුකූලව යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වී තිබූ බව අප කවුරුත් හොඳින් දන්නා කාරණයකි. එලෙසම, වර්තමාන පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වන කාල වේලාවන්, ආංශික අධීක්ෂණ කාරක සභා, විද්‍යුත් ඡන්ද ක්‍රමය යනාදී වශයෙන් සිදු වී තිබෙන සහ සිදු කිරීමට නියමිත නව ප්‍රවණතාවන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අන්තර්ගත විය යුතු බව, සභාවේ කටයුතු මනා ලෙස පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍ය සාධකයක් බව අපි කවුරුත් අවිවාදයෙන් යුතුව පිළිගනිමු.

කරුණු මෙසේ හෙයින්, ලෝකයේ දියුණු රටවල දැනට පවතින තත්ත්වයන් පිළිබඳව ද විවිධාකර දේශීය-විදේශීය විද්වතුන්, ක්ෂේත්‍රයේ විශේෂඥයන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා යෝජනා ද, පසුගිය හත්වැනි පාර්ලිමේන්තුවේදී පවා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඉදිරිපත් කර තිබූ අදහස් ද, මැනවින් අධ්‍යයනය කර නියෝජ්‍ය කථානායක ගරු තිලංග සුමතිපාල මැතිතුමා, නියෝජ්‍ය කාරක සභාපති ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මැතිතුමා, අමාත්‍ය ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍ය ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා, ගරු විජිත හේරත් මැතිතුමා, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමා, ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා, ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා යන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත මාගේ සභාපතිත්වයෙන් යුත් ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව විසින් 2015 දෙසැම්බර් මස 16 වන දින සිට 2017 ඔක්තෝබර් මස 31 දින දක්වා පුරා වසර දෙකකට ආසන්න කාලසීමාවක් තුළ රැස්වීම් වාර 12කදී ගැඹුරින් සලකා බලා ඉන් අනතුරුව අමාත්‍ය ගරු රවුෆ් හකීම් මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා, වර්තමාන පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු රාජවරෝදියම් සම්පන්දන් මැතිතුමා, හත්වැනි පාර්ලිමේන්තුවේ හිටපු මාගේ පූර්වගාමී කථානායක ගරු චමල් රාජපක්ෂ මැතිතුමා යන මහත්වරුන් ඇතුළු පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විශේෂ කමිටුව විසින් ද සලකා බලා ඉදිරිපත් කරන ලද නිර්දේශ ද, තවත් අවස්ථා හයකදී සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආරාධනය කර පැය ගණනාවක් දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉදිරිපත් වූ සියලු අදහස් සහ සංශෝධන සැලකිල්ලට භාජන කරමින් ද, ඉතාමත් කැපවීමෙන් හා ඕනෑකමින් සකස් කරනු ලැබූ යෝජිත පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සම්බන්ධයෙන් ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව අද දින මෙම ගරු සභාවට මේ ආකාරයෙන් පිළිගැන්වීමට ලැබීම අටවැනි පාර්ලිමේන්තුවේ අප ලද සුවිශේෂී ජයග්‍රහණයක් බව සඳහන් කළ හැකි ය.

අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආසියාවේ නව ආදර්ශවත් පාර්ලිමේන්තුව ලෙස පිළිගෙන තිබෙන මෙවන් මොහොතක, සභාවේ කටයුතු අභිමානවත් ලෙස, නීතිගරුකව, අදට ගැළපෙන අයුරින් පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය මෙම යෝජිත ස්ථාවර නියෝග හැකි ඉක්මනින් මෙම ගරු සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු බව සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරමින් පසුගිය දිනක පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරන ලද පරිදි 2018 වර්ෂයේ ජනවාරි මාසයේ මුලදී මෙය ප්‍රධාන මෙන්ම අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස සලකා පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීමට යෝජනා කරන අතරම, මේ වෙහෙසකර කාර්යය වෙනුවෙන් දායකත්වය ලබා දුන් සෑම සියලු දෙනාටම මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත" සහ "2016 වර්ෂය සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(iii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් හතර මම පිළිගන්වමි.

(1) දියතලාව, කහගොල්ල, රත්පහ, "රේණුකා නිවස" යන ලිපිනයෙහි පදිංචි ඩී.ඒ. ශාන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බණ්ඩාරගම, ගම්මන්පිල, පළමු සැතපුම් කණුව, අංක 28 දරන ස්ථානයෙහි පදිංචි ඩී.සී.එම්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ත්‍රිකුණාමලය, අභයපුර, 154 දරන ස්ථානයෙහි පදිංචි කේ.එච්. ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) කළුතර, කටුකුරුන්ද, නාගොඩ පාර යන ලිපිනයෙහි පදිංචි එන්.ඒ.පී.එම්.ඩබ්ලිව්. සේනානායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහරගම, දුම්රිය මාවත, අංක 216 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩී. උපාලි පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පොළොන්නරුව, පලුගස්දමන, එකේ ඇල, අංක 100 දරන ස්ථානයෙහි පදිංචි කෝරලේ ගෙදර ලොකුබංඩා මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## I

## සැපයුම අඩු වීම නිසා පවතින ඉන්ධන අර්බුදය
## குறைந்தளவு விநியோகத்தினால் நிலவும் எரிபொருள் நெருக்கடி
## FUEL CRISIS DUE TO SHORT SUPPLY

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අද මුළු රටම මහා අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා පෞද්ගලික මෝටර් රථ, වෑන් රථ, ත්‍රි රෝද රථ, ලොරි රථ, මෝටර් බයිසිකල් යනාදිය සඳහා ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධව පසුගිය දින කිහිපයේ සිට අර්බුදයක් මතු වී ඇත. එය මහජන ජීවිතයට සහ ආර්ථික හා සේවා කටයුතුවලට ඉමහත් කරදරකාරී තත්ත්වයක් උදාකර ඇත. ලංකාවේ ප්‍රධාන ඉන්ධන සැපයුම කරනු ලබන්නේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව බව ගරු ඇමතිතුමා පිළිගන්නවාද? ඒ අනුව,

1. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මඟින් සපයන ඉන්ධන ප්‍රමාණය අඩු වීම හේතුවෙන් මෙම අර්බුදය මතු වී ඇති අතර, එසේ ඉන්ධන සැපයුම අඩු වීම සම්බන්ධව මහජනයාට කරුණු පැහැදිලි කරනවාද?

   ඊට හේතුව, ඇමතිතුමා එක ප්‍රකාශයක් කරනවා; නියෝජ්‍ය ඇමතිතුමිය තව ප්‍රකාශයක් කරනවා; ආයතනයේ අය තව ප්‍රකාශයක් කරනවා. මම විශේෂයෙන් කියන්නේ මෙයයි. ඉන්ධන පැමිණෙන දින වකවානු පිළිබඳව විවිධ අය විසින් විවිධ ප්‍රකාශ කිරීම හේතුවෙන් දැන් මුළු රටම කැළඹිලා; ආර්ථිකය ඇනහිටින තත්ත්වයට ඇවිල්ලා ගරු ඇමතිතුමනි.

2. අමාත්‍යතුමාගේ ප්‍රකාශයට අනුව තව දින ගණනාවකට මෙම අර්බුදය විසඳීමට නොහැකි බව ප්‍රකාශ කිරීමට හේතු මොනවාද?

   මෙම ප්‍රශ්නය පටන් ගත් දවසේ ඉඳලා තිබෙන තත්ත්වයයි මම මේ කියන්නේ. බලාපොරොත්තු වන පරිදි, තව දවස් ගණනක් යනතුරු ඉන්ධන පැමිණෙයි කියලා ස්ථිරව නිගමනයක් දෙන්නට බැරි තත්ත්වයකයි ඉන්නේ. සාමාන්‍යයෙන් ගබඩාවේ ඉන්ධන විශාල තොගයක් පවතිනවා. එය අනිවාර්ය නියමයක්. එම ඉන්ධන තොගය එසේ පවත්වාගෙන යන්න නොහැකිවීම පිළිබඳව වග කියන්නේ කවුද? ඒක තමයි ඇමතිතුමනි, ප්‍රධානම ප්‍රශ්නය.

දෙවැනි ප්‍රශ්නය, ගුණාත්මකභාවයෙන් අඩු,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තුන්වැනි ප්‍රශ්නය අහන්න, දෙවැනි ප්‍රශ්නය ඇහුවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් කිව්වා, මේක ගරු මන්ත්‍රීවරුන්ටත් පාර්ලිමේන්තුවට එන්න බැරිවෙලා තිබෙන වෙලාවක්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මම වෙලාව ගන්නේ නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්. [බාධා කිරීම්] තරහා ගන්න එපා, පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අහන ප්‍රශ්න මොනවාද කියලා මම බලාගෙන හිටියේ. ඒ ප්‍රශ්නය මටත් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නය ඔබතුමාටත් තිබෙනවා; මටත් තිබෙනවා. කථානායකතුමා හැටියට ඔබතුමාගේ වාහනවලටත් පෙට්‍රල් නැත්නම් සාමාන්‍ය ජනතාවට පෙට්‍රල් තියේවිද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, මටත් පෙට්‍රල් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොඩ්ඩක් ඉන්න. ඔබතුමා දැන් ඒ ගැන කියන්න. ඒ අනුව ශ්‍රී ලංකා,- [බාධා කිරීමක්] කෑ ගැහුවාට දැන් රට අර්බුදයකට වැටිලා ඉවරයි. බොරුවට කෑ ගහන්නේ නැතුව අර්බුදයෙන් ගොඩ එන්න හිතන්න. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් අර්බුදයට වැටිලා ඉවරයි; වළට වැටිලා ඉන්නේ.

ඇමතිතුමාගේ පිහිටෙන්වත් ගොඩ එන ක්‍රමයක් සොයා ගන්න. අපේ "Captain Cool"ගේ පිහිටෙන්වත් ගොඩ එන ක්‍රමයක් හිතන්න. මෙය ලොකු ප්‍රශ්නයක්.

3. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අඩු වී ඇති ඉන්ධන සැපයුම යථා තත්ත්වයට පත් කිරීම සඳහා තෙල් නෞකාවක් කොළඹ වරායට ගෙන්වා ගැනීමෙන් පසු, සිදුවන බව අමාත්‍යවරයා ප්‍රකාශ කිරීමෙන් විසඳෙන බව පිළිගන්නේද?

දිනයක් නැහැ, එය කවදා එයිද කියලා ඇමතිතුමාටවත්, CPC ආයතනයටවත් සහතික වෙන්න බැහැ. මේ වන කොට ඉන්දියාවේ සැපයුම කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටින බව ඔබතුමාත් පිළිගන්නවා. මෙයට හේතුව, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි අපට නැහැ. එහෙම තිබුණා නම් මේ අර්බුදය මතු වන්නේ නැහැ. හම්බන්තොට ගබඩාවත් අපට නැහැ. ඒ ගබඩාව අපට තිබුණා නම් මේ අර්බුදය මතු වන්නේ නැහැ. ඔබතුමා දන්නවා, අපේ CPC එකේ කොළොන්නාවේ ගබඩාවත්, ඉන්දියානු සමාගමත් පොම්ප කරන්නේ එකම නළයෙන් බව. ඉන්දියානු සමාගම පොම්ප කරන්නේත් අපේම නළයෙන්. සතියකට වරක් දෙගොල්ලන් -ඉන්දියාව සහ අපේ සමාගම්- හමු වනවා. ඇමතිතුමනි, මේ අර්බුදය මතු වන්නේ කොහොමද? හරියාකාරව මේ කටයුත්ත කෙරෙනවා නම් මේ අර්බුදය මතු වන්නේ කොහොමද? ජාත්‍යන්තර තර්ජනයකටද අපි දැන් මුහුණ දෙන්නේ? මේ කරුණු ගැන ඇමතිතුමා ප්‍රකාශයක් කරන්න. මොකද, මහ ජනතාව විශාල අර්බුදයකට පත් වෙලා, ආර්ථිකය විශාල වශයෙන් අඩපණ වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා එය පිළිගන්නවා ඇති. අපි අහන්නේ එයට විසඳුමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ස්ථාවර නියෝග 23 (2) යටතේ ඒ වාගේම තවත් ප්‍රශ්නයක් අනුර දිසානායක මන්ත්‍රීතුමාට ඉදිරිපත් කරන්න තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළාට පස්සේ ඔබතුමා උත්තර දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ප්‍රශ්නය නොවෙයි, ඒ ප්‍රශ්නයම වෙන විධියකට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා දෙවෙනි ප්‍රශ්නය වරක් කියෙව්ව නිසායි මම කිව්වේ, "තුන්වන ප්‍රශ්නය අසන්න" කියලා. ඔබතුමාට බාධා කළාම මේ දවස්වල තරහා යනවා. වැඩිය තරහා ගන්න එපා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ වේදනාවම මේ දවස්වල ගරු කථානායකතුමාටත් තිබෙනවා, ඒකයි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

## II

## ඉන්ධන හිඟය
### எரிபொருள் பற்றாக்குறை
### FUEL SHORTAGE

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, රට තුළ නිර්මාණය වී ඇති ඉන්ධන හිඟය හේතුවෙන් ගමනා ගමන ක්ෂේත්‍රයේ මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය කෙරෙහි මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. මේ වන විට දිවයිනේ- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා මෙම මන්ත්‍රීතුමාට කථා කරන්නට අවස්ථාව දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශවල පවතින පෙට්‍රල් හිඟය හේතුවෙන් ජනතාව විශාල අපහසුතාවකට පත්ව සිටිනවා. එසේම මෙම තත්ත්වය රටේ ආර්ථිකයට බලපෑම් කරන තත්ත්වයක් දක්වා වර්ධනය වෙමින් පවතිනවා. මෙයට ප්‍රධාන හේතුව ලෙස ප්‍රකාශ වන්නේ ඉන්දීය තෙල් සමාගම ගෙන්වන ලද තෙල් නැවක තෙල් නියමිත ප්‍රමිතීන්ට නොමැතිකමින් ගොඩබෑම ප්‍රතික්ෂේප වී තිබීමයි.

ගරු කථානායකතුමනි, නමුත් මේකේ ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා. පළමු කරුණ, නියමිත පටිපාටිය අනුගමනය නොකර තෙල් ආනයනය කිරීමට ආණ්ඩුව විසින් ගෙන ඇති පියවර. ඔබතුමා දන්නවා, 2012දී ගත්තු කැබිනට් මණ්ඩල තීන්දුවක් තිබෙන බව, තෙල් ආනයනය කරන්නේ දිගු කාලීන කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ටෙන්ඩර්වලින් පමණයි, spot tendersවලින් ආනයනය කරන්නේ නැහැයි කියලා. පසුගිය කාලයේ ලංකාවට තෙල් ගෙන්වන ලද්දේ දීර්ඝ කාලීන කොන්ත්‍රාත් ක්‍රමය යටතේයි. පසුගිය දා ඒ සඳහා ටෙන්ඩර් කැඳවා ආයතනයක් තෝරාගෙන තිබියදී, - ඔබතුමන්ලා දන්නවා, ටෙන්ඩර් කැඳවලා නැව් 23ක් සඳහා ආයතනයක් තෝරාගෙන තිබුණු බව. - 2017 ජූලි මාසයේ අවසානයේදී මෙම ටෙන්ඩර් තුන ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දුන්නා. දැන් ඒ ටෙන්ඩරය කැබිනට් මණ්ඩලය වෙත ලබා දිය යුතුව තිබෙනවා. නමුත් ඒක එසේ ලබා දෙන්නේ නැතිව ස්ථානීය ටෙන්ඩර් මිලදී ගැනීම - spot tender මිලදී ගැනීම- හරහා ඔබතුමා මේ වන විට තෙල් නැව් 5ක් ගෙන්වලා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

ඒ නියමිත පටිපාටියට තිබෙන ටෙන්ඩරය කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළේ නැහැ. මෙම තෙල් සංස්ථාවෙන් එන්න තිබෙන පමා වන නැවත් spot tenders හරහා ගෙන්වන ලද නැවක්. ක්‍රමානුකූලව දීර්ඝ කාලීන ටෙන්ඩර් පදනම මත ගෙන්වන ලද සමාගමකට දුන්නා නම් සමහර විට පමා වන එකක් නැහැ. එය උපකල්පනයක් විතරයි. නමුත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් 03වැනි දා එන්න තිබෙන නැවත් spot tenders හරහා ලබා දෙන ලද නැවක්. කැබිනට් අනුමැතිය ලබා නොදී, ඒ වෙනුවට වෙළෙඳ පොළෙන් ස්ථානීය මිලදී ගැනීම් යටතේ තෙල් ගෙන්වීම අරඹා තිබෙනවා. ඒ නිසා පසු ගිය මාස කීපය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක බරපතළ පාඩුවක් සිදු වී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක් කියලා කිව්වාට හරියටම එය සංසන්දනය කර බැලුවොත් ඇමෙරිකානු ඩොලර් මිලියන 38.1ක්. ඒ කියන්නේ, දිගුකාලීන ටෙන්ඩරය සහ ස්ථානීය ටෙන්ඩර් හරහා මිලදී ගත් ප්‍රමාණය සංසන්දනය කර බැලුවොත් ඩොලර් මිලියන 38.1ක අතිරික්තයක් මේ හරහා ගොස් තිබෙනවා. ඒ පිළිබඳව ඉදිරියේදී සවිස්තරාත්මකව -නැවෙන් නැවට- මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා, ගරු කථානායකතුමනි.

දෙවැන්න, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති වීමයි. දැනට පවතින ගබඩා ප්‍රමාණවත් වන්නේ සති දෙකකට -ආසන්න වශයෙන් දින 18කට, දින 14කට- ආසන්න ප්‍රමාණයකටයි.

ගරු කථානායකතුමනි, එහෙත් ත්‍රිකුණාමල චීන වරායේ ටැංකි 99ක් පවතින අතර, 2003 වන විටත් -වර්තමාන අග්‍රාමාත්‍යවරයා යටතේම- මෙය LIOC සමාගමට වසර 35කට ලියවිල්ලකින් පමණක් ලබා දී තිබෙනවා. එහි 1.2 ඡේදය යටතේ 2003.03.01 දින සිට මාස හයක් තුළ විධිමත් බදු ගිවිසුමකට නොයෑම හේතුවෙන් ඔවුන් එහි දැන් සිටින්නේ නීති විරෝධී ලෙසයි. එබැවින් දැනට ඔවුන් භාවිතා කරන්නේ ටැංකි 8යි. ත්‍රිකුණාමල චීන වරායේ තෙල් ටැංකි 99ක් තිබුණත් භාවිතා කරන්නේ තෙල් ටැංකි 8ක් පමණයි. 2003 ගිවිසුම අත්සන් කරලා අවුරුදු 14ක් ගත වෙලා තිබුණත්, ඔවුන් කිසිදු ප්‍රතිසංස්කරණයකට යන්නේ නැහැ. අවුරුදු 14කට වඩා වැඩි කාලයක් ඔවුන්ගේ යටතේ මේ තෙල් ටැංකි දිරාපත් වෙමින් තිබෙනවා.

ඉතිරි තෙල් ටැංකිවලින් දහයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පරිහරණයට ලබා ගැනීමට 2016 අප්‍රේල් මාසයේ කැබිනට් තීරණයක් ගත්තා. එතැනින් තෙල් ටැංකි දහයක් ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට දෙන්නයි තීරණයක් ගත්තේ. 2016.06.06වැනි දා ගරු අග්‍රාමාත්‍යතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, එම LIOC සමාගම සතුව තිබුණු තෙල් ටැංකි දහයක් තෙල් සංස්ථාවට පවරා ගැනීම සඳහා 2016 අප්‍රේල් මාසයේ ලබා ගත් කැබිනට් තීරණය වෙනස් කිරීමේ කැබිනට් තීරණයක් ගත්තා. ඒ නිසා ගරු කථානායකතුමනි, මෙහි ප්‍රධානම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා මේ ගබඩාවල තිබෙන හිඟකම.

අපි දන්නවා කොලොන්නාවේත්, මුතුරාජවෙලත් තිබෙන ගබඩා සංකීර්ණ CPSTL සමාගමට අයිති බව. එහි තුනෙන් එකක් අයිති LIOC සමාගමට. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වෙනම ගබඩා නැහැ. LIOC සමාගමත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් තෙල් ගබඩා කරන්නේ CPSTL කියන සමාගමේ ගබඩාවල. එහි සමාගමේ අයිතිය තුනෙන් එකක් තිබෙන්නේ LIOC එකට. LIOC එක තමන්ගේ වාරයේ - turn එකේ- අවශ්‍ය නැව ගෙනාපු නැති එක ඇත්ත. හැබැයි, අපට එතැන තිබෙන ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවන හේතුව මෙහි දෙවන ප්‍රධාන ගැටලුවයි. තමුන්නාන්සේලා මේ තත්ත්වය වෙනස් කරන්න සමත් වෙන්නේ නැත්නම්; අපේ ගබඩා පහසුකම් වර්ධනය කරන්න සමත් වෙන්නේ නැත්නම්; ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණ අපේ තෙල් අවශ්‍යතාවන් සඳහා උපයෝගී කර ගැනීමට මැදිහත් වෙන්නේ නැත්නම් මේ ගබඩාවල ඇති වී තිබෙන අර්බුදය නැවක් පමාවීමෙන් පමණක් නොවෙයි, දිගු කාලීනව ඇතිවීමේ අනතුර තිබෙනවා ගරු කථානායකතුමනි.

තෙවැන්න, සපුගස්කන්ද තෙල් පිරිපහදුව අකර්මණ්‍යවීම. මෙය 1969දී ඉදිකළ අතර, එය දැන් අබලන්ව තිබෙනවා. එය 1969දී ඉදි කර තිබෙන්නේ. එහි තාක්ෂණයත් දැන් යල් පැනලායි තිබෙන්නේ. පසු ගිය සතියේදී පිරිපහදුවේ හදිසි බිඳවැටීමක් සිදුවීම මෙම ගැටලුව තීව්‍ර කොට තිබෙනවා. 2007දී උමා ඔය ව්‍යාපෘතිය ආරම්භ කරන වෙලාවේ ඉරානයේ අග්‍රාමාත්‍යවරයා ඇවිල්ලා සපුගස්කන්ද පිරිපහදුව සෑදීමට මුල්ගලක් තිබ්බා; ඉඩම් පවරා ගත්තා; කාර්යාල ඇති කළා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රුපියල් කෝටි සියයකට වැඩි මුදලක් මේ වෙනුවෙන් වැය කරලා තිබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, පිරිපහදුවේ කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදු වී නැහැ. 2007දී නව පිරිපහදුවක් ඉදිකිරීමට ප්‍රෝඩාකාරී ලෙස මුල්ගල තැබුවද, එය ඉදි වී නැහැ.

අනෙක් අතට මෙහිදී වෘත්තීය සමිති විසින් මතු කරන සාධාරණ සැකයක් වන්නේ, වත්මන් LIOC එක අත්තනෝමතික ලෙස හිතාමතා පොරොන්දු කඩකරමින් තෙල් නොගෙන්වා රට තුළ කුමන්ත්‍රණයක් ලෙස අර්බුදයක් නිර්මාණය කොට ඇති වන තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් බාල තෙල් ගෙන්වීමට දරන උත්සාහයක්ද කියලා. මොකද, ගරු කථානායකතුමනි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පෙට්‍රල්වලින් පාඩුවක් තිබුණා. ඒක ඔබතුමා දන්නවා. ඒ නිසා LIOC එක දිගින් දිගටම ඉල්ලා සිටියා, "තෙල් මිල වැඩි කරන්න" කියලා. නමුත්, ආණ්ඩුව පැත්තෙන් තෙල් මිල වැඩි කරන්න ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා

[ගරු අනුර දිසානායක මහතා]

LIOC එක බොහෝ දුරට උත්සාහ දරමින් සිටියා, පෙට්‍රල් වෙළෙඳාමෙන් අයින් වෙන්න. මොකද, පෙට්‍රල් විකුණන එක ඔවුන්ට පාඩුයි. එම නිසා, ඒ සඳහා දරන ප්‍රයත්නයක්ද මේක? මේ නැව පමා වුණා නම්, -ඒ කියන්නේ LIOC එකෙන් ගෙන්වන ලද නැව ප්‍රතික්ෂේප වුණා නම්- නැවත නැවක් ගෙනඒම ඔවුන්ගේ කාර්ය භාරයයි. හැබැයි, ඔවුන් මෙට්‍රික් ටොන් 16,500ක් තිබෙන පෙට්‍රල් නැවක් ලංකාවට හැරෙව්වා. ඒකට මොකද කළේ? ගරු කථානායකතුමනි, ඒකේ ඩීසල් මෙට්‍රික් ටොන් 5,500ක් තිබෙනවා. හැබැයි, ඒවා ප්‍රමිතියෙන් තොරයි. ඒ පෙට්‍රල් ටික ගන්න නම් ප්‍රමිතියෙන් තොර ඩීසල් ගන්නත් කියනවා. ගරු ඇමතිතුමනි, මම හිතන විධියට ඔබතුමාට එහෙම කියලා තිබෙනවා. ගරු කථානායකතුමනි, LIOC එක ඉතා කුඩා පංගුවක් අපේ ගබඩා සංකීර්ණයේත්, ඒ වාගේම වෙළෙඳ පොළේත් තබාගෙන මුළු තෙල් වෙළෙඳ පොළම හසුරුවන තත්ත්වයකට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා යළි අපේ රටේ සම්පත් LIOC එකට පැවරීම සඳහා කටයුතු කරනවාද කියලා මේ ආණ්ඩුව කල්පනා කර බලන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක් LIOC එක හිතාමතා නිර්මාණය කළාද කියන සැකයක් මතු වෙමින් තිබෙනවා. ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මේ පිළිබඳව පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වනවා.

1. LIOC එකට තමන්ට අවශ්‍ය පරිදි තෙල් නැව් ප්‍රතික්ෂේප කළ හැකිද? ඒවායේ පාලනය කෙබඳුද? ඒ සඳහා ගෙන ඇති පියවර කුමක්ද?
2. තෙල් නැවක් ප්‍රතික්ෂේප වූ පමණින් රටේ ජනතාව පාරේ රස්තියාදු වන අන්දමට රටට අවශ්‍ය රක්ෂිත තොග පවත්වා නොගන්නේ මන්ද?

   රක්ෂිත තොග පවත්වාගෙන යෑමේ ක්‍රමවේදය කුමක්ද? එය කුමන කාලයකට ප්‍රමාණවත්ද?
3. තෙල් සැපයීම නොකළ සමාගම වෙනුවෙන් ගෙන ඇති පියවර කුමක්ද? මෙවැනි දේ නියාමනය කිරීමට ඇති ක්‍රමවේදය කුමක්ද?
4. ටෙන්ඩර් ක්‍රියාවලිය මඟින් තෝරාගත් ආයතනයට මෙම තෙල් ආනයනය පැවරීමට කටයුතු නොකරන්නේ මන්ද?
5. සපුගස්කන්ද පිරිපහදුව අලුත්වැඩියා කිරීමට පියවර නොගන්නේ මන්ද?
6. ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් උදාවීම වැළැක්වීම වෙනුවෙන් ආණ්ඩුව ගෙන තිබෙන පියවර මොනවාද?

   ගරු කථානායකතුමනි, ඉහත ප්‍රශ්නවලට පිළිතුරු කුමක්දැයි දැන ගන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මටත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒවා කිව්වාට පස්සේ ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඒකට අමුතුවෙන් තවත් ප්‍රශ්න එකතු කරන්න බැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ස්ථාවර නියෝග 23(2) යටතේ, එක මාතෘකාවකට අදාළ ප්‍රශ්න දෙකක් අහන්න බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම දෙයක් මෙතැන නැහැ නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට ඕනෑ ඕනෑ වෙලාවට එහෙම වෙනස් කරලා දාන්න බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. එහෙම දෙයක් මෙතැන නැහැ නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට ප්‍රශ්නය අහන්න බැරිද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කරපු නිසා මම කැමැතියි කරුණු පැහැදිලි කරන්න.

පළමුවෙන්ම 2003 වර්ෂයේදී මේ ගිවිසුමට ඇතුළත් වෙන අවස්ථාව වෙන කොට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මේකෙන් කිසිම ප්‍රයෝජනයක් අරගෙන තිබුණේ නැහැ; අරගන්න ශක්තියක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි අපි ඒ අවස්ථාවේදී මේවා පිටට දෙන්න, පළමුවෙන්ම ඉන්දියාවෙන් ඇහුවේ, ඉන්දියාව ගන්න කැමැතිද, නැත්නම් වෙන සමාගමකින් ඉල්ලුම්පත් ලබා ගන්නද කියලා. ඒ වෙලාවේදී ඉන්දියාව එකඟ වුණා. එකඟ වෙලා අපි ගිවිසුම අත්සන් කළා. අපි ඒක සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක

කරන්නයි හිටියේ. ඒ අතරතුරේ ආණ්ඩු මාරුවක් සිදු වුණා. එදා ඉඳන් මේක කල් ගියා. ලංකා ආණ්ඩුව පැත්තෙනුත් යෝජනා කිහිපයක් ආවා, මේ ගිවිසුම සංශෝධනය කරන්න කියලා. ඒ වාගේම අනෙක් පැත්තෙනුත් ආවා. ඒ ගැන මට වග කියන්න බැහැ.

ඒත් අපේ ආණ්ඩුවක් තිබුණා නම් මේ වෙන කොට මෙම තෙල් ටැංකි සියල්ලම හදලා අවසන් වෙන්න තිබුණා. මේවා අරගෙන දියුණු කරන්න ආපසු 2015දී අපි ඉන්දියාව සමඟ එකඟ වුණා. විශේෂයෙන්ම ඉන්දීය අගමැතිතුමා මෙහි පැමිණි වෙලාවේත්, ජනාධිපතිතුමා එහේ ගිය වෙලාවේත්, මම එහේ ගිහින් කළ සාකච්ඡා අනුවත් 2015දී අප අතර එකඟත්වයක් ඇති වුණා ඉන්දියාව යළිත් මේ වැඩ කටයුතු කරනවා කියලා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මුදල් නැහැ. ඔවුන්ට තවමත් විශාල ණයක් ගෙවන්න තිබෙනවා. මේ දේවල් අලුතින් කරනවා නම් අපි මුදල් හොයන්න වෙනවා. ඒ ප්‍රශ්න නිසා අපි ඉන්දියාව සමඟ කටයුතු කරන්න තීරණය කළා. මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තීරණය ගත්ත දවසේදී කිව්වා, එහෙම ගිවිසුමකට අපි ඉන්දියාව එක්ක එකඟ වෙලා තිබුණා, ඒ නිසා ඒ ගිවිසුම අනුව ක්‍රියා කරන්න වුවමනායි කියලා. එච්චරයි මෙතැන තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මට මතක විධියට ඒ කාලයේ අපි ඉන්දියාව සමඟ මේ ගැන කථා කරද්දී ඔබතුමා කැබිනට් මණ්ඩලයේ හිටියා. ජාතික ආණ්ඩුව හැදුවාට පසු අලුත් ඇමතිතුමා ඒ කැබිනට් පත්‍රිකාව ගෙනෙන කොට මේ කාරණා දැනගෙන හිටියේ නැහැ. ඒකයි මම මීට ඉස්සර වෙලාත් මේ ගරු සභාවට කිව්වේ, ඉන්දියාව සමඟ එකඟ වුණු පරිදි අපි එකට එකතු වෙලා යළිත් ඔවුන් මාර්ගයෙන් මේ වැඩ කටයුත්ත කරමු කියලා. ඔය කාරණයේ එච්චරයි තිබුණේ. වෙන මොකුත් තිබුණේ නැහැ. ඉන්දියාවේ උදවු ගන්න එපා නම් ඒ අවුරුදු දහය තුළ අපට එය දියුණු කරන්න තිබුණා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඒක කරන්නත් බැරි වුණා. ඔවුන් ඒක කළේ නැහැ. ඒ නිසා 2016දී අපි ඉන්දියාව සමඟ කථා කළා. අපි දැන් සාකච්ඡා කරගෙන යන්නේ ඉන්දියාව සමඟ එකතු වෙලා මේක දියුණු කරන්නයි. මේක දියුණු වෙනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ලංකාවටත්, ඉන්දියාවේ කොටසකටත් තෙල් ගබඩා කර තියාගන්න මෙතැන තිබෙන තෙල් ටැංකි ටික ඇති. ඒ නිසා තමයි අපි බැලුවේ මෙතැන තෙල් ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් බවට පත් කරන්න.

අනික් කාරණය මේකයි. චීනයෙන් තව තෙල් පිරිපහදුවක් දැන් හම්බන්තොට හදන්න යනවා. අපි අපේ පිරිපහදුව හදන්න ඉරානය එක්ක එකඟ වුණා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඉරානයයි, ඇමෙරිකාවයි අතර තිබෙන ප්‍රශ්නය නිසා ඉරානයේ ගනු දෙනු සියල්ලම නැවතුණු බව. ඉරානයට අපේ තේ දෙන එක, එහෙන් උමා ඔයට ගෙවන එක යන ඒ සියල්ලම නතර වුණා. ඒ නිසා ඒ වැඩ කටයුත්ත අපට කරන්න බැරි වුණා. ඒ අතරතුරේදී චීනයෙන් ඉල්ලීමක් කර එකඟ වෙලා තිබෙනවා, තෙල් පිරිපහදුවක් දෙන්න. මම දන්නවා මේ ගැන සාකච්ඡා කරද්දී වෘත්තීය සමිති ඒකටත් විරුද්ධ වුණු බව. අඩු ගණනේ ලංකාවේ තෙල් පිරිපහදු දෙකක් තියන්න ඕනෑ. එහෙම තියලා විශාල තෙල් ගබඩා සංකීර්ණයක් ඇති කරන්න ඕනෑ. සමහර වෘත්තීය සමිති මේ කාරණා අරගෙන තිබෙන්නේ ප්‍රශ්න ඇති කරන්නයි. නමුත් මේකයි දැනට තිබෙන ඇත්ත තත්ත්වය.

අපේ රටට ගෙනෙන තෙල් ගන්නවාද, නැද්ද කියන එක තීරණය කරන්නේ කොමිටියක් මඟින්. ඒ කොමිටියෙන් ප්‍රතික්ෂේප කළාම LIOC එක, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒ තෙල් ගැනීම ප්‍රතික්ෂේප කරනවා. අනික, මේ රටේ තෙල් සේවක වර්ජනයක් තිබියදී LIOC තිබුණු නිසා තමයි අපේ ජනතාවට යම් කිසි ආකාරයකින් හෝ තෙල් ලබා ගන්න පුළුවන් වුණේ. ඒකත් අපි මතක තියා ගන්න ඕනෑ.

ඊළඟට, මේ තෙල් නැව එන්න ප්‍රමාද වුණේ ඇයි, ඒකට මොකක්ද වුණේ කියන එක සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා කරුණු කියයි. අපි තීරණය කර තිබෙනවා, ඒ ගැන හොයා බලා එයට වගකිව යුත්තන් කවුද කියලා දැන ගන්න. ගරු ඇමතිතුමනි, දැනට, මේ දවස් කිහිපයට අවශ්‍ය තෙල් ප්‍රමාණය තිබෙනවා නේද?

**ගරු අර්ජුන රණතුංග මහතා (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Petroleum Resources Development)
ඔව්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේ දවස් කිහිපයට අවශ්‍ය තෙල් ප්‍රමාණය තිබෙනවා කියා ගරු ඇමතිතුමා කියනවා. ඒ සම්බන්ධයෙන් එතුමා වැඩිදුර කරුණු කියයි.

මේ අවස්ථාවේ මා ගැන සඳහන් කරපු නිසායි මේ කාරණා ටික සඳහන් කළේ. විශේෂයෙන් මේ ඇති වෙලා තිබෙන අර්බුදයට LIOC එක වග කියන්න ඕනෑය කියන එකට මා එකඟ වෙන්නේ නැහැ. මේ ගැන සාකච්ඡා කරද්දී ඕනෑ නම් මට පෙන්වන්න පුළුවන්, මේ කටයුතු තවත් ප්‍රමාද කළේ කවුද කියලා. ගරු කථානායකතුමනි, තව තෙල් පිරිපහදුවක් ගෙනෙන කොට විරුද්ධ වුණේ කවුද කියන එකත් අපි මතක තියා ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න. මා ඔබතුමාට නැවතත් මතක් කරනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තෙල් ලබා දීම සඳහා යම් කිසි ක්‍රමවේදයක් ඇති කළොත් හොඳයි කියලා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාත්, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් මේ ප්‍රශ්න කිහිපය මතු කිරීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, ඩීසල්වල කිසිම අඩුවක් අද වන කොට සිද්ධ වෙලා නැහැ. පෙට්‍රල්වල අඩුවක් පමණයි තිබෙන්නේ. නමුත්, අවාසනාවකට වාගේ සමහර petrol sheds වැසීම නිසා ඩීසල් බෙදා දීමත් නතර වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය මූලික ලෙස බලපා තිබෙන්නේ ත්‍රිරෝද රථ හිමියන්ට සහ මෝටර් සයිකල් හිමියන්ටයි.

මා ඉතා කෙටියෙන් සඳහන් කරන්නම්, මොන විධියට ද මේ අර්බුදය ඇති වුණේ කියලා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, අපි spot tender එකකින් තෙල් ගෙනාවා කියලා. මා ඒක ප්‍රතික්ෂේප කරනවා. මේවා සාමාන්‍ය ක්‍රමවේදයට ගෙනාපු තෙල් තොගයක්. LIOC එක ඔක්තෝබර් 17වැනි දා මේ රටට තෙල්

[ගරු අර්ජුන රණතුංග මහතා]

නැවක් ගෙන්වූවා. පරීක්ෂණ දෙකකදීම ඒ නැවේ තෙල් තොගය ප්‍රතික්ෂේප වුණු නිසා අපි තීරණයක් ගත්තා, ඒ තෙල් නැව භාර නොගන්න. ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ සුදුසු නැති තෙල් ගෙනැල්ලා, ඒවා වාහනවලට ගහලා, වාහනවලට ප්‍රශ්න ඇති වූ නිසා වන්දි මුදල් ගෙවන්න පවා රජයට සිද්ධ වුණා. ඒ නිසා අපි ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා, ඒ තෙල් නැව ප්‍රතික්ෂේප කරලා ආපසු යවන්න. නමුත්, දැනට දවස් 14ක්, 16ක් තිස්සේ ඒ තෙල් නැව ත්‍රිකුණාමල වරායේ නවත්වාගෙන ඉන්නවා. ඒ තෙල් නැව ප්‍රතික්ෂේප වුණාට පස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙන්වන තෙල් නැව 2වැනි දා 3වැනි දා වන විට එන්න නියමිතව තිබුණා.

සාමාන්‍යයෙන් terminal එකක තෙල් ගහන්න යන්නේ දවස් එකහමාරයි, වැඩිම වුණොත් දවස් දෙකයි, ගරු කථානායකතුමනි. නමුත් අවාසනාවකට වාගේ දවස් හතරක ප්‍රමාණයක් අරගෙන අද වෙනකොට මේ නැවේ දවස් හතක ප්‍රමාදයක් - පසු වීමක් - සිදු වෙලා තිබෙනවා. දැන් තිබෙන විධියට මේ නැව හෙට රාත්‍රී වෙනකොට කොළඹට ළඟා වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම 9 වන දා වෙනකොට මේ තෙල් බෙදා හැරීම නැවත වරක් සාමාන්‍ය විධියට සිදු කර ගෙන යන්නට පුළුවන්.

අපිට ලොකු ප්‍රශ්නයක් ඇවිත් තිබෙනවා, ගරු කථානායකතුමනි. මම අද කැබිනට් මණ්ඩලයේ දී ගරු ජනාධිපතිතුමාගෙනුත්, ගරු අගමැතිතුමාගෙනුත් ඉල්ලා සිටියා, මේ ප්‍රශ්නය නිරාකරණය වුණාට පස්සේ, මේ සඳහා විශේෂ කණ්ඩායමක් දාලා පරීක්ෂණයක් කරන්නය කියා. මොකද, මේ සිදු වීමත් එක්ක එකකට එකක් හිතන්නට බැරි සිදු වීම් ඇති වෙනවා. මේවායින් වාසි ගන්නට හදන දේශපාලනඥයෝත් ඉන්නවා. නමුත් මේකේ ඇත්ත තත්ත්වය තමයි මේ කාලයේම - පසුගිය 30 වැනිදා, 31 වැනිදා වෙනකොට - අපේ පිරිපහදුවත් දවස් තුනකට නැවතුණා. ඒ වාගේම අපේ තෙල් බෙදා හැරීමට තිබෙන computer system එකත් පැය ගණනකට නැවතුණා. මේ සිද්ධීන් එකකට එකක් සම්බන්ධ කර බැලීමේ දී මේවා සාමාන්‍ය සිදු වීම් නොවෙයි. ඒ වාගේම අපිට ආපු නැව මහදී bunkering වලට පැය 10කට නවත්වා තිබෙනවා. මෙවැනි සිදු වීම් රාශියක් එක්ක තමයි මේ නැව ප්‍රමාද වෙලා තිබෙන්නේ.

අපට මේ රටේ මෙට්‍රික් ටොන් අනූ දාහක පෙට්‍රල් තැන්පත් කරන්නට පුළුවන්. මා අමාත්‍යාංශය භාර ගෙන තවම මාස තුනක පමණ කාලයක් විතරයි ගත වෙලා තිබෙන්නේ. මා ආවාට පස්සේ කිසිම වෙනසක් සිදු කර නැහැ. [බාධා කිරීමක්] මම මේ කථා කරන්නේ මා ගැනයි. මට පොඩ්ඩක් මේක කියන්න දෙන්න කෝ. අපි කිසිම දෙයක් වෙනස් කරලා නැහැ. තිබුණු ක්‍රමවේදයට අනුව තමයි මේ කටයුතු කර ගෙන යන්නේ. මේ රටේ පෙට්‍රල් මෙට්‍රික් ටොන් අනූ දාහක් තැන්පත් කරන්නට පුළුවන්, ගරු කථානායකතුමනි. අපි සාමාන්‍යයෙන් මෙච්චර කාලයක් පෙට්‍රල් මෙට්‍රික් ටොන් හතළිස් දාහක නැව් ගෙනාවේ. තිබෙන තෙල් තත්ත්වය මෙට්‍රික් ටොන් පනස් දාහකට විතර අඩු වෙනකොට තමයි, එන නැවේ තෙල් කොලොන්නාව, මුතුරාජවෙල සහ සපුගස්කන්දට ගෙන යන්න පුළුවන් වෙන්නේ. අපි මෙච්චර කාලයක් එම ක්‍රමවේදය අනුවයි කටයුතු කරලා තිබෙන්නේ. එහෙම නැතිව අලුත් දෙයක් කරලා නොවෙයි.

හුඟක් දෙනෙක් පෙන්වන්න හදනවා, මේ කටයුත්ත spot tendersවලට යනවාය කියා. නමුත් මේ දීර්ඝ කාලීන ගිවිසුම් එක්ක තිබෙන ටෙන්ඩර් එකක් තමයි අපි නැවත වරක් දියත් කර තිබෙන්නේ. මම තව දෙයක් කියන්න ඕනෑ, මේ තෙල් මාෆියාව ගැන. පසුගිය කාලයක් තිස්සේ එකම ආයතන දිගටම මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒක නවත්වන්න ක්‍රමවේදයක් හදන්න මම පසුගිය කාලයේ කැබිනට් පත්‍රිකාවක් දැම්මා. අපි ඒක සාකච්ඡා කර ගෙන යනවා.

අද වනකොට තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් මම දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. අපට දිනකට පෙට්‍රල් මෙට්‍රික් ටොන් 2,500ක් අවශ්‍යයි. අපි සාමාන්‍යයෙන් ඉරිදාට තෙල් බෙදා හරින්නේ නැහැ. පසු ගිය සෙනසුරාදා තෙල් මෙට්‍රික් ටොන් 2,866ක් අපි බෙදා හැර තිබෙනවා. නමුත්, අපි තෙල් බෙදා හරින්නේ නැති ඉරිදා දවසේත් මෙට්‍රික් ටොන් 963ක් බෙදා හැර තිබෙනවා. ඒ වාගේම සඳුදාත් මෙට්‍රික් ටොන් 2,623ක් බෙදා හැර තිබෙනවා. අදත් අපි මෙට්‍රික් ටොන් 3,000ක් බෙදා හරින්න නියම කරලා තිබෙනවා. මෙතැනදි ඇති වුණු ප්‍රශ්නය මෙයයි. මෙහිදී ලොකු කැලඹීමකට පත් වෙලා, මාධ්‍ය හරහාත් මේ සම්බන්ධයෙන් දිගටම කථා කළා. දවස් දෙකක් පමණ යන තෙක් මේ කටයුත්ත ඉතාමත් සාමාන්‍ය විධියට; සාමාන්‍ය ක්‍රමවේදයට ගෙන ගියා, ගරු කථානායකතුමනි. නමුත්, SMS පණිවුඩයකින් තමයි මේ තත්ත්වය ඇති වුණේ. මේ කරුණ මම කැබිනට් මණ්ඩලයේ දීත් සාකච්ඡා කළා. මේ SMS පණිවුඩ අපටත් ආවා. මේ හරහා රටේ ලොකු කැලඹීමක් ඇති වුණා. මේ තත්ත්වයත් එක්ක දිනක තෙල් අවශ්‍යතාව වන මෙට්‍රික් ටොන් 2,500ක් වෙනුවට ඊයේ දිනයේ දී මෙට්‍රික් ටොන් 4,700ක ඉල්ලීමක් ඇවිල්ලා තිබුණා. මෙවැනි තත්ත්වයක් එක්ක තමයි අපි මේ කටයුත්ත කර ගෙන යන්නේ. 9වැනි දා වනකොට තෙල් නැව ආවාම, අපට නැවත වරක් සාමාන්‍ය පරිදි තෙල් බෙදා හැරීම කරගෙන යන්න පුළුවන්. ඒ වාගේම තමයි, සාමාන්‍යයෙන් අපේ පිරිපහදුව මෙට්‍රික් ටොන් 550ක්, 600ක් හදන පිරිපහදුවක්. දැන් වනකොට අපි 750ක් හදනවා. නමුත්, අවාසනාවකට වාගේ විදුලිය ප්‍රශ්නයක් නිසා ඒ යන්ත්‍ර ක්‍රියා විරහිතවීමෙන් දවස් 3ක් මේ පිරිපහදුවෙන් අපට ලබා ගන්න පුළුවන් තෙල් ටිකත් ලබා ගන්න බැරි වුණා. ඒ වාගේම නොවැම්බර් 9වෙනි දා වෙනකොට මේ සියල්ලම සාමාන්‍ය තත්ත්වයකට පත් කරන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

මේ ක්‍රමවේදය අලුත් ක්‍රමවේදයක් නොවෙයි. මේ, කලින් කර ගෙන ගිය ක්‍රමවේදයමයි. හැබැයි, මේ හරහා මේවායේ තිබෙන යම් යම් අඩු පාඩු අපි දකිනවා. අපට ඒවා වෙනස් කරන්න අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරියේදී තීරණ ගන්නවා. නමුත්, දැනට තිබෙන තත්ත්වය අනුව නොවැම්බර් මස 9වෙනි දා වෙනකොට මේ තත්ත්වය නිරාකරණය කරන්න පුළුවන් වනවා, ගරු කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේ නැවට අමතරව 9වෙනි දා ඉන්දියාවෙන් තවත් තෙල් නැවක් එවනවා. ජනාධිපතිතුමා අද උදේත් ඉන්දියාවේ මහ කොමසාරිස්තුමා එක්ක මේ ගැන කථා කළා; මමත් කථා කළා. අපේ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ඇමතිතුමාට මම

දැනුම් දුන්නා, මේ සම්බන්ධයෙන් හොයන්න කියලා. එතුමා මේ සම්බන්ධයෙන් සොයා බලා මට කිව්වා, 9වෙනි දා නැත්නම් 10වෙනි දා ඉන්දියාවෙන් තෙල් නැවක් එනවා කියලා. ඒ අනුව අපට 10වැනි දා වනකොට තෙල් නැව් 2ක් පැමිණෙන්නට තිබෙනවා.

මේ තෙල් හිඟය පිළිබඳ තත්ත්වය නිසා හුඟක් අය අපහසුතාවට පත් වුණා කියා මම හිතනවා. විශේෂයෙන්ම three-wheel රියැදුරන්. ඒ අයට දවසකට විටින් විට තෙල් වුවමනායි. සමහර අය පැය තුන,හතරක් පෝලිමේ ඉන්නවා මම දැක්කා. මා ඒ අය පසු කරගෙන යන ගමන් ඇහුණු කථාවලින් ඒ අය මටත් බැන්නා වාගෙයි මට වැටහුණේ. කෙසේ වෙතත් ඇති වූ අපහසුතාව පිළිබඳව අපි දන්නවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. එහෙත් රටට වුවමනා තෙල් ප්‍රමාණය තිබෙනවා කියා කිව්වා. මා විශේෂයෙන් කියන්න කැමැතියි, මේ සතිය අවසන් වන කොට ඇමතිතුමා එනවා යැයි කියපු තෙල් නැවත්, ඊට අමතරව ඉන්දියාවෙන් තවත් තෙල් නැවකුත් පැමිණෙන්නට නියමිතව තිබෙන බව.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මා ගරු අමාත්‍යතුමාගෙන් යම් කාරණයක් පිළිබඳව දැනගන්න කැමැතියි. ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම දැනට තිබෙන ප්‍රශ්නයක් ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. Petroleum Corporation එකේ නියෝගයක් මත බැරල්වලට, වෙනත් භාජනයකට තෙල් ගන්න දෙන්නේ නැහැ. සමහර වාහන තෙල් නැතිව ගෙදර නතර වෙලා, එහෙම නැත්නම් අතර මඟ නතර වෙලායි තිබෙන්නේ. එතකොට බැරල් එකක් හෝ මොකක් හරි භාජනයක් පාවිච්චි කරලා තමයි තෙල් ටික අරගෙන යන්න වෙන්නේ. දැන් තිබෙන තත්ත්වයත් එක්ක එතැන සාධාරණ අවුලක් ඇති වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ ගැන ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා එහි වෙනසක් කරන්න කියා ඉල්ලනවා. ඒ පළමුවන කාරණයයි. ගරු අමාත්‍යතුමනි, ඒ වාගේම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේවාට පිළිතුරු දෙන්න සූදානම්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා ලෑස්තියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඔබතුමා පිළිතුරු දෙන්න සූදානම්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා සූදානම්.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
කමක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකද, අද දින ස්ථාවර නියෝග 23(2) යටතේ ඔය ගැන ප්‍රශ්න දෙකක් ඇහුවා. එක ප්‍රශ්නයක් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇහුවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මෙය මේ රටේ වැදගත් ප්‍රශ්නයක් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අමාත්‍යතුමා කැමැතියි, ඒකට උත්තර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න කෝ. ස්ථාවර නියෝග ගැනයි මා කියන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කතා කරන කොට, ස්ථාවර නියෝග.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ජනතා විමුක්ති පෙරමුණ තමයි ඇහුවේ, LIOC එක ගැන. ඒකයි ඒකට ප්‍රධාන හේතුව. නමුත් ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න. එතුමාගේ අවසරය අරගෙන අහන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා අවසරය දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, හරි. [බාධා කිරීමක්] ඒක තමයි මා කියන්නේ. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කතා කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න කැමැතියි නේද? අවුලක් නැහැ නේද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
කමක් නැහැ. එතුමාට ප්‍රශ්නය අහන්න දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා ඒ අවසරය දුන්නා. එතුමා මගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ නිසා තමයි ඔබතුමාට අවස්ථාව දුන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
LIOC එකට මේ රටේ තෙල් වෙළඳ පොළෙන් සියයට 20ක්
***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අගමැතිතුමා එවකටත් අගමැතිව සිටි කාලයේයි. ඒ පාප කර්මය තමයි අද අප මේ ගෙවන්නේ. තමන් ලෝකයම ජයගත් නායකයාය කියනවා. හදිස්සියකට තෙල් ටිකක් ඉල්ලා ගන්න මොකෙක්වත් නැහැ. ඒක වෙනම කතාවක්. ගරු අමාත්‍යතුමනි, මට ඔබතුමාගෙන් අහන්න තිබෙන්නේ මෙයයි. මීට පෙර ඔබතුමා මේ ගැන මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා ප්‍රකාශ කළා LIOC එකේ ප්‍රමිතියෙන් තොර තෙල් ටික ගන්න කියා ඔබතුමාට දේශපාලන වශයෙන් විශාල බලපෑමක් එල්ල වුණා කියා. අන්න ඒ දේශපාලන බලපෑම එල්ල කළේ කවුද කියා ඔබතුමා කොන්දක් තිබෙන ඇමති කෙනකු නම් මේ සභාවේදී හෙළි කරාවි කියලා මම හිතනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් විවාදයකට යන්න බැහැ. ගරු අමාත්‍යතුමා, එතුමාට පිළිතුරු දෙන්න සූදානම්ද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
කමක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ දී කියා සිටියා, මේ තිබුණු ක්‍රමවේදයම තමයි ඔබතුමා අමාත්‍යාංශය භාර ගත් පසුවත් ගෙන ගියේ කියලා. අලුත් ක්‍රමවේදයක් ගෙනාවේ නැහැ. ඒ ක්‍රමවේදය තුළම තිබුණු අඩු පාඩුකම් නිසා තමයි මේ තත්ත්වය උද්ගත වුණේ. එතකොට මේ අඩු පාඩුකම් සහිත ක්‍රමවේදය ඉන්දියාවේ LIOC එකත් එක්ක ඇති කරගත්ත ගිවිසුම තුළ අන්තර්ගත කොන්දේසිවල ක්‍රියාත්මකවීම නිසා ඇති වුණු අඩු පාඩුවක්ද කියලාත් ඔබතුමා කියන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කොහොමද ඒකට සම්බන්ධ වෙන්නේ, ගරු මන්ත්‍රීතුමා? ඔබතුමා හරි කථාවක් නේ කියන්නේ. ඒ කාලයේ මම ඇමතිවරයා විධියට කටයුතු කළාට එදා ක්‍රියාත්මක කළේ කැබිනට් මණ්ඩලයේ තීරණයක්. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකරලා ඒ ප්‍රකාශය ඉල්ලා අස් කරගන්න. ඔබතුමා කියපු කථාව වැරැදියි. එහෙම කථා කරන්න එපා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා ඒ විධියට කථා කරන්න එපා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ඒක මම අගමැති විධියට සිටියදී සහ ඔබතුමා ඇමතිවරයා විධියට කටයුතු කරද්දී එදා ඉන්දියාවේ වාජ්පායි අගමැතිතුමා එක්ක අපි සාකච්ඡා කළාට පස්සේ කැබිනට් මණ්ඩලයේ දී ගත්ත තීරණයක්. LIOC එක අපේ රටේ ඉන්න එක ගැන මට ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් ඒක ප්‍රශ්නයක් නැතිව ඇති. නමුත් මේක හොඳ නැත්නම්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ මේක cancel කරලා ඒ අයව පැන්නුවේ නැත්තේ ඇයි? [බාධා කිරීම්] මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේක cancel කළේ නැත්තේ ඇයි කියලා අපට කියන්න. [බාධා කිරීම්] ඔබතුමන්ලා දැන් අපට බැනලා වැඩක් නැහැ. කවුද කළේ? අනෙක් කාරණය තමයි, හම්බන්තොට වරාය ඇති කරලා හම්බන්තොට වරායේ තෙල් පිරිපහදුව දාන්න කියද්දී ඒකට විරුද්ධව සුප්‍රීම් උසාවියට ගිහින් පන්නලා දැම්මේ කවුද කියලා අහන්න කැමැතියි. තවත් මේවා ගැන අහලා වැඩක් නැහැ නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, මට කරපු චෝදනාව ඉල්ලා අස්කර ගන්න වෙයි. මොකද, කැබිනට් මණ්ඩලයේ තීරණ ගැන එක් කෙනෙකුට විතරක් ඇඟිල්ල දිගු කරන්න බැහැ. ඒ වාගේම, ගරු සභාවේ සිටින කථානායකතුමාට චෝදනා කිරීම සම්පූර්ණයෙන්ම වැරැදියි. ඔබතුමා කළේ සම්පූර්ණයෙන්ම වැරැදි දෙයක්.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
නැහැ, නැහැ. එහෙම නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇයි නැත්තේ? [බාධා කිරීමක්] ඇයි බැරි? [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒක වැරැදියි. මම ඒ කථාව ඉල්ලා අස්කර ගන්න ඕනෑ. මොකද, ඔබතුමා දැන් මේ සභාවේ කථානායකතුමා. මම මේ කියන්නේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැනයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ කථාව ඉල්ලා අස්කර ගන්න. ඒ කාලයේ මේ තීරණය ගත්තේ ඇමතිවරයා විධියට මම නොවෙයි, කැබිනට් මණ්ඩලයයි. ඒ ප්‍රකාශය මම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. [බාධා කිරීම්] ඔබතුමා ඉතාම පහත් තත්ත්වයට වැටුණා නේද? පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන්වලට අගෞරව කරමින් ඔබතුමා වාගේ චරිතයක් මේ විධියට කථා කරයි කියලා මම හිතුවේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම කියන කොට ඔබතුමාට රිදෙනවා නේද? [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට රිදෙන්නේ නැහැ. ඒක බොහොම පහත් කථාවක්. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා කියනා දේ -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම තෙල් අර්බුදය පිළිබඳ අවසාන වශයෙන් දෙයක් කියන්න තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම මොහොතේ නැව පමාවීම් එක්ක නිශ්චිත ලෙස මෙම තෙල් අර්බුදය ගැටගැහිලා තිබුණාට, අපේ රටේ බලශක්ති වෙළෙඳ පොළ LIOC සමාගමට පැවරීමත් එක්ක දිගු කාලීන අර්බුදයක් ගැටගැහිලා තිබෙනවා. බලශක්ති ක්ෂේත්‍රය වැදගත් ක්ෂේත්‍රයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපි දැන් ඒ ගැන හරි-වැරැද්ද කථා කළා නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒ ගැන කථා කළා නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ මේ කාරණයයි. 2003 -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගර කථානායකතුමනි, එතුමා තමුන්නාන්සේට පොඩ්ඩක් වෙලාව දෙන්න කිව්වාම -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. නැහැ. එහෙම නැහැ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අපි ප්‍රධාන කටයුතුවලට යමු. [බාධා කිරීම්] දැන් වාඩි වෙන්න. දැන් ඇති. මම අවස්ථාව දුන්නා නේ. සාධාරණ වෙන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම මේ කියන්න හදන්නේ සිදු වුණු දේ ගැනයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. දැන් ඕනෑ නැහැ. දැන් අවශ්‍ය වෙන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු මන්ත්‍රීතුමා, cansවලටයි, බෝතල්වලටත් තෙල් නොදෙන්න අපි තීරණයක් අරගෙන තිබෙන්නේ. මොකද, කුට ව්‍යාපාරික ජාවාරමක් යනවා. පොඩි cansවලටයි, බෝතල්වලටයි petrol shedsවලින් තෙල් අරගෙන වැඩි මිලට එළියේ විකුණනවා. ඒකෙන් නැති ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඔබතුමාගේ තර්කය සාධාරණයි. ගෙදර වාහනේට තෙල් නැති වුණොත් ඒකේ ප්‍රශ්නයක් තිබෙනවා. නමුත්, අපි ඉදිරිය ගැන බලලා තමයි මේ තීරණය ගත්තේ. පෙට්‍රල් නැතිවීමත් එක්ක කුට ව්‍යාපාර ක්‍රමවේදයක් හදලා, එය ජාවාරමක් විධියට ඉස්සරහට යනවා. [බාධා කිරීම්] පෙට්‍රල් ගහන්න ඕනෑ වාහනයකට නේ. වාහනයේ පෙට්‍රල් නැත්නම් අපට ඒකට-[බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ. නැහැ. දැන් කාලය නාස්ති වුණා. ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දීලා අවසානයි ද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

අවසානයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. පිළිතුරු ලබා දීලා අවසානයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැහැ. මගේ ප්‍රශ්නයට -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න ගොඩාක් ඇහුවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ඇමතිතුමාගෙන් මම යළි අහන්නේ, දැනට ගබඩාවේ තෙල් අර්බුදයක් පැවතිලා තිබෙනවා. දිනපතා ඉල්ලුම වැඩිවන බවත් ඇමතිතුමා පිළිගත්තා; demand is rising. අද වන විට තෙල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 4000ක් දක්වා වැඩි වෙලා. සාමාන්‍යයෙන් තෙල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 1500යි, 1700යි. මෙට්‍රික් ටොන් 2000ට කිට්ටුයි. ඒක දැන් මෙට්‍රික් ටොන් 4000 දක්වා වැඩි වෙලා. ඇමතිතුමා, ඔබතුමා බලාපොරොත්තුවෙන් ඉන්නේ මේ නැව් දෙක එනකන්. අගමැතිතුමාත් කිව්වා. ඔබතුමා බලාපොරොත්තු වන කාලය ඇතුළත මේ නැව් දෙක නාවොත් ඇතිවන අර්බුදය මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු ඇමතිතුමනි, අපි මෙතැනින් මේක නවත්වනවා. අද හුඟාක් වැඩ කටයුතු තිබෙනවා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් අපි ඕනෑම නැවක් පිටවෙන්න කලින් පරීක්ෂණයක් කරනවා. අපි අද වෙනකොට දෙන්නෙක්ම දාලා තෙල්වල තත්ත්වය කොහොමද කියලා පරීක්ෂණ කරලා තිබෙනවා. හුඟාක් දුරට ඒක සාධාරණීකරණය කරලා තිබෙනවා; clearance ඇවිල්ලා තිබෙනවා. හැබැයි, අපි දැනට monitor කරගෙන යනවා. හෙට ඊ 11.00ට එන්න තිබෙන නැව මේ වන විට හෙට ඊ 9.00 වෙනකොට එන තත්ත්වයක් තිබෙනවා. අපි satellite එකෙනුත්, harbour masterගෙනුත් තොරතුරු අරගෙන තිබෙනවා. ඒ නැව් ආවොත් නැවත වරක් තෙල් බෙදීමේ කටයුත්ත හෙට ඊ ඉඳලා පටන් ගන්න බලාපොරොත්තු වනවා. එතකොට නව වෙනිදා වන විට සාමාන්‍ය තත්ත්වයකට පත් කරන්න අපට පුළුවන් වෙනවා. ඒක තමයි දැනට තිබෙන තත්ත්වය. මෙම ප්‍රශ්නය ඇති වුණේ වැඩි ඉල්ලීම අනුවයි. මොකද, ත්‍රිවීලර් හිමියෝ බොහෝ වෙලාවට අඩු මුදලකට තෙල් ගහන්නේ. දැන් වන විට වැඩි මුදලකට තෙල් ගහන්න ඇවිල්ලා ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ.නැහැ. මොකක්ද point of Order එක? ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නාම මට මෙතැනින් එහාට ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීම්] මොකක්ද, point of Order එක?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මම එතුමාගෙන් ප්‍රශ්න දෙකක් ඇහුවා. දෙකෙන් එකකටයි උත්තර දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතුමා වෙනත් පිළිතුරු දෙන්නේ නැහැ. ගරු ඇමතිතුමා පිළිතුරු දීලා ඉවරයි නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

දේශපාලන බලපෑම ගැන එතුමා මොකුත් කිව්වේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් අවසාන කරන්න, ගරු ඇමතිතුමා. [බාධා කිරීම්]

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

නැහැ. මම අවශ්‍ය වෙලාවට අවශ්‍ය පිළිතුරු දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා ඒක අහගෙන ඉන්න ඕනෑ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න කෝ. පොඩ්ඩක් ඉඳගෙන ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම පිටින්ම ස්ථාවර නියෝග කඩ කරමින් යනවා. මේක ජාතික ප්‍රශ්නයක් විධියට මම කථා කරන්න ඉඩ දුන්නා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

මම ඉතාමත් වගකීමෙන් කියනවා, මේ රටට කිසිම නරකක් වෙන්න දෙන්නේ නැහැයි කියලා. නුසුදුසු තෙල් නිකුත් කරන්න කියලා කවුරු කිව්වත් මම එය කරන්න දෙන්නේ නැහැ. මම ගෙදර ගියත් කමක් නැහැ. ඇමතිවරයා හැටියට මට අද වන තෙක් ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා හෝ බල කරලා නැහැ, ඒවා නිකුත් කරන්න කියලා. ඒක මම වගකීමෙන් කියනවා. සමහර අය මේකෙන් වාසි ගන්න හදනවා. ඒවා මට අදාළ දේවල් නොවෙයි. මට භාර දී තිබෙන දේ මේක. මතක තියා ගන්න මේ රටේ ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මට ඒ ප්‍රශ්නය විසඳා ගන්න ඉඩ දෙන්න. ඊට පස්සේ අපි පරීක්ෂණයක් කරන්න යනවා - [බාධා කිරීමක්] ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉඳගන්න. ඒ පරීක්ෂණය කරලා මෙතැන වැරදිකාරයෝ කවුද, ඒවා කළේ කොහොමද කියලා සොයා ගන්න මම මූලික වෙනවාය කියන එකත් තමුන්නාන්සේලාට කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ගරු රවි කරුණානායක මැතිතුමා, වරප්‍රසාද ප්‍රශ්නය.

## වරප්‍රසාද: අතිරේක සොලිසිටර් ජෙනරාල් යසන්ත කෝදාගොඩ මහතා මහ බැංකු බැඳුම්කර කොමිසම හමුවේ කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: மேலதிக சொலிசிட்டர் ஜெனரல் யசந்த கோதாகொட அவர்கள் மத்திய வங்கி பிணைமுறி பற்றிய ஆணைக்குழு முன் தெரிவித்த கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY ADDITIONAL SOLICITOR GENERAL YASANTHA KODAGODA BEFORE THE COMMISSION ON CENTRAL BANK BOND ISSUE

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු වරප්‍රසාද පනතේ (අ) කොටසේ 8වන ඡේදය යටතේ මාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද කඩ වීමක් සිදු වී තිබෙනවා.

අද දින මා නැඟී සිටින්නේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහායි. ඒ සඳහා මට අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

2017.10.17 දින රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල් යසන්ත කෝදාගොඩ මහතා විසින් මහ බැංකු බැඳුම්කර කොමිසම අවසාන වීමට නියමිතව තිබූ දිනයේ කරන ලද ප්‍රකාශයක් නිසා මාගේ මන්ත්‍රී වරප්‍රසාද කඩ වී ඇති බව මම ඔබතුමාට දන්වනු කැමැත්තෙමි.

ඔහු එදින, එනම් ඔක්තෝබර් මස 17 දින බැඳුම්කර කොමිසම හමුවේ ප්‍රකාශ කළේ විජිත විජේසූරිය නැමැති පුද්ගලයකු විසින් කොමිසමේ ලේකම් වෙත යොමු කරන ලද පැමිණිල්ලක පිටපතක් තමා වෙත ලැබී තිබෙන බවයි; එහි විජිත විජේසූරිය මහතා මෙම කොමිසමේ සාක්ෂිකාරියක වූ අනිකා විජේසූරියගේ වැඩිමහල් සොහොයුරා වීම මත කොමිසමේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව විෂය සීමාවට ගැනෙන බවත්; ඔහු කොමිසමට පැමිණිලි කර තිබෙන්නේ, තම සොයොහුරිය මෙම කොමිසම ඉදිරියේ දුන් සාක්ෂිය හිටපු අමාත්‍ය රවි කරුණානායක මහතාට විරුද්ධ වීම නිසා ඇයට නිරන්තර තරජන එල්ල වීම මත රටින් පලා යාමට සිදු වූ බවය; ඇය මෙම කොමිසම හමුවට සාක්ෂි දීමට ඉදිරිපත් කළ දිනයේදී තමා මෙම කාරණය කොමිසමේ අවධානයට ලක් කළ බවත්, ඇයට ඇති විය හැකි බලපෑම් නිසා ඇගේ නියම අනන්‍යතාව හෙළි නොකිරීමට ඉල්ලා සිටි බවත්, ඒ කෙසේ වෙතත් ඇයට නිරන්තරව එල්ල වන තර්ජන හමුවේ ඇය සිය රටින් පලා ගොස් ඇති බවය; ඊට හේතුව හිටපු අමාත්‍ය රවි කරුණානායක මහතාට තම මාමා හෙවත් "uncle" ලෙස අමතන ශනිල් නෙත්තිකුමාර යන අයෙක් 2017.10.14 රාත්‍රී 10.30 ට පමණ විජිත විජේසූරිය මහතාට දුරකථනයෙන් අමතා ඉතා පැහැදිලි ලෙස තර්ජනය කර ඇති බවය. යසන්ත කෝදාගොඩ මහතා කොමිසම ඉදිරියේ කළ ප්‍රකාශය ඇමුණුම 1 වශයෙන් මේ අවස්ථාවේ දී මා **සභගත*** කරනවා. ඔබතුමාගේ අවසරය පරිදි එහි කොටසක් මුද්‍රණය කරන ලෙස මා ඉල්ලා සිටිනවා:

> "Your Honour, I am in receipt of a copy of a complaint submitted by one Mr. Wijtha Wijesuriya, submitted to the Secretary of this Commission and copied to me. Mr. Wijtha Wijesuriya comes within the ambit of the witness of this Commission by virtue of his being the elder brother of witness Anika Wijesuriya. In terms of the assistance to and protection of victims of crime and witnesses Act. A brother or a sister or any other family member of a witness before Commission is also deemed to be a witness comes within that definition. He has complained to this commission that sequel to his sister, Miss Anika Wijesuriya having given evidence before this Commission which *inter-alia* related to the former Minister Mr. Ravi Karunanayake having received certain financial benefits from Mr. Arjun Aloysius. She had to flee this country due to numerous threats levelled against her. "

ඔහු මෙහිදී සිදු කරන්න තැත් කළේ මෙම කොමිසමේ විෂය පථයට අදාළ නොවන සිද්ධිදාමයකට මගේ නම ඈඳා ගෙන නැවත නැවතත් මා චරිත ඝාතනයට ලක් කිරීමටය. ඔහු නිරන්තරයෙන්ම මාගේ ප්‍රතිරූපයට විශාල හානියක් සිදු කරමින් කටයුතු කරනවා.

මොහුගේ මේ ප්‍රකාශය පිළිබඳව ශ්‍රී ලංකාවේ බොහෝ පුවත්පත් හා විද්‍යුත් මාධ්‍යවල ප්‍රධාන ප්‍රවෘත්තියක් ලෙස 17වැනිදා සිට අද දක්වා පුන පුනා වාර්තා කොට තිබුණා: "ලංකාදීප", "ඉරිදා ලංකාදීප", "මව්බිම", "ඉරිදා ලක්බිම", දිනපතා "ලක්බිම", "දිවයින", "අද", "දේශය", "Daily Mirror", "Ceylon Today" යන සමහර පුවත් පත් හා විද්‍යුත් මාධ්‍යවල මෙම ප්‍රවෘත්තිය විග්‍රහ කරමින් පළ කොට තිබුණා. එම වාර්තාවට ලබා දී තිබුණු ප්‍රසිද්ධිය හේතුවෙන් එම සතිය පුරා ප්‍රධාන පුවතක් ලෙස මෙම ප්‍රවෘත්තිය පැතිර ගියා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

ගරු කථානායකතුමනි, කෝදාගොඩ මහතාගේ මෙම ප්‍රකාශය මුළුමනින්ම ගොතා බඳින ලද ද්වේෂසහගත අසත්‍ය ප්‍රකාශයක්. මෙම ප්‍රකාශයේ සඳහන් වන ශනිල් නෙත්තිකුමාර නමැත්තා කිසිසේත් මාගේ ඥාතියෙකු නොවන බව මා ඉතාම අවධාරණයෙන් පවසනවා. මා නොදන්නා ඥාතිකමක් යසන්ත කෝදාගොඩ දන්නේ කෙසේද? අතිරේක සොලිසිටර් ජනරාල් තනතුර දරන අයෙකු මේ ලෙස වගකීම් විරහිත වන්නේ කෙසේද? ගරු කථානායකතුමනි, මා අභියෝග කරනවා, යසන්ත කෝදාගොඩ මහතා ශනිල් නෙත්තිකුමාර නමැති අයට මගේ ඥාතීත්වයක් ඇති බව ඔප්පු කළහොත්, මා ඉල්ලා අස්වීමට සූදානම් බවට. ඒ වාගේම ඔහු, ඔහු කළ අසත්‍ය ප්‍රකාශය, -මා සහ ශනිල් නෙත්තිකුමාරගේ ඥාතීත්වය- ඔප්පු කළ නොහැකි නම් ඔහු විසින් හිතාමතා නොමඟ යැවූ බැඳුම්කර කොමිසමෙන් ඔහු සමාව ගත යුතුය.

ගරු කථානායකතුමනි, අනිකා විජේසූරිය බැඳුම්කර කොමිසම හමුවේ 2017 ජූලි 24 දිනයේ සාක්ෂියට ඉදිරිපත් කරමින් ඇයට මේ නිසා මරණ තර්ජන එල්ල විය හැකි බවට නීතිපති දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශ කළා. දැන් දින 85කට පසු බැඳුම්කර කොමිසමේ අවසන් දිනයේදී තම අනාවැකි සනාථ කිරීම සඳහා මෙම අභූත චෝදනාව ඉදිරිපත් කරනවා. මෙම සිදුවීම් දාමය කොතරම් විශ්වාසනීයද?

ගරු කථානායකතුමනි, සාක්ෂි දුන් දින සිට අද වෙනතෙක් අනිකා විජේසූරිය ඇය මුහුණ දුන් තර්ජන පිළිබඳව මේ රටේ කිසිදු පොලීසියකට පැමිණිලි කර තිබේද? මා දන්නා තරමින් නැහැ. එසේ නම් ඇයට දිගින් දිගටම තර්ජන තිබුණු බව රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ පවසන්නේ කුමන පදනමක් මතද? ගරු කථානායකතුමනි, මෙම කොමිසමේ සාක්ෂි විභාගය අවසන්වීමට නියමිතව තිබුණු දිනයේ යසන්ත කෝදාගොඩ මහතා ඔහුට ලැබුණු තොරතුරක් පිළිබඳව කොමිසමට කරුණු වාර්තා කරනවා. එදින උදේ දහය වනවිට කොමිසමේ ලේකම්වරයාට ලැබුණු ලිපියක් පදනම් කරගෙන වෙනත් කිසිදු පරීක්ෂණයක් ඒ සම්බන්ධයෙන් නොකොට තීරණයකට පැමිණෙනවා. ඒ අනුව ඔහු මේ ප්‍රකාශය සිදු කරනවා. මේක හරියට චිත්‍රපට ජවනිකාවක් වාගේයි.

ගරු කථානායකතුමනි, එවැනි පැමිණිල්ලක් ලැබී තිබුණා නම් එය දිවුරුම් ප්‍රකාශයක් සමඟ කොමිසමට යොමු කළ යුතුයි. එසේ වූවාද? මේක ෆැක්ස් පණිවුඩයකින් ලැබුණු බවයි කියැවෙන්නේ. එවිට කොමිසමේ ලේකම් උපදෙස් ගත යුත්තේ සභාපති විනිසුරුවරුන්ගෙනුයි. එම ලිපිය පිළිබඳව තීරණයකට එළඹීමට ප්‍රථමව අතිරේක සොලිසිටර් ජනරාල්වරයා එම ලිපියේ සත්‍ය-අසත්‍යතාව පිළිබඳව සාක්ෂිකාරියගෙන් විමසීමක් සිදු කළාද? එපමණක් නොව, එම ලිපිය පිළිබඳව විමර්ශනය කිරීමට අවශ්‍ය නම් කොමිසම තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් ද සිටිනවා. ඔවුන් පාවිච්චි කළා නම්, මේ නොමඟ යැවීම සිදුවන්නේ නැහැ. ඒ වෙනුවට නීතිපති දෙපාර්තමේන්තුවේ උදවිය මේ විමර්ශන කරලා කොමිසමට කරුණු වාර්තා කර තිබෙනවා.

අනෙක් සිද්ධිය වන්නේ මෙම ලිපි සියල්ල පුවත් පත්වල පළවූ පසු මම කොමිසමේ ලේකම්වරයාට මේ සම්බන්ධයෙන් ලිපියක් යොමු කළා. ඒ ලිපිය ඇමුණුම 2 වශයෙන් මා **සභාගත*** කරනවා. ඒ ලිපියේ කොටසක් හැන්සාඩ්ගත කරන ලෙස මා ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා:

"We are writing on the instructions of our client, Hon. Ravi Karunanayake M.P, seeking indulgence of the members of the Commission, to bring the following to the notice of the Commission, since our client has learnt from the media that the formal sittings of the Commission have been concluded:-

1. On 17.10.2017 Additional Solicitor General Yasantha Kodagoda P.C., one of the officers assigned by the Hon. Attorney General to assist the Commission, alleged the following before the Commission, seeking witness protection for the family members of Ms. Anika Wijesuriya, who testified before the Commission.

   a) that he is in receipt of a copy of a complaint made by Mr. Wijitha Wijesuriya to the Secretary of the Commission.

   b) that Mr. Wijitha Wijesuriya has complained that his sister Ms. Anika Wijesuriya has had to flee the country due to numerous

   threats levelled against her after giving evidence before the Commission, against former minister Mr. Ravi Karunanayake."

එම ලිපිය මඟින් මගේ නිවැරදිතාව මම කොමිසමට ඉදිරිපත් කළා. නමුත් අතිරේක සොලිසිටර් ජනරල්වරයා මගේ ලිපිය සම්බන්ධයෙන් අද වන තුරු කිසිවක් කොමිසමට වාර්තා කර නැත. පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකුගේ සහෝදරයා එවූ ලිපිය ගැන විමර්ශනය කරන නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ඉදිරිපත් කරන ලිපිය ගැන කිසිදු සැලකීමක් නැහැ. මේක ද අපි බලාපොරොත්තු වන යහ පාලනය? මෙය ද නීතියේ ඉදිරියේ සාධාරණත්වය? මේ සිද්ධිය පිටුපස කුමන්ත්‍රණයක් ඇති බව පැහැදිලිව පෙනෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින වැදගත් නිලධාරීන් පවා මේ පිළිබඳ කනස්සල්ලට පත් වී සිටිනවා. මේ පිළිබඳව ඉතා විශ්වාසනීය ආරංචි මාර්ග මා වෙත ලැබෙනවා. අනිකා විජේසූරිය මහත්මිය ඉන්දුනීසියාවේ සංචාරක පුරවරයක් වන බාලි දූපතේ සිට 2017 ඔක්තෝබර් 05 වෙනි දින අලුයම 1.55ට එමිරේට්ස් ගුවන් සමාගමට අයත් EK 349 ගුවන් යානය මඟින් මේ රටට පැමිණ තිබෙනවා. ඇය එදින ආගමන විගමන නිෂ්කාසන වී ඇත්තේ උදෑසන 2.08ටය. ඇය මේ රටට පැමිණ ඇත්තේ ඔවුන්ගේ පවුල් දේපළ බෙදා ගැනීම පිළිබඳ කටයුත්තකට බව මාධ්‍යයේ සඳහන් වී තිබුණා. පසු දින 2017 ඔක්තෝබර් 06 දින රාත්‍රී 9.05ට ආගමන විගමන නිෂ්කාසනය වී 22.10ට එමිරේට්ස් ගුවන් සමාගමට අයත් EK 655 ගුවන් යානය මඟින් ඇය ඩුබායි හරහා එංගලන්තය බලා පිටත්ව ගොස් තිබෙනවා. ඉන්පසුව ඇය මේ රටට පැමිණ නැහැ.

ගරු කථානායකතුමනි, ශනිල් නෙත්තිකුමාර යන අය මූලික අයිතිවාසිකම් සම්බන්ධව FR - 388/17 අංක දරන නඩුවක් ගොනු කර තිබෙනවා. එම නඩුවේදී ඔහු උසාවියට කරුණු දක්වමින් ඔහු මා හට කිසිදු ඥාති සම්බන්ධයක් නැති බව ප්‍රකාශ කර සිටිනවා. එය ඇමුණුම 3 වශයෙන් **සභාගත*** කරනවා. ඔබතුමාගේ අවසර පරිදි මෙය හැන්සාඩ්ගත කරන ලෙස ඉල්ලා සිටිනවා.

අනිකා විජේසූරිය යන අයගේ සොහොයුරකු වන විජිත විජේසූරියත්, ඔහුත් එකම පාසලේ ඉගෙනගත් මිතුරන් බව පවසා තිබෙනවා. 2017 ඔක්තෝබර් 14 වන දින ඔවුන් රාත්‍රී සමාජශාලාවක හමුවී යම් කරුණකට බහින්බස් වී ඇති බැවින් ඒ පිළිබඳව පැමිණිල්ලක් කුරුඳුවත්ත පොලීසියේ දමා ඇති බවත් පැවසෙනවා. ගරු කථානායකතුමනි, රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා කර ඇත්තේ කුමක්ද? රාත්‍රී සමාජශාලාවක දෙදෙනෙක් ගැටුණු විට එයින් එක් අයෙකුට මාගේ ඥාති සම්බන්ධතාවක් පටලා මා වෙත අස්ථාන චෝදනා ඉදිරිපත් කිරීමය.

ගරු කථානායකතුමනි, මේ ජනාධිපති විමර්ශන කොමිසමේ මමත් සාක්ෂිකරුවෙක්; අනිකා විජේසූරියත් සාක්ෂිකාරියක්. මේ

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

විධියට සාක්ෂිකරුවන් දෙදෙනෙකුට නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනස් ලෙස සලකන්නේ කෙසේද?

නීතිපති දෙපාර්තමේන්තුවට, කාට හෝ යොමු කරන ලද පැමිණිල්ලක පිටපත් එවූකල නීතිපති දෙපාර්තමේන්තුව වහාම ක්‍රියාත්මක වනවාද? එසේ නම් මාගේ ලිපිය සම්බන්ධයෙන් එසේ නොවූයේ ඇයි?

ගරු කථානායකතුමනි, අපි සාමාන්‍යයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ පොලීසියටයි. මන්ද, පැමිණිල්ලක් සම්බන්ධව විමර්ශනය කළ හැකි නිලධාරීන් සිටිනුයේ පොලිස් දෙපාර්තමේන්තුවේ වන බැවිනි. එහෙත් නීතිය පිළිබඳව දන්නා උදවිය මා වෙත ප්‍රකාශ කර සිටියේ, මෙතැන සිදුවී ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුව පැමිණිල්ල සකස්කොට, ඔවුන්ම විමර්ශනයකොට, ඔවුන්ම චෝදනා ගොනුකොට, ඔවුන්ම මාධ්‍යයන්හි සඳහන් විය යුත්තේ කුමක්ද යන්න තීරණය කිරීම බවයි.

මේ වන විට බැඳුම්කර කොමිසමේ ගරු විනිසුරුවන්ට පවා මෙම නිලධාරීන්ගේ ක්‍රියාකලාපය හිසරදයක් වී ඇති බව පුවත් පත් වාර්තාවලින් පෙනී යනවා. ඔවුන් විනිසුරුවන්ගේ තීරණ එළිපිට අභියෝගයට ලක් කරන්නේ කාගේ අදිසි හස්තයක බලපෑම් මතද? එවැනි සිදුවීමක් පසු ගිය 3වැනි දින "Daily Mirror" පුවත් පතේ වාර්තා වී තිබුණා. ගරු කථානායකතුමනි, මම එම පුවත් පත් වාර්තාව **සභාගත*** කරනවා. ඔබතුමාගේ අවසර පරිදි එය හැන්සාඩගත කරන ලෙස ඉල්ලා සිටිනවා.

එම නිලධාරීන්ට පෞද්ගලිකව කොතරම් උපදෙස් දුන්නද, ඔවුන් ඒවා පිළිපැදීමට සූදානම් නැති නිසා විවෘත සභාව තුළද ඔවුන්ට දැඩි ලෙස අවවාද කිරීමට සිදුවී තිබෙනවා. සභාවේ විනිසුරුවන්ට, "මෙය මාධ්‍ය සංදර්ශනයක් බවට පත් කර ගන්නට එපා.", යනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවවාද කරන්නට පවා සිදු වුණා.

අද නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව මහ බැංකුවේ එස්. පදුමනාපන් මහතා, ඔහුට වූ නීති විරෝධී තර්ජන හා හිරිහැර සම්බන්ධයෙන් මානව හිමිකම් නඩුවක් දමා තිබෙනවා. එම ලියවිල්ල ඇමුණුම 4 වශයෙන් මම **සභාගත*** කරනවා. ගරු කථානායකතුමනි, මෙම ලේඛනයේ කොටසක් හැන්සාඩගත කිරීමට ඔබතුමාගේ අවසර පතනවා.

"Dear Sirs,

**S. PATHUMANAPAN**

We have been consulted by our client Mr. S. Pathumanapan of 29, 5/1, Frederica Road, Colombo 06, a Staff Office Grade 2 of the Central Bank of Sri Lanka (hereinafter "CBSL") who is currently functioning as a Senior Assistant Director of the Communications Department, and write this letter on his instructions.

We wish to draw your attention to a number of recent incidents concerning the Commission involving the unlawful treatment of our client *inter alia* in violation of his rights and of the law. Our client is also apprehensive of further imminent unlawful treatment arising out of matters that have already transpired.

We are writing today in view of the urgency of the matter and the imminent prejudice likely to be caused against our client."

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ අයිතිවාසිකම් පිළිබඳ භාරකාරයා වන ඔබතුමන් මේ පිළිබඳ වහාම පරීක්ෂණයක් සිදුකොට මගේ වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට කමිටුවක් පත් කරන ලෙසත්, මෙවැනි වැරැදි කරන රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය පියවර ගන්නා ලෙසත්, කොමිසමේ වාර්තා නොවුණු දේ විකෘති කරමින් වාර්තා කරන ලද මාධ්‍යයන් සම්බන්ධයෙන් මාගේ වරප්‍රසාද කඩවීමට අනුව කටයුතු කරන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, 148 ව්‍යවස්ථාව අනුව සහ මුදල් බලතල අනුව තමයි මම මේ ස්ථාවර නියෝග ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. අද දින පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. බැලූ බැල්මට රුපියල් මිලියන 6,000කට අධික මුදලක් වෙන් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ අමතර ප්‍රතිපාදන ඔක්කොම වියදම් කරලාත් ඉවරයි. නමුත් ආණ්ඩුවෙන් මේ සභාවට පැහැදිලි කිරීමක් කළ යුතු වෙනවා, ඒ අමාත්‍යාංශයෙන් මේ මුදල් යොමු කරන්නේ කුමකටද කියන කාරණය පිළිබඳව. මම ඔබතුමාට උදාහරණයක් යොමු කරන්න කැමැතියි. 959 වන ඡේදය යටතේ විදේශ කටයුතු අමාත්‍යාංශයට පමණක් විදේශ ගමන් වියදම් සඳහා වන ප්‍රතිපාදන ඌනතාවට රුපියල් මිලියන 31ක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා මේ මුදල් වෙන් කර ගත්ත පදනම ඒ අමාත්‍යාංශය විසින් මේ සභාවට පැහැදිලි කරන්න ඕනෑ. නැතුව නිකම්ම කොළ දමලා සල්ලි ගන්න බැහැ. ගරු කථානායකතුමනි, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ගරු සභානායකතුමාගේ අවධානයට යොමු කරවීමටත් ක්‍රියා කරන්න.

ඊළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු සභානායකතුමා.

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2017 නොවැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා අ.භා. 3.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, රවි කරුණානායක හිටපු අමාත්‍යතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. ඒ මතු කළ ප්‍රශ්නය, අධිකරණයේ විභාග වෙමින් තිබෙන කාරණයක්. මේ පැත්තෙන් ඔය වාගේ දෙයක් කරන්න ගියා නම් ඔබතුමාට ටක් ගාලා අධිකරණය මතක් වෙනවා. ඒකට තිබෙන අවකාශය වළක්වනවා. මම අහන්නේ, ඔබතුමා අවසර දුන්නේ කොහොමද, අධිකරණයේ විභාග වෙමින් තිබෙන කාරණයක් පිළිබඳව - [බාධා කිරීමක්] කොමිසමට තිබෙන්නේත් අධිකරණ බලය තමයි. [බාධා කිරීම්] ජනාධිපති කොමිසමකට අධිකරණ බලය තිබෙනවා, දඬුවම් දීමේ බලය හැර. අනෙක් එක කොමිසමේ විතරක් නොවෙයි, උසාවියේත් නඩුවක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන මම හොයලා බලන්නම්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

කොමිසමේ විතරක් නොවෙයි, අධිකරණයේත් නඩුවක් තිබෙනවා. මම අහන්නේ, එහෙම අනුමැතිය දුන්නේ කොහොමද කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 8 වන ඡේදයේ ආ කොටස යටතේ මට බලතල තිබෙනවා. ඒක point of Order එකක් නොවෙයි.

මීළඟට, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම; අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම; පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද point of Order එක ගරු මන්ත්‍රීතුමා?

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු කථානායකතුමනි, පසු ගිය දවසක මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවට බෝම්බ ගහන කථාවක් පාර්ලිමේන්තුවෙන් එළියේදී කිව්වා. ඔබතුමා කිව්වා, ඒ පිළිබඳව ක්‍රියා මාර්ගයක් ගන්නවා කියලා. මේ වෙනකොට ඔබතුමා ඒ පිළිබඳව යම් ප්‍රකාශයක් කරනවාද, නැත්නම් ඉදිරියේදී යම් ප්‍රකාශයක් කරනවාද කියා අපි දැනගන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට අපි කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අධිකරණ අමාත්‍ය ගරු තලතා අතුකෝරල මහත්මිය.

## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
## நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
## JUDICATURE (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 2.17]

**ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சரும் நீதி அமைச்சரும்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment and Minister of Justice)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවනවර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතින් මහාධිකරණ විනිශ්චයකාරවරුන් වැඩි කිරීම සම්බන්ධයෙන් කරන සංශෝධනය ඉදිරිපත් කරනවා.

ඒ වාගේම, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා රීති ප්‍රශ්න අහනවා. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරගෙන යන්න දෙන්නේ නැහැනේ. සාධාරණව කටයුතු කරන්නකෝ. මෙතැන ඉතා වැදගත් කරුණු තිබෙනවා නේ. ඔබතුමාගේ වැඩේ බාධා කරන එකම නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් අහන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද රීති ප්‍රශ්නය. අවසාන වතාවට කියන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණය ජනවාරි මාසය ඇතුළත පවත්වනවා කියලා ගරු ඇමතිතුමා පොරොන්දු

වුණා. ඒ පිළිබඳ වූ ගැසට් නිවේදනයත් අත්සන් කළා කිව්වා. නමුත්, දැන් ගැසට් නිවේදනයක් මුද්‍රණය වෙලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ සඳහා ගරු ඇමතිතුමාට උත්තර දෙන්න කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා උත්තර දෙයි. ගරු ඇමතිතුමා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)
Hon. Speaker, firstly, I will not respond to this question because it is not a point of Order. Secondly, intentionally I have not done anything to delay this election. I have followed the due process of the law. It is with the Government Press. Unfortunately, if my learned Friend does not understand the process, I would humbly request him to first read -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමිය කථා කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා දැන් කිව්වනේ ඡන්දය වෙලාවට පවත්වනවා කියලා. ඉතින් ඒක කර ගන්න ඉඩ දෙන්න. ඡන්දය කරන්න ඉඩ දෙන්න. ඔබතුමා හරස් ප්‍රශ්නය අහනවා නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතින් - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා වාඩිවෙන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒ අයට විදේශයක සිට සාක්ෂි දීමේ හෝ ආරක්ෂාව ලබා ගැනීමේ සංශෝධන ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වනවා. අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා. එහි උප ලේඛනයෙහි සඳහන් තවත් වැරදි හැටියට සලකන පනත් 17ක වැරදි නිවැරදි කිරීම සඳහා තමයි එම සංශෝධනය ගෙනඑන්නේ.

පළමුවෙන්ම ඒ පිළිබඳව ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරනවා ඇති.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමිය කථා කරලා ඉවරද?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔව්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා විෂය අංක 4 ඉදිරිපත් කරන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Speaker, I move that the Local Authorities (Special Provisions) Bill be read the Second time.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 2.20]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, අද දින මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අධිකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ඉතා වැදගත් වූ සංශෝධන පනත් කෙටුම්පත් තුනක් පිළිබඳව ගරු ඇමතිතුමියගේ අවසරය පරිදි කරුණු දැක්වීමට ඔබතුමාගෙන් අවසර පතනවා. ගරු අධිකරණ ඇමතිතුමිය එම ධුරයට පත් වෙලා මේ රටේ අධිකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම පිණිස ඉදිරිපත් කරන ඉතා බරපතළ ක්‍රියාදාමයක පළමුවන පියවර හැටියට මෙම සංශෝධන ඉදිරිපත් කරන බව කියන්න අවශ්‍යයි. ඒ සඳහා එතුමියට ශක්තිය තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය දැනුම එතුමියට තිබෙනවා. අපි එතුමියට ශුභ පතනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු කථානායකතුමනි, මේ රටේ නීති ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සඳහා වූ වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් තමයි අද දින ඉදිරිපත් කරන්නේ. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක්.

ගරු කථානායකතුමනි, මේ රටේ සාක්ෂිකරුවන්ගේ සහ අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කරන, ලෝකය පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අපේ රටේ අපරාධ යුක්ති ක්‍රියාදාමය ගළපන ඉතා සුවිශේෂ පනත් කෙටුම්පතක් අපේ රජය යටතේ අපි සම්මත කළා. නමුත් ඒ පනත ක්‍රියාත්මක කිරීමේදී ඉතා වැදගත් වන අවශ්‍යතාවක් පිළිබඳව රජයේ අවධානය යොමු වුණා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපේ රටේ සිවිල් අධිකරණ බලය භාවිත කරන වාණිජ මහාධිකරණයේ සාක්ෂිකරුවන්ට විදේශ රටවල සිට පවා සාක්ෂි දීමට අවස්ථාව මීට ප්‍රථම සලසා තිබෙන බව. ඒ වාගේම එම අවස්ථාවේදීම හරස් ප්‍රශ්න නැඟීමට, සාක්ෂි දීමට අවශ්‍ය පහසුකම් සලසා දීලා තිබෙනවා. ඒවා අපේ රටට අලුත් කාරණා නොවෙයි. දැනටමත් අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ සිවිල් නඩුවලදී ශ්‍රී ලංකාවට පැමිණ සාක්ෂි දීමට යම් ප්‍රායෝගික අසීරුතාවන් ඇති අවස්ථාවලදී එවැනි සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අපි අනුකූල කරගෙන තිබෙනවා. අපේ රටේ නීතිය අනුව එය අනුකූල කර ගැනීමට පුළුවන්. නමුත් අපේ රටේ අපරාධ නීති ක්ෂේත්‍රය හා සම්බන්ධව අපරාධයක වින්දිතයෙකුට -අපරාධයකට ලක් වූ තැනැත්තෙකු- හෝ අපරාධයක සාක්ෂිකරුවෙකුට ලංකාවේ විභාග වන අපරාධ නඩුවකදී සාක්ෂි දීමට ලංකාවට පැමිණීමට නොහැකි තත්ත්වයක් මතු වී ඇති විටෙක එම සාක්ෂිය අදාළ රටේ ශ්‍රී ලංකා රජයේ දූත මණ්ඩල කාර්යාලයේදී වාර්තාගත කර ගැනීම සඳහා ප්‍රතිපාදන මෙම සංශෝධනය මඟින් සලසනවා. මේ හරහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් දුරස්ථ ස්ථානයක සිට සාක්ෂියක් ලබා දීමට හෝ ප්‍රකාශයක් ලබා දීමට තිබෙන අයිතිය තහවුරු වෙනවා.

යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය සෑම සාක්ෂියක්ම ලබා ගැනීමට අවකාශය සලසා දීම ශිෂ්ට නීති පද්ධතියක කොටසක්. අපේ රටේ ඉතිහාසය තුළ ඇති වූ යම් අප්‍රසන්න කාරණා නිසා ඇතැම් තැනැත්තන් තවමත් ශ්‍රී ලංකාවට පැමිණ සාක්ෂි දීමට බියක් දැක්වීමට ඉඩකඩ තිබෙනවා. එසේ නොමැතිනම් බරපතළ රෝගී තත්ත්වයක් නිසා හෝ ගුවන් මඟින් පැමිණීමට නොහැකි වෙනත් සුවිශේෂී ශාරීරික හෝ මානසික තත්ත්වයක් නිසා ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ අධිකරණයක සාමාන්‍ය ක්‍රමයට සාක්ෂි දීමට නොහැකි අවස්ථාවක සාක්ෂි දීම සඳහා වූ අවකාශය මෙයින් සලසනවා. එම නිසා මේ රටේ අපරාධ වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන, යුක්තිය පසිඳලීමට සහාය දක්වන සංශෝධනයක් තමයි රජය විසින් මේ ඉදිරිපත් කරනු ලබන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපේ රටේ ඉතාමත් සුවිශේෂී තවත් ක්ෂේත්‍රයක් තමයි අපරාධ වැළැක්වීම. අපරාධකරුවෙකුට දඬුවම් කිරීම වාගේම අපරාධ වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමත් රජයක වගකීමක්. අපේ රටේ අපරාධ වැළැක්වීම සඳහා වූ නීතිය ඉතා පැරණි නීතියක්. ගරු කථානායකතුමනි, අපේ රටේ අපරාධ වැළැක්වීමේ නීතිය ඇති කරලා තිබෙන්නේ 1926 අංක 2 දරන අපරාධ වැළැක්වීමේ ආඥාපනත යටතේයි. එම නීතිය 1929 ජනවාරි මාසයේ 01වෙනි දා ඉඳලා ක්‍රියාත්මක වෙනවා ගරු කථානායකතුමනි. නමුත් පසුව හඳුන්වා දුන් කාර්ය පටිපාටික නීති, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ එහි සංශෝධනයන් සමඟ මේ නීතිය ගැළපීම් කළේ නැහැ. මේ තත්ත්වය කාලයක් තිස්සේ තිබුණා. මේ ගැටලුව අපරාධ යුක්ති ක්ෂේත්‍රය විසින් හඳුනාගෙන තිබුණා. ඒ සංශෝධන සිදු නොවීම නිසා තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ ගරු කථානායකතුමනි. මේ හරහා පුළුවන්කම ලැබෙනවා, අපරාධ සඳහා වරදකරුවන් වූ තැනැත්තන් පිළිබඳව සොයා බැලීමට. ඒ වාගේම දණ්ඩන කාලය අවසන් වීමෙන් පසුවත් පොලීසිය විසින් ඒ තැනැත්තන් පිළිබඳව අවධානයෙන් සිටීමට සහ ඒ පිළිබඳව වාර්තා කිරීමට මේ හරහා අවකාශ සලසනවා.

ඒ පිළිබඳව වූ වගන්ති සහ ඒ සඳහා අදාළ වන අලුත් නීති මොනවාද කියලා මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පතත්, නීතිය යාවත්කාලීන කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉතා වැදගත් වූ පනත් කෙටුම්පතක්. මේ සංශෝධනය ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ගරු අධිකරණ ඇමතිතුමියට ස්තුතිවන්ත වන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් කරන සංශෝධන තුනෙන් වැදගත්ම සංශෝධනය තමයි, අපේ රටේ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 75 සිට 110 දක්වා වැඩි කිරීමට කරන ලද සංශෝධනය. මේ පනත් කෙටුම්පත මුලින්ම ඉදිරිපත් කරන අවස්ථාවේදී යෝජනා කරලා තිබුණේ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 75 සිට 85 දක්වා වැඩි කිරීමටයි. නමුත් නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් මේ පනත් කෙටුම්පත පිළිබඳව සලකා බැලීමේදී පෙනී ගියා, මෙම සංඛ්‍යාව කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව. මෙම ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් මේ රටේ අපරාධ යුක්තිය පසිඳලීම පිළිබඳව ඉදිරිපත් කර තිබෙන වාර්තාව පරිදි අපි හඳුනාගෙන තිබෙනවා, අලුතින් මහාධිකරණ 10ක් මේ රටේ ඇති කරන්න; දූෂණ විරෝධී මහාධිකරණයක් - Anti-corruption High Court - නමින් විශේෂ අධිකරණයක් මේ රටේ ඇති කරන්න; ඒ වාගේම trial at bar ක්‍රමයට බරපතළ නඩු විභාග කරන්න. ඒ සඳහා දැනට සිටින මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව කිසිසේත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මීට කලින් ඉදිරිපත් කර තිබුණු මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව දස දෙනෙකුගෙන් වැඩි කිරීම සඳහා වූ එම යෝජනාව වෙනුවට මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 35 දෙනෙකුගෙන් වැඩි කරන්නට මේ පනත් කෙටුම්පතින් යෝජනා කරනවා. ඒ අනුව මේ රටේ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව සියයට 45කින් පමණ වැඩි වනවා, ගරු කථානායකතුමනි. මේක දැවැන්ත වෙනසක්. මෙම පනත් කෙටුම්පත, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිය හා සම්බන්ධව විශාල බලපෑමක් ඇති කරන පනත් කෙටුම්පතක්. ඒ නිසා බරපතළ අපරාධ නඩු ඉක්මනින් විසඳන්න මේ හරහා අවකාශ සැලසෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ පවතින අපරාධ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදය සහ ගුණාත්මක භාවය පිළිබඳ කාරණා සම්බන්ධයෙන් මෙම ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් දීර්ඝ ලෙස සලකා බලනු ලැබුවා. නීතිපති දෙපාර්තමේන්තුව විසින්ම කරන ලද වාර්තාවක් අනුව පෙනී ගියා, යම් බරපතළ අපරාධයක් සිදු වීමෙන් පසුව එම නඩුව මහාධිකරණයක් ඉදිරිපිට අධිචෝදනාවක් මත විභාග කොට අවසන් කිරීම සඳහා ගත වන සාමාන්‍ය - average - කාලය අවුරුදු දහයකුත් මාස දෙකක් බව. ඒ වාගේම එම නඩුව සම්බන්ධයෙන් අභියාචනාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට තවත් අභියාචනා අවස්ථා දෙකක් තිබෙනවා. මේ කාරණා පිළිබඳව විමර්ශනය කරපු අලුවිහාරේ කමිටුව නිරීක්ෂණය කර තිබෙනවා, අභියාචනා විභාග කිරීම සඳහා ගත වන කාලය අවුරුදු හතක් බව. ඒ අනුව, බරපතළ අපරාධ නඩුවක් විභාග කොට අභියාචනා අවස්ථාවන් අවසානවීම සඳහා සාමාන්‍ය වශයෙන් අවුරුදු 17ක් ගත වනවා. ගරු කථානායකතුමනි, අවුරුදු

17ක් කියන්නේ ජීවිත කාලයක්; වරදකින් පීඩාවට පත් වුණු මිනිහෙකුට, වින්දිතයෙකුට, සාක්ෂිකරුවෙකුට දරාගෙන ඉන්න බැරි තරම් කාලයක්; යුක්තිය අපේක්ෂා කරන සමාජයක් වශයෙන් දරාගෙන ඉන්න බැරි තරම් කාලයක්.

මේ ප්‍රශ්නයට විසඳුම් විධියට, පාර්ලිමේන්තුවේ නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මේ වන විට ඒ යෝජනා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර, ඒ වෙනුවෙන් අමාත්‍ය අනු කමිටුවක් පත් කර, ඒ මඟින් මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ගෙන යනවා. ඊළඟට ගරු ජනාධිපතිතුමා වෙත මේ වාර්තාව ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ සඳහන් ආකාරයට මාස හයක් තුළ ඒ යෝජනා ක්‍රියාත්මක කර අවසන් කරන ලෙසට ගරු ජනාධිපතිතුමා උපදෙස් ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින්, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනා මොනවාද කියා ඔබතුමා සහ සමාජය දැනුවත් කරන්න මම කැමැතියි. පළමුවැනි කාරණය තමයි ගරු කථානායකතුමනි, රුපියල් මිලියන පහකට වැඩි වටිනාකමින් යුතු අල්ලස්, වත්කම්, දූෂණ, මුදල් විශුද්ධිකරණය, වංචා, සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධී විශ්වාසය කඩ කිරීම, කූට ලේඛන සෑදීම වැනි වැරදි පිළිබඳව සියලුම නඩු, trial-at-bar ක්‍රමයට පැවැත්වීම. ඇත්තවශයෙන්ම, ඒ සඳහා දැනට පවතින නීතිය සංශෝධනය කිරීම අවශ්‍ය නැහැ. ඒ ගොනු පිළිබඳව පරීක්ෂා කර බලා, ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ අනුමැතිය සහිතව මේ ක්‍රියාදාමය ආරම්භ කරන්න ගරු නීතිපතිතුමාට හැකියාව තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ රටේ දූෂණය, අල්ලස ඉතා බරපතළ ප්‍රශ්නයක්. එහෙත්, අල්ලස සහ දූෂණය පිළිබඳ නඩු විභාග කිරීම ඉතාම ප්‍රමාද වෙලා තිබෙනවා. අද තිබෙන තත්ත්වයේ හැටියට දූෂණය පිළිබඳ, - corruption කියන මේ නිශ්චිත චෝදනාව පිළිබඳ- නඩු විභාග කරන්න රටේ තිබෙන පහළම අපරාධ අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණයයි. මහේස්ත්‍රාත් අධිකරණයකට එම නඩුවක් විභාග කර අවසන් කරන්න අවුරුදු දහයක්, පහළොවක් ගත වෙනවා. පසු ගිය අවුරුදු විසිතුනටම දූෂණය - corruption - නැමති වරදට අපේ රටේ අධිකරණ විසින් හතරදෙනෙකු පමණයි වරදකරු කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, මේ රටේ දූෂණය නැහැයි කියන එකද? මේ රටේ අල්ලස නැහැයි කියන එකද?

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම, අපේ රටේ දූෂණය - corruption - හා සම්බන්ධ ක්ෂේත්‍රයේ නීති ඉතාම දුර්වලයි. ඒ නිසා මේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අප යෝජනා කර තිබෙනවා. ඊට අදාළ යෝජිත සංශෝධන සියල්ලම අවසන් කොට, ඒවා කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ලබා දී තිබෙන බවට එම කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්තුමා අප කමිටුවට වාර්තා කළ බව මා සතුටින් කියන්න කැමැතියි.

එම පනත් කෙටුම්පතේ අඩු පාඩු ගොඩක් තිබෙනවා. ඊළඟ මාස කීපය තුළදී ඒ පනත් කෙටුම්පත සම්මත වුණායින් පස්සේ ඒක මේ රටේ නීතිය බවට පත් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ පනත හරහා අල්ලස සහ දූෂණය පිළිබඳ නීතිය ශක්තිමත් වන විට ඒවා විභාග කිරීම සඳහා විශේෂිත මහාධිකරණයක් - Anti-corruption High Court - මේ රටට අවශ්‍යයි. මේක අලුත් දෙයක් නොවෙයි; ලෝකයේ හැම රටකම තිබෙනවා. අපි යෝජනා කරනවා, ඒ Anti-corruption High Court එක මහාධිකරණ විනිශ්චයකාරවරු තිදෙනෙකුගෙන් යුතු විනිශ්චය මණ්ඩලයක් මඟින් ස්ථිරසාරව නඩු විභාග කළ යුතුයි කියලා. ඒ වාගේම එවැනි Anti-corruption High Court එකක තීන්දුවක් අභියාචනා කිරීමේ අයිතිය තිබිය යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයට පමණයි. ඒ අනුව අඩු ගානේ වසර 3ක් - 4ක් ඇතුළතවත් එවැනි නඩුවක සම්පූර්ණ ක්‍රියාදාමය අවසන් කිරීමට අවකාශය ලැබෙනවා. එසේ කරන්නට වැඩිපුර විනිශ්චයකාරවරුන් අවශ්‍යයි. එසේ කරන්නට වැඩිපුර මහාධිකරණ විනිශ්චයකාරවරුන් අවශ්‍යයි. එසේ කිරීම සඳහා තමයි මෙම පනත මඟින් වැඩිපුර විනිශ්චයකාරවරුන් ප්‍රමාණයක් පත් කිරීම කරන්නේ.

ගරු කථානායකතුමනි, අද හුඟක් වෙලාවට තිබෙන ප්‍රශ්නයක් තමයි නඩු කල් යෑම. අද තිබෙන අපරාධ නඩු විධාන සංග්‍රහය අනුවත්, අපරාධ නඩු විභාග කිරීම දින පතා - day-to-day trials - පවත්වන්නට අවශ්‍යයි. අපරාධ නඩු විධාන සංග්‍රහය අනුව බරපතළ අපරාධයක් පිළිබඳව දින පතා නඩු විභාගය පැවැත්විය යුතුයි කිව්වත්, අද සිද්ධ වෙන්නේ එක දිනක් නඩුව අහලා තවත් මාස ගණනකට නඩුව කල් දැමීමයි. ඒකට ප්‍රායෝගික හේතු ගොඩක් තිබෙනවා. ඒ අතින් ගත්තාම අද තිබෙන තත්ත්වය අනුව අධිකරණය ඉතාම දුර්වලයි. එක පැත්තකින් අධිකරණවලට ඒ අවශ්‍ය කරන ශ්‍රමය නැහැ; ලඝුලේඛිකාවන් නැහැ; ඒවා පටිගත කිරීමේ පහසුකම් නැහැ. ඒ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ තත්ත්වය තුළ මහාධිකරණයන්හි නඩු විභාගයට පූර්වයෙන් වූ ගැටලු විසඳීම සඳහා වාර්තාධිකාරී විනිසුරුවරුන් - Recorder judges - පත් කිරීමට අපි යෝජනා කර තිබෙනවා. මෙය අපේ අදහසක් නොවෙයි. මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාර අලුවිහාරේ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කර තිබුණු කාරක සභාවක් විසින් ඉදිරිපත් කරපු යෝජනාව අපේ කමිටුව පිළිගත්තා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මිනී මැරුම්, මිනී මැරීමට තැත් කිරීම, ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර ඇතුළු අනෙකුත් බරපතළ අපරාධ සම්බන්ධයෙන් වූ නඩු විභාග දින පතා සිදු කිරීම සඳහා අපි විශේෂයෙන් කටයුතු කරන්න අවශ්‍යයි. අපි ඒ පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම ඉතාම බරපතළ ලෙස නඩු ගොඩ ගැසී ඇති සමහර අධිකරණ අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අතරින් අනුරාධපුර, මහනුවර, ගම්පහ, රත්නපුර විශේෂයි. ඒවායේ තවත් එක් මහාධිකරණයක් බැගින් වැඩිපුර පිහිටුවන්නත්, මාතලේ අලුත්ම අධිකරණයක් පිහිටුවන්නත් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම අපරාධ වැඩි, බොහෝ චෝදනා පිළිබඳව අධිකරණ බලය තිබෙන කොළඹ සඳහා තවත් මහාධිකරණ පහක් අපි යෝජනා කරනවා. ඒ අනුවයි අලුත් මහාධිකරණ දහයක් ගැන සඳහන් වන්නේ, ගරු කථානායකතුමනි.

ඊළඟට, ළමා අපචාර පිළිබඳ ප්‍රශ්නය බරපතළයි ගරු කථානායකතුමනි. ළමා අපචාරයකට ලක්වූවෙකුට වසර 10ක්, 15ක් නඩු විභාගයට මුහුණ දෙන්න සිදුවීම කිසිසේත්ම සාධාරණ නැහැ. එය ඉතා අමානුෂිකයි. ළමා අපචාර පිළිබඳ නඩු විභාග කරන්න, වෙනමම අධිකරණයක් තිබෙනවා නම් ඒක සුදුසු දෙයක්. ළමා අපචාර නඩු විභාග කිරීම සඳහා වෙනම මහාධිකරණයක් දැනටමත් අනුරාධපුරයේ සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ගරු කථානායකතුමනි, අපි යෝජනා කරලා තිබෙනවා, කොළඹ තවත් මහාධිකරණයක් ළමා අපචාර නඩු වෙනුවෙන්ම වෙන් කර තබන ලෙස.

ගරු කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවට බොහෝ චෝදනා එල්ල වෙලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවට එල්ල වෙලා තිබෙන මේ චෝදනා පිළිබඳව අපේ අවධානය යොමු

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි. 2017 මාර්තු 31වන විට මහාධිකරණවල විභාග වෙමින් පැවතුණා, නඩු 16,534ක්. නඩු 16,534ක්! මිනී මැරීම්, මිනී මැරීමට තැත් කිරීම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, ත්‍රස්තවාදී වැරැදි යනාදී නඩු 17,000ට ආසන්න ප්‍රමාණයක් විභාග වෙමින් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඊට අමතරව නීතිපති දෙපාර්තමේන්තුවේ අඩු ගණනේ තවත් ගොනු 18,000ක්වත් තිබෙනවා. මේවා අවසන් කර ගන්න බැරි, මේවා පිළිබඳ සාර්ථක ප්‍රගතියක් අත්කර ගන්න බැරි මට්ටමක තිබෙනවා. මම දන්නවා, පසු ගිය කාලයේ යම් ප්‍රගතියක් තිබුණාය කියලා. ඒ කියන්නේ, අවුරුද්දකට එන ගොනු ප්‍රමාණයට වඩා ස්වල්ප වශයෙන් වැඩි ප්‍රමාණයකට අධිචෝදනා ගොනු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ කටයුතුවල යම් ප්‍රතිශතයක ප්‍රගතියක් අත්කරගෙන තිබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, මේ එකතු වෙලා තිබෙන නඩු දසදහස් ගණනක ප්‍රශ්නය විසඳන්න මේ තත්ත්වය සෑහෙන්නේ නැහැ.

අපි හොයලා බැලුවා මොකක්ද තිබෙන ප්‍රශ්නය කියලා. නීතිපතිවරයා අපේ කමිටුව ඉදිරියට කැඳවලා අපි එතුමාගෙන් ඒ ගැන ප්‍රශ්න කළා; සාක්ෂි ලබා ගත්තා; ලිඛිත වාර්තාවක් ලබා ගත්තා. එතුමා යෝජනා කරලා තිබෙනවා, "නීතිපති දෙපාර්තමේන්තුවට රජයේ අධිනීතිඥවරුන් ප්‍රමාණවත් ලෙස නැත" කියලා. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥවරුන්ගේ අනුමත සංඛ්‍යාව - approved cadre - 118ක් පමණයි. නීතිපතිතුමාම ඉල්ලීමක් කරනවා, "ප්‍රශස්ත ලෙස මේ කටයුතු කරගෙන යන්න නම් රජයේ අධිනීතිඥවරුන් සංඛ්‍යාව තවත් 100කින් වැඩි කරන්න ඕනෑ" කියලා. අපි ඒ යෝජනාව පිළිගත්තා. මේ තරම් දැවැන්ත මුදලක් මේ රටේ ජනතාව වෙනුවෙන් වියදම් කරන ආණ්ඩුවකට රජයේ අධිනීතිඥවරුන් වැඩිපුර පත් කරගන්න බැරි නම් වැඩක් නැහැ.

ගරු කථානායකතුමනි, මට විශ්වාසයක් තිබෙනවා, ගරු ඇමතිතුමිය දැනට කරගෙන යන විධියටත්, අපට වාර්තා කරලා තිබෙන විධියටත් අපට මේ කටයුත්ත සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙයි කියලා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි, රජයේ නීතිපති දෙපාර්තමේන්තුවට ගුණාත්මකභාවයකින් යුක්ත දක්ෂ තරුණ නීතිඥවරුන් සහ නීතිඥවරියන් බඳවා ගැනීමට තිබෙන නොහැකියාව. ඒ ක්‍රමවේදය විධිමත් කරන්න, නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන් අධික ලෙස මහන්සි වෙනවා. ඔවුන් ඉතාම අපක්ෂපාත ලෙස වැඩ කරනවා. ඔවුන් ඉතාම දුක්විඳිනවා. ඔවුන් ඈත පළාත්වලදී අවම පහසුකම්වත් නැතුව වැඩ කරනවා. ඒ රජයේ අධිනීතිඥවරුන්ගේ වැටුප මහෙස්ත්‍රාත්වරයෙකුගේ වැටුපට ආසන්න මට්ටමකට අරගෙන එන්න කියලා අපි යෝජනා කරලා තිබෙනවා. ඒක අපේ යෝජනාවක්ම නොවෙයි, කලින් ඉඳලාම තිබුණු යෝජනාවක්. නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. අවුරුදු ගණනක් ඒක පරක්කු වුණා. ඒ නිසා අපි බලකර සිටිනවා, රජයේ අධිනීතිඥවරුන්ගේ සහ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් ප්‍රමාණවත් ලෙස වැඩි කිරීමට අවශ්‍ය පියවර ගන්න කියලා.

අධිකරණ අමාත්‍යාංශය තුළ මේ කැපවීම තිබෙනවා; අධිකරණය අමාත්‍යාංශයෙන් අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. එම නිසා මේ හා සම්බන්ධව වග කියන රජයේ අනිකුත් ආයතන ප්‍රමුඛතම කාර්යයක් වශයෙන් සලකලා, යුක්තිය පසිඳලීමේ කාරණය කාර්යක්ෂම කිරීම සඳහා වූ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුව තිබෙනවා. ඊළඟ මාස කීපය තුළ මේ ගැටලු විසඳන්න රජයට හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීමේදී තිබෙන ප්‍රශ්න ගැන ඇහුවාම අපට පුදුමත් හිතෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ දැනට සිටින නීතිඥවරුන්ට පවා ඒ අයගේ කටයුතු කර ගැනීමට ප්‍රමාණවත් ගොඩනැඟිලි පහසුකම් නැහැ. රජයේ අධිනීතිඥවරු කීප දෙනෙක් එක කාමරයක ඉතාම දුෂ්කර තත්ත්ව යටතේ ඉන්නවා. මේ තත්ත්වය තුළ අනාගතයේ බඳවා ගන්නා රජයේ නීතිඥවරුන්ටත්, දැනට කාර්යාල පහසුකම් නැති අයටත් ගොඩනැඟිල්ලක් අවශ්‍යයි. දැනට ඒ අය සඳහා ගොඩනැඟිල්ලක් හදනවා. මුල් සැලැස්මේ හැටියට ඒ ගොඩනැඟිල්ල 2019 මාර්තු මාසයේ අවසන් වෙන්න ඕනෑ. නමුත් එදාට මේ ගොඩනැඟිල්ල හැදෙන්නේ නැහැ කියන එක අපට පැහැදිලියි. මේ තත්ත්වය නිසා, ප්‍රමාණවත් තරම් ඉඩ පහසුකම් තිබෙන අලුත් ගොඩනැඟිල්ලක් කුලී පදනම මත නීතිපති දෙපාර්තමේන්තුවට ලබාදෙන්න කියා අධිකරණ අමාත්‍යාංශයට අපි යෝජනා කර තිබෙනවා. අපි එය කමිටුවට වාර්තා කළා. ඒ පිළිබඳව ප්‍රගතියක් තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. තමන්ගේ කටයුතු නිදහසේ කරගන්න ප්‍රමාණවත් තරම් පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් සහ ඒ උපකරණවල වාසිය ඊළඟ මාස කීපය තුළ රජයේ අධිනීතිඥවරුන් වෙත ලැබෙයි කියා අපි අපේක්ෂා කරනවා. ඒ සඳහා මහන්සියෙන් කැපවීමෙන් වැඩ කළ අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින්ට මේ අවස්ථාවේ අපේ ගෞරවයත්, ස්තුතියත් පිරිනමනවා.

ගරු කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කරන්න නම්, එහි කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපනය කරන්න ඕනෑ. එය අපි යෝජනා කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, රජයේ අධිනීතිඥවරු විසින්ම ඔවුන්ගේ පරිපාලන කටයුතු කිරීම සුදුසු දෙයක් නොවෙයි. ඔවුන්ගේම ඉල්ලීම පරිදි, මේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකුගේ සේවය ඔවුන්ට ලබාදෙන්න කියා අපි යෝජනා කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම සඳහා අලුත් නීති හදන කොට අප මෙන්න මේ කාරණාත් සැලකිල්ලට ගත යුතුයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා පසු ගිය රජය යටතේත්, අපේ රජය ආවාට පසුවත් මේ රටේ දූෂණ සිද්ධ වෙලා තිබෙන බව. ඒ දූෂණ පිළිබඳව අප සොයන්න ඕනෑ; ඒවායින් අහිමි වූ දේපළ නැවත මේ රටට අයිති කර ගන්න ඕනෑ. හැබැයි, දැනට තිබෙන නීතිය අනුව ඒවා නැවත අත්පත් කර ගැනීමට ඉතා අසීරුයි. එම නිසා දූෂණයෙන්, අපරාධ මඟින් අහිමි වූ දේපළ නැවත රජය වෙත අත්පත් කර ගැනීම සඳහා වූ නව නීතිවල අවශ්‍යතාව තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ කාරණය ඇහුවාම ඔබතුමාත් පුදුම වෙයි. අපේ රටේ දිනපතා නඩු විභාග කරන්න අමාරුකම තිබෙන, ඒ වාගේම day-to-day trials කරන්න බැරිකම තිබෙන ප්‍රධානම හේතුවක් තමයි ලඝු ලේඛක ලේඛිකාවන්ගේ හිඟය.

පාර්ලිමේන්තුව හොඳට පඩි ගෙවනවා. එම නිසා පාර්ලිමේන්තුවට ලඝු ලේඛක ලේඛිකාවන්ගේ ආකර්ෂණයක් තිබෙනවා. හැබැයි, අපේ රටේ අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථය තුළට වැටෙන ලඝු ලේඛිකාවන්ට හෝ ලඝු ලේඛකයන්ට ගෙවන පඩිය හොඳටම මදි. ඒ නිසාම අද මේ ක්ෂේත්‍රය වෘත්තියක් වශයෙන් හඳුනා ගන්නේ නැහැ. එය බොහෝදෙනෙකුගේ ප්‍රමුඛතාවක් ඇති වෘත්තියක් නොවෙයි. ඒ නිසා ලඝු ලේඛක සේවය වෙනම වැටුප් තලයක පිහිටුවන්න කියා අපි යෝජනා කර තිබෙනවා. ඔවුන්ට විශේෂ පුහුණුවක් ලබාදෙන්න, ඒ ලඝු ලේඛනය පහසුවීම සඳහා සහ වාර්තා කිරීම පහසුවීම සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දෙන්න අපි යෝජනා කර තිබෙනවා. මෙය ඉතා ප්‍රමුඛ කාරණයක්. මෙය බැලූ බැල්මට පුංචි කාරණයක් වුණාට, සෑම අධිකරණයකම -මහේස්ත්‍රාත් අධිකරණයේත්, දිසා අධිකරණයේත්, මහාධිකරණයේත්- වාර්තා කිරීමේ ප්‍රශ්නය -ලඝු ලේඛක- ප්‍රශ්නය බරපතළ ලෙස තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සංශෝධන කිරීම සඳහා මාස හයක කාලයක් ගන්න කියලා ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා කර තිබෙනවා. සමහර විට මේ කටයුතු වේගවත් වෙන්න පුළුවන්. එහෙම වේගයක් ඇතිව වැඩ නොකළොත්, මේ රටට අපි යුක්තියක් ඉෂ්ට කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

අපේ නව ගරු ඇමතිතුමියට මම සුබ පතනවා. මේ කටයුතු සාර්ථකව කරන්න එතුමියට වාසනාව ලැබේවා!යි කියා මම ප්‍රාර්ථනා කරනවා. අධිකරණ අමාත්‍යාංශයේත්, නීතිපති දෙපාර්තමේන්තුවේත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේත් දක්ෂ නිලධාරි මණ්ඩලයක් ඉන්නවා. ඒ සියලුදෙනාම එකතු වෙලා මේ ප්‍රශ්න විසඳා ගන්න කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, අද දින විවාදයට ගෙන තිබෙන මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට බලපාන පනත් කීපය පිළිබඳව කරුණු කීපයක් මේ ගරු සභාව ඉදිරියේ තබන්න මම බලාපොරොත්තු වෙනවා.

ප්‍රථමයෙන්ම මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව. මට පෙර කථා කළ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා මෙම පනත තුළින් සාක්ෂිකරුවන්ට ලැබෙන ඉමහත් වාසිය පිළිබඳව කරුණු ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමනි, මේ පනත් සංශෝධනය අපට වියුක්තව සලකා බලන්න බැහැ.

දැනට මේ රටේ සිදු වෙමින් පවතින ක්‍රියාදාමයකට සාපේක්ෂවයි මේ කාරණය පිළිබඳව අපට අවධානය යොමු කරන්න පුළුවන් වන්නේ.

දැනටමත් පුද්ගලයන් අතුරුදහන් වීමට අදාළ ජාත්‍යන්තර ප්‍රඥප්තියට මංගල සමරවීර හිටපු විදේශ අමාත්‍යවරයා අත්සන් කර තිබෙනවා. ඒ ජාත්‍යන්තර ප්‍රඥප්තිය බලාත්මක කිරීමේ පනත් කෙටුම්පතක්ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එය විවාද කර සම්මත කිරීමට සූදානම්ව තිබියදී, අවස්ථා දෙකකදීම විවාද නොකොට කල් දමනු ලැබුවා. ඒ පිළිබඳව මේ රටේ විද්වතුන් සහ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන කණ්ඩායම් රජයේ විවිධ අංශවලට කරන ලද කරුණු දැක්වීම් මත ඒ කාර්යය දැන් ටිකක් පස්සට ගිහිල්ලා තිබෙනවා. නමුත් ඒක නැත්තටම නැති වෙලාය කියලා අපට පෙනෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට අදාළ ඒ ජාත්‍යන්තර ප්‍රඥප්තියට ඇමෙරිකා එක්සත් ජනපදයවත් අත්සන් කරලා නැහැ. මංගල සමරවීර හිටපු විදේශ අමාත්‍යවරයාගේ අත්සන ඒකට ලබා ගැනීම, ශ්‍රී ලංකා රජය ඒකට බැඳීම මඟින් තමයි, ජෙනරල් ජගත් ජයසූරියලාට විරුද්ධව අද බ්‍රසීලයේ පවා පැමිණිලි ගොනු වෙන්න පටන් අරගෙන තිබෙන්නේ.

පසු ගිය දා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන නියෝජිතයකු මේ රටට ආවා. මාධ්‍ය සාකච්ඡාවේදී ඔහු ඉතාම පැහැදිලිව කිව්වා, "කවුරු කොහොම කිව්වත් යුද අපරාධ කර තිබෙන හමුදා නිලධාරින්ට එරෙහිව ශ්‍රී ලංකාව තුළත්, ඉන් පිටතත් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න දැන් පුළුවන්කම තිබෙනවා" කියලා. මා හිතන හැටියට ඔබතුමන්ලා ඒ මාධ්‍ය සාකච්ඡාව අධ්‍යයනය කරන්න ඇති. ඒ කරුණු අනුව අපට බොහොම පැහැදිලියි, පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය රට තුළ නීතියක් බවට පත් කරන්න යනවා, ඒ අනුව පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ චෝදනා විභාග කරන වෙනම අධිකරණයක් අපි නිර්මාණය කරනවා, ඒ අධිකරණයට ඇවිල්ලා සාක්ෂි දෙන්න දේශපාලන රැකවරණ පිට ඉන්න දෙමළ ඩයස්පෝරාවේ සාමාජිකයන්ට බැරි වෙන බව. එතකොට දේශපාලන රැකවරණ පිට යුරෝපීය රටවල ඉන්න කොටි ඩයස්පෝරාවේ පුද්ගලයන්ට, හෙට දවසේ අර පනත් කෙටුම්පත සම්මත කරලා අර කියන විශේෂ අධිකරණය ඇති කළාම, රජයේ හමුදාවලට එරෙහිව බොරු සාක්ෂි දෙන්න, අල්ලේ පැළ වෙන බොරු සාක්ෂි දෙන්න, ඒ සාක්ෂි පිළිගන්නා තත්ත්වයකට පෙරළන්න පුළුවන්කම ලැබෙනවා. අන්න ඒ නිසා තමයි තමුන්නාන්සේලා සාක්ෂිකරුවන්ට අධිකරණය තුළ නොවෙයි, වෙන රටක ඉඳගෙන වුණත් සාක්ෂි දෙන්න තිබෙන අයිතිය ආරක්ෂා කරනවාය කියලා හදිසියේම මේ කියන්නේ. එහෙම නැතිව වෙන කථාවක් නොවෙයි එතැන තිබෙන්නේ.

පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය දැන් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. ඒ නීතිය තමුන්නාන්සේලා අනාගතයේ සම්මත කරන්න ඉඩ තිබෙනවා. ඒ නීතිය සම්මත කළොත් විශේෂ උසාවියක් හැදෙනවා. ඒ උසාවියට යන්නේ පුද්ගලයන් අතුරුදහන් කිරීම පිළිබඳ පැමිණිලි. දැනටමත් තමුන්නාන්සේලා පුද්ගලයන් අතුරුදහන් කිරීම පිළිබඳ සොයා බලන්න අර්ධ අධිකරණ බලය තිබෙන කාර්යාලයකුත් වෙනම පිහිටුවා තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කරලා. ඒ කාර්යාලය මේ සම්බන්ධ බොරු චෝදනා, පැමිණිලි එකතු කරනවා. ඒකට අර්ධ අධිකරණ බලයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සන්දර්භය ඇතුළේයි අපි මේ පනත් සංශෝධනය කියවන්න ඕනෑ. මේ දෙස වියුක්තව බැලුවාම කෙනකුට හිතෙන්න පුළුවන්, සාක්ෂි දෙන කෙනකුට පිට රට ඉඳලා හෝ සාක්ෂි දෙන්න පුළුවන් වීමෙන් සිදුවන වරද මොකක්ද කියලා. ඒක හොඳයි කියලා හිතෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, යම් කිසි පුද්ගලයකු අධිකරණ පරිශ්‍රය තුළ සාක්ෂි දෙන කොට එතැනදී ඔහු මුහුණ දෙන තත්ත්වයයි, වෙනත් රටක හෝ වෙනත් සුවපහසු ස්ථානයක ඉඳගෙන දුරකථන

[ගරු විමල් වීරවංශ මහතා]

මහින්, වීඩියෝ මඟින් සාක්ෂි දෙන කොට මුහුණ දෙන පරිසරයයි වෙනස්. අධිකරණය ඇතුළේ ඉඳගෙන සාක්ෂි දෙන කෙනකුට සත්‍ය ප්‍රකාශ කරන්න තිබෙන ඉඩකඩ වැඩියි. ඒ භූමියට, ඒ පරිශ්‍රයට ඇතුළු වුණාම කෙනකුගේ මානසිකත්වය ඊට අවනත මානසිකත්වයක් බවට පෙරළෙනවා. එහෙම යම්කිසි පීඩනයක් ඒ පරිසරය විසින් ඇති කරනවා. ඒ නිසා කෙනකුට තමන් දෙන සාක්ෂිය පිළිබඳව, එහි නිරවද්‍යතාව පිළිබඳව වගකීම ගන්න වෙනවා. නමුත්, යුරෝපා රටක ඉඳගෙන දෙමළ ඩයස්පෝරාවේ සාමාජිකයකු කරන බොරු චෝදනාවලට, සාක්ෂිවලට අනාගතයේ හඳුන්න යන අතුරුදහන් වීම පිළිබඳ චෝදනා විභාග කරන අධිකරණයේදී පණ දීමේ, වලංගුභාවය හදලා දීමේ පාපතර ක්‍රියාව වෙනුවෙන් තමයි මේ සංශෝධනය එන්නේ. ඒ නිසා ඒ සන්දර්භය ඇතුළේ ඉඳගෙනයි අපට මේක කියවා ගන්න වෙන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. තමුන්නාන්සේලා අධිකරණයේ ස්වාධීනත්වය ගැන බොහෝ කරුණු කියනවා. මේ වන කොට ශ්‍රේෂ්ඨාධිකරණයේ එක විනිසුරුවරයකු විශ්‍රාම ගිහිල්ලා තිබෙනවා. මෙතෙක් මුළු ඉතිහාසයේම ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබුණු සම්ප්‍රදායය තමයි විනිශ්චයකාරවරයකු විශ්‍රාම ගොස් දින තුන, හතරක් ඇතුළත ඒ පුරප්පාඩුව පිරවීම. නමුත්, දැන් මාසයකට වැඩියි, ඒ පුරප්පාඩුව පුරවා නැහැ. මේ මාසයේ අන්තිම වන කොට තවත් විනිශ්චයකාරවරයකු විශ්‍රාම ගන්නවා. එතකොට පුරප්පාඩු දෙකයි. තමුන්නාන්සේලා බලන්නේ, මේ පුරප්පාඩු සාම්ප්‍රදායික ක්‍රමයට විධිමත්ව පුරවන්නේ නැතිව, ශ්‍රේෂ්ඨාධිකරණයට පිටතින් තමන්ගේ දේශපාලන හෙන්චයියන් දෙදෙනකු අරගෙන යන්නයි.

අලුත් ව්‍යවස්ථා සංශෝධන එනවා. ඒවාට විරුද්ධව මිනිස්සු ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. එවැනි වෙලාවක ශ්‍රේෂ්ඨාධිකරණය නීතිය අනුව තීරණ ගන්නා තැනක් වෙනවා වෙනුවට, දේශපාලන පක්ෂ පාතිත්වය අනුව තීරණ ගන්නා තැනක් විධියට ඒ පුරප්පාඩු පුරවන්න තමයි තමුන්නාන්සේලා උත්සාහ කරන්නේ. ඒවා එහෙම වුණාට පස්සේ කියලා වැඩක් නැති නිසායි කල්තියා මේ අනතුර අඟවන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේලා අධිකරණ ක්‍රියාදාමය විධිමත් කරනවාය කිව්වාට මොනවාද කරන්නේ? මේ රටේ රිමාන්ඩ් බන්ධනාගාරයකට ගිහින් බලන්න. බන්ධනාගාරයේ මිනිස්සු මුහුණ දී තිබෙන ප්‍රශ්න බලන්න. ගරු කථානායකතුමනි, සමහර වෙලාවට කුඩු පැකට් එකත් එක්ක අහු වෙච්ච මිනිහා දඬුවම ලබන්නේ නැතිව අවුරුදු එකහමාර, දෙක හිරේ ඉන්නවා. මොකක්ද හේතුව? රජයේ රස පරීක්ෂක වාර්තාවේ ප්‍රමාදය. එතැන මිලිග්‍රෑම් කොච්චර ප්‍රමාණයක් කුඩු තිබුණාද, වෙන මොනවාද තිබුණේ කියලා වාර්තාව එන්නේ නැහැ. හැමදාම මාසයකට වරක් උසාවි යනවා. " ස්වාමීනි රස පරීක්ෂක වාර්තාව ලැබී නැහැ" කියනවා. අර මනුෂ්‍යයාව අයෙත් හිර ගෙදරට ගේනවා.

ගරු ඇමතිතුමනි, මා රිමාන්ඩ් බන්ධනාගාර ගත වී සිටිද්දී එක හිර කරුවෙක් සිටියා. ඔහු ලන්ඩනයේ සිටි කෙනෙක්. විවාහ වෙන්න ලංකාවට ආවා. විවාහ වෙන්න එනකොට අයියා පොඩි පර්සලයක් දුන්නා., "මේක යහළුවාට ගෙන ගිහින් දෙන්න" කියා. ඒක කුඩු. ඒ පුද්ගලයා අහු වුණා. ඇත්තටම ඔහුගේ අතේ තිබුණු කුඩුවල යම් මිලිග්‍රෑම් ප්‍රමාණයක් මැනෙනවා. ඒ ප්‍රමාණය අනුව තේ දඬුවම තීරණය වෙන්නේ. ඔහු හොඳටම දන්නවා, වරදකරු වුණත් ඔහුට අවුරුද්දක් විතර තමයි දඬුවම ලැබෙන්නේ කියලා. නමුත් මේ රස පරීක්ෂක වාර්තාව නැති නිසා දැනටත් ඔහු අවුරුදු තුනක් හිරේ ඉන්නවා. රස පරීක්ෂක වාර්තාව නැහැ. ඔහු දැනටත් හිරේ ඉන්නවා. එවැනි තත්ත්වයක් තිබෙන්නේ. අපි මේ රටේ ප්‍රතිසංස්කරණයක් කරනවා නම්, මෙන්න මේවායි කරන්න ඕනෑ. මේවා මිනිසුන්ට එකහෙලා බල පා තිබෙන ප්‍රශ්න. මිනිස්සු නිකම් හිර ගෙවල්වල කන්න බොන්න දීලා තියාගෙන ඉන්නවා. කාර්යක්ෂම විධියට ඒ නඩුව අහලා වරදකරු නම් වරදකරුට හිමි දඬුවම දෙනවා හැරෙන්න, වරදකරු නොවී අවුරුදු තුන හතර හිර ගෙවල්වල ගත කරනකොට ඒ කිසිම පුද්ගලයෙක් ආයෙත් සමාජ හිතකාමී මිනිසෙක් වෙන්නේ නැහැ. සමාජයෙන් එළියට එන්නේම වෛරයෙන්. ගිය මිනිහාටත් වඩා නරක මිනිහෙක් තමයි අන්තිමට බන්ධනාගාරයෙන් එළියට එන්නේ. දඬුවමක් දෙනවා නම් දෙන්නේ මිනිහෙක් හදා ගන්න. දඬුවමක් දෙන්නේ නැතිව -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මේ පිළිබඳව පැහැදිලි කර ගන්න අවශ්‍යයි. ගරු මන්ත්‍රීතුමා කිව්වා, රස පරීක්ෂක වාර්තාව නැතිව අවුරුදු තුනක් බන්ධනාගාරයේ ඉන්නවාය කියා. කරුණාකර එම විස්තරය අපට දෙන්න. එම කාරණය මාත් දැන ගෙන සිටියා. අපි විශ්වාස කරන ආකාරයට මේ වෙන කොට මාස තුනක් ඇතුළත රස පරීක්ෂක වාර්තාව එනවා. විශේෂ කාරණාවක් තිබෙනවා නම්, ඔබතුමා එම තොරතුරු ඇමතිතුමියට දෙන්න. ඇමතිතුමිය ඒ ගැන අනිවාර්යයෙන්ම සොයා බලයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඇත්තටම ගරු ඇමතිතුමියගේ ප්‍රශ්නයක් හැටියට නොවෙයි මම කියන්නේ. System එකේ තිබෙන රෝගයක්. [බාධා කිරීමක්] නැහැ. මගේ පෞද්ගලික අත්දැකීමක් ගරු ඇමතිතුමියනි. මට අසත්‍යයක් කියන්න අවශ්‍ය නැහැ. මම මේ ආයතනයට චෝදනා කරනවාත් නොවෙයි. සමහරවිට පිරිස මදි ඇති. මොකක් හෝ ඒ ගැටලුවට උත්තරයක් ඕනෑ. ආයතනයට චෝදනාවක් නොවෙයි. [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේ දීත් ඔය ප්‍රශ්නය පිළිබඳව සලකා බැලුවා. එහිදී අපට දැන ගන්නට ලැබුණා, මේ වෙනකොට - අනෙක් ආයතන ගැන නොවෙයි මම කියන්නේ. - රස පරීක්ෂක දෙපාර්තමේන්තුව කාර්යක්ෂමව වැඩ කරන බව. ඔබතුමාගේ චෝදනාව අසත්‍යයක් යයි කියනවා නොවෙයි. විශේෂිත ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට කියන්න. ගරු ඇමතිතුමියත්, නිලධාරිනුත් ඉන්නවා. ඔවුන් කිව්වා, ඒ ගැන සොයා බලන්නම් කියා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි. ඇත්තටම දෙපාර්තමේන්තුවට චෝදනාවක් නොවෙයි. පුද්ගල සම්පත් සීමාසහිත වීම නිසා සිදු වෙන දෙයක්

වන්නට පුළුවන්. හිතාමතාම කෙනෙකුගේ වාර්තාවක් ප්‍රමාද කරනවාය කියා මම චෝදනා කරන්නේ නැහැ. මා ලැබූ අත් දැකීමක් ගැනයි මම මේ කිව්වේ. [බාධා කිරීම්] මේ රටේ අධිකරණ ක්‍රියාදාමයේ; යුක්තිය පසිඳලන ක්‍රියාදාමයේ විශාල අඩුපාඩුකම් තිබෙනවා. දුබලතා තිබෙනවා. ඒ අඩුපාඩුකම් නිසා, දුබලතා නිසා හිර ගෙවල් අනවශ්‍ය ආකාරයට පිරෙනවා. දඬුවමක් ලැබූ මිනිහෙක් හොඳ කෙනෙක් වෙලා හොඳ මානසිකත්වයෙන් නොවෙයි එළියට එන්නේ. ගිය මිනිහාට වඩා නරක මිනිහෙක් වෙලා එළියට එන්නේ. මෙන්න මේවා ගැනයි බලන්න ඕනෑ. බලය බෙදනවා, ෆෙඩරල් ගේනවා, අරවා කරනවා නොවෙයි. මේ රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ගැනයි බලන්නට ඕනෑ. මනුෂ්‍යයෙක් හැටියට ඔහු වරද කළා නම් අධිකරණයෙන් දෙන තීන්දුවක් අනුව හිර ගෙදරදී දඬුවම් ලබන එක වෙනම දෙයක්. නමුත් මනුෂ්‍යයෙක් හැටියට ඔහුට යුක්තිය ඉටු වෙන්නට ඕනෑ. ඒ කිසිවක් මේ ක්‍රියාදාමය ඇතුළේ සලකා බැලෙන්නේ නැහැ.

දැන් පොලිසියට පුළුවන්, ඕනෑ මිනිහෙකුගේ කන පලන්න. පසුගියදා පැවැති හම්බන්තොට විරෝධතා ව්‍යාපාරයේ දී පොලිසිය තරුණයෙකුට පහර දුන්නා. ඔහු මුහුණුපොතේ, ඒ වාගේම පත්තරයකත් මාධ්‍යවේදියෙක්. එම තරුණයා කළේ තමන්ගේ දුරකථනයෙන් video කරපු එක. වෙන කිසිම ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවකට ඔහු සම්බන්ධ වෙලා නැහැ. අන්තිමට මොකද කළේ? පොලිසියේ උසස් නිලධාරියෙක් ඔහුට කන පැලෙන්න ගැහුවා. පොලිසියේ උසස් නිලධාරියාට විරුද්ධව තවම කිසිම පියවරක් නැහැ. නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අනීතික බලයක් භුක්ති විඳින්නට දීමෙන් පීඩාවට පත් වන්නේ සාමාන්‍ය රටවැසියා.

ප්‍රසන්න මන්ත්‍රීතුමා විරෝධතා ව්‍යාපාරයකට සහභාගි වුණාය කියලා පසු ගිය දිනක එතුමාව අත් අඩංගුවට ගත්තා. එතුමාට විරුද්ධව අධිකරණයෙන් වාරණ නියෝගයක් තිබුණේත් නැහැ, විරෝධතා ව්‍යාපාරයට සහභාගි වන්න එපා කියලා. ප්‍රසන්න මන්ත්‍රීතුමා දැන් මාසයකට වැඩි කාලයක් තිස්සේ හිරගෙදර තබා ගෙන ඉන්නවා. ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකුව අත් අඩංගුවට ගන්නවා නම්, ඊට පෙර ඔබතුමාට දන්වන්න ඕනෑය කියලා සාමාන්‍ය සම්ප්‍රදායක් තිබෙනවා. දැන් ඒ සම්ප්‍රදායන් සලකන්නේත් නැහැ. ඒවා නොසලකන්නේ ඇයි කියලා ඔබතුමා පොලිස්පතිතුමාගෙන් අහන්නේත් නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල තිබෙන දුබලතා විශාලයි කියලායි අපි මේ කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, තව මොහොතකින් මගේ කථාව අවසන් කරනවා.

අධිකරණ ක්‍රියාදාමයන් ඇතුළේ; ඒ ක්‍රමවේදයන් ඇතුළේ තිබෙන දුබලතා විශාලයි. ඒවා කාටවත් කරන පෞද්ගලික චෝදනා නොවෙයි. ඒවා පිළිබඳව සොයා බලා සියුම්ව අධ්‍යයනය කර වෙනස් කරන්න ඕනෑ. එහෙම නැතිව මේ රට බෙදීම; බලතල බෙදීම; ෆෙඩරල් කිරීම; සමගාමී ලැයිස්තුව ඉවත් කිරීම; ඒකීයභාවයට වැඩක් දීම නොවෙයි මේ රටේ මිනිස්සු ඉල්ලන්නේ. සිංහල වුණත්, දෙමළ වුණත්, මුස්ලිම් වුණත් මිනිස්සු ඉල්ලන්නේ මොනවාද? කන්න නැතිව, ණය ගෙවා ගන්න බැරිව කිලිනොච්චියේ අම්මා දරුවන්ටත් වස කවා අම්මාත් වස කාලා මැරෙනවා. තාත්තාත් ණය ගෙවා ගන්න බැරිව ඊට කලින් මැරෙනවා. ඒවාට උත්තර දෙන්නේ නැතිව මොනවාදෝ මේ බලය බෙදීමක් අල්ලා ගෙන කථා කරනවා. මේ ආණ්ඩුව බලය බෙදන්න තියා පෙට්‍රල් ටිකවත් බෙදා ගන්න බැරි ආණ්ඩුවක්, ගරු කථානායකතුමනි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කොටියා බෝම්බ ගහද්දිත් අපි මේ රටේ අඛණ්ඩව තෙල් සැපයුම කළා. යුද්ධ කරද්දිත් අපි අඛණ්ඩව තෙල් සැපයුම කළා. දැන් එක තෙල් නැවක් හැරිලා ගියාම මේ රටේ තෙල් නැහැ. එපමණ අකාර්යක්ෂම, අබල දුබල ආණ්ඩුවක්. සුද්දෝ දීපු කොන්ත්‍රාත් ටික දඩ බඩ ගාලා කරන්න හදනවා. ඒ හැරෙන්න රටේ මහ ජනයාට බලපාන කිසිදු දැවෙන ප්‍රශ්නයකට විසඳුමක් තමුන්නාන්සේලා දෙන්නේ නැහැයි කියන එකයි අපි අවධාරණය කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මී ළඟට, ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. LUCKY JAYAWARDANA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 2.55]

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයට සහ විශේෂයෙන්ම අපරාධ නඩු විධානවලට අදාළ කාරණා කිහිපයක් පිළිබඳව ඉතාමත්ම වැදගත් පනත් කෙටුම්පත් කීපයක් අද විවාදයට ගන්නවා. එනම්, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත. මෙම පනත් කෙටුම්පත් දෙක පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටුවනවා.

අධිකරණ ක්ෂේත්‍රය ගත්තාම ඇත්ත වශයෙන්ම අපරාධ නඩුවල පමණක් නොවෙයි, සිවිල් නඩුවල පවා පවතින දීර්ඝ

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

කාලීන ප්‍රමාදය අලුත් දෙයක් නොවෙයි. අය වැය විවාදයේ දී අධිකරණ අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු සාකච්ඡා කරන ආකාරය අපි හැම අවුරුද්දකම වාගේ දකිනවා. මා නීතිඥ වෘත්තියට ඇතුළු වුණු දවසේ සිට නීතිඥ සංගමය විසින් ඒ පිළිබඳව සාකච්ඡා කරන ආකාරය මා දැක්කා. මේ සම්බන්ධයෙන් නිකුත් කළ වාර්තා ගණනාවක් තිබෙනවා. වනසුන්දර විනිශ්චයකාරතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවෙන් මේ සම්බන්ධයෙන් ඉතාමත්ම හොඳ වාර්තාවක් එක්දහස්නවසිය අනූ ගණන්වලදී ඉදිරිපත් වුණා. ඊට අමතරව මේ සම්බන්ධයෙන් නොයෙකුත් සාකච්ඡාත් පවත්වා තිබෙනවා. නමුත්, ඒවායෙන් එතරම් ප්‍රගතියක් ලැබී නැති බව අපි දකිනවා. මෑතකදී මේ සම්බන්ධයෙන් යම් යම් ප්‍රායෝගික පියවර ගන්න පුළුවන් වීම පිළිබඳව අපි සතුටුවනවා. අඩුම ගණනේ ඒ පිළිබඳව ප්‍රායෝගිකව මුල් පියවර ගන්නට අවස්ථාව ලැබීම පිළිබඳව.

නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට මා කටයුතු කළා. එම කාරක සභාවෙන් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එය අපරාධ යුක්තිය පසිඳලීම කඩිනමින් හා කාර්යක්ෂමව සිදු කිරීමට අදාළව නිර්දේශ පිළිබඳ වාර්තාවක්. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාගේ ඉතාමත්ම විශිෂ්ට සභාපතිත්වයෙන්; නායකත්වයෙන් යුතුව අපි ඒ කටයුත්ත කළා. නීතිපති දෙපාර්තමේන්තුවෙන්, අධිකරණ අමාත්‍යාංශයෙන්, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඒ සඳහා අපට විශාල සහායක් ලැබුණා. එවැනි ආයතනවලින් නිලධාරින් ඇවිල්ලා අපව දැනුවත් කළා. නීතිඥ සංගමයේ නියෝජිතයන් ඇවිල්ලා අපව දැනුවත් කළා. ඒ අනුව අද ඉතාමත්ම ප්‍රායෝගික යෝජනා ඉදිරිපත් කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක නොවුණු යෝජනා වාගේ නොවෙයි, ඉතාමත්ම ප්‍රායෝගික යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපරාධ යුක්තිය පිළිබඳව එම වාර්තාවේ විශේෂයෙන්ම සඳහන් වනවා. වින්දිතයාටත්, විත්තිකරුවන්ටත්, පුරවැසියන්ටත් යුක්තිය ඉටුවන කාර්යක්ෂම අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියක කාලීන අවශ්‍යතාව පිළිබඳව ඒ තුළින් අවධාරණය කරලා තිබෙනවා.

සාමාන්‍යයෙන් අපරාධ නඩු සැලකෙන්නේ, සමාජයට විරුද්ධව කරන වැරදිවලට අදාළ නඩු ලෙසයි. එම නිසා තමයි නීතිපතිවරයා එහි පැමිණිලිකරු වන්නේ. නියම පැමිණිලිකරු වන්නේ, ක්‍රියාත්මක වශයෙන් ඇත්තටම පැමිණිලිකරු වන්නේ නීතිපතිවරයායි. එහිදී එහි සම්පූර්ණ වගකීම නීතිපති දෙපාර්තමේන්තුව ගනිමින්, සමාජයට විරුද්ධව කරන ලද අපරාධ පිළිබඳව නීතිපතිවරයා මුළු සමාජයම නියෝජනය කරමින් නඩු පවරනවා. නමුත් අවාසනාවකට අපි දකිනවා ඉතාම දීර්ඝ කාලීන ප්‍රමාදයන්. ඒ බව මේ වාර්තාවේත් සඳහන්ව තිබෙනවා. අපි ඒ ගැන කනගාටු වන්න ඕනෑ. අපරාධයක් සිදුවී අධිචෝදනා පත්‍රයක් මහාධිකරණයට යන්න අවුරුදු 4යි මාස 7ක් යනවා නම්, මහාධිකරණයට අධිචෝදනා පත්‍රය - indictment එක - ඉදිරිපත් කළාම එහි කටයුතු පටන් ගන්න තවත් අවුරුදු 3 මාස 7ක් යනවා නම්, නඩුව අවසන් වන විට තවත් අවුරුදු 1කුත් මාස 8ක් යනවා නම් - ඒ සියල්ලට අවුරුදු 10යි මාස 2ක් කල් යනවා නම් -, අභියාචනයේදී තවත් අවුරුදු 7ක් ප්‍රමාද වනවා නම් එය සුළු ප්‍රමාදයක් නොවෙයි, අතිවිශාල ප්‍රමාදයක්. අපි ඔක්කෝම වග කියන්න ඕනෑ, ඒ ප්‍රමාද වීමේ වරදට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට අවුරුදු 40කට ඉස්සර වෙලා මා නීතිඥ වෘත්තියට එද්දී තිබුණේ යුක්තිය පසිඳලීමේ පනතයි. ඒ කාලයේ සියලු අපරාධ නඩු මහාධිකරණයේදී ඇහුවේ ජූරි සභාවක් ඉදිරිපිටයි. මම කියන්නේ නැහැ, ඒ තැනට ආපසු යන්න ඕනෑ කියා. නමුත් එහි වාසියක් තිබුණා. මොකද, නඩුව සූදානම් නම් විතරයි නඩුව පටන් ගන්නේ. දිනෙන් දින කල් යෑමක් නැහැ. ජූරි සභාවක් රැස් වුණාම ඒ ජූරි සභාව විසුරුවා හරිනතුරු ඒ නඩුව කෙසේ හෝ අහන්න ඕනෑ. අපරාධ නඩු සම්බන්ධයෙන් මේ රටේ හිටපු හොඳම විනිශ්චයකාරවරයකු වන, අද අප අතර නැති, හිටපු මහාධිකරණ විනිසුරුතුමකු වූ ඕ.එස්.එම්. සෙනෙවිරත්න මහතාගෙන් ඉගෙනගන්න මට අවස්ථාව ලැබුණා. මා බොහෝ දේවල් එතුමාගෙන් ඉගෙන ගත්තා. එතුමා විශ්‍රාම ගත්තේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙක් වශයෙන් සිටියදී. එතුමාගේ කාලයේදී අපි හුඟක් දේවල් ඉගෙන ගත්තා. එතුමා අපට - කනිෂ්ඨ නීතිඥවරුන්ට - බැණ බැණ ඉගැන්නුවා මට මතකයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාත් මමත් එකම නීතිඥ සංගමයේ සාමාජිකයන්. අපි ඕ.එස්.එම්. සෙනෙවිරත්න මහතාගෙන් හුඟක් දේවල් ඉගෙන ගත්තා. ඒ කාලයේ හැම නඩුවක්ම දිනෙන් දිනටයි ඇහුවේ. ඉන් පසු ජූරි සභාව නැතිව නඩු අහන ක්‍රමය - non-jury cases - පටන් ගත්තා. එහි වරදක් නැහැ. මුල් කාලයේදී non-jury cases පවා ඇහුවේ දිනෙන් දිනයි. නමුත් කල් යත්ම ඒ පුරුද්ද නැති වුණා. විශේෂයෙන්ම නීතිඥවරුත් ඒකට වග කියන්න ඕනෑ කියා මම හිතනවා. මොකද, non-jury cases පවා දිනෙන් දින අහන්නේ නැතිව - දිනපතා අහන්නේ නැතිව - එක දවසක් අහලා තවත් දවසකට කල් දමන එකට නීතිඥවරු කැමැති වෙන්න පටන් ගත්තා. මා හිතන්නේ, දැන් එය දුර ගියා වැඩියි කියායි. සාමාන්‍ය රීතිය විය යුතුව තිබුණේ ඒවා දිනෙන් දින ඇසීමයි; ඉතාම විශේෂ අවස්ථාවලදී හැරෙන්නට නඩු කල් නොයැවීමයි. නමුත් අද රීතිය බවට පත් වෙලා තිබෙන්නේ, නඩු දිනෙන් දින අහන්නේ නැතිව මාස දෙකකට තුනකට කල් දැමීමයි. මහාධිකරණය පවා එහෙමයි. එම නිසා මම හිතනවා, නීතිය ආපසු වෙනස් කිරීම අද අත්‍යවශ්‍යයි කියා. නඩු ඇසිය යුතු රීතිය වන්න ඕනෑ නඩු දිනෙන් දින ඇසීමයි. පැහැදිලිව විධාන කරන්න ඕනෑ ඒ සඳහායි. That must be the rule and not the exception. Postponements must only be exceptional. අවශ්‍ය නම් නීතිය තවත් ශක්තිමත් කරලා, විශේෂයෙන්ම අග්‍රවිනිශ්චයකාරතුමාගේ සභාපතිත්වයෙන් යුත් අධිකරණ සේවා කොමිෂන් සභාවේද උපදෙස් විනිශ්චයකාරවරුන්ට දීලා එය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න කනගාටුයි, සමහර නීතිඥවරු හිතනවා - බොහොම ටික දෙනකු හෝ හිතනවා - නඩු කල් යන කොට තමාට වාසියි කියා. එහෙම වෙන්නේ නැහැ. ඇත්ත වශයෙන් නඩු ඉක්මනට අවසන් වන්න අවසන් වන්න තමයි නඩු වැඩියෙන් උසාවිවලට එන්නේ. එවිට නීතිඥවරුන්ට වඩාත් හොඳයි. එම නිසා නඩු ඉක්මනින් අවසන් කරන තරමට තවත් වැඩියෙන් නඩු එන බව, එවිට වෘත්තීමය වශයෙන් ඔවුන්ද වඩා ශක්තිමත් වන බව නීතිඥවරුන්ද තේරුම්ගත යුතුයි කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ වශයෙන් කතා කරන්න යන්නේ නැහැ. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා දීර්ඝ විස්තරයක් කළා. මා ගරු අධිකරණ අමාත්‍යතුමියගේ අවධානයට යොමු කරනවා, මහාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 110 දක්වා වැඩි කරන එකට මා සම්පූර්ණ සහයෝගය දෙනවා කියන කාරණය. ඒක ඉතාම හොඳයි.

අධිකරණ විනිශ්චයකාරවරුන් වැඩි කරනවා වාගේම විනිශ්චයකාරවරුන්ගේ quality එක ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ද ගත යුතුයි. ඒ පිළිබඳව විශේෂයෙන්ම, ශ්‍රී ලංකා විනිශ්චයකරුවන්ගේ ආයතනය - Sri Lanka Judges' Institute - සමඟත් සාකච්ඡා කරමින් ඔවුන්ගේ quality එක ඒ විධියටම තියා

ගන්නට උත්සාහ කළ යුතුයි. ඒ වාගේම, අලුතින් මහාධිකරණ ගණනාවක් පිහිටුවා තිබෙනවා; තවත් පිහිටුවන්න යෝජනා කර තිබෙනවා. මම හිතනවා, අධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කිරීමෙන් එයට ද පිළිවිසලක් වනවා ඇති කියලා.

නීතිපති දෙපාර්තමේන්තුව ගැනත් මම කියන්න ඕනෑ. නීතිපති දෙපාර්තමේන්තුවේ පැරණි නිලධාරින් අපට කියපු පරිදි 1950 ගණන්වල, 60 ගණන්වල රුපියල් 1,000කට වඩා ටිකක් අඩුවෙන් තමයි රජයේ නීතිඥවරයෙකුගේ - State Counsel කෙනෙකුගේ - මාසික වැටුප තිබුණේ. එදා මාසික වැටුප රුපියල් 1,000ට ටිකක් අඩුයි කියන්නේ රජයේ සේවයේ ඉතාමත්ම ඉහළ වැටුපක්. නමුත්, අද ඒ තත්ත්වය නැහැ. එදා එම නිසාම නීතිඥ වෘත්තියට බැඳුණු ඉතාමත්ම දක්ෂ අය private bar එකේ ඉන්නේ නැතිව නීතිපති දෙපාර්තමේන්තුවට බැඳුණා. අද එවැනි තත්ත්වයක් අපට දකින්න නැහැ, ගරු ඇමතිතුමියනි. අද ඒ තත්ත්වය නැහැ. එම නිසා මම හිතනවා, නීතිපති දෙපාර්තමේන්තුවේ වැටුප් වැඩි කිරීම ඉතාමත්ම වැදගත් කියලා. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉතාමත්ම අමාරු තත්ත්වයන් යටතේ තමයි කටයුතු කරන්නේ. සමහර මහාධිකරණවලට ගියාම රජයේ නීතිඥවරයා පේන්න නැහැ. එච්චරටම files උඩට ගොඩ ගහලා. ඉතාමත්ම අමාරු තත්ත්වයන් යටතේ තමයි ඔවුන් කටයුතු කරන්නේ. සමහර වෙලාවට ඔවුන් files 30ක්, 40ක් දවසකට සූදානම් කරන්න ඕනෑ. එම නිසා ඔවුන්ගේ සේවා කොන්දේසි වඩා ආකර්ෂණීය කළ යුතුයි. ඒ වාගේම, අපි වෘත්තියට බැඳුණු මුල් කාලයේ මහාධිකරණ විනිශ්චයකරුවන් සමහර නීතිඥවරුන් recommend කරනවා. මහාධිකරණ විනිශ්චයකරුවන් නීතිඥවරුන් හොඳට හඳුනා ගෙන, "මෙන්න මේ නීතිඥයා හොඳයි. මේ මනුස්සයා අධිකරණ ක්ෂේත්‍රයට ගියොත් හොඳයි. මේ නීතිඥවරයා නීතිපති දෙපාර්තමේන්තුවට ගියොත් හොඳයි." කියලා නිර්දේශ කරනවා. එවැනි පුරුද්දක් ආපසු ඇති කරගත යුතුයි. ඒ වාගේම, cadre එක වැඩි කළ යුතුයි. ඒ පිළිබඳවත් අධිකරණ අමාත්‍යතුමියගේ අවධානය යොමු කරයි කියලා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමියනි, මහේස්ත්‍රාත් අධිකරණ පිළිබඳවත් එක කාරණයක් කිව යුතුව තිබෙනවා. රුවන්වැල්ලේ නීතිඥ සංගමයෙන් මට කරුණක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පිළිබඳව ඊයේ හෝ අද ඔබතුමියටත් ලිපියක් එවා තිබෙන බව දන්වා තිබෙනවා. දැරනියගල සහ දෙහිඕවිට ප්‍රදේශයේ පොලිස් කොට්ඨාසවල නඩු තවමත් යන්නේ සබරගමුව පළාතෙන් පිට තිබෙන අවිස්සාවේල්ල උසාවියටයි. ඒක නීති විරෝධියි. මොකද, පළාත්බදව තමයි අද මහාධිකරණ පිහිටුවා තිබෙන්නේ. ඒ යටතේ තමයි දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ පිහිටුවා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එක මිනිත්තුවක් දෙන්න.

එය නිවැරැදි කරලා හැකිතාක් ඉක්මනින් දැරනියගල සහ දෙහිඕවිට පොලිස් ස්ථානවල නඩු නැවතත් රුවන්වැල්ල උසාවියේ ගොනු කිරීමට පොලීසියට උපදෙස් දෙන ලෙසත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටිනවා. දැනටමත් සිවිල් නඩු රුවන්වැල්ල උසාවියට එනවා. නමුත්, මොකක්දෝ හේතුවක් නිසා,- 2010දී ගැසට් පත්‍රයක තිබුණු කුඩා දෝෂයක් තමයි මෙයට හේතුව. ඒ ප්‍රශ්නය විසඳලා පැහැදිලි උපදෙස් පොලීසියට ලබා දී දැරනියගල සහ දෙහිඕවිට පොලිස් ස්ථානවල අපරාධ නඩු නැවතත් රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන්නට කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

[பි.ப. 3.06]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்பட்ட விடயங்களில் நான் முதலாவதாக நீதித்துறை (திருத்தம்) சட்டமூலம் தொடர்பாகக் குறிப்பிட விரும்புகின்றேன். நீதித்துறைச் சட்டத்தின் நான்காம் பிரிவினைத் திருத்துவதன்மூலம் மேல்நீதிமன்றங்களின் நீதிபதிகளை 85க்கு மேற்படாமல் அதிகரிப்பதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன. தற்பொழுது மேல் நீதிமன்றங்களில் பல நூற்றுக்கணக்கான வழக்குகள் நிலுவையில் உள்ளன. இவ்வழக்குகளை முடிந்தளவு விரைவாக விசாரித்து. அவ்வழக்குகளில் சம்பந்தப்பட்டவர்களுக்கு நீதி கிடைக்கச் செய்ய வேண்டும். "நீதி கிடைப்பது தாமதிக்கப்படும்போது அங்கு நீதி மறுக்கப்படுகின்றது" - "Justice delayed is justice denied" என்று ஒரு சட்டக் கூற்று உண்டு. மக்கள் நீதிமன்றங்களுக்கு வழக்குத் தொடர்வதற்கு அல்லது குற்றஞ்சாட்டப்பட்டு வரும்பொழுது, "நீதிமன்றங்கள் நீதியின் கோயில்கள்" என்ற எண்ணத்துடனேயே வருகின்றார்கள். இன்று நீதிமன்றங்களில் போதிய வளங்கள், ஆளணி வசதிகள் இல்லாத காரணத்தால், வழக்கு விசாரணைகளில் தாமதம் ஏற்படுகின்றது. இத்தாமதத்திற்கான இன்னுமொரு காரணம், போதியளவில் நீதிபதிகள் நியமிக்கப்படாமையாகும். எனவே, இத்திருத்தச் சட்டத்தின்மூலம் மேல்நீதிமன்ற நீதிபதிகளின் எண்ணிக்கையை அதிகரிப்பதற்கு ஆவனசெய்வது, வழக்குகளை விரைவாக விசாரிப்பதற்கு ஒரு தீர்வாக அமையும்.

இதனுடன் இணைந்ததாக நான் இங்கு ஏற்கெனவே வலியுறுத்தியுள்ள சில கோரிக்கைகளையும் முன்வைக்க விரும்புகின்றேன். உச்ச நீதிமன்றங்கள், மேல் நீதிமன்றங்கள் மற்றும் மேன்முறையீட்டு நீதிமன்றங்களில் போதியளவு தமிழ்மொழி மூலமான நீதிபதிகளை நியமிப்பதற்கும் வடக்கு, கிழக்கு மாகாணங்களில் செயற்படுகின்ற நீதிமன்றங்களில் மேலதிகமாக நீதிபதிகளை நியமிப்பதற்கும் நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். தமிழ்மொழி மூலமான மொழிப் பயன்பாட்டைக் கொண்டவர்களது பல வழக்குகள் தேங்கிக் கிடப்பதற்குத் தீர்வாக இந்த நடைமுறை அமையும் என்பது எனது எதிர்பார்ப்பாகும். அன்றி, இக்கோரிக்கை தொடர்பில் எவரும் இனவாத நோக்கம் கொண்ட அவதானத்தைச் செலுத்தக்கூடாது எனக் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், அனைத்து நீதிமன்றங்களுக்கும் போதியளவு மொழிபெயர்ப்பாளர்களை நியமிப்பது குறித்தும் விரைவான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென்ற கோரிக்கையையும் இங்கு முன்வைக்க விரும்புகின்றேன். மேலும், சட்ட மாஅதிபர் திணைக்களத்தில் பல்வேறு வழக்குகள் பாரியளவில் குவிந்திருப்பதற்கான பிரதான காரணங்களில் சட்டத்தரணிகளின் பற்றாக்குறையும் ஒன்று எனக் கூறப்படுகின்றது. எனவே, இவ்விடயம் தொடர்பிலும் முக்கிய கவனம் செலுத்தப்பட்டு, போதியளவு சட்டத்தரணிகளை உள்வாங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

வடக்கு, கிழக்கில் தங்களது அரசியல் உரிமைகளை வென்றெடுக்கப் போராடிய தமிழ் பேசும் இளைஞர்கள் பலர், பயங்கரவாதத் தடைச்சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு, பிணை வழங்கப்படாமலும் குற்றப்பத்திரிகை பகிரப்படாமலும் வருடக்கணக்கில் சிறைக்கைதிகளாக உள்ளனர். விசாரணைகள் இன்னமும் முடிவுறவில்லை என்ற காரணத்தால், இன்னுமொரு தொகையினர் சிறையில் வாடுகின்றனர். அவர்கள் சிறைகளில் அடைக்கப்பட்டுப் பிணை வழங்கப்படாமல் வழக்குகள் தாமதமாக விசாரணைக்கு எடுக்கப்படும்போது பல வருடங்கள் கடந்துபோகின்றன. இறுதித் தீர்ப்பு வரும்பொழுது பல வழக்குகளில் அவர்கள் குற்றமற்றவர்கள் என்றும் விடுதலை செய்யப்படுவதையும் காண்கிறோம். அவ்வாறானவர்கள் தமது இளமையை, வாலிபத்தை இழந்தவர்களாக, வயோதிபர்களாகவும் நோயாளிகளாகவும் வெளியே வருகின்றார்கள். மனிதாபிமான அடிப்படையில் பார்க்கும்பொழுது இது ஒரு பாவச் செயலாகும். அவர்களை வெளியே எடுப்பதற்குச் சம்பந்தப்பட்டவர்களின் குடும்பத்தவர்கள் பல இலட்சக்கணக்கான ரூபாயைச் செலவிடுகின்றனர். குடும்பத்தவர்கள் நீதிமன்றங்களுக்கு ஏறி இறங்கியே காலத்தைக் கழித்து கடைசியில் அவர்களும் இறந்துவிடுகிறார்கள். கடந்த 30 ஆண்டு காலத்தில் தமிழர்களில் பெரும்பாலானவர்கள் நீதி கிடைக்காமலும் உரிமையும் சமத்துவமும் கிடைக்காமலும் மண்ணுடனும் கடலுடனும் சங்கமமாகிவிட்டார்கள். இந்த நாட்டின் அரசுகள் இதற்குப் பொறுப்புக் கூறவேண்டும்.

அண்மையில் தமிழ் இளைஞர் ஒருவர் 18 ஆண்டுகள் அநியாயமாகச் சிறையிலடைக்கப்பட்டு, 18 ஆண்டுகளின் பின் நிரபராதி என்று விடுவிக்கப்பட்டுள்ளார். இவரின் இளமையையும் இழந்த வாழ்வையும் யாரும் மீளக்கொடுக்க முடியாது. இதேபோல், அநுராதபுர சிறைச்சாலையில் அடைக்கப்பட்டவர்களும் தமக்காக நீதி கேட்டு உண்ணாவிரதமிருக்க வேண்டிய நிலைமையே ஏற்பட்டுள்ளது. சட்ட மாஅதிபருக்கு வவுனியாவுக்கு வழக்கை மாற்றுகின்ற அதிகாரமிருந்தும், அவர் அதைப் பயன்படுத்தத் தயங்குகின்றார். இதற்குப் பின்னால் இருக்கும் தடை என்ன? தெற்கைச் சாந்தப்படுத்த வடக்கிலுள்ளவர்களைச் சிறையில் அடைக்கின்றார்கள். குற்றமிழைத்திருந்தால் சட்டத்தின் காவலர்களும் சட்டத்தைச் செயற்படுத்துபவர்களும் விரைவாக நடவடிக்கை எடுக்கவேண்டும். காலந்தாழ்த்திச் செய்யப்படும் விடுதலையினால் எந்தவிதமான நன்மையும் சம்பந்தப்பட்டவர்களுக்குக் கிட்டாது. மக்களை உணர்ச்சிவசப்படுத்தாமலும் உசுப்பேத்தாமலும் மென்மேலும் காலந்தாழ்த்தாமலும் அரசு விரைவாக நடவடிக்கை எடுத்துக் கைதிகளை விடுதலை செய்யவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன். இளைஞர்களின் அமைதியின்மை, நாட்டுக்கு நல்லதல்ல. இதை அனுபவத்தில் நாம் அனைவரும் அறிவோம்.

மேலும், அனுராதபுரத்தில் மூன்று தமிழ் அரசியல் கைதிகளின் 41 நாட்களான உண்ணாவிரதப் போராட்டமானது, உரிய நோக்கினை எட்டாத நிலையில் முடிவுக்கு வந்திருக்கிறது. "தம்மீதான வழக்குகளை வேறு நீதிமன்றங்களுக்கு மாற்றக்கூடாது" என்ற மேற்படி கைதிகளின் கோரிக்கையானது நியாயமானதே! அவர்களது போராட்டத்திற்குத் தமிழ் மக்கள் தரப்பிலிருந்தும் பரவலாகப் பொது அமைப்புகள் தரப்பிலிருந்தும் பல்கலைக்கழக மட்டத்தில் தங்களது கற்கைகளை இடைநிறுத்திக்கொண்ட மாணவர்கள் தரப்பிலிருந்தும் ஆதரவு கிடைத்திருந்தது. எனினும், இந்தப் போராட்டத்தினை வழிநடத்தியிருக்க வேண்டியவர்கள், தமிழ் மக்களது அரசியல் பிரதிநிதிகள் தாமே என்போராவர். அவர்கள் இந்த விடயத்தைத் தமது சுயலாப அரசியலுக்காக மாத்திரம் பயன்படுத்திக்கொள்ள முயற்சித்துச் செயற்பட்டதன் காரணமாகவும் மேற்படி பிரச்சினையைத் தீர்ப்பதற்கு அல்லது இக்கைதிகளின் விடுதலைக்காக நேர்மையான முறையில் செயற்படாததன் காரணமாகவுமே 41 நாட்கள் தொடர்ந்திருந்த போராட்டம், அதற்கான நோக்கம் நிறைவேறாத நிலையிலே கைவிடப்பட நேரிட்டுள்ளது. எம்மைப் பொறுத்தவரையில், தமிழ் அரசியல் கைதிகள் அனைவரும் பொது மன்னிப்பின் அடிப்படையில் விடுவிக்கப்பட வேண்டும் என்பது எமது வேண்டுகோளாகும். இது தொடர்பில் உரிய அனைத்துத் தரப்பினரும் கவனம் செலுத்த முன்வரவேண்டும். அத்துடன், 1983ஆம் வருடம் வெலிக்கடைச் சிறைச்சாலையில் மேற்கொள்ளப்பட்ட படுகொலைகள், அதற்குப் பின்னரான காலகட்டங்களில் பண்டாரவளை, வவுனியா போன்ற இடங்களில் சிறைக் கைதிகள் படுகொலை செய்யப்பட்டமை என்பவை தொடர்பிலும் உரிய விசாரணைகள் மேற்கொள்ளப்பட வேண்டும்.

அடுத்ததாக, குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சியாளருக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டத்தை திருத்துவதற்கான சட்டமூலம் இங்கு சமர்ப்பிக்கப்பட்டிருப்பது காலத்தின் கட்டாயத் தேவையாகும். இலங்கையின் சனத்தொகை தற்பொழுது ஏறத்தாழ 22 மில்லியனை எட்டிப்பிடித்துள்ளது. இவர்களில், கடந்த 30 வருட கால யுத்தத்தின் காரணமாக 1980களிலிருந்து புலம்பெயர்ந்த தமிழ்பேசும் மக்கள் ஏறத்தாழ 1.5 மில்லியன் அல்லது 15 இலட்சம் பேர் உள்ளடங்குவார்கள். இதுதவிர, ஏறத்தாழ 7 இலட்சம் பேர் தொழில் காரணமாக, வெளிநாட்டு வேலைவாய்ப்பு முகவரகத்தின் சட்டங்களுக்கு ஏற்ப வெளிநாடுகளில் தொழில் செய்யும் அனைத்து இனங்களையும் சேர்ந்த இலங்கையர்கள் ஆவார்கள். இவர்களில், இலங்கையின் இனக்கலவரங்களின் போது பாதிக்கப்பட்டோரும் சாட்சியாளர்களும் அடங்கியுள்ளார்கள். இவர்கள் சம்பந்தப்பட்ட வழக்குகள் விசாரிக்கப்படும்போது, அவர்கள் தாம் தொழில்புரியும், வதியும் நாடுகளில் இருந்தவாறு நீதிமன்ற விசாரணைகளில் சாட்சியம் அளிப்பதற்கு அல்லது கூற்றினை வழங்குவதற்கு இத்திருத்தம் வழிசெய்கின்றமை வரவேற்கத்தக்கதாகும்.

இலங்கையின் சனத்தொகையில் பத்து சதவீதமானோர் தற்பொழுது வெளிநாடுகளில் வாழ்கின்றனர். அவர்கள் ஏறத்தாழ 8 மில்லியன் அமெரிக்க டொலர்களை வருடாந்தம் நமது நாட்டுக்கு அனுப்புகின்றார்கள். இத்தொகை நமது ஏற்றுமதிக்கும் இறக்குமதிக்கும் இடையிலான வணிக நிலுவையைச் சமன்செய்வதற்குப் பேரளவில் உதவி புரிகின்றது. இவர்களுக்கு நாம் பாதுகாப்பும் சலுகைகளும் வழங்குவதுடன் மட்டும் நின்றுவிடாது, அவர்கள் வாக்காளர் தகைமை பெற்றிருப்பின், தேசியமட்டத் தேர்தல்களில் வாக்களிப்பதற்கும் அவர்கள் வாழும் நாடுகளிலுள்ள நமது தூதரகங்களில் வசதி செய்து கொடுக்கப்பட வேண்டுமென்று இச்சபையில் மீண்டுமொரு முறை வலியுறுத்திக் கூற விரும்புகிறேன்.

அதேநேரம், வெளிநாடுகளில் வாழ்பவர்களாகட்டும், உள்நாட்டில் வாழ்பவர்களாகட்டும், தாங்கள் சார்ந்த வழக்குகளில் தங்களது சாட்சியங்களை வழங்குகின்றபோது, குற்றங்கள் சுமத்தப்படுகின்ற நபர்களது பாதுகாப்பினை உறுதிப்படுத்துவதற்கும் சமூகத்தில் அவர்களுக்கிருக்கின்ற

நற்பெயரைப் பாதுகாப்பதற்கும் உரிய நடவடிக்கைகள் எடுக்கப்படுதலும் பொய்யான குற்றச்சாட்டுகள் ஒரு நபர்மீது சுமத்தப்படுமானால் அதனைப் பகிரங்கப்படுத்தாது அது தொடர்பில் உரிய விசாரணைகளை மேற்கொண்டு உண்மைகள் வெளிக்கொண்டுவரப்படுதலும் வேண்டும். குற்றம் சுமத்தப்பட்டவர்மீது வீண்பழிகள் சுமத்தப்படாத வகையிலான ஏற்பாடுகளை மேற்கொள்வதும் பொய்க் குற்றச்சாட்டுகளைச் சுமத்துவோருக்கு எதிரான சட்ட நடவடிக்கைகள் எடுக்கப்படக்கூடிய சூழ்நிலை உறுதிப்படுத்தப்படுவதும் அவசியமாகும்.

அடுத்ததாக, குற்றச்செயல்களைத் தடுத்தல் திருத்தச் சட்டமூலம் பற்றிப் பேச விரும்புகிறேன். ஜனநாயகத்திற்கு நான்கு தூண்கள் உண்டென்று சொல்லப்படுகிறது. சட்டத்துறை, நீதித்துறை, நிர்வாகத்துறை, ஊடகத்துறை என்பனவே ஜனநாயகத்தை தாங்கும் அந்த நான்கு தூண்களாகும். ஜனநாயகத்தின் தூண்கள் மக்களுக்கான, மக்களின் உரிமைகளைக் காப்பாற்றும் தூண்களாக, பிரச்சினைகளை முன்னிறுத்தும் நிறுவனங்களாக இருக்க வேண்டும். இந்த நான்கு தூண்களும் மக்களின் நலன்களைக் கருத்திற்கொண்டு வினைத்திறனுடன் செயற்படும்பொழுதே சட்டத்தின் ஆட்சி நிலவும்; நாட்டு மக்கள் அனைவரும் சமாதானமாகவும் இன இணக்கப்பாட்டுடனும் வாழ முடியும்.

ஜனநாயகத்தின் முதன்மைத் தூணான எமது சட்டவாக்கத்துறைக்கு 70 ஆண்டுகள் பூர்த்தியை நாம் அண்மையிலேயே பாராட்டிப் பேசினோம். இருப்பினும் யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந்த பிறகு இன்னமும் இனப் பிரச்சினைக்கான தீர்வு முன்வைக்கப்படவில்லை. நமது நாட்டின் படுகடன்களை அடைப்பது பற்றியும் அபிவிருத்தித் திட்டங்களைச் செயற்படுத்துவது பற்றியும் சிலாகித்துப் பேசுகின்றோம். மிகவும் கஷ்டப்பட்டு ஒருவாறு உள்ளூராட்சித் தேர்தல் சட்டங்களையும் மாகாண சபைத் தேர்தல் சட்டங்களையும் திருத்தினோம். புதிய அரசியலமைப்பை இயற்றுவது, பாராளுமன்றத் தேர்தல்கள் சட்டத்தை திருத்துவது, ஜனாதிபதியின் அதிகாரங்களைக் குறைப்பது, நிலைமாறுகால நீதியை நிலைநாட்டுவது, பொறுப்புக் கூறுவது, இழப்பீடு வழங்குவது போன்ற விடயங்கள் நிறைவேற்றப்படாது நம்முன் இன்னமும் பாக்கியாகவே இருக்கின்றன. இதனிடையே, உயர்ந்து செல்லும் விலைவாசியினாலும் நாட்டில் அதிகரித்துச் செல்லும் குற்றச்செயல்களாலும் இயற்கையின் அனர்த்தங்களாலும் வீதி விபத்துக்களின் அதிகரிப்பு என்பனவற்றினாலும் சாதாரண மக்கள் பாதிக்கப்பட்டுள்ளார்கள். இக்கட்டத்தில், நாம் நீதித்துறையை வினைத்திறனாக்குவதற்கு இந்தக் குற்றச்செயல்களைத் தடுத்தல் திருத்தச் சட்டமூலம் பற்றி விவாதித்துக் கொண்டிருக்கின்றோம்.

ஜனநாயகத்தின் இரண்டாவது தூணான நீதித்துறையிலுள்ள ஓட்டைகள் விரைவாக அடைக்கப்பட வேண்டும். அந்த வகையில், நீதித்துறையின் முக்கிய பதிவுகளான 1979ஆம் ஆண்டின் 15ஆம் இலக்க குற்றவியல் நடைமுறைச் சட்டக்கோவையின் தோதான பிரிவுகள் நீக்கப்பட்டு, குற்றவியல் சட்டக்கோவையின் பிரிவு இலக்கங்களைக் கொண்டு பிரதியீடு செய்வதன்மூலம் திருத்துவதற்கு வழிவகை செய்வது காலத்தின் உடனடித் தேவையாகும். இங்கு முக்கியம் என்னவென்றால் இலங்கைக் குற்றவியல் சட்டம் இலங்கை மக்களுக்கு மட்டுமல்லாமல் இலங்கையில் வசிக்கின்ற சகலருக்கும் ஏற்புடைய சட்டமாகும். எனவே, நீதித்துறையை வினைத்திறமையுடன் செயற்படுத்துவதற்கு ஏற்புடையதாக, 22ஆம் அத்தியாயமான குற்றச் செயல்களைத் தடுத்தல் கட்டளைச் சட்டத்தைத் திருத்துவதன்மூலம், இம்முதன்மைச் சட்டவாக்கத்தின் அட்டவணையைப் பொருத்தமானவாறு மாற்றீடு செய்வது காலந்தாழ்த்தாமல் செய்யப்பட வேண்டிய திருத்தமாகும்.

இதன்மூலம், இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுச் சட்டத்தின் கீழான தவறின் தன்மைகள், கணினிவழிக் குற்றச்சட்டத்தின் கீழான தவறின் தன்மைகள், போதையூட்டும் ஔடதங்களினதும் உளமருட்சி ஏற்படுத்தும் பதார்த்தங்களினதும் சட்ட விரோதமான வியாபாரத்திற்கெதிரான சமவாயங்களின் கீழ்வரும் தவறுகள், சித்திரவதை மற்றும் வேறு கொடூரமான, மனிதாபிமானமற்ற அல்லது கீழ்த்தரமாக நடத்தல் அல்லது தண்டித்தல் என்பனவற்றுக்கெதிரான சமவாயச் சட்டத்தின் கீழ்வரும் தவறுகள், பயங்கரவாதத்திற்கு நிதியளிப்பை ஒடுக்குதல் மீதான சமவாயச்சட்டத்தின் கீழான தவறுகள், சுடுபடைக்கலன்கள் கட்டளைச் சட்டத்தின் கீழான தவறுகள், குடிவருவோர், குடியகல்வோர் சட்டத்தின் கீழான தவறுகள், புலமைச்சொத்துச் சட்டத்தின் கீழான தவறுகள், பகிரங்க ஆதனச் சட்டத்தின் கீழான தவறுகள், தீங்கு விளைவிக்கும் ஆயுதங்கள் சட்டத்தின் கீழான தவறுகள், கொடுப்பனவு உபாயங்களின் மோசடிச் சட்டத்திற்குக் கீழான தவறுகள், தண்டனைச் சட்டக் கோவையின் கீழான தவறுகள், நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான ஔடதங்கள் சட்டத்தின் கீழான தவறுகள், பணம் தூய்தாக்கல் தடைச் சட்டத்தின் கீழான தவறுகள், பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின் கீழான தவறுகள், இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகச் சட்டத்தின் கீழான தவறுகள் என்று 107 வகையான தவறுகளின் அட்டவணைகள் தயாரிக்கப்பட்டு, 1979ஆம் ஆண்டின் 15ஆம் இலக்கக் குற்றவியல் நடவடிக்கை முறைச் சட்டக்கோவையின் தோதான பிரிவுகளின் இலக்கங்கள் மாற்றீடு செய்யப்பட்டிருக்கின்றன. இவ்வாறான திருத்தச் சட்டமானது, அதனை நடைமுறைப்படுத்தும் ஜனநாயகத்தின் மூன்றாவது தூணான நிர்வாகத்துறையினர் மற்றும் வழக்குகளில் சம்பந்தப்பட்டவர்களின் நடவடிக்கைகளை இலகுபடுத்துவதுடன், நீதிமன்றங்களின் வழக்குகளின் தீர்ப்புக்களை விரைவுபடுத்துவதற்கும் உதவும். எனவே, இச்சட்டத் திருத்தத்தைக் காலந்தாழ்த்தாது சபையில் சமர்ப்பித்திருப்பதை நான் வரவேற்கின்றேன்.

இறுதியாக, நான் உள்ளூர் அதிகாரசபைகள் (விசேட ஏற்பாடுகள்) சட்டத்தைப் பற்றிக் கூற விரும்புகிறேன். காலந்தாழ்த்தியேனும் இவ்விசேட சட்ட ஏற்பாடுகளை மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் இச்சபையில் சமர்ப்பித்துள்ளதை வரவேற்கின்றேன். நீண்டகாலமாக, அசாதாரணமான சூழ்நிலைகள் காரணமாக வட மாகாணத்திலுள்ள முல்லைத்தீவு மாவட்டத்தைச் சேர்ந்த புதுக்குடியிருப்பு மற்றும் கரைதுறைப்பற்று என்று மக்களால் அறியப்படும் *'மரிட்டைம்பற்று'* பிரதேச சபைகளுக்கான தேர்தல் தொடர்பான அறிவித்தல்கள், தேர்தல்களைப் பிற்போடுதல், நியமனங்களை அளித்துள்ள ஆட்கள் இறந்தமை, புலம்பெயர்ந்தமை, கட்சி மாறியுள்ளமை, 35 வயதுக்குக் குறைந்த அபேட்சகர்கள் 35 வயதுக்கு மேற்பட்டவர்களாகியுள்ளமை ஆகியவை காரணமாக இச்சட்டத்திருத்தம் அவசியமாகின்றது. இவ்விசேட ஏற்பாட்டுச் சட்டம் புதுக்குடியிருப்பு மற்றும் கரைதுறைப்பற்றுப் பிரதேச சபைகளுக்கான உள்ளூராட்சித் தேர்தல்களை நடத்துவதற்கு வழிசெய்திருப்பது வரவேற்கத்தக்கது. இவ்விசேட ஏற்பாட்டுச் சட்டத்தின் தமிழ் மொழிபெயர்ப்பில் கரைதுறைப்பற்றை *'மரிட்டைம்பற்று'* என்று குறிப்பிடப்பட்டுள்ளது. மரிட்டைம்பற்றைத் தமிழில் கரைதுறைப்பற்று என்றே அப்பிரதேச மக்கள் அழைப்பதால் *மரிட்டைம்பற்று* என்ற

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

ஆங்கிலச் சொற்பதத்திற்குத் தமிழில் கரைதுறைப்பற்று என்று திருத்தம் செய்யுமாறு அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக, ஜனநாயகத்தின் நான்காவது தூணான ஊடகம் பற்றிப் பேசவேண்டும். நான் ஏற்கெனவே கூறிய மூன்று தூண்களைப் பற்றியும் அவற்றில் என்ன நடக்கின்றது என்பதனைப் பற்றிய உண்மைகளையும் அவற்றின் விமர்சனங்களையும் செய்தியாகவும் பகுப்பாய்வாகவும் மக்களிடம் கொண்டுசெல்லும் மகத்தான கடமையை ஊடகம் செய்ய வேண்டும். உண்மைகள் புனிதமானவை, கருத்துச் சுதந்திரமானது என்ற மூலமந்திரத்தைப் பதிகாலாகக்கொண்டு மக்களுக்கு ஊடகத்துறையினர் சேவையாற்ற வேண்டும்; மக்களுக்கு உண்மைகள் கொண்டுசெல்லப்பட வேண்டும். அந்த வகையில், அவர்கள் நாட்டின் நலனையும் மக்களின் நலனையும் முன்னிறுத்தி ஜனநாயகத்தை இந்த நாட்டில் பலப்படுத்துவதற்காகச் செய்கின்ற பங்களிப்பை வரவேற்பதோடு, அவர்களின் சேவைக்காக எனது நன்றியையும் தெரிவித்துக்கொள்கின்றேன்.

அடுத்து, தமிழ் மக்கள் தமக்கான நீதிக்கெனக் காத்திருக்கும் சூழலுக்குள்ளே இன்னமும் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். போர்க்குற்ற விசாரணைகள், மனித உரிமை மீறல்கள், காணாமற்போனவர்கள் தொடர்பான முறைப்பாடுகள் ஆகியவற்றுக்கு நம்பகமான விசாரணைப் பொறிமுறையினூடாகப் பாரபட்சமற்ற விசாரணைகள் நடத்தப்பட்டு, உண்மைகள் கண்டறியப்பட வேண்டும். அத்தகைய விசாரணைகளினூடாகப் பாதிக்கப்பட்டவர்களுக்கு நீதியும் பரிகாரமும் கிடைக்கச்செய்வது நம் ஒவ்வொருவரினதும் கடமையாகும். இவ்விடயங்களில் நீதி கிடைக்க வேண்டுமென்று காத்திருக்கும் மக்களுக்கு உரிய காலத்தில் நீதி கிடைக்க வழி செய்யப்படாமல் காலந்தாழ்த்தப்படுமாக இருந்தால் அது நீதி மறுக்கப்படுவதற்கு ஒப்பானதாகும்.

புதிய ஆட்சி ஏற்படுத்தப்பட்டபோது தன்னைக் கொலை செய்ய முயன்றவர் என்று கூறப்பட்டவருக்கு பொது மன்னிப்பு வழங்கி தனது நல்லெண்ணத்தை ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் வெளிப்படுத்தியிருந்தார். அதேபோல், 1998ஆம் ஆண்டு என்னைக் கொலை செய்யும் நோக்கத்துடன் தாக்கியவர்களுக்கும் தற்கொலைத் தாக்குதல் நடத்தி என்னைக் கொலை செய்வதற்கு முயற்சி செய்தவர்களுக்கு உதவியதாகக் குற்றம் சுமத்தப்பட்டவர்களுக்கும் நீதிமன்றம் தண்டனைகளை வழங்கித் தீர்ப்புகளை வழங்கியிருந்தாலும், அவர்கள் தவறாக வழிநடத்தப்பட்டவர்கள் என்பதால் அவர்களை மன்னித்து பொது மன்னிப்பு வழங்க வேண்டுமென்று நானும் விரும்புகின்றேன்; எனது விருப்பத்தை அடிக்கடி வெளிப்படுத்தியும் வந்திருக்கின்றேன்.

இவ்வாறான சூழலில் இந்த அரசாங்கம், பல ஆண்டுகளாகச் சிறைகளில் அடைக்கப்பட்டு தண்டனைகளை அனுபவித்துக் கொண்டிருக்கும் தமிழ் அரசியல் கைதிகளையும் பொது மன்னிப்பு வழங்கி விடுதலை செய்து தனது நல்லிணக்கச் சமிக்ஞையை தமிழ் மக்களுக்கு வழங்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் வலியுறுத்துவதோடு, எனக்கு இந்த வாய்ப்பை வழங்கியமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

Hon. Member, I just want to clarify something. I want to know whether you will be here in the House till the end of the Session.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

If you want me to, I can stay.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

You mentioned a particular case which was transferred to Anuradhapura. Hon. Member, that was done at the request of the key witnesses. They are also former LTTE cadres and they have made this request for their own safety. So, that was done because of their request.

Also, you mentioned about some detainees. If you want, I can give you all the details. Island-wide, the total number of suspects in remand custody to frame charges as at 31.07.2017 are 18. The number of detainees in remand custody, who are to be served with indictments are 17 as at today, out of which seven are Sinhala suspects and ten are Tamil suspects. Twelve of them are at the New Magazine Prison, four are at Trincomalee, one is in Batticalo and the other is in Monaragala. If you really want to know other details, I can give you the details.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Hon. Minister, as you know, now security-wise, the country is safe.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

Yes.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Therefore, the witnesses can be given security and they can go there and give witness.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

For that, of course, the aggrieved party will have to make an appeal to the High Court, Anuradhapura. Then, they will consider it and transfer the case back to the court in Vavuniya. They all have been one group and now, two of them have become key eye-witnesses. They had made the request and the Attorney-General had consented the transfer of this case to Anuradhapura.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Thank you.

[අ.භා. 3.30]

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ඇමතිනී ගරු තලතා අතුකෝරළ මැතිනිය විසින් දෙවන වර කියැවීම සඳහා අද දින ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත් අපේ රටේ අධිකරණයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ඉතාමත්ම වැදගත් ඒවා බව අපි සඳහන් කරන්න කැමැතියි.

අපේ තිබෙන ප්‍රධාන කියමන් දෙකක් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒවා තමයි "යුක්තියේ පමාව - යුක්තියේ නිමාව" කියන එක සහ "කලබල යුක්තිය, යුක්තිය වළ දැමීමක්" - justice hurried is justice buried - කියන එක. ඒ කාරණය සම්බන්ධයෙන් නම් අපි භය වෙන්න අවශ්‍ය නැහැ. මොකද, එහෙම එකක් අපේ රටේ වෙන්නේ නැති බව හැමෝම කියනවා. සරත් ෆොන්සේකා මහත්මයාට නඩු දමන්න වාගේ දේවලදී හැරුණු කොට "කලබල යුක්තියක්" සාමාන්‍යයෙන් සිදුවෙලා නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ සිද්ධ වෙමින් තිබෙන්නේ නඩු කටයුතුවල ප්‍රමාදයයි. [බාධා කිරීමක්] ඒවාටත් වෙලාවට වැඩේ සිද්ධ වෙයි. කොහොම වුණත් රටේ යුක්තියේ පමාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් අපරාධ නඩුවක් අවසන් වන්න අවුරුදු 17ක විතර කාලයක් ගතවෙනවා. ඒ නඩු සම්බන්ධයෙන් ගතවන කාල සීමා ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉදිරිපත් කළා. එතුමා මතක් කළා, මේ වන විට අපරාධ නඩු 17,000ක් පමණ අධිකරණවල ගොඩ ගැහිලා තිබෙන බව. අපි හිතමු, ඒවායේ වින්දිතයන්ට යුක්තිය ඉෂ්ට කර ගන්න අවුරුදු 17ක් බලාගෙන ඉන්න සිද්ධ වුණාය කියලා. ඒ පමා වී ලැබෙන යුක්තියෙන් ඇති තේරුම මොකක්ද? එහි කිසිම තේරුමක් නැහැ. යුක්තිය ඉටු නොවුණා හා සමානයි. එම නිසා අපේ රටේ ප්‍රමුඛ අවශ්‍යතාවක් තමයි, යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය වේගවත් කිරීම සඳහා පියවර ගැනීම. අධිකරණ නිලධාරීන්ගේ, විශේෂයෙන් මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම කියන කාරණය ඒ සඳහා ගන්නා එක පියවරක් පමණයි. මේවා සම්බන්ධයෙන් රටේ විවේචනයක් ඇතිවෙලා තිබෙනවා. අධිකරණයෙන් නිසි කලට, නිසි වෙලාවට යුක්තිය ඉෂ්ට සිද්ධ නොවීම සම්බන්ධයෙන්, රටේ අධිකරණ පද්ධතිය පිළිබඳව ලොකු විවේචනයක් ඇතිවෙලා තිබෙනවා. නමුත් අවාසනාවකට තිබෙන කරුණ වන්නේ සමාජයෙන් මේ වාගේ විවේචන එල්ල වෙන කොට අපේ අධිකරණ ක්ෂේත්‍රයේ සමහර අය ඒවා පෞද්ගලිකව භාර ගන්න එකයි. පෞද්ගලිකව භාර අරගෙන ඒගොල්ලෝ කල්පනා කරනවා, මේක මට එල්ල කළ විවේචනයක් කියලා. අපේ රන්ජන් රාමනායක රාජ්‍ය අමාත්‍යතුමාටත් සිද්ධ වුණේ ඒ වාගේ දෙයක්. එතුමා ඉදිරිපත් කළේ මේ රටේ අධිකරණ පද්ධතියේ කඩා වැටීම පිළිබඳව තිබෙන පොදු විවේචනයයි. "රාවය" පත්‍රයේ කර්තෘ වික්ටර් අයිවන් මහත්මයා මීට කලින් පොතක්ම ලියලා පෙන්නුවා, අධිකරණයේ තිබෙන කඩා වැටීම මේකයි කියලා. ඒක රටේ තිබෙන මතයක්; රටේ තිබෙන ඇත්ත මතයක්.

අපේ රන්ජන් රාමනායක රාජ්‍ය ඇමතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට ඒ කාරණය ඉදිරිපත් කළාට පස්සේ, එතුමාට විරුද්ධව නඩු දමන්න කථා කරනවා. ඒක මහා විහිළුවක්. පෙණිවිඩකරුවාට වෙඩි තැබීමෙන් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. එහෙම විසඳෙනවා නම් එතුමාව හිරේ දමලා, අධිකරණයේ කටයුතු වේගවත් කරලා, අධිකරණය ශුද්ධ පවිත්‍ර කරන්න ඕනෑ. නමුත් ඒක වෙන්නේ නැහැ. අද අධිකරණය සම්බන්ධයෙන් මතුවෙලා තිබෙන පොදු විවේචනය අවුරුදු ගණනාවක් තිස්සේ තිබෙන විවේචනයක්. ඒ සම්බන්ධයෙන් සමාජය අවදි වෙන්න ඕනෑ. අපිත් චෝදනා කරන්නේ නැතිව කරන්න පුළුවන් දේවල් ටික කරන්න ඕනෑ.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක වුණු නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ඉතාම වැදගත් යෝජනා රාශියක් -යෝජනාවලියක්- ඉදිරිපත් වෙලා තිබෙනවා. දැන් අපට පෙනෙනවා, ඒවා මත පදනම්වෙලා එකින් එක, එකින් එක ඒ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන බව. සමහර දේවල් මේ වාගේ නෛතික සංශෝධන වෙන්න පුළුවන්. තවත් සමහර දේවල් අර කිව්වා වාගේම අදාළ පහසුකම් සැපයීම යනාදී කරුණු සම්බන්ධයෙන් වෙන සංශෝධන වෙන්න පුළුවන්.

අපි ඒවායින් යුක්තියේ පමාව නිමා කිරීම සඳහා වැඩ කටයුතු කරන්න ඕනෑ. එම නිසා මම හිතන්නේ මේ ඉදිරිපත් කර තිබෙන (සංශෝධන) පනත් කෙටුම්පත් තුනම ඉතාම වැදගත් කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද යුක්තියේ විශාල පමාවක් තිබෙන නිසා අපරාධ කිරීමට, දූෂණ කිරීමට තිබෙන ලජ්ජාව සහ භය සමාජයෙන් පහ වෙලා ගිහිල්ලා තිබෙනවා. මොකද, ඒ අපරාධකරුවන් කල්පනා කරනවා අපේ අපරාධයට දඬුවමක් හම්බ වෙන්නේ නැහැ, හම්බවුණත් ඒ දඬුවම බොහොම පමා වී හම්බවෙන දඬුවමක්, ඒ කාලය ඇතුළත අපට ඕනෑ දෙයක් කර ගන්න පුළුවන් කියලා. විශේෂයෙන්ම ධනය සහ බලය තිබෙන සමහර අය මේ කරුණු කාරණා සම්බන්ධයෙන් කල්පනා කරනවා, අපට ඕනෑ තරම් ඔය කථා කියාපුදෙන්, අපේ ආණ්ඩුවක් ආවාම අපි ඒක අපි වෙනස් කර ගන්නම්, එතෙක් මේක අල්ලාගෙන, අල්ලාගෙන යමු කියලා. ඒ වාගේ ආකල්ප දරන අයට පමා වී යුක්තිය ඉෂ්ට වෙන අධිකරණ පද්ධතියක් තිබීමෙන් වාසි වෙන්නට පුළුවන්. නමුත්, සමාජයක් හැටියට අපි ඒ මඟින් කඩාගෙන වැටෙනවා. එම නිසා පොදුවේ ගත්තාම, මේ ව්‍යවස්ථාදායක සභාව තුළින් රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය වේගවත් කරන්න නම් මෙවැනි අණපනත් ඉතාම වේගයෙන් සම්මත කරලා ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි කියලා අපි අදහස් කරනවා. මේ කටයුතු වේගවත් කිරීම සඳහා අපේ ගරු අධිකරණ ඇමතිතුමිය ගන්නා වූ ඉතාම කාර්යක්ෂම ක්‍රියාදාමය සම්බන්ධයෙන් රටේ ගෞරවය ඔබතුමියට හිමි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව තව එක වැදගත් කාරණාවක් මම මතක් කරන්න ඕනෑ. අපේ ගරු මන්ත්‍රීතුමෙක් මෙම ගරු සභාවේ කථා කරලා එක කාරණාවක් ඉදිරිපත් කළා. එතුමා කිව්වා, අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ආණ්ඩුව ඉදිරිපත් කරන්නේ වෙන දෙයක් හිතේ තියාගෙනයි කියලා. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම සඳහා නෛතික යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රටේ විවිධ මත තිබෙනවා කියලා අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් විවිධ අර්ථ නිරූපණ ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සමහර වැරදි අදහස් ප්‍රචාරය වෙමින් තිබෙනවා. මෙතැනත් ඒක කියන්න තමයි උත්සාහ ගත්තේ. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන එන්නේ කොටි ඩයස්පෝරාව සනසන්නයි කියන කථාවක් මෙම ගරු සභාවේදී කියැවුණා.

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

දැන් මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැළැක්වීම සඳහා ඒ යෝජනාව ගෙනෙන්නේ, අතීතයට බලපාන විධියට නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යවස්ථාදායක සභාවට බැහැ, අතීතයට බලපාන විධියට නීති සම්මත කරන්න. ඒක මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ පනත් කෙටුම්පත් මේ පාර්ලිමේන්තුවට සම්මත කරන්න බැහැ. මම කියන්නේ මේකයි. ඕනෑම නම් තවදුරටත් එම පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදය ගෙනෙන දවසේ අපි -මේ සභාවම- එකතු වෙලා තව වගන්තියක් දමමු. ඒ තිබෙන සැකය දුරු කර ගැනීම සඳහා "මෙය අතීතයට බලපාන්නේ නැහැ" කියලා වගන්තියක් අපි දමමු. එතකොට වැඩේ ඉවරයි. එතකොට 'තලියෙහි පැනෙහි කිඹුලන් දකින්න' බැරි වෙනවා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? කෝප්පයක් දැකලා කියනවා, "මෙන්න මේකේ කිඹුලන් ඉන්නවා" කියලා. ඒ වාගේ කථාවක් තමයි මෙතැන කිව්වේ. මේ දිහා ඒ විධියට බලන්න එපා. මේ පාර්ලිමේන්තුවට පැවරුණු ඉතා විශාල වගකීමක් තිබෙනවා, මේ රටේ අධිකරණ පද්ධතිය නිසියාකාරව මෙහෙයවීම සඳහා අදාළ නීති සම්පාදනය කරන්න. ඒ එක කරුණක් තමයි, අධිකරණය කාර්යක්ෂම කිරීම. ඇත්ත වශයෙන්ම අපට අවශ්‍ය වෙලා තිබෙනවා, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමයක් ආරම්භ කරන්න.

අද අපි තනි රටක් විධියට නොවෙයි ඉන්නේ. අපේ රට ලෝකයට සම්බන්ධ වෙලා තිබෙනවා. අපේ රටේ මිනිස්සු ලෝකය පුරා යනවා; පදිංචි වෙලා ඉන්නවා; සංචාරය කරනවා; රැකියා සඳහා යනවා. ගෝලීය වශයෙන් අපි අන්තර් සම්බන්ධිතයි. අපරාධ ගත්තත්, ඒවා දේශීය වශයෙන් හුදෙකලාව ඈත නගරයක සිද්ධ වෙන දේවල් නොවෙයි. අපරාධ කරලා ලෝකය පුරා ගොස් අපරාධවලින් වසන්වෙලා සිටීමට අපරාධකරුවන් ඉතාම ශූර වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි සාක්ෂිකරුවෝත් ලෝකයේ හැම තැනම ඇවිදිනවා; ජීවිත ගත කරනවා. සමහර වේලාවට ඔවුන්ට ඉඩක් හම්බ වෙන්නේ නැහැ, එම නඩුව වෙනුවෙන්ම මේ රටට ඇවිල්ලා කල් ගත කරන්න. ඒ වාගේම, දැනට මේ රටේ ප්‍රසිද්ධ නඩු තිබෙන බව අපි දන්නවා, විදේශයක ජීවත් වෙන පුරවැසියන් ඇවිල්ලා සාක්ෂි දිය යුතු. ඒවා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධ, කොටි ඩයස්පෝරාවට සම්බන්ධ නඩු නොවෙයි. ඒවා ඉතාම බලවත් අපරාධ; මහා පරිමාණ දූෂණ. ඒ අයට අපේ තානාපති කාර්යාලයකට ඇවිල්ලා සාක්ෂි දෙන්න ඉඩකඩ ලබා දුන්නොත් මොකද වෙන්නේ? ඒ නඩුව වේගවත් වෙලා රටට යුක්තිය ඉෂ්ට වෙනවා. ඒවාට බය අය මේවාට ඩයස්පෝරා කථාව කියන්න හදනවා; මේවාට කොටි ලේබල් අලවන්න හදනවා. ඔවුන් 'තලියෙහි පැනෙහි කිඹුලන් දකින්න' හදනවා. ඒ නිසා අපි ඉතාම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනෙන්නේ ඉතාම පැහැදිලි අරමුණකින් බව. ඒ තමයි, මේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය වේගවත් කිරීම. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත අනාගතයට බලපාන එකක්. එය, වැරැද්දක් සහිත එකක් නොවෙයි. ඒක ඉතාම ශිෂ්ටසම්පන්න ක්‍රමයකට අපේ රට ගෙන යෑම සඳහා ගෙනෙන ඉතාම වැදගත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයක්. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ මේ රටට හඳුන්වා දීම මේ රටට කරන වැරැද්දක් හැටියට ව්‍යාජ දේශප්‍රේමීන් විසින් හඳුන්වා දෙන්න හදනවා. අද වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා ඒවායෙන් ජනතාව නොමඟ යෑම වැළැක්වීම සඳහා එම පනත් කෙටුම්පත් ගෙනෙන අවස්ථාවේදී අපි මේවා පිළිබඳව විශේෂයෙන් සඳහන් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

එහෙම නම්, මේ සම්බන්ධයෙන් කාර්යක්ෂම පියවර ගැනීම සම්බන්ධයෙන් නැවත අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට සහ ගරු ඇමතිතුමියට අපේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.42]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අධිකරණ ක්ෂේත්‍රයට අදාළව සංශෝධන පනත් කෙටුම්පත් තුනක් සහ පළාත් පාලන මැතිවරණයට අදාළව විශේෂ විධිවිධාන පනත් කෙටුම්පතක් දෙවැනිවර කියැවීම සඳහා ඉදිරිපත් වෙලා තිබෙනවා.

මෙහිදී පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉතාම වැදගත් වෙනවා. මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙක 2011දී මැතිවරණය සඳහා නාම යෝජනා කැඳවූ ප්‍රාදේශීය සභා දෙකක්. නාම යෝජනා කැඳවූවාට පසු ඒ ආයතන දෙකේ මැතිවරණය කල් ගියා. අවසානයේ නීතිමය ප්‍රශ්න මතු වුණා; උසාවි තීරණත් එක්ක ඒ මැතිවරණය කල් ගියා. නමුත් දැන් මැතිවරණ ක්‍රමය වෙනස් වෙලා තිබෙනවා. නව ක්‍රමයට මුළු රටේම මැතිවරණය පැවැත්විය යුතුව තිබෙනවා. එවැනි අවස්ථාවක මේ ප්‍රාදේශීය සභා දෙක පමණක් පරණ ක්‍රමයට පැවැත්වීම කිසිදු ආකාරයකට සාධාරණ වෙන්නේ නැහැ. ඒ නිසා පරණ නාම යෝජනා අහෝසි කරලා, ඒ වෙනුවට නැවත නාම යෝජනා කැඳවලා, සුදුසු කාලයක් ලබාදීලා, ඒ කාලය තුළ මැතිවරණය පැවැත්වීම කාලෝචිත වෙනවා. එහෙම නැත්නම් ඒ ආයතන දෙක නිසා සමස්ත මැතිවරණයම කල් දාන්න සිද්ධ වෙනවා. ඒ අර්ථයෙන් ගෙන -මුළු රටේම පළාත් පාලන ඡන්දය ඉක්මන් කර ගැනීම අරමුණු කරගෙන- පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉක්මනින් සම්මත කරගත යුතු වෙනවාව කියා අපි දකිනවා. ඉතින් ඒ පනත් කෙටුම්පත පිළිබඳව අපට විශේෂ ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධව ඉදිරිපත් වෙලා තිබෙන පනත් කෙටුම්පත් තුනම ඉදිරිපත් වන්නේ අධිකරණ ක්ෂේත්‍රය තුළ යම් යම් ප්‍රතිසංස්කරණ ඇති කිරීම සඳහායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වෙද්දී ඉතා පැහැදිලිව ජනතාවට පොරොන්දු වුණා, තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලින් ජනතාවට කරුණු ඉදිරිපත් කළා, අධිකරණ ව්‍යුහයේ කඩිනම් ව්‍යුහාත්මක වෙනස්කමක් කරනවා, එහෙම කරලා කඩිනමින් නඩු කටයුතු අවසන් කරන්න වහාම පියවර ගන්නවා කියලා. ඇත්තටම ඒක කිව්වේ මීට අවුරුදු තුනකට කලින්, 2015දී. 2015 මුල් අවස්ථාවේ කියපු දේ නැවත

පුනරුච්චාරණය කරන්න ආණ්ඩුවේ ඇමතිවරුන්ට අදත් සිද්ධ වෙලා තිබෙනවා. අවසානයේදී ආංශික අධීක්ෂණ කමිටුවේදී ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, ඒ හරහා යම් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාවට අනුව කටයුතු කරන්න කියන එක තමයි අද ආණ්ඩුවේම ඇමතිවරුන්ට නැවත නැවත කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට ඉතා පැහැදිලිව ඔප්පු වෙන කාරණාවක් තමයි, මේ ගෙවුණු කාලය තුළ ආණ්ඩුව අසමත් වෙලා තිබෙන බව එදා වෙච්ච පොරොන්දුව ඉටු කරන්න. විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රය තුළ ඒ ව්‍යුහාත්මක වෙනස ඇති කරන්න අසමත් වෙලා තිබෙනවා. මීට පෙර හිටපු ඇමතිතුමාත් විවිධ අවස්ථාවලදී සහතික දුන්නා, පොරොන්දු දුන්නා, ඒවා කරනවා, කඩිනමින් කරනවා කියලා. නමුත් කළේ නැහැ. නව ඇමතිතුමියත් ආවා. ආපු ගමන් මහා සද්දෙට සෝඩා බෝතලය කැඩුවා වාගේ පෙන්නුවා, ඔන්න දැන් ඔක්කෝම කරනවා, මෙච්චර කල් බැරි වෙච්ච ඒවා අලුත් ඇමතිතුමිය ආපු ගමන් වෙනස් කරනවා කියලා පෙන්නුවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව නොමඟ යැවීමට මේ වාගේ අසත්‍ය කියන්න දෙන්න එපා. මේ උත්තරීතර සභාවේ හිනහ වෙච් පව කියනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මොකක්ද අසත්‍ය?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

සෝඩා බෝතලය ඇරියා වාගේ කියලා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

සෝඩා බෝතලය ඇරියා වාගේ කියලා උපමාවක් කිව්වේ. ඒක තේරුණේ නැද්ද? [බාධා කිරීමක්]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ඒ උපමාව ගැළපෙන්නේ නැහැ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඔබතුමිය සෝඩා බෝතලයකට උපමා කළේ නැහැ; ආදේශ කළේ නැහැ. "සෝඩා බෝතලය ඇරියා වාගේ" ප්‍රකාශ නිකුත් කළා කියලා තමයි කිව්වේ. ඔබතුමිය ඒ ප්‍රකාශය වරදවා වටහා ගැනීම ගැන මම කනගාටු වෙනවා. ඔබතුමිය කිසිසේත්ම සෝඩා බෝතලයකට සමාන නැහැ, සෝඩා බෝතලය ඔයිට වඩා ලස්සනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, [බාධා කිරීමක්]ඉල්ලා ගෙන නේ කන්නේ? ඇයි, මේ ඉල්ලා ගෙන කන්නේ?

ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රකාශනයේ ඉතා පැහැදිලිව තිබෙනවා, අධිකරණයේ ව්‍යුහාත්මක වෙනස කරනවා කියලා. තවම ඒවා කෙරුණේ නැහැ කියලා දැන් හිටපු ඇමතිතුමාට දොස් පවරා හෝ තව තවත් යෝජනා ඉදිරිපත් කරමින් ඉඳලා, තවත් අවුරුදු දෙක තුනක් යනකොට ආපසු කියයි තවමත් ඒ ගැන ක්‍රියාත්මක වුණේ නැහැ කියලා. විශේෂයෙන්ම එතැන තිබුණා, දූෂණ වංචා පිළිබඳව සහ මිනීමැරුම් වාගේ අපරාධ පිළිබඳව කඩිනමින් විභාග කිරීම සඳහා වෙනම අධිකරණයක් පිහිටුවනවා කියලා. විශේෂ අධිකරණයක් පිහිටුවන්න නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න වෙනවා. ඒක ටිකක් සංකීර්ණ ක්‍රියාවලියක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න වෙනවා. නමුත් වෙනම අධිකරණයක් පිහිටුවන්න කිසිදු බාධාවක් තිබුණේ නැහැ; අදත් නැහැ.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ තිබෙන නිර්දේශවල ඇත්තටම ඉතා වැදගත් දේවල් තිබෙනවා. ඒ කිසිවක් බැහැර කරන්නට බැහැ. එම නිර්දේශ ක්‍රියාත්මක වෙනවා නම්, මේ කටයුත්ත ගොඩක් දුරට කඩිනම් වෙනවා. ඒ වාගේම විනිවිද පෙනෙන ආකාරයට ක්‍රියාත්මක වෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. දැන් මේ යෝජනා තිබෙනවා, නමුත් මේ යෝජනා ක්‍රියාත්මක වෙන්න එපායැ. ඒවා ක්‍රියාත්මක වීම පිළිබඳ කිසිදු සහතිකයක් තවම රටට ලැබිලාත් නැහැ; අපට ලැබිලාත් නැහැ.

අද ඉදිරිපත් කර තිබෙන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතේ මහාධිකරණ විනිසුරුවරුන් ප්‍රමාණය 75 සිට 110ක් දක්වා වැඩි කිරීමේ යෝජනාවක් තිබෙනවා. ඒක බොහොම හොඳයි. ඇමතිතුමියම කියන්න, පසු ගිය කාලයේ මහාධිකරණ විනිසුරුවරුන් හැත්තෑපස් දෙනාගේ තනතුරු සම්පූර්ණ කළාද? එහි තිබුණු පුරප්පාඩු සංඛ්‍යාව පිරෙව්වේත් නැහැ. මහාධිකරණ විනිසුරුවරුන් තිස්පහක් වැඩි කරන්න කියන එක හොඳයි. තිස්පහත් මදි තමයි. තිස්පහක් වැඩි කරන්න යෝජනා කරන්න කලින්, හැත්තෑපහක් තිබුණා. ඒ හැත්තෑපහක පුරප්පාඩු පිරෙව්වේත් නැහැ. ඒ නිසා තමයි මොනරාගල මහාධිකරණ විනිසුරුවරයාට අම්පාරට යන්න වුණේ. ගම්පහ මහාධිකරණ විනිසුරුවරයා නැඟෙනහිර පළාතට ගියේ. මහාධිකරණ විනිසුරුවරුන්ගේ හැත්තෑපහක් වූ cadre එකවත් පසු ගිය කාලය තුළ නිවැරදිව පිරෙව්වේ නැහැ. Cadre එක වැඩි කිරීම හොඳයි. Cadre එක වැඩි නොකර තිබුණු තත්ත්වය යටතේ පුරප්පාඩු පිරවීමවත් නිවැරදිව සිදු වුණේ නැහැ. එම නිසා නඩු විභාග කිරීම් ගොඩක් ප්‍රමාද වුණා. අදත් ප්‍රමාද වෙනවා.

මහාධිකරණ විනිසුරුවරුන් වැඩි කිරීම වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයත් අපට වැදගත්. ශ්‍රේෂ්ඨාධිකරණය තමයි අපේ රටේ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු සියල්ල විභාගයට ගනු ලබන්නේ. රටේ ජනතාවගේ සියලු මූලික අයිතිවාසිකම් නඩු විභාග වෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේයි. අපට තිබෙන්නේ එක ශ්‍රේෂ්ඨාධිකරණයයි. එතැන ඉන්නේ ඉතාම සීමිත විනිශ්චයකාරවරු ප්‍රමාණයක්. එම නිසා අපි දිගින් දිගටම මේ ප්‍රශ්නය මතුකළා. එතකොට ඔබතුමන්ලාගේ පැත්තෙන් -ආණ්ඩුව පැත්තෙන්- සහතික වුණා, මූලික අයිතිවාසිකම් නඩු ඇසීම සඳහා පළාත්බද අධිකරණ පද්ධතියක් හදනවා, ඒ සඳහා වහාම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා කියලා. නමුත් අද වෙනකම් ඉදිරිපත් වෙලා නැහැ. පළාත් මට්ටමෙන් මූලික අයිතිවාසිකම් නඩු විභාග කරන එක කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව වැඩි කරන්න. අපි එම ප්‍රශ්නයත් මතු කළා. එතකොට benches කිහිපයක් දමලා මූලික අයිතිවාසිකම් නඩු ඉක්මනින් විභාග කරන්න පුළුවන්. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වැඩි කිරීම සඳහා වන සංශෝධනයක් ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් වුණේ නැහැ. මේ ඉදිරිපත් වුණු කාරණාව නරකයි කියනවා නොවෙයි. නමුත්, කළ හැකි, කළ යුතුව තිබූ කඩිනම් සංශෝධනවත් ඔබතුමන්ලා කළේ නැහැ; අද වෙනකම් කරලාත් නැහැ. ඒ නිසාම බොහෝ නඩු කල් යනවා. සමහර අයගේ අදහස් දැක්වීමේ දී, නඩු ප්‍රමාද වීම පිළිබඳ අධිකරණයට තමයි චෝදනා කළේ. අධිකරණය මෙහෙය වීම, අධිකරණයට ඇඟිලි ගැසීමක් නොවෙයි.

[ගරු විජිත හේරත් මහතා]

අධිකරණය ඒ ආකාරයට ව්‍යුහාත්මකව වෙනස් කිරීම ආණ්ඩුවේ වගකීමක්. නඩු ප්‍රමාද වෙනවා නම්, නඩු කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අධිකරණ ඇමැතිවරියගේ; ආණ්ඩුවේ වගකීමක්. එදා පොරොන්දු වුණු දේවල් අද ඉෂ්ට කරලා නැහැ. එම යෝජනාවල තිබුණු දේවල් අපට මතකයි . "උදේ වරුවේ නඩු අහනවා, සවස් වරුවේ නඩු අහනවා, කාල වේලාව වෙනස් කරනවා" කිව්වා. උදේ උදේ 9.00ට අධිකරණ කටයුතු පටන් ගන්නවා කියලාත් කිව්වා. නමුත්, අද ඒවා එකක්වත් සිදු වෙලා නැහැ. එම නිසා මෙය ප්‍රායෝගික භාවිතයෙන් ඔප්පු කිරීමට අවශ්‍ය කරන මැදිහත් වීම කරන්න තිබෙන්නේ ආණ්ඩුවටයි. ආණ්ඩුව එම වගකීම ඉටු කරනවා නම්, අධිකරණ පද්ධතියේ තිබෙන බොහෝ ගැටලු නිරාකරණය කරන්න පුළුවන්.

විනිශ්චයකාරවරුන්ටත් ගැටලු තිබෙනවා. තමන්ගේ දරු පවුල එක තැනක, ළමයි පාසල් යන්නේ තව තැනක, විනිශ්චයකාරවරයා රාජකාරි කරන්නේ කිලෝ මීටර් සිය ගණනක් ඈතින්. එහෙම වුණාම ප්‍රශ්න ඇති වෙනවා. ඇත්තටම නඩු විභාග කිරීම ඉක්මන් කිරීමට තාවකාලිකව ගත හැකි පියවර වන්නේ, එවැනි තැන් නිවැරදි කිරීම සඳහා මැදිහත් වීමයි. සම්පූර්ණ ව්‍යුහාත්මක වෙනසක් කිරීමට යම් කිසි කාලයක් ගත වෙයි. එතෙක් කළ හැකි, කළ යුතු අවම දේවල්වත් ඔබතුමන්ලාගේ පැත්තෙන් තවම කරලා නැහැ. ඒ වාගේම "අධිකරණයට ඇඟිලි ගහන්නේ නැහැ; අධිකරණය දැන් ස්වාධීනයි" කියලා පුන පුනා කියනවා අපි දැක්කා.

පසුගිය කාලයේ ඉතාම පැහැදිලි නඩු තීන්දුවක් අපි දැක්කා. ඒ තමයි සිල් රෙදි බෙදා හැරීමේ වංචාව පිළිබඳ නඩු තීන්දුව. එම නඩුව දීර්ඝ කාලයක් තිස්සේ විභාග කරලා අවසානයේ ඉතා නිවැරදි තීන්දුවක් උසාවිය මඟින් ලබා දුන්නා. මොකක්ද වුණේ?

රුපියල් ලක්ෂ 6,000ක් වංචා කරපු, රුපියල් ලක්ෂ 6,000ක මූල්‍ය අවභාවිතාවක් කරපු හිටපු ජනාධිපති ලේකම්වරයා, TRC එකේ හිටපු සභාපතිවරයා දවස් 10න් ඇප දීලා ගෙදර යැව්වා. එතකොට හරි පැහැදිලිව මේ රටේ ජනතාවට පෙනෙනවා, එතැන බලපෑමක්, ඇඟිලි ගැසීමක් තිබෙනවා කියලා. කවුරු හරි කියනවා නම් ඒක අධිකරණ තීන්දුවක් කියලා, ඒක පට්ටපල් බොරුවක්. ඒ නඩුව මෙහෙයවපු, නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා දිගින් දිගටම මේ නඩුවට මැදිහත් වුණා. මැදිහත් වෙලා, දුෂ්කර කාර්යක යෙදිලා, ඉතා අමාරුවෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ අනුව තමයි උසාවිය මඟින් ඒ නඩු තීන්දුව ලබා දුන්නේ. ඒක ශ්‍රේෂ්ඨ, ඓතිහාසික නඩු තීන්දුවක්. මේ රටේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන නඩු තීන්දුවක්. දේශපාලනඥයන් කියන කියන විධියට වැඩ කරලා, දේශපාලනඥයින්ගේ ඕනෑ එපාකම් ඉෂ්ට සිද්ධ කරන්න ගිහිල්ලා අමාරුවේ වැටෙන්නේ නැතුව, මේ රටේ රාජ්‍ය සේවකයන්ට කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න පුළුවන් බව කියන නිවැරදි නඩු තීන්දුවක්. නමුත් මොකක්ද වුණේ? දවස් දහයෙන් ඇප දුන්නා. "මට නම් රෙද්දක් ඇඳගෙන ගිහිල්ලා ඇප ඉල්ලන්න බැහැ" කියලා නීතිපති දෙපාර්තමේන්තුවේ එම ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා ඇප ඉල්ලන්න ගිහිල්ලා තිබුණේ නැහැ. එම රාජ්‍ය නිලධාරියාට කොන්දක් තිබුණා, "නඩුව මෙහෙයවලා තීන්දුව දුන්නාට පස්සේ නැවත ගිහිල්ලා ඇප ඉල්ලන්න ලජ්ජයි, එවැනි තැනකට මම යන්නේ නැහැ" කියලා කියන්න. හැබැයි ඔබතුමන්ලා මොකක්ද කළේ? ඔබතුමන්ලාගේ මැදිහත් වීම ඇතුළේ ඔබතුමන්ලා ඒවා වෙනස් කළා. රටේ ජනතාවට ඒක ඉතා පැහැදිලියි. නැති බැරිකමට අඹ ගෙඩි තුනක් කඩාගෙන ගිහිල්ලා විකුණපු වයසක අම්මාව ගෙනිහිල්ලා දඩ ගහලා හිරේ දැම්මා. සපත්තු දෙකක් ගන්න කියලා පොල් ගෙඩියක් කඩා ගත්ත අහිංසක දැරියව ගෙනිහිල්ලා හිරේ දැම්මා; රුපියල් පනස්දහසක් දඩ ගැහුවා. හැබැයි මේ රටේ මහා පරිමාණ වංචා කරපු අයට, රුපියල් ලක්ෂ 6,000ක් වංචා කරපු අයට දවස් දහයෙන් ඇප දුන්නා.

එදා අපි කවුරුත් දැක්කා, SAITM එකේ අධ්‍යක්ෂවරයා -සමීර සේනාරත්න- වෙඩි තබා ගත්ත සිද්ධිය. වෙඩි තැබුවා කියලා කිව්වා. අවසානයේ දී ඉතා පැහැදිලිව ඔප්පු වුණා, වෙඩි තියලා නැහැ, වෙඩි තබා ගැනීමක් වුණේ, ඒක හිතාමතා -සැලසුම් සහගතව- කරපු වැඩක් කියලා. ඒක මුළු රටම දැක්කා. අද වෙනකල් ඒ සිද්ධිය සම්බන්ධයෙන් කෝ, දඬුවම් දුන්නාද? SAITM ආයතනයේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන්, ශිෂ්‍යයන් අද මාරාන්තික උපවාසයේ යෙදෙනවා, තමන්ගේ ගැටලුව විසඳා ගන්න බැරිව. හැබැයි ඒ අයට යුක්තිය ඉටු කළාද? ඒ අයට යුක්තිය පසිඳලීමේ ක්‍රියාමාර්ගයක් ගත්තාද? නැහැ. ඒ සිද්ධියට සම්බන්ධ සමීර සේනාරත්නට එරෙහිව දඬුවම් ලබා දුන්නේ නැහැ; නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒකට ප්‍රබල දේශපාලනඥයන් සම්බන්ධ වුණා කියලා මාධ්‍ය ඉතා පැහැදිලිව වාර්තා කළා. නමුත් ඒ සිද්ධිය නිර්මාණය කරපු පුද්ගලයාට, SAITM ආයතනයේ පරිපාලන නිලධාරියාට එරෙහිව නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ දී දිගටම ප්‍රශ්න කළා. අගමැතිවරයා විවිධ පිළිතුරු දුන්නා. ඒ ගැන වහාම නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා කියා කිව්වා. හැබැයි අද වෙනකල් නීතිමය ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මෙන්න නීතිය! මෙන්න යුක්තිය! රටේ ජනතාව මේවා හොඳට තරාදියේ දමලා, මැනලා බලනවා. ඔබතුමන්ලා කියනවා, "අපේ ආණ්ඩුව ස්වාධීනයි, අපි උසාවියේ කටයුතුවලට ඇඟිලි ගහන්නේ නැහැ, ඒ පරීක්ෂණ වෙනම සිදු වෙනවා" කියලා. නමුත් මේ සිදුවීම්වලින් ඔප්පු කරලා තිබෙනවා, ඒක එහෙම නොවෙයි කියලා. වෙනදා වාගේම ඍජුව සහ වක්‍රාකාරයෙන් ඒ මැදිහත්වීම් සිදු වෙනවා කියලා ඔප්පු කරලා තිබෙනවා. ඒ නිසා ඒවා වහාම නතර කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට යම් කිසි නඩු කටයුත්තකදී සාක්ෂි දෙන්න ඕනෑ නම්, විදේශ රටවල ඉඳලා සාක්ෂි ලබා දීමේ හැකියාව මේ සංශෝධනය හරහා ගෙන එනවා කියන කාරණය මෙතැනදී මතු වුණා. ඒක ඉතාම වැදගත් දෙයක්; ගෙන ආ යුතු දෙයක්. නූතනයේ තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. නූතනයේ ලෝකයේ විවිධ රටවල ලංකාවේ අය ජීවත් වෙනවා. අද ගත්තොත් ලාංකිකයන් ලක්ෂ විස්සකට වඩා ජීවත් වන්නේ විදෙස් රටවල. අපේ රටේ විවිධ පුද්ගලයන් විවිධ හේතු මත -රැකියා සඳහා, එහෙම නැත්නම් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති නිසා, ඉන්න බැරි ප්‍රශ්නය නිසා- රට ගිහිල්ලා තිබෙනවා. පසු ගිය කාලයේ මාධ්‍යවේදීන්ට විවිධ හේතු මත විදේශගත වෙන්න සිදු වුණා. සමහරුන්ට තවමත් ආපසු එන්න බැරි තත්ත්වයක් තිබෙනවා. එතකොට ඒ අයට සිදු වුණු අසාධාරණය පිළිබඳව යම් කිසි නඩුවක් තිබෙනවා නම්, ඒ නඩුවට අදාළ සාක්ෂි ලබා දීමේ අයිතිය අපි සහතික කරන්න ඕනෑ. ඡන්ද අයිතිය වුණත් එහෙමයි. විදේශගත ශ්‍රී ලාංකිකයින්ට අපි ඡන්ද අයිතියත් ලබා දෙන්න ඕනෑ. ඡන්ද අයිතිය දෙනවා නම්, එහේ ඉඳලා සාක්ෂි ලබා දීමට අයිතිය දෙන එක වැරැදි වෙන්නේ කොහොමද? ඒක ඉතාම වැදගත් සහ අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්. එතැනදී මේ අතුරුදහන් කරවීම අපරාධයක් සේ සලකා - එම පනතයි, මේකයි අතර සම්බන්ධයක් පෙන්වුවා. නැහැ, එහෙම කිසි සම්බන්ධයක් නැහැ. අපි ඉතාම පැහැදිලිව කියනවා, අතුරුදහන් කරවීම බරපතළ අපරාධයක් සේ සලකා ඒ වෙනුවෙන් පනත් කෙටුම්පතක් වහාම ගෙන ආ යුතුයි කියලා ඇයි, ප්‍රමාද? ඔබතුමන්ලා ඇයි ඒක පස්සට දමන්නේ? ඒක මීට කලින් ගෙනෙන්න තිබුණු එකක්. ඒක කිසිසේත්ම අතීතයට බලපාන එකක් නොවෙයි.

අතීතයේ යම් කිසි අතුරුදහන් කරවීමක් කළා නම්, ඒ අයට දඬුවම් දෙන්න පුළුවන් පනතක් නොවෙයි ඒක. ඒක අනාගතය සඳහා බලපාන එකක්. අපි කියන්නේ, ඒ පනත ගේන්න කියන එකයි. මොකද, ඔබතුමන්ලාගේ ආණ්ඩුව තමයි දැන් අතුරුදහන්

කරවීම් පටන් අරගෙන තිබෙන්නේ. SAITM අරගළයේදී රයන් ජයලත් වෛද්‍ය ශිෂ්‍යා වෛද්‍යවරු ඇතුළු සියලුමදෙනා සිටියදී මහා දවාලේ පොලීසිය ඇවිල්ලා පැහැරගෙන යන්න හැදුවා. ඒවා වළක්වන්න ඕනෑ. ඒවා වළක්වන්න නම් මේ වාගේ පනත් ඕනෑ. ඒවා ෆායාරුපගත කළා, ඒවා වීඩියෝගත කළා. මේ නීතිය සම්මත වෙලා තිබුණොත් පමණයි එවැනි දේවල්වලට දඬුවම් කරන්න පුළුවන් වෙන්නේ. එම නිසා අතුරුදහන් කරවීම අපරාධයක් සේ පෙනී පෙනී,- බලහත්කාරයෙන් පැහැරගැනීම වාගේම, නොපෙනී අතුරුදහන් කරවීම ඉදිරියේදීත් වෙන්න පුළුවන්. එහෙම දේවල් වෙන්න පුළුවන් සලකුණු දැන් මතුවෙමින් තිබෙනවා. මේක අතීතයට බලපාන පනතක් නොවෙයි. ඒ පනතේ කොහේවත් නැහැ, අතීතයට අදාළයි කියලා. ඒ පනතේ යම් යම් සංශෝධනත් කළ යුතුයි. අපි දකින්නේ එහෙමයි. මොකද, මිනී මැරුමක් සිදු කළාම, ඒ වූදිතයාට එක්කෝ මරණ දණ්ඩනය, එහෙම නැත්නම් ජීවිතාන්තය දක්වා සිර දඬුවම නියම කරනවා. හැබැයි, අතුරුදහන් කරවීම සම්බන්ධව පනතේ තිබෙන්නේ උපරිමය අවුරුදු 20ක දඬුවමක්. ඝාතනයක් සිද්ධ කළාම අඩුම ගණනේ මළ කඳ හරි - දේහය හරි- තිබෙනවා. නමුත්, අතුරුදහන් කළාම දේහයවත් නැහැ; dead body එකවත් නැහැ. එහෙම පුද්ගලයෙකුට දෙන්නේ අවුරුදු 20ක දඬුවමක්ද? ඒක හරිද? මිනී මැරුමක් කළාම ජීවිතාන්තය දක්වා සිර දඬුවම් දෙනවා; මරණීය දණ්ඩනය දෙනවා. හැබැයි, අතුරුදහන් කරලා ඒක ඔප්පු වුණාම දඬුවම වෙන්නේ අවුරුදු 20ක සිර දඬුවමක්. ඒක ප්‍රමාණවත් නැහැ. එම නිසා ඒ පනතට අන්න එවැනි සංශෝධන ගේන්න ඕනෑ. ඒවා තවත් ධනාත්මක කරන වගන්ති ඇතුළත් කරන්න ඕනෑ.

අතුරුදහන් වූවන් පිළිබඳ පනත ප්‍රමාද ඇයි? අතුරුදහන් කිරීම අපරාධයක් සේ සලකන පනත ඔබතුමන්ලා ගේන්නේ නැත්තේ ඇයි? ඒක ඉක්මනින් ගේන්න. මොකද, ඒක වැදගත් වෙන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට; මේ රටේ නිදහසට. විශේෂයෙන්ම අද මේ ආණ්ඩුව ආර්ථිකමය හා දේශපාලනමය අර්බුදයක් දක්වා ගමන් කරනකොට ඔබතුමන්ලා කරන්නේ මර්දනයයි. පසු ගිය කාලයේ ඔබතුමන්ලා ශිෂ්‍ය අරගළවලට, SAITM ආයතනය වහන්න කියලා කරපු අරගළවලට පාවිච්චි කළේ වෙඩි උණ්ඩ, කඳුළු ගෑස්, ඒ වාගේම අමානුෂික මිලේච්ඡ ප්‍රහාර. ඒවා තමයි ඉදිරියේදී තවත් වර්ධනය වෙන්නේ. එම නිසා ඒ පනත මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අත්‍යවශ්‍ය පනතක්. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය, එහෙම නැත්නම් වෙන කවුරු හෝ කියනකල් ඉන්න ඕනෑ නැහැ ඒක ගේන්න. ඒක මේ රටේ ජනතාවගේ අයිතිය වෙනුවෙන් අපි සම්මත කරගත යුතු එකක්. අපට ඒ ඉතිහාසය මතකයි. ඒ ඉතිහාසයේ අතුරුදහන් කරවීම් එකක් නොවෙයි, දකුණේත්, උතුරේත්, රටේ හැමතැනමත් සිදු වූ අතුරුදහන් කරවීමේ සිද්ධි දහස් ගණනක් පිළිබඳව අපට කථා කරන්න පුළුවන්. නීත්‍යානුකූල හමුදාවක් විසින් කරපු පැහැරගැනීම්, අතුරුදහන් කිරීම්, නීතිවිරෝධී කහ බලල්ලු, කොළ කොටි, එක එක ජාතියේ කට්ටිය, උකුස්සෝ කරපු අතුරුදහන් කිරීම් ගැන අපට මතකයි. එම නිසා එවැනි අතීතයක් අපි නැවත බිහි කරගන්න ඕනෑ නැහැ. අපි ඒවා වළක්වන්න ඕනෑ. ඒවා වළක්වන්න මේ වගේ නීති ගෙන ආ යුතුයි. ඒ නීතියයි, විදේශගත වූ ශ්‍රී ලාංකිකයෝ විවිධ රටවල ඉඳලා සාක්ෂි ලබාදීමයි අතර කිසි සම්බන්ධයක් නැහැ. මොකද, මේ පනත අතීතයට බලපාන්නේ නැත්නම්, මේ පනත බලපාන්නේ අනාගතයට නම්, අනාගතයේ අතුරුදහන් කරවීමක් සිදු වුණොත්, අන්න ඒ අතුරුදහන් කරවීම අපරාධයක් සේ සලකා කටයුතු කිරීම සඳහා තමයි ඒ පනත තිබෙන්නේ. එවැනි අවස්ථාවක විදේශගතව සිටින කෙනෙකුට සාක්ෂි ලබාදිය හැකි වෙන්නේ ඒ සිද්ධියට අදාළවයි; අනාගතයේ සිදුවන සිද්ධියට අදාළවයි. එහෙම නැතුව අතීතයේ වෙච්ච දෙයක් සඳහා නොවෙයි. ඒ නිසා නැති බිල්ලෝ, බොරු බිල්ලෝ මවලා තමන්ගේ පටු දේශපාලන වාසි ගන්න එක නවත්තලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මේ රටේ ජනතාවගේ ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් අවශ්‍ය කරන පනත් වහාම ගෙන ආ යුතුයි කියන එක මා දැඩිව අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ තත්ත්වය ගත්තොත්, පසු ගිය කාලයේ නීතිපති දෙපාර්තමේන්තුවට දිගටම විවේචන ගොඩක් තිබුණා. නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් මදි. ඒක ඉතා පැහැදිලිව කවුරුත් පිළිගන්නවා. හැබැයි, ඒක ප්‍රමාණවත් මදි කියලා අවුරුදු කීයක් තිස්සේ කියමින් ඉන්නවාද? හිටපු ඇමතිතුමාත් ඒක කිව්වා. අදත් අපි ඒ පිළිබඳව කථා කරනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරින්ගේ ප්‍රමාණය වැඩි කිරීම සඳහා මේ වෙනකොට ඔබතුමන්ලා අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? කාර්ය මණ්ඩලය වැඩි කරන්න කියලා ආංශික අධීක්ෂණ කමිටුවෙන් ලබාදුන් යෝජනාව තිබෙනවා. හැබැයි, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වැඩි කරලා නැහැ. වැඩි කරන්න බැරි බාධා මොනවාද තිබෙන්නේ මොනවාද?

ඇත්තටම ගත්තොත්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට private practice කරන්න බැහැ. ඒ අයට උසාවිවලට ගිහින් නඩුවලට පෙනී සිටින්න බැහැ. ඒ අය ලබා ගන්නා ආදායම වෙනත් නීතිඥවරයකු හෝ නීතිඥවරියක ලබා ගන්නා ආදායමට වඩා අඩුයි. ඒ නිසා බොහෝ නීතිඥවරු නීතිපති දෙපාර්තමේන්තුවට යන්න කැමැති නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමියගේ මැදිහත් වීමෙන් පසුව නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන්ගේ සංඛ්‍යාව 118 සිට 217 දක්වා වැඩි කිරීම පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට සතුටුදායක ආරංචියක් මේ කියන්නේ. ඉතිරි පරිපාලන ගැටලු නිරාකරණය කර ගත්තාම තව 100කින් නීතිපති දෙපාර්තමේන්තුවේ බලය වැඩි වනවා. ඇත්තටම සියයට 100කින් වැඩි වනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මේ උත්තරය විජයදාස රාජපක්ෂ හිටපු ඇමතිතුමාත් මට දුන්නා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ. මෙය ඊයේ-පෙරේදා එකක්. පරණ එකක් නොවෙයි, අලුත් එකක්. මොනවාද මේ පරණ කථා? මේවා අලුත් ඒවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මේ සතුටුදායක ආරංචිය හොඳයි. දැන් මා කියා ගෙන ආපු කාරණය කියන්න දුන්නේ නැහැ නේ. මීට කලින් හිටපු

[ගරු විජිත හේරත් මහතා]

ඇමතිතුමාත් දෙවතාවක් මටම ඔය උත්තරයම දුන්නා. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේදී දෙවතාවක්ම කිව්වා, "නැහැ, අපි වැඩ කරනවා. ඒ සඳහා කටයුතු කරලා තිබෙනවා. අපි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලනවා"යි කියලා. නමුත් අද වන කල් ඒ කටයුතු සිද්ධ වෙලා නැහැ. දැන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, අනුමැතිය ලැබී තිබෙනවාය කියලා. හොඳයි. මා කියන්නේ, අනුමැතිය ලැබුණාට වැඩක් නැහැ කියලායි. මොකද, මෙතැනට නීතිඥවරු -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, සති 3කට කලින් තමයි මේ අවසරය ලැබී තිබෙන්නේ. එය ඔබතුමාට සතුටින් දැනුම් දෙනවා. ඔබතුමාත් සාමාජිකත්වය දරන ආංශික අධීක්ෂණ කාරක සභාව ඔබතුමාගේත් දායකත්වයෙන් විශිෂ්ට වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව පිළිගනිමින් තමයි ඒ කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

අනුමැතිය ලැබුණු එක ගැන වැරැද්දක් කියනවා නොවෙයි. මා කිව්වේ, නීතිඥවරුන් ලබා ගැනීම පිළිබඳව මීට කලිනුත් සහතික වුණා, පොරොන්දු වුණා, මේ ගරු සභාවේ කිව්වාය කියලායි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වුණාය කියන එක හොඳයි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ඒ cadre එක අනුමත වුණාටම - මා කියා ගෙන ආවේ ඒ කාරණයයි. - නීතිඥවරුන් නීතිපති දෙපාර්තමේන්තුවට එන්නේ නැති එකයි. එයට හේතුව, ඒ අය එතැනට ගියොත් ඒ අයට private practice කරන්න බැරි වන එකයි. ඒ අයට private practice කරන්න බැරි වුණොත්, උසාවිවල නීතිඥවරුන් ලබා ගන්නා ආදායම ඔවුන්ට ලබා ගන්න බැහැ. ඒ නිසා තමයි ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා කළේ, ඒ අයට ලබා දෙන පඩි-නඩි සහ අනිකුත් දීමනා වැඩි කරන්න කියලා. ඔබතුමන්ලා ඒ සඳහා කැබිනට් මණ්ඩලයෙන් වහාම අනුමැතිය ලබා ගන්න ඕනෑ. මීට කලින් මේ පාර්ලිමේන්තුවේදීම විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට එය යෝජනා කළා. එතුමාත් පිළිගත්තා, "ඔව්. ඒක ඇත්ත. එහෙම කළොත් අපට නීතිඥවරුන් විශාල සංඛ්‍යාවක් ගෙනෙන්න පුළුවන්" කියලා. නමුත් ඒ කාර්යය සිද්ධ වෙලා නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ එතැනයි. අපි මේ කථා කරන්නේ අධිකරණයේ නඩු ප්‍රමාද වීම ගැනයි. ඒ ගමන් අපි කථා කරනවා, මේ යෝජනා ක්‍රියාත්මක නොවීම පිළිබඳව. ඒකයි මේ ප්‍රශ්නය. නඩු ප්‍රමාද වෙන්න හේතුව ගැන කථා කරන ගමන් මේ යෝජනා පිළිබඳවත් මීට කලින් සාකච්ඡා වුණා, ඒ පිළිබඳව එකඟ වුණා, නමුත් ක්‍රියාත්මක වුණේ නැහැ. අදත් තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒ අයට දෙන දීමනා සහ අනිකුත් පඩි-නඩිවල වෙනස්කමයි. ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉක්මනින් ඉදිරිපත් කරලා සම්මත කර ගන්න ඕනෑ. ඒ කටයුතු කඩිනමින් කළොත් විතරයි, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වුණු පුරප්පාඩු ටික පුරවා ගන්න පුළුවන් වන්නේ. එහෙම නැත්නම් වෙන්නේ, අපි කවුරුත් දන්නා පරිදි විශ්වවිද්‍යාලයෙන් ඒ නීති උපාධිය ගත්තාට පස්සේ කනිෂ්ඨ නීතිඥවරුන් පළමුවන රක්ෂාව විධියට නීතිපති දෙපාර්තමේන්තුවට ගිහින් ටික කාලයක් එහි සේවය කොට තමන්ගේ වෘත්තිය තුළ යම් මට්ටමකට ප්‍රායෝගික පුහුණුව, අත් දැකීම් ලබා ගත්තාට පස්සේ නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉවත් වෙලා පෞද්ගලිකව නඩුවලට පෙනී සිටින්න උසාවිවලට යෑමයි. ඒක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් ඉතාම අතළොස්සක ප්‍රමාණයක් ඉතිරි වනවා. අදත් තිබෙන ඇත්ත ඒක තමයි. නීතිපති දෙපාර්තමේන්තුවේ වර්තමාන තත්ත්වය ගත්තත් මීට දෙවෙනි වන්නේ නැහැ. ඒ නිසා මෙය වෙනස් කරන්න ගත යුතු ක්‍රියාමාර්ගය තමයි ඔබතුමන්ලාගේ පැත්තෙන් ගත යුතු වන්නේ. එහෙම නැත්නම් වෙන්නේ, අපි cadre එක වැඩි කළාට cadre එක පුරවන්න නීතිඥවරුන් එන්නේ නැති එකයි. ඒකයි මා උදාහරණයට කිව්වේ.

මහාධිකරණ විනිසුරුවරුන්ගේ cadre එකේ 75දෙනෙක් සිටියා. ඒ 75වත් සම්පූර්ණ වුණේ නැහැ. එහෙම තත්ත්වයක් නේ තිබුණේ. Cadre එක වැඩි කරන එක හොඳයි. Cadre එක වැඩි කරලා ඒ සඳහා බඳවා ගැනීම් කළ යුතුයි. ඒ සඳහා අනුමැතිය ලබා ගෙන, ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුවේ රඳවා ගැනීම සඳහා වූ ඊළඟ ක්‍රියාමාර්ගයට කඩිනමින් යා යුතුව තිබෙනවා. එහෙම කළොත් පමණයි, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කඩිනම් කර ගන්න පුළුවන් වන්නේ.

නීතිපති දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම පිළිබඳව ගත්තොත්, අද අපි දැක්කා, තමන්ගේ පෞද්ගලික කාරණා සම්බන්ධයෙන් යම් යම් කොමිෂන්වල විභාග වුණු කරුණු විවේචනය කරනවා. තමන්ට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන් නීත්‍යානුකූලව මැදිහත් වුණොත්, රජයේ නිලධාරියකු බරපතළ වැරැද්දක් කළ විධියට දකිනවා. එහෙම කරන්න බැහැ. රජයේ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකුට, එහෙම ප්‍රකාශයක් කරන්න සිද්ධ වීම ම ඉතිහාසයේ සරදමක්.

අනෙක් පැත්තට එහෙම කරලා බලාපොරොත්තු වෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවට අනියම් බලපෑමක් කිරීමයි. මේ කරන්නේ අනියම් බලපෑමක්. මන්ත්‍රීවරයෙකුගේ යම්කිසි අකටයුත්තක් පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් මැදිහත් වුණොත් ඒක පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරනවා, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කමිටුවට කැඳවනවා. මේ භය කිරීමයි මේ කරන්නට යන්නේ. එහෙම භය කරලා නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය කෙලෙසන්නට එපා, ඒක වැරදියි. එහෙම වුණොත් ඔය තනතුරු ප්‍රමාණය කොපමණ වැඩි කළත් වැඩක් නැහැ, ඉන් පසුව එන නීති නිලධාරීන් තමන්ගේ ස්වාධීනත්වය ධෛර්යයෙන් යුක්තව ක්‍රියාත්මක කරන්නේ නැහැ. එම නිසා ඒ වැරදි ආදර්ශය දෙන්න එපා කියන කාරණයත් අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූලික අයිතිවාසිකම් නඩු ඇසීම පිළිබඳව අධිකරණ පද්ධතිය තුළ වෙනස්කම් සිදු විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම පළාත් මට්ටමෙන් හෝ මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා තවමත් නිවැරදිව කඩිනම් පියවරක් අරගෙන නැහැ. මූලික අයිතිවාසිකම් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරලා නඩුව අහන තත්ත්වයට ගේන්න අද රුපියල් ලක්ෂ 10ක් විතර වියදම් වෙනවා. ඈත පිටිසර ගමක දුප්පත් දෙමව්පියන්ට, දුප්පත් පුද්ගලයකුට තමන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් පිළිබඳව අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් ඒ නඩුව දිනන තරමට වියදම් කරන්නට බැහැ. අඩුම තරමින් ඒ අයට කොළඹට එන්න බස් ගාස්තු සොයා ගන්නවත් විධියක් නැහැ. එවැනි තත්ත්වයක් වෙනස් කරන්නට අධිකරණ පද්ධතිය තුළ කඩිනමින් ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද? ඒ ගැන අද දහස් ගණනක් ජනතාව සාකච්ඡා කරනවා. අද පවතින මූලික අයිතිවාසිකම් නඩුවලින් වැඩි ප්‍රමාණයක් පවරලා තිබෙන්නේ යම් ආර්ථික හැකියාවක් ඇති සමාගම්, එහෙම නැත්නම් දේශපාලන වශයෙන් යම්කිසි බල පුළුවන්කාරකමක් තිබෙන අය, එහෙමත් නැත්නම් වෙනත් හැකියාවක් තිබෙන අය කිහිප දෙනෙකු විතරයි. නමුත් අපේ රටේ සාමාන්‍ය දුප්පත් ජනතාවට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරන්න වත්කමක් නැහැ, හැකියාවක් නැහැ, ඒ පිළිබඳ දැනුමක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මානව හිමිකම් පිළිබඳ කාර්යාල දිස්ත්‍රික් මට්ටමින් තිබෙනවා. නමුත් ඒ කාර්යාල හරහාවත් අඩුම තරමින් ඒ නීති උපදේශයනය, මැදිහත් වීම තවම නිවැරදිව සිද්ධ වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසුගිය කාලයේ අපේ රටේ සිදු වුණු බරපතළ සිදුවීම් කිහිපයක් තිබුණා. කටුනායක රොෂේන් චානක ඝාතනය, බන්ධනාගාරය තුළ වෙඩි තැබීමේ සිද්ධිය, වවුනියාව කඳවුරේ සිරකරුවෙකුට වෙඩි තැබීමේ සිද්ධිය. මේවා පිළිබඳව විශේෂ කොමිෂන් සභා පත් කළා. ඒ කොමිෂන් සභා වාර්තාවලට, ඒ නිගමනවලට මොනවාද වුණේ? අදත් මේ රටේ යුක්තිය පසිඳලීම ගැන ආශාවෙන් බලාගෙන ඉන්න ජනතාව අහන ප්‍රශ්න තමයි බන්ධනාගාරය තුළ වෙඩි තැබීමේ සිද්ධියට නියෝග දීපු අයට, ඒ වෙඩි තැබීම මෙහෙයවපු අයට, ඒ සිද්ධියට අදාළ වින්දිතයන්ට දීපු දඬුවම් මොනවාද, රොෂේන් චානකව වෙඩි තියලා මරපු විත්තිකරුවන්ට දීපු දඬුවම කෝ කියන ඒවා. අඩුම තරමින් ඒ වාර්තාවට වුණු සාධාරණයක්වත් නැහැ. ඒ පිළිබඳව විනිශ්චයකාරවරයෙකුගෙන් යුත් ඒක පුද්ගල කොමිෂන් සභාවක් පිහිටවූවා. ඒ විනිශ්චයකාරවරයා ඉදිරිපත් කළ වාර්තාවට අනුවවත් තවම කටයුතු කරලා නැහැ. ඔබතුමන්ලා බලයට ආවේ ඒවා කඩිනමින් සිද්ධ කරනවා කියලා. "සියලු සිරකරුවෝ මනුෂ්‍යයෝය." කියලා උද්ධෘත පාඨයක් තිබුණත් ඒ සිරකරුවන්ට නිසි සාධාරණත්වය ලැබිලා නැහැ. ඔවුන්ව වෙඩි තියලා මැරුවා, ඝාතනය කළා. ඒ ඝාතකයෝ තවමත් නිදැල්ලේ, ඒ වින්දිතයෝ තවම නිදැල්ලේ. තවම එයට සාධාරණය ඉටු කළෙත් නැහැ. එම නිසා ඔබතුමන්ලා මේ කාරණා ටික අවධානයට අරගෙන, සමාලෝචනය කරලා අද සිද්ධ වෙලා තිබෙන නඩු ප්‍රමාද වීමට හේතු සොයා ගන්න. නඩු කඩිනම් කිරීම සඳහා අධිකරණ පද්ධතියේ කළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම මේ සංශෝධන පනත් කෙටුම්පත් හතරෙන් විතරක් කරන්නට බැහැ. ඒ සඳහා කඩිනම් මැදිහත් වීමක් වහාම අත්‍යවශ්‍ය වෙනවා. ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් ඉදිරිපත් කළ යෝජනා හොඳයි. යෝජනා ක්‍රියාත්මක කිරීම ගරු ඇමතිතුමියගේ වගකීම, ආණ්ඩුවේ වගකීම. ඒවා කවදාද ක්‍රියාත්මක කරන්නේ, කවදාද ඒවාට නිසි ක්‍රියාමාර්ග ගන්නේ කියන එක මේ රටේ ජනතාව දැන ගන්නට කැමැතියි. එය ඉටු කරන ලෙස නැවත අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 29ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.12]

**ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත වැනි කාලීන පනත් කෙටුම්පත් කරළියට ගෙන ඒමට දිරි දුන්, එම කටයුතු සංවිධානය කරපු ගරු තලතා අතුකෝරල අධිකරණ ඇමතිතුමිය, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා සහ අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලුම පාර්ශ්වවලට මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වනවා.

මෙම පනත් කෙටුම්පත් ඉතාම කාලෝචිත පනත් කෙටුම්පත් හැටියට මා දකිනවා. ඒ කාරණය සම්බන්ධයෙන් ප්‍රශංසා කරන අතරතුර මෙවැනි කාලෝචිත පනත් කෙටුම්පත් ගෙන එන්නට මෙපමණ කාලයක් ගත වීම සම්බන්ධයෙන් මා පොඩි දෝෂාරෝපණයකුත් කරන්න ඕනෑ. මොකද, ආණ්ඩුවක් හැටියට අපි බැණුම් අහනවා නම් අහන්නේ මේ ප්‍රශ්නය නිසා කියන කාරණය මා බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. නමුත් කල් ගිහිල්ලා හෝ මෙවැනි පනත් කෙටුම්පත් ගෙන ඒම පිළිබඳව එම තිදෙනාටම මගේ ස්තුතිය, ප්‍රශංසාව සහ ජනතාවගේ ප්‍රණාමයත් පිරිනමන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාධිකරණ විනිසුරුවරුන් 75 දෙනෙකු වෙනුවට 110ක් පත් කරන්න ඕනෑ කියලා කියනවා. මෙය කල් ගිහිල්ලා හෝ ඉදිරිපත් කරපු ඉතාම හොඳ යෝජනාවක්. මහාධිකරණ විනිසුරුවරුන් වැඩි කරනවාට අපි කැමතියි; ඒකට ජනතාවත් කැමැති වේවි. හොරුන් නම් ඒකට අකැමති වේවි. හැබැයි, විනිසුරුවරුන්ගේ quality එක ගැන අපේ ජයම්පති වික්‍රමරත්න මැතිතුමා කථා කළා. "අධිකරණ විනිශ්චයකාරවරුන් වැඩි කරනවා වාගේම විනිශ්චයකාරවරුන්ගේ quality එක ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ද ගත යුතුයි." කියලා එතුමා කිව්වා. මොකක්ද, මේ quality එක කියන්නේ?මට විරුද්ධව නඩුවක් තිබෙනවා. නමුත් මා එම නඩුව ගැන කථා කරන්නේ නැහැ. මා විනිසුරුවරුන් ගැන කථා කරන්නම්. හොඳ විනිසුරුවරුන්ට මා පසඟ පිහිටුවා වඳින්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරුතර මහා සංඝ රත්නයට වාගේ පසඟ පිහිටුවා වඳින්න පුළුවන් හොඳ විනිසුරුවරුන් ලංකාවේ ඉන්නවා. ඒ අයගේ පඩි වැඩි කරන්න, ආරක්ෂාව වැඩි කරන්න, තව දීමනා දෙන්න, වරප්‍රසාද ලබා දෙන්න කියන යෝජනාවට අපි අත් දෙකම උස්සලා කැමැත්ත පළ කරන්නම්; අපි ඒ සඳහා පූර්ණ සහයෝගය ලබා දෙන්නම්. අපේ ලංකාවේ ඒ වාගේ නම් හදා ගත් හොඳ විනිසුරුවරුන් හිටියා. ගිහාන් කුලතුංග මහත්මයා, පද්මිණී එන්. රණවක ගුණතිලක මහත්මිය -එතුමිය තමයි ආර්.දුමින්ද සිල්වා මහත්මයාගේ නඩුව වාගේ බොහොම තීරණාත්මක නඩුවලදී බය නැතිව කෙළින්ම තීන්දුව ලබා දුන්නේ.-, ලංකා ජයරත්න මෙනෙවිය, වරාවැව මහත්මයා, ලලිත් ජයසූරිය මහත්මයා, නෙවිල් සමරකෝන් මහත්මයා, නිමල් ගාමිණී අමරතුංග මහත්මයා, විමල් දිසානායක මහත්මයා, හෙක්ටර් එස්. යාපා මහත්මයා, එෆ්.එන්.ඩී. ජයසූරිය මහත්මයා, ශිරානි තිලකවර්ධන මහත්මිය, යාපනයේ මහාධිකරණ විනිසුරු හැටියට කටයුතු කරන ඉලංචෙලියන් මහතා -තමුන් වෙනුවෙන් වෙඩි කාපු කොස්තාපල්වරයාගේ බිරිඳට ගිහිල්ලා දණ ගහලා වඳින්න තරම් එතුමා නිහතමානී වුණා.-, ශ්‍රී ස්කන්ධරාජා මහත්මයා, වසන්ත ජිනදාස මහත්මයා, අමේන්ද්‍ර සෙනෙවිරත්න මහත්මයා, ධම්මික හේමපාල මහත්මයා - කඩුවෙල උසාවියේ ඉඳලා දැන් බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩට මාරු කරලා තිබෙනවා.- වාගේ අයට අපි පසඟ පිහිටුවා වඳින්නම්. නමුත් අපට අනික් අය ගැන මෙහෙම හිතන්න පුළුවන්ද? මට දැනුම, තේරුම තිබෙන කාලයේ ඉඳලා මා අගවිනිසුරුවරු තුන් දෙනෙක් දැක්කා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අගවිනිසුරුවරු තුන් දෙනාගෙන් එක් කෙනෙක් තමයි, සරත් නන්ද සිල්වා. සරත් නන්ද සිල්වා කියන්නේ දූෂිත

[ගරු රන්ජන් රාමනායක මහතා]

පුද්ගලයෙක් කියා අපි කියන්න බය වෙන්න ඕනෑ නැහැ. වික්ටර් අයිවන් මහතා "නොනිමි අරගලය" කියන පොතේ ඒ ගැන ලියලා තිබෙනවා. "උසාවිය නිහඬයි" කියන film එකේ පවා එතුමා ගැන සඳහන්ව තිබෙනවා. ඒ තරම් මේ නීති ක්ෂේත්‍රය ගඳ ගස්සපු දූෂිත පුද්ගලයෙක් ඉතිහාසයේ පහළවෙලා නැහැ. එතුමා තමයි, රෝහිත බෝගොල්ලාගම මහත්මයා ඡන්ද අරගෙන අනික් පැත්තට පැන්නාම -පක්ෂ මාරු කළාම- ඒක සාධාරණීකරණය -justify- කරන්න තීන්දුව දුන්නු කෙනා. එතුමා තමයි කිව්වේ, "මම හිර ගෙදර යවන්න ඕනෑ කෙනාව රජ ගෙදර යැව්වා. මට සමා වෙන්න. මට සමා වෙන්න. මට සමා වෙන්න." කියලා. ඒ කාලයේ මහින්ද රාජපක්ෂ මහත්තයාව සුනාමි වංචාවට විරුද්ධව හිර ගෙදර යැව්වා නම් අද අපේ රට විශාල අගාධයකින් බේරා ගන්න තිබුණා. "අනේ! මට සමා වෙන්න." කියලා එතුමාම කිව්වා. තමුන් ලබා දුන්නු judgment එක ගැන එතුමාම වික්ෂෝපවෙලා ජනතාවගෙන් සමාව ඉල්ලුවා. මෙන්න, අගවිනිසුරුවන්ගේ භූමිකාව! මා මේ තර්කය ගොඩ නඟන්න යන්නේ මෙහෙමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අගවිනිසුරු කෙනෙක් එහෙම හැසිරෙනවා. එතුමා මේ දියවන්නාවේදී ඉතාම පොඩි ඇඳිවතක් ඇඳගෙන තවත් නීතිඥවරියක් එක්ක ඉඳලා අහු වුණා.

ඒක අහුවුණු පොලීසියේ මහත්මයාට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න වුණා. ඒ නීතිඥවරිය හඳුන්වා දුන්නේ එස්.බී. දිසානායක මහත්මයා කියලා ඒ මහත්මයාත් මට කිව්වා. අදත් එතුමිය සමඟ තමයි ඉන්නේ. මෙන්න මෙහෙමයි සරත් නන්ද සිල්වා මහත්මයා හැසිරුණේ. මට දැනුම්-තේරුම් තිබෙන කාලයේ ඉඳලා සරත් නන්ද සිල්වා හැසිරුණු විධියයි ඒ මම කිව්වේ.

ඊට පස්සෙ කවුද ආවේ? ශිරානි බණ්ඩාරනායක. එතුමිය වෙනුවෙන් මගේ මතය වෙනස්. නමුත්, මේ සභාවේ ඉන්න අනුර ප්‍රියදර්ශන යාපා මහත්මයා, ඩිලාන් පෙරේරා මහත්මයා, රාජිත සේනාරත්න මහත්මයා, විමල් වීරවංශ මහත්මයා ඇතුළු හයදෙනෙක් කිව්වා, එතුමිය "හොරක්" කියලා. ඕස්ට්‍රේලියාවේ වතු ගත්තා කිව්වා, accountsවල සල්ලි දමා ගත්තා කිව්වා. එතුමියට දූෂණ චෝදනා තිබුණා. ඒ තමයි දෙවැනියා. ඒ තමයි හිටපු අගවිනිසුරුවන් දෙදෙනෙකුගේ හැසිරීම.

ඊට පස්සේ ආවා, ඊටත් වඩා හොර ගෙඩියෙක්. කවුද? ඒ, මොහාන් පීරිස්. මොහාන් පීරිස් මොනවාද කිව්වේ ඇවිල්ලා? "ප්‍රගීත් එක්නැලිගොඩට වුණු දේ දෙයියෝ තමයි දන්නේ" කිව්වා. ඊට පස්සේ එතුමා ජනවාරි 8වැනිදා රෑ කරපු භූමිකාව මොකක්ද? ජනවාරි 9වැනිදා උදේ ලංකාවේ පළමුවැනි පුරවැසියාගේ එනම් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ගෙදරට ගියා. ජනාධිපතිතුමාමයි ඒ බව කියන්නේ. එතුමා කියනවා, පාන්දර එතුමාගේ ගෙදරට ඇවිල්ලා මොහාන් පීරිස් හිටපු අගවිනිසුරුතුමා කිව්වාලු, "මට නැවත අගවිනිසුරුකම දෙන්න. මම ඔබතුමාට කැමති විධියට තීන්දු - judgments - හදලා දෙන්නම්" කියලා. මෙන්න! අපි දැක්ක, මට දැනුම්-තේරුම් තිබෙන කාලයේ ඉඳලා හිටිය අගවිනිසුරුවරුන් තුන්දෙනාගේ භූමිකාව. තුන්දෙනාම දූෂිතයි; තුන්දෙනාටම දූෂණ චෝදනා තිබුණා. දැන් කොහොමද, අපි මේ අයට පසඟ පිහිටුවා වඳින්නේ? අපි කොහොමද, මේ අයට "ස්වාමීනි" කියලා කියන්නේ? අපි කොහොමද, මේ අයට "නඩුකාර උන්නාන්සේ" කියන්නේ? අපි කොහොමද, මේ අය ඉදිරිපිට කම්සයේ උඩ බොත්තම දමා ගන්නේ? ඇයි, අපි අධිකරණයේදී කතින්නේ නැතිව ඉන්නේ; කිව්සුම් අරින්නේ නැතිව ඉන්නේ; බෙල්ල හිර ගෙන භයෙන් ඉන්නේ? අපේ බදු මුදලින් පඩි ගන්න මේ අය කරන මේ දේවල් දැක දැක, අපි කොහොමද මේ අයට ගරු කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන හැදුණේ නැත්නම් අපේ රටේ ජනාධිපති වෙනස් වුණාට වැඩක් නැහැ; අපේ රටේ අගමැති වෙනස් වුණාට වැඩක් නැහැ; ආණ්ඩුව වෙනස් වුණත් වැඩක් නැහැ. මෙතැන තමයි හැම හොරෙක්ම ගිහිල්ලා හැංගෙන තැන. මේ තමයි කඩතුරාව. මේ අධිකරණයේ තමයි හැම හොරෙක්ම ගිහිල්ලා අන්තිමට හැංගෙන්නේ. අපට එතැන වෙනස් කර ගන්න වෙනවා; එතැන පිරිසිදු කර ගන්න වෙනවා. ඒකයි මම ප්‍රකාශ කළේ, "බහුතරය දූෂිතයි" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් ගෞතම බුදුරජාණන් වහන්සේගේ බෞද්ධ ධර්මයේ දේශනාවකිනුත් ආදර්ශ ගන්න පුළුවන්. උන්වහන්සේ ප්‍රකාශ කළා, "රජ අධාර්මික වුණාම, ඇමති මණ්ඩලය අධාර්මික වෙනවා; ඇමති මණ්ඩලය අධාර්මික වුණාම නිලමෙලා අධාර්මික වෙනවා; නිලමෙලා අධාර්මික වුණාම රටවැසියා අධාර්මික වෙනවා" කියලා. එහෙම බැලුවාම, අධිකරණ ක්ෂේත්‍රයේ 'රජ' කවුද? ' ඒ, අගවිනිසුරු. හිටපු අගවිනිසුරුවරුන් දූෂිතයි. එතකොට පොඩි උන් ගැන කවර කථාද? පොඩි අය මොනවාද කරන්නේ? හිටපු අගවිනිසුරුගේ ඉඳලා දීලා තිබෙන්නේ වැරදි පූර්වාදර්ශ. ඒවා දැකලා තමයි අර සරත් ආබෲ කියන බිහිසුණු, අමානුෂික, සල්ලාල විනිසුරුවරයා, මෙහෙකාරියක් දූෂණය කළේ; පොලීසියට ගැහුවේ. අන්තිමට කන පැළෙන්න බීලා බැල්කනියෙන් වැටිලා මළා. ඔන්න ඕක තමයි තත්ත්වය. අපි කොහොමද, ඒ අයට "ස්වාමීනි" කියලා වඳින්නේ? මම අර කලින් නම් කිව්ව විනිසුරුවරුන්ට අපි පසඟ පිහිටුවා වඳින්නම්. නමුත්, හැමෝටම එහෙම කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තනිව හිතා නොවෙයි, "බහුතරයක් විනිසුරුවරුන් දූෂිතයි" කියලා කිව්වේ. පොත් පත් කියවලා, ප්‍රසන්න විතානගේ මහත්මයාගේ 'උසාවිය නිහඬයි' කියන film එක බලලා, 'නොනිමි අරගලය' පොත කියවලා, 'රාවය' පත්තර බලලා, ඒවා පදනම් කර ගෙනයි මම එහෙම කිව්වේ.

මම මේ කාරණය ගැන ජනමාධ්‍යයට අභියෝග කරනවා. ජනමාධ්‍යවේදීන්ට පුළුවන් නම්, උසාවියක් අවසන් වෙලා එළියට එන නඩුවක පාර්ශවකරුවෙක් ඉදිරිපිට mike එකක් තියලා නිකම් අහලා බලන්න, "තමුන්නාන්සේ ලංකාවේ අධිකරණය ගැන මොනවාද හිතන්නේ?" කියලා. අම්මමෝ! නැතිව කියයි, අපි කියන්න ඕනෑ නැහැ. මේ ස්ථානය එපමණකටම පීඩිතයාව, දුබලයාව, අහිංසකයාව, දුප්පතාව පීඩනයට පත් කරන්න හදපු තැනක් කියලා මම නිර්භයව කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් අයට "අපේක්ෂිත ඇප" - anticipatory bail - තිබෙනවා. අර අඹ ගෙඩි තුනක් කඩා ගත්ත අම්මාට කවදාවත් බැහැ නේ, රොමේෂ් ද සිල්වාගේ සේවය ලබා ගන්න. එයාට බැහැ, රියෙන්සි අර්සකුලරත්නගේ සේවය ලබා ගන්න; කාලිංග ඉන්ද්‍රතිස්ස මහත්මයාගේ සේවය ලබා ගන්න. ඒගොල්ලෝ ඉහළ ගාස්තුවක් අය කරනවා. ඒ නිසා අර අහිංසක අම්මා රිමාන්ඩ් බන්ධනාගාරයට යනවා. පොල් ගෙඩි හයක් ගත්ත කෙනාට ලොකු නීතිඥයෙක් අල්ලන්න බැහැ; මුදල් නැහැ. සීගිරියේ කුරුටු ගී සුරපු ළමයාට ලොකු නීතිඥයෙක් අල්ලන්න බැහැ; මුදල් නැහැ. ඒ සේවය මුදල් මතයි තිබෙන්නේ. Highest-paid lawyersලා තමයි මේක පාලනය කරන්නේ. ඒ අය විනිසුරුවරුන් එක්ක "ඩීල්" දාගෙන තිබෙනවාය කියනවා. මේක හරිම පුදුමාකාර තත්ත්වයක්! මම හිතනවා, අපි මේ ගැන විශේෂයෙන්ම සොයා බැලිය යුතුයි කියලා. ඒ අය ස්වේච්ඡාවෙන්, තමුන්ගේ හදවතට එකඟව හැදෙන්නේ නැතුව, අධිකරණ වැඩිපුර පිහිටෙව්වත්, හිර ගෙවල් වැඩිපුර හැදුවත්, මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව 75 සිට 110 දක්වා වැඩි කළත්, මොන පනත් කෙටුම්පත pass කළත් වැඩක් වෙන්නේ නැහැ කියන එකත් මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

සරත් එන්. සිල්වා මහත්මයා එක වතාවක් කියපු කථාව මම කිව්වා. එතුමා කිව්වේ, " හිර ගෙදර යවන්න ඕනෑ කෙනාව මම රජ ගෙදර යැව්වා" කියලා. ඒ වාගේ අවංක ප්‍රකාශයක් කළාට, එතුමාට ස්තුතියි. හැබැයි, ඒක මෙහෙම කිව්වා නම් තවත් හොඳයි. "මම හිර ගෙදර යවන්න ඕනෑ දේශපාලනඥයන්ව අද පාර්ලිමේන්තුවට එව්වා" කියලා. මොකද, මෙතැන කෑ ගහන ගොඩක් දෙනා දැන් ඉන්න ඕනෑ හිරේ. ඒගොල්ලන්ට කොහොමද අපේක්ෂිත ඇප - anticipatory bail - ලැබෙන්නේ? ඒ ගැන ජනතාව කථා වෙනවා. ඒ කියන්නේ, අහිංසකයන්ව විතරයි හිර ගෙදර යවන්නේ; ලොකු ලොකු අය යවන්නේ නැහැ කියලා. හිටපු ලොකු මහත්තයෙක් කියනවා, "මාව අත් අඩංගුවට ගන්න එපා" කියලා. කෝටි ගණනක් හොරකම් කරපු ගාමිණී සෙනරත් නැමැති හොරා කියනවා, "මාව අත් අඩංගුවට ගන්න බැරි වන විධියට anticipatory bail ගන්නවා" කියලා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා නඩුව එන්න ඉස්සර වෙලා අපේක්ෂිත ඇප ගන්නවා. ඒ කාලයේ එතුමා ගල්කිස්ස උසාවියට යද්දි උසාවිය ඇතුළට වාහන ගන්න බැහැ; lawyersලා එළියේ ඉන්න ඕනෑ. එයාගේ ආරක්ෂාව නිසා කියලා ආරක්ෂක ලේකම්තුමා විතරයි ඇතුළට යන්නේ. මෙන්න මෙහෙමයි ඒ කාලයේ කළේ. මේ විධියට තමයි අධිකරණය දූෂිත වෙලා තිබුණේ. මම ඒ නිසා පසඟ පිහිටුවලා වැඳලා මේ අධිකරණයට සම්බන්ධ සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා, පීඩිත හා දුප්පත් පන්තියේ ජනතාවට මේ වාගේම ආදරය කරන්න, ගෞරව කරන්න කියලා. මොකද, අපි සියලුදෙනා ජනතා සේවකයන්. අපි සියලුදෙනා පඩි ගන්නේ හාල් සේරුව, පරිප්පු කිලෝ එක, සැමන් ටින් එක ගන්න ඒ මිනිසුන් ගෙවන මුදලේ ඇතුළත් tax එකෙන්. කවුරුත් සර්වබලධාරි නැහැ. අපි ප්‍රතිපත්තිවලට ගරු කරන්නම්. අපි තනතුරුට, "Sir" කියන්නම්; "ස්වාමිනී" කියන්නම්; "හාමුදුරුවනේ" කියන්නම්. ඕනෑ දෙයක් කියන්නම්. හැබැයි, අපෙන් "ස්වාමිනී" කියලා අහගන්න, අපෙන් "Sir" කියලා අහගන්න, අපෙන් "හාමුදුරුවනේ" කියලා අහගන්න වැදගත් විධියට ජීවත් වෙන්න කියලා මම විනිසුරුවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. හැබැයි, හැමෝගෙන්ම නොවෙයි.

පසුගිය දවස්වල අපි අහගෙන සමහරු කියනවා, 'ඩීල්' දාන නීතිඥයන් ඉන්නවා කියලා. මම ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාට තවත් යෝජනාවක් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නීතියේ ස්වාධිපත්‍ය පිහිටුවන්න නම්, නීතිය පිරිසිදු කරන්න නම්, අධිකරණය පිරිසිදු කරන්න නම් අපි කියනවා, විනිසුරුවරුන් ගැන විතරක් නොවෙයි; විනිසුරුවරු සමඟ 'ඩීල්' දාන නීතිඥයන් ගැනත් හොයන්න කියලා. නීතිඥවරු මා එක්ක තරහා වෙන්න එපා. තරහා වුණත් කමක් නැහැ. මම පැහැදිලිව කියනවා, නීතිඥයන් අද කෝටි ගණන් මුදල් හොයන බව. දේශපාලනඥයන් හොරකම් කරපු සල්ලිවලින් වැඩි ප්‍රමාණයක් හොරකම් කරන්නේ නීතිඥවරු. නඩු දිනයක් ගත්තත් Rs. 1 million, Rs. 2 million ගන්නවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එකක් කියන්න කැමැතියි. "ෂරී ආ" නීතිය තිබෙන සවුදි අරාබියේ වාගේ මේවා blood money; මේවා ලේ සල්ලි. මේවා අරගෙන යා දෙන්නේ නැහැ. තමුන්ගේ සේවාදායකයා මොන හොරා වුණත්, තමුන්ගේ සේවාදායකයා මිනීමරුවා වුණත්, මේ lawyersලා කියනවා, "He is my client. I have to protect him" කියලා. ඒ කියන්නේ මේ අයට සල්ලි දෙනවා නම්, ප්‍රභාකරන්වත් බෝධිසත්වයෙක් කරයි; හිට්ලර්වත් බෝධිසත්වයෙක් කරයි. තමුන්ගේ මවට අතවර කරපු විත්තිකරුවා ඇවිත් සල්ලි දීලා, "මම ඔබගේ මව සමඟ ප්‍රේම කළා. අනේ! මාව බේරා ගන්න" කිව්වත්, මේ දුෂ්ට නීතිඥවරු මේ අය බේරා ගන්නේ නැද්ද? තමුන්ගේ මව දූෂණය කරපු කෙනාව බේරා ගනීවි, සල්ලිවලට. මොකද, "I have to protect my client" නේ. මගේ සේවාදායකයාව මම ආරක්ෂා කළ යුතුයි නේ. ඒ වාගේ තත්ත්වයක් තිබෙන්නේ.

ඒ නිසා මම අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමාටයි, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාටයි, අධිකරණ ඇමතිනී තලතා අතුකෝරල මැතිතුමියටයි යෝජනාවක් කරනවා. පසු ගිය කාලයේ යෝජනාවක් ආවා, ත්‍රීවීලර් රියැදුරන්, තමුන්ගේ සේවාදායකයාට රිසිට් පතක් නිකුත් කරන්න කියලා. ත්‍රීවීලර් රියැදුරන් 2018 ජනවාරි 01වැනි දා සිට තමුන්ගේ සේවාදායකයාට අදාළ ගාස්තුව වෙනුවෙන් බිලක් දෙන්න කියලා මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත වුණා. අපේ සේවාදායකයන් ගෙවන ගණන්වලටත් මේ lawyersලා බිලක් ලබා දෙන්න කියලා, මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් ගෙනැල්ලා අපි සියලු දෙනාම අත ඔසවලා සම්මත කර ගනිමු කියා මම ඉල්ලා සිටිනවා. මොකද? දවසකට Rs. 2 million, Rs. 3 million ගන්න අයත් ඉන්නවා. මේවා කිව්වාම මා එක්ක නීතිඥ මහත්වරු තරහා වෙයි. මම සියලුදෙනා ගැනම නොවෙයි කියන්නේ. නමුත් මේ විධියට කොල්ල කන්න හොඳ නැහැ කියන එක හොරු පවා මට ඇවිල්ලා කියලා තිබෙනවා. හොරු මේ සල්ලි දෙන්නේ කැමැත්තෙන් නොවෙයි. "හොරු" කියලා ජාතියක් ඉන්නවා නේ. හොරු හොරකම් කරලා තිබෙන්නේ, මාස ගණන් හොඳට සැලසුම් හදලායි. බලන්න, හොරා කොච්චර මහන්සි වෙනවාද කියලා. තනියෙන් නොවෙයි, කණ්ඩායම ඇවිල්ලා සාකච්ඡා පවත්වනවා. සාමාන්‍යයෙන් මංකොල්ලයක් කන්න ඉස්සෙල්ලා පෙරහුරුවකුත් කරනවා. නමුත් නීතිඥයා නිකම්ම ඉඳලා පහුවදාම ලක්ෂ 10කට විතර කෙළිනවා නේ. එහෙම බලන කොට කවුද ලොකුම හොරා? නිකම් හිතන්න. හොරාගෙනුත් හොරකම් කරනවා නේ. සමහර අපරාධකාරයන් නීතිඥයන්ට සල්ලි ගෙවන්නේ හිතේ ආසාවෙන් නොවෙයි; ඇඟෙන් කැල්ලක් යනවා වාගේ. හොරුන් කියනවා, "ජීවිතය පරදුවට තියලා හොරකම් කරපු සල්ලිවලට නේ මූ කෙළින්නේ" කියලා; "හෙණ ගහනවා" කියලා කියනවා. නීතිඥ මහත්වරුන්ට හෙණ ගහන්න ඕනෑ කියලා කියනවා; මුඛ පිළිකා හැදෙන්න ඕනෑ කියලා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසාවියේදී බයිබලයට අත තියලා දිවුරනවා මම දැකලා තිබෙනවා. "මම කියන දේ සත්‍යයක් බවටත්, මා කියන්නේ අසත්‍යයක් නොවන බවටත්" කියලා දිවුරනවා. දිවුරලා මූ කියන්නේම බොරු. නීතිඥයාත් බොරු කියනවා. ඒක විනිසුරුවරයාත් දන්නවා. නිකම් හිතන්න, නීතිඥ මහත්වරු ලංකාවේ මිනිසුන් රවට්ටන රැවටිල්ල ගැන. දෙකේ පන්තියේ ළමයින්ට කියන බොරු නේ කියන්නේ. ඩෙයි ආච්චි මැණික් මල්ලක් ගෙනාවාලු. මැණික් මල්ල අරගෙන, මුදලාලි කෙනෙක් සල්ලි මල්ලක් දුන්නාලු. මේවා විශ්වාස කරලා ඇප දෙන විනිසුරුවරු ලංකාවේ ඉන්නවා නේ, දෙයියනේ! ඕනෑම මනුස්සයෙක් දන්නවා නේ, මේ ගැන.

මට විරුද්ධව නඩු දාලා තිබෙන යූ.ආර්. ද සිල්වා මහත්මයා බැසිල් රාජපක්ෂ මහත්තයාගේ නීතිඥයා. මල්වානේ තිබෙන බංගලාවට දැන් අයිතිකාරයෙක් නැහැ. බංගලාව තිබෙනවා. ඒ වෙනුවෙන් පෙනී හිටපු මිනිස්සු තමයි මේ. මේ අය තමයි අද සුද්ධෝදනලා වෙලා, බෝධිසත්වයන් වාගේ මේ වැඩ කරන්නේ. මම ඒ නීතිඥ මහත්වරුන්ට කියන්නේ, "ඔය මුදල් යා දෙන්නේ නැහැ. ඔබලා කොල්ල කන්නේ, අහිංසක මිනිසුන්ගේ ලේ සල්ලි; අහිංසක මිනිසුන්ගේ දාඩිය; අහිංසක මිනිසුන්ගේ මහන්සිය" කියලායි. මේ අයගෙන් සමහර අයගේ ගෙවල්වලට මම ගිහිල්ලා තිබෙනවා. මාළිගා - palaces - වාගේයි. ඒවා හදන්න සල්ලි හෙව්වේ කොහොමද කියලා දන්නේ නැහැ. විජයදාස රාජපක්ෂ මහත්තයා -මට සමාවෙන්න- කවදාවත් එතුමා ගෙදර ඉඳගෙන පුවත් පත්වලට interview එකක් තියන්නේ නැහැ. මාධ්‍යවේදියෙක් පුවත් පත් සාකච්ඡාවට එන්න ඇහුවාම මේ අය ගෙදරට එන්න කියන්නේ නැත්තේ ඇයි? මම නම් මාධ්‍ය සාකච්ඡා තියන කොට මාදිවෙල මන්ත්‍රී නිවාසයේ 'ඒ - 5' ට එන්න කියනවා. මට ගෙයක් නැහැ. මම ඉන්නේ ඒ විධියට කියලා කවුරුත්

[ගරු රන්ජන් රාමනායක මහතා]

දන්නවා. නමුත් ඔය ලොකු ලොකු දේශපාලන නායකයෝ, lawyersලා කවදාවත් ගෙදර meetings තියන්නේ නැහැ. ගෙදරට එන්න කියන්න බැහැ. මුන්ගේ හොරකම් ටික අහුවෙනවා. ගහලා තිබෙන ගැහිල්ල අහුවෙනවා. ඒක තමයි තත්ත්වය. කවදාවත් මේ සල්ලි යාදෙන්නේ නැහැ. මේවා අහිංසක මිනිසුන්ගේ සල්ලි කියන එක මම බොහොම පැහැදිලිව කියනවා.

හොඳ නීතිඥවරු ඉන්නවා. නුවර, අප්තාර් ජමීල් කියලා නීතිඥ මහත්මයෙක් ඉන්නවා. එතුමා අය කරන ගණනට හැම දාම බිලක් දෙනවා. රුපියල් 10,000ක් අය කරනවා නම් ඒ ගණනට බිලක් දෙනවා. සුමන්තිරන් මහත්තයා - මාගේ lawyer මහත්තයා - සත පහක්වත් ගන්නේ නැහැ. හොඳ නීතිඥ මහත්වරු ඉන්නවා. අපේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා නීතිඥයෙකු හැටියට පෙනී ඉඳලා විත්තිකාරයෙකු නිදහස් කර ගත්තා; මිනී මරුවෙක් නිදහස් කර ගත්තා. මොකක්ද එතුමා කළේ? මගේ ළඟ ඒ විස්තරය තිබෙන පත්තර කෑල්ල තිබෙනවා. එතුමා මොකක්ද කළේ? ඒ පත්තරයේ සඳහන් වෙනවා, "අත්තනගල්ලේ සිදු වූ මිනී මැරුම් සිද්ධියකට විත්තිය වෙනුවෙන් පෙනී සිටි බණ්ඩාරනායක මහත්තයා සැකකරුවෝ නිදහස් කර ගත්තා. හැබැයි, එය වෘත්තිමය ජයග්‍රහණයක් විතරයි. බණ්ඩාරනායක මහත්මයා මැරුණු කෙනාගේ පවුලේ උදව්යට ජීවත් වෙන්න ඉඩම් කට්ටියක් ලබා දීලා නීතිඥ රස්සාව අත හැර දැම්මා." කියලා. ඒ කවුද? එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා. අද නීතිඥවරු එහෙම කරයිද, එක දිගට හම්බ කරයිද කියලා තමුන්නාන්සේලා කවුරුත් දන්නවා.

පිට රට අධිකරණ කිසිම බයක් නැතිව ලූලා ද සිල්වා කියන මහා දේශපාලනඥයාව අවුරුදු ගණනාවකට හිරේට යැව්වා. පාකිස්තානයේත් ඒක වුණා. ඇයි, අපේ අධිකරණයේ අය මේ දේශපාලනඥයන්ට බය? මම අහන්නේ ඒකයි. ඇයි එහෙම වන්නේ? එහෙම වෙන්න හොඳ නැහැ. ඇමෙරිකාවේ බිල් ක්ලින්ටන් පවා උසාවියට ගෙන්නුවා. එයා උසාවියට ඇවිත්, අඬලා ඇමෙරිකාවේ ජනතාවගෙන් සමාව ගත්තා. මම මේ කිව්ව කථාවම පසු ගිය 21වැනි සෙනසුරාදා උදේ 9.30ට සිට 4.30 දක්වා කාලය අතරතුර සුප්‍රීම් උසාවියේ, Ceremonial Hall එකේදී අගවිනිසුරු ඩෙප් මහත්මයාත් කිව්වා. "නීතිඥයන්ට විරුද්ධව චෝදනා තිබෙනවා; විනිසුරුවන්ට විරුද්ධව චෝදනා තිබෙනවා" කියා අගවිනිසුරු ඩෙප් මහත්මයා කිව්වා. ඒ කථාව පුවත් පත්වල වාර්තා වුණා. එහෙම නම් ඔහුවත් අත් අඩංගුවට ගන්න වෙනවා. මොකද, අගවිනිසුරු ඩෙප් මහත්මයාත් අධිකරණයට අපහාස කර තිබෙනවා. මේ දේවල් වෙනස් කරන්න අප එකතු වෙන්න ඕනෑ; ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ පනත් සම්මත කරගන්න ඕනෑය කියන කාරණය මම තමුන්නාන්සේලාට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "රාවය" පුවත් පතේ හොඳ කථාවක් පළ වෙලා තිබුණා. ඒ මෙන්න මේකයි:

> "උසාවි කටයුතු සිදුවන අවස්ථාවකදී උසාවියේ අසුන් ගෙන සිටි පුද්ගලයකුට හඬ නඟා ඇනුමක් යෑමේ වරදට එය උසාවියට අපහාස කිරීමක් ලෙස සලකා ඇනුම ඇරිය පුද්ගලයාට මාස අටක සිර දඬුවමක්."

ඇනුමකට මාස අටක සිර දඬුවමක්! මේ දිනය කවදාද? 2015 නොවැම්බර් 29වැනි දා. වාර්තා කර තිබෙන්නේ වික්ටර් අයිවන්. ඕනෑ නම් නඩු දමන්න පුළුවන්. මේක සිද්ධ වෙලා තිබෙන්නේ ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් හිතලා බලන්න. ඇනුමකට මාස අටක සිර දඬුවමක්. ඇනුමක් කියන්නේ මොකක්ද? ස්වාභාවිකව යන දෙයක්. තව දෙයක් ගියොත් කොහොම කරයිද දන්නේ නැහැ. විජිත හේරත් මන්ත්‍රීතුමාත් මේ ගැන කිව්වා. පොඩි දේවල්වලට තමයි මෙහෙම කරන්නේ. නමුත් ලොකු ලොකු අයට කොහොමද? හැම දාම අහු වන්නේ හාල්මැස්සෝ, කුනිස්සෝ. තෝරු, මෝරු කවදාවත් අහු වන්නේ නැහැ. මොකද, ඒ අයට සල්ලි තිබෙනවා. ඒක තමයි මෙතැන වන්නේ. ඒ නිසා මම ජනමාධ්‍යයටත් මේ කාරණය කියනවා. ජනමාධ්‍ය සොයුරනි, ඔබලා මේ ගැන හිතන්න. මේ කථාව අසා සිටින සියලුම ජනතාවටත් මම මේ කාරණය මතක් කරනවා.

අපේ මුතුන් මිත්තන්ගේ කාලයේ සිට අපට අහන්න ලැබුණේ මොකක්ද? "ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටකි" කියා තමයි අපේ මුතුන් මිත්තෝ කිව්වේ. ඊට පසුව අපේ ආච්චිලා සීයලා මොකක්ද කිව්වේ? ඔවුනුත් කිව්වා, "ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටකි" කියලා. දැන් අපි කියන්නේත්, "ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටකි" කියලා නේ. අපේ දරුවන්ට කියන්න වන්නේ මොකක්ද? ඔවුන්ට කියන්න වන්නේත්, "ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටකි" කියලා තමයි. මොකක්ද හේතුව? හේතුව වෙන මොකක්වත් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩු වෙනස් වුණත්, ජනාධිපතිවරු වෙනස් වුණත්, පාර්ලිමේන්තුව වෙනස් වුණත්, අතැනින් තමයි බේරෙන්නේ. සියලුම හොරු ටික ගිහින් නීතිපති දෙපාර්තමේන්තුවේදී සහ අධිකරණයේදී ගැලවෙනවා. තමන් මොන දූෂණය කළත්, මොන හොරකම කළත්, මොන මිනීමැරුම කළත් හොඳ highest-paid lawyer කෙනෙක් අල්ලලා බේරෙන්න පුළුවන් බව ඒ අය දන්නවා. ඒ මතය දැන් ජාත්‍යන්තරයටත් ගිහින් ඉවරයි. මෙන්න මේ කාරණය ගැන නිකම් හිතා බලන්න. නාමල් රාජපක්ෂ මහත්මයාගේ සුරූපී ලේකම්ට ජාත්‍යන්තර වරෙන්තුවක් එනවා; Dubai Airport එකේදී Red Notice එකක අහු වෙනවා; මහා උජාරුවෙන් එයා අල්ලාගෙන එනවා; මෙහේ Airport එකට දොලවත්ත කියන නීතිඥ මහත්මයාත් යනවා; පොලීසියත් එනවා. අපේ ජනතාව බොහොම සතුටින් ඉන්නවා. "ෂා, මෙයා අවුරුදු ගණනකට හිරේට යවයි, මොකද මිලියන 60ක ලොකු මුදලක් නේ" කියලා ජනතාව හිතනවා. අනේ, පැය භාගෙන් එයා එළියට එනවා. මොකද, විනිසුරුවරයා රජයේ නීතිඥවරයාගෙන් අහනවා, "මැයට ඇප දීමට ඔබ විරුද්ධද?" කියලා. ඔහු නැඟිටලා කියනවා, "අනේ නැහැ ස්වාමීනි, කිසි ප්‍රශ්නයක් නැහැ" කියලා. අන්න එයාට ඇප දෙනවා. පොල් ගෙඩි හය ගත්ත කෙනාට නීතිඥ මහත්වරු ඒක කරයිද? සාමාන්‍යයෙන් කුකුළෙක් හොරකම් කළ මිනිහෙකුට, ඇනුමක් ඇරිය මිනිහෙකුට නීතිඥ මහත්වරු එහෙම කරයිද? මේ සියලු දේවල් පැවතෙන්නේ මුදල් මතයි. හොඳ අධිකරණයක් හදා ගත්තොත් අපට ලංකාව සුර පුරයක් කරගන්න පුළුවන්. දියුණු රටවල් ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ නීතියක් තිබෙන නිසායි. ඒ රටවල නීතිය රජාටත් එකයි, හිඟන්නාටත් එකයි; ජනාධිපතිටත් එකයි, සාමාන්‍ය පුරවැසියාටත් එකයි. එතකොට ජනතාව නීතියට බයයි. දියුණු වන හැම රටක්ම සුර පුරයක් බවට පත් වෙලා තිබෙන්නේ ඒ රටවල පිරිසිදු අධිකරණයක් තිබෙන නිසායි. කා එක්කවත් තිබෙන තරහකට නොවෙයි, පිරිසිදු අධිකරණයක් නිර්මාණය කර ගන්නයි අප සියලුදෙනා එකතු වෙන්න ඕනෑ වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙත් නඩු දමලා තිබෙන්නේ හතරදෙනාටයි කියලා අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී කිව්වා. හතර දෙනාටලු නඩු දාලා තිබෙන්නේ! නඩු දාහත්දාහක් තිබෙනවාලු. වැරදිකරුවන් වෙලා තිබෙන්නේ හතර දෙනායි. මේ වාගේ දේවල් ගැන ජනතාව දැනුවත් විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන්නේ නීතිය ගැන ප්‍රාථමික දැනුමක් තිබෙන අහිංසක ජනතාව. මට නීතිය ගැන පෘථුල දැනුමක් නැහැ. අපි ඒ ලොකු ලොකු බර වචන දන්නේ නැහැ. සමහර විට අපේ ගමේ ඉන්න සාමාන්‍ය

මනුෂ්‍යයෙක් "යුෂ්මතා" කියන වචනයවත් දන්නේ නැහැ. අනේ! ඒ අය අහිංසකයි. ඒ උසාවියේදී අය වෙවුලනවා. ඒ අයට නොයෙකුත් නීති දාලා තිබෙනවා. ඒ අයට උසාවියේදී කෙළ ගිලින්න බැහැ; ඇනුම් අරින්න බැහැ. ඒ අය එතැනදී භය වෙලා ඉන්නේ. මේ භය වීම නවත්වන්න. අපි අන්තර්ජාලය හරහා දැක්කා, ඇමෙරිකාවේ විනිසුරුවරයෙක් හැසිරෙන හැටි. ඒ අය කොච්චර මානුෂිකද? කොච්චර humane ද? ඒ විනිසුරුවරයා high-speed ගිය මවකගෙන් අහනවා, "ඔබගේ දරුවා මම උකුලේ වාඩි කරවා ගත්තාට කමක් නැද්ද?" කියාලා. එහෙම අහලා දරුවාට කියනවා, "ඔබගේ මවට මම දඬුවම් දෙන්නේ නැහැ, හැබැයි ඔබගේ මව ඔබ breakfast එකට ගෙනියන්න ඕනෑ" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒ වාගේ විනිසුරුවරයෙකු ගැන පොඩ්ඩක් අධ්‍යයනය කරන්න. [බාධා කිරීමක්] ඒ වාගේ විනිසුරුවරයෙකු ගැන අධ්‍යයනය කර, ඒ විධියට හැසිරෙන්න කියලා මම කියනවා.

මට තව විනාඩි පහක කාලයක් ලැබුණා. TNA එකේ මන්ත්‍රීවරුත් ඇවිත් නැහැ. එතුමන්ලාත් කිව්වා මට කාලය ගන්න කියලා. මට දුරකථන ඇමතුමකින්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි පහකින් කථාව අවසාන කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ටීඑන්ඒ එකේ මන්ත්‍රීවරු අද ඇවිත් නැහැ. එතුමන්ලාත් කිව්වා මට ඒ කාලය ගන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ටීඑන්ඒ එකට වෙන් කරපු වෙලාව අවසානයි. ඔබතුමා තව විනාඩි පහකින් කථාව අවසාන කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරත් ආබෲ ගැන කථා කරමු. සරත් ආබෲ බීලා බැල්කනියෙන් වැටිලා මිය ගියාට, එයා නිසා අගතියට පත් වූ ජනතාව, ඒ දූෂණයට ලක් වූ මෙහෙකාර අයගේ පවුල් තවම ජීවත් වෙනවා. ඒ වාගේම සරත් එන් සිල්වා මහත්මයා කරපු විනිශ්චය පිළිබඳව එතුමා සමාව ඉල්ලුවා. එතුමා දීපු judgmentsවලට සමාව ඉල්ලුවාට විතරක් මදි. ඒවායින් අගතියට පත් වූ අය ගැන සොයා බලන්න ක්‍රමවේදයක් අවශ්‍යයි කියන එක මම අධිකරණ ඇමතිතුමියට යෝජනා කරනවා. විනිසුරුවරයා වැරදි නඩු තීන්දු දුන්නා; විනිසුරුවරයා බීලා වැටුණා; විනිසුරුවරයා බීලා මළා. නමුත් එයා නිසා අගතියට පත් වූ ඒ පාර්ශ්වය තවම ඉන්නවා. ලෙනින් රත්නායක කියන පුද්ගලයා, ඒ විනිසුරුවරයා උසාවියේ චේම්බර් එකේදී අහිංසක කාන්තාවක් දූෂණය කරනවා. ඔහු අද ගමේ බොහොම සුවදායක ජීවිතයක් ගත කරනවා. ඒවා ගැන මොකුත් මේ අධිකරණ සේවා කොමිසමෙන් කරන්නේ නැද්ද? ඒ සියලු දේවල් දැක දැක මේ අය නිහඬව ඉන්නවා. මේ අය අල්ලා ගන්න ඉන්නේ අධිකරණය දූෂිතයි කියපු රන්ජන් රාමනායක විතරද?මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගෙනෙන සියලු කෙටුම්පත් හොඳයි. ඒ දේවල් වෙන්න ඕනෑ. නමුත් කළ යුතු තවත් බොහෝ දේවල් තිබෙනවා. ගරු ජයම්පති වික්‍රමරත්න මැතිතුමා කිව්වා වාගේ විනිසුරුවරයන්ගේ "කොලිටිය" හදා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේ මේ කාරණය බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. කුඩු කාරයන්ට, මිනීමරුවන්ට සෘජු නඩු තීන්දු දුන්න විනිසුරුවරු හිටියා. සර්ත් අබේපිටිය මහත්මයා පොට්ට නවුෆර්ගේ නඩුවේදී කෙලින්ම ඔහුට මරණීය දඬුවම දුන්නා. මොකක්ද එතුමාට අත් වුණු ඉරණම?

මට පසු ගිය දිනවල විනිසුරුවරියක් කථා කළා. ඒ විනිසුරුවරිය කුඩුකාරයෝ දෙන්නෙකු ගැන තීන්දුවක් දුන්නා. ඒ තීන්දුව දෙද්දී කුඩුකාරයෝ දෙන්නා විත්ති කූඩුවේ හිටියේ විනිසුරුවරියට රව රවා. එතුමිය භයෙන් ගෙදර ගිහින් තිබෙන්නේ; එතුමියට ආරක්ෂාවක් නැහැ. එතුමියට පිහියකින් දමලා ඇන්නොත්, ඇසිඩ් ටිකක් ගැහුවොත් මොකද වෙන්නේ අර අඹන්වල මහත්මයාට වාගේ? ඒ වාගේ තත්ත්වයක් තමයි අද ලංකාවේ විනිසුරුවරුන්ගේ ජීවිතවලට තිබෙන්නේ. ඒ නිසා හොඳ විනිසුරුවරු බිහි කරන්න, ගරු ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා වාගේ "කොලිටි" විනිසුරුවරුන් බිහි කරන්න සමාජයේ අපි සියලු දෙනා එකතු වෙන්න ඕනෑ. ඒ දේ වනතුරු මේ පනත් කෙටුම්පත් මොන තරම් ආවත් හරි යන්නේ නැත කියන එකයි මගේ මතය. ඒ නිසා අපි සියලු දෙනා එකතු වෙලා එවැනි හොඳ දේවල්වලට අත ඔසවමු.

නීතිඥ සංගමයේ මහත්වරුන්ට මා නැවතත් මේ කාරණය කියන්න කැමැතියි. මා ඉදිරිපත් කළේ මේ රටේ පොදු ජනතාවගේ මතයයි; පොදු ජනතාවගේ අඳෝනාවයි. නීතිපති උපදෙස්, රස පරීක්ෂක වාර්තා නැති තවත් කුඩු සම්බන්ධ නඩු දාසයදහසක් පමණ තිබෙනවාය කියනවා. ඉතින් මෙවැනි ආකාරයට අන්තයටම දූෂිත වුණු තත්ත්වයක තමයි ලංකාවේ අධිකරණය තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නීතිය හැම දාම ක්‍රියාත්මක වුණේ අහිංසක, දුප්පත්, පීඩිත පන්තියේ ජනතාවට පමණයි. ඒ තුළින් තළා පෙළා දැම්මේ ඒ ජනතාව පමණයි. හැම දාම අපරාධකරුවන්, වැරදි කරපු දේශපාලනඥයන්, ආගමික නායකයන් බේරුණා. ඒ නිසා තමයි අද මේ පාර්ලිමේන්තුවේත් මෙච්චර ශබ්දයක් තිබෙන්නේ. අද පාර්ලිමේන්තුවට එන අපරාධකාරයන් කෑ ගහනවා; "උඹලා අප අත්අඩංගුවට ගත්තාද" කියලා අහලා හිනා වෙනවා. මා නැවත නැවතත් මේ කරුණ කියනවා. අධිකරණය කියන ගෞරවනීය දේවාලයට පුළුවන්, මේ මුළු ශ්‍රී ලංකාවම සුරපුරයක් කරලා අපේ මුතුන් මිත්තන් කියපු කථාව නොකියා, "ශ්‍රී ලංකාව දියුණු වුණු රටකි" කියලා කියන්න. අපේ අධිකරණයට පුළුවන් අපේ රට ඒ තත්ත්වයට ගෙනෙන්න. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ ජර්මනියේ, එංගලන්තයේ, ඇමෙරිකාවේ, පින්ලන්තයේ තිබෙනවා වාගේ සුපිරිසිදු, හොඳ අධිකරණයක් වාගේම හොඳ විනිසුරුවරුන් පිරිසක්.

ඒ විතරක් නොවෙයි. නීතිඥ මහත්වරුන්ද සේවා දායකයා වෙනුවෙන් වැරදි දේ කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් විතරක් කරුණු කිහිපයක් කියන්න මට ඉඩ දෙන්න. ළඟදී දවසක 'වෙඩින්' එකකට ගිය වෙලාවේ මට හමු වුණා, ජනාධිපති නීතිඥ මහත්මයෙක්. ඒ වෙලාවේ මා අත්

[ගරු රන්ජන් රාමනායක මහතා]

දෙක එකතු කරලා වැදලා එතුමාට කිව්වා, "අනේ! සර්, ඔබතුමා පෙනී සිටින්නේ මිනීමරුවකු වෙනුවෙන්. ඔය දේ කරන්න එපා" කියලා. ඒ විතරක් නොවෙයි. මා ඇහුවා, "ඒ පුද්ගලයා මිනීමැරුම කළ බව සර්, දන්නවාද?" කියලා. එතකොට එතුමා කිව්වා, "රන්ජන්, client ඇවිත් මගේ මේසය ඉස්සරහා ඉඳගෙන විනාඩි 05ක් කථා කරද්දී, ඒ මනුෂ්‍යයා ඒ මිනීමැරුම කළාය කියන එක මා දන්නවා" කියලා. එතකොට මා ඇහුවා, "එහෙම නම් ඒ මිනීමරුවා බේරන්න ඔබතුමා උගුර ලේ රස වනතුරු උසාවියේ කෑ ගහන්නේ ඇයි?" කියලා. එතකොට එතුමා කිව්වා, "ඒක මගේ ජොබ් එක" කියලා. එතකොට මට එතුමාගෙන් අහන්න හිතුණා, කුලියට මිනී මරණ කෙනකු ඔබතුමාට පිහියෙන් ඇනලා, "ඒක මගේ ජොබ් එක" කියලා කිව්වොත් මොකද වෙන්නේ, එතැන තිබෙන සාධාරණත්වය මොකක්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ underage rape casesවලට සැක කරන පුද්ගලයන් වෙනුවෙන් කිසිම නීතිඥයකු ඉදිරිපත් වන්නේ නැහැ. ඒක නීතිඥ සංගමය විසින් ගත්ත තීරණයක්. ඒ වාගේම, නීතිඥ නාගානන්ද කොඩිතුවක්කු මහත්මයා බොහොම පැහැදිලිව කියනවා, එංගලන්තයේ නීතිඥයන් විසින් සේවා දායකයකුට අසාධාරණයක් කළොත්, ඒ වෙනුවෙන් පැමිණිලි කරන්න තැනක් එංගලන්තයේ තිබෙනවා කියලා. අද ලංකාවේ එහෙම තැනක් තිබෙනවා ද? නීතිඥයකු කෙනෙකුට අසාධාරණයක් කළොත් පැමිණිලි කරන්න තැනක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක දෙයක් කියන්න තිබෙනවා. දික්කසාද නඩුවලදීත් ඒ දේම වෙනවා. දික්කසාද නඩුවලට උසාවියට එන අහිංසක මිනිසුන්ට වෙන්නෙත් ඒ දේම තමයි. මා මේ වෙලාවේ විශේෂයෙන් ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාටත්, අධිකරණ අමාත්‍යතුමිය වන ගරු තලතා අතුකෝරල මැතිනියටත් ස්තුතිවන්ත වෙනවා. මේ පනත් කෙටුම්පත් ගෙන ඒමේදී මා මේ ඉදිරිපත් කළ යෝජනාත් අදාළ කර ගන්නය කියලා මා ඉල්ලා සිටිනවා. ඒ තුළින් අපි හොඳ අධිකරණයක්, පිරිසිදු අධිකරණයක් හදා ගනිමු. එතකොට මේ ලංකාව සුරපුරයක් බවට පත් කර ගන්න අපට පුළුවන් කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

[අ.භා. 4.47]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා මේ රටේ අධිකරණ පද්ධතියත්, විනිශ්චයකාරවරුත්, ඒ වාගේම යුක්තිය පසිඳලන ආයතන සහ ඒවායේ නායකත්වය දරන සියලු විනිශ්චයකාරතුමන්ලාත්, නීතිඥවරුත් බරපතළ විවේචනයකට, පහර දීමකට ලක් කළා.

මම දන්නේ නැහැ, එතුමා-

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු මන්ත්‍රීතුමා මගේ නම mention කරලා වැරදි ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා, “සියලුම විනිශ්චයකාරවරුත්, සියලුම නීතිඥවරුත්” කියලා මම කිව්වාය කියලා. ඔබතුමා මගේ කථාව අහගෙන සිටියා. මම කිව්වේ, “සමහරු” කියලා නොවෙයි. මම හොඳ නීතිඥවරුන්ගේ නම් කිව්වා, හොඳ විනිශ්චයකාරවරුන්ගේ නම් කිව්වා. කරුණාකර වැරදි ප්‍රකාශ ඉදිරිපත් කරන්න එපා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ එතුමා නම් කරපු විනිශ්චයකාරවරු සහ නීතිඥවරු තමයි හොඳ. අනෙක් අය දූෂිතයෝ. අනෙක් අය හොරු. පාර්ලිමේන්තු වරප්‍රසාද උපයෝගී කර ගෙන කාටද මේ අභියෝග කරන්නේ? පාර්ලිමේන්තු වරප්‍රසාද උපයෝගී කර ගෙන අභියෝග කරන්නේ මේ රටේ අධිකරණ පද්ධතියට, නීතිඥවරුන්ට, විනිශ්චයකාරවරුන්ට. මම ශ්‍රේෂ්ඨාධිකරණයේ අවුරුදු 25ක් වෘත්තියෙන් නීතිඥවරයෙක්. අතිශය තරගකාරී විභාගයකින් තමයි අපි කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට යන්නේ. අපි වෘත්තීය නීතිඥයකු වන්නේ ඊටත් වඩා තරගකාරී විභාගයකින්. ඒ වාගේම මහේස්ත්‍රාත්වරයකු විශේෂ විභාගයකට පෙනී සිට අධිකරණ ධුරාවලියේ ඉතාමත් සංකීර්ණ කටයුතුවලට මුහුණ දීලා, තමන්ගේ මුළු ජීවිත කාලයම කැප කරමින් තමයි මහාධිකරණ, අභියාචනාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු බවට පත්වන්නේ. එම නිසා, අධිකරණ පද්ධතියේ විනිශ්චයකාරවරු මෙහෙම අවඥාවට ලක් කරනවා නම්, මේ රටේ යුක්තිය පිළිබඳව අපට තිබෙන්නේ මොන බලාපොරොත්තුද ? මේවා තමයි පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවෙලා අධිකරණ පද්ධතිය පිළිබඳව කරන විවේචන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නළු බට්ටන්ට මල් කඩන්න නිදහස තිබෙන්න පුළුවන්. නමුත් උසාවිවල විනිශ්චයකාරවරුන්ට - [බාධා කිරීමක්] පිරිමි ගණිකාවන්ට ඒවා පුළුවන් ඇති. හැබැයි, විනිශ්චයකාරවරු තීන්දුවක් දෙන්නේ නීතිමය සහ සිද්ධිමය කාරණා පිළිබඳව සාපේක්ෂව විමසා බලායි. එම නිසා විනිශ්චයකාරවරු තමන්ගේ අභිමතය -ස්වකැමැත්ත- මත තීන්දු දෙන්නේ නැහැ. එහිදී ඔවුන්ට තම විනිශ්චය ලබා දෙන්න අතීත පූර්වාදර්ශ තිබෙනවා; අතීත නඩු තීන්දු තිබෙනවා; සිද්ධිමය කාරණා සම්බන්ධයෙන් පූරි සභාවන් තිබෙනවා. [බාධා කිරීමක්] කරුණාකරලා තමුන්නාන්සේ නිශ්ශබ්ද වන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මල් කඩන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ රටේ අධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට අපහාස කරන්න බැහැ. අධිකරණය ඉස්සරහා ඕනෑම තැනැත්තෙක් වැරදිකරුවෙකු කියලා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කරන තුරු ඒ තැනැත්තා නිර්දෝෂී තැනැත්තෙක් කියලායි පිළිගන්නේ. එතුමාගේ නඩුවටත් එතුමාගේ හෘදය සාක්ෂියේ ඇති, එතුමා නිර්දෝෂීයි කියලා. එම නිසා ඒ වෙනුවෙන් එතුමාට අධිකරණය ඉදිරියේ කරුණු කියාපෑමේ ක්‍රියා පිළිවෙතක්; ක්‍රියා පටිපාටියක් තිබෙනවා. එම නිසා නීතිඥවරුන්ට අපහාස කරන එකවත්, විනිශ්චයකාවරුන්ට අපහාස කරන එකවත් නොවෙයි කළ යුත්තේ.

ජනවාරි අටවැනි දා වන තෙක් සරත් එන්. සිල්වා මැතිතුමා නිර්දය ලෙස විවේචනයට ලක් කළ බව අපි දන්නවා. ජනවාරි අටවැනි දා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ වේදිකාවට නැඟලා එතුමා වෙනුවෙන් පෙනී සිටින කොට සරත් එන්. සිල්වා තමයි උත්තරීතර වන්නේ. එම නිසා මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ලජ්ජා නැතිව කථා කරන්න එන දේවල් පිළිබඳව අපට ඇත්තේ ඉතාම කනගාටුදායක පිළිකුලක්ය කියලා මා මතක් කරනවා. අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ තවත් පනත් කෙටුම්පත් කීපයක් අද දින විවාදයට ගන්නවා. හිටපු අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ මැතිතුමා තමයි, මේ අධිකරණ ක්‍රියාවලිය තුළ නඩු පමාව වැළැක්වීම සඳහා වූ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කළේ. එතුමාට අපේ ගෞරවය හිමිවනවා. හැබැයි, එතුමා ඊයේ රාත්‍රියේ යම් ප්‍රකාශයක් කළා. ඒක කියන්න රන්ජන් රාමනායක මැතිතුමාට අමතක වුණා. පාලකයෝ සම්බන්ධ වෙලා -මැති ඇමතිවරු සම්බන්ධ වෙලා- මේ මහ පොළොවේ ලෝක ඉතිහාසයේ හොරකමක් කළා නම්, ඒ ලොකුම හොරකම මහ බැංකු බැඳුම්කර හොරකමයි. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් නිහඬයි. චෝදනා කරන්න. පොලීසිය නිහඬයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නිහඬයි. තමුන්නාන්සේ හෘදය සාක්ෂියට කථා කරන්න. බැඳුම්කර හොරු නිදැල්ලේ. තමුන්නාන්සේලා කියන අඹ ගෙඩි තුන කඩපු මිනිහා හිරේ. එම නිසා ඒවාට චෝදනා කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
තමුන්නාන්සේට විනාඩි 29ක් දුන්නා. රිදෙනවා නම්, කට වහගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මගේ නම සඳහන් කළා. ටියුෂන් මාස්ටර් කෙනෙක් කෑ ගහනවා, මම රිසිට් ඉල්ලූ නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තමුන්නාන්සේගේ point of Order එක මොකක්ද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බැඳුම්කර හොරු ගැන කිව්වේ නැහැයි කියලා එතුමා කියනවා. මම තමයි බැඳුම්කර හොරු ගැන කෙළින්ම කිව්වේ. ඒ අයට දඬුවම් දෙන්න ඕනෑය කියලා කිව්වේ මම. ඒක මුළු රටේම ජනතාව දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ එක එක මන්ත්‍රීවරුන්ගේ නම් කිව්වොත් ඔවුන්ට ස්ථාවර නියෝග අනුව අවස්ථාවක් ලැබෙනවා, ඔබතුමාගේ කථාවට බාධා කරන්න. එම නිසා ඔබතුමා කථා කරද්දි ඒ ගැන සැලකිලිමත් වන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පනත් කෙටුම්පත් අනුමත කරමින් කතා කරපු අය දූෂණය, යුක්තිය පසිඳලීම ගැන කතා කළාට ඒ බොහෝ දෙනා බැඳුම්කර හොරකම කරපු අය ආරක්ෂා කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කල්ලිය - මට එය පැටලෙනවා. - footnote කල්ලිය. මොකද, ඔය අනෙක් වචනය නියෝජනය කරන අය තමයි මේ ආණ්ඩුවේ වැඩියෙන් ඉන්නේ. Footnote කල්ලියේ සාමාජිකයන් තමයි මේ අධිකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරන්න කතා කරන්නේ; යෝජනා කරන්නේ; සාකච්ඡා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අපේ රටේ මහාධිකරණයේ නඩු පමාවක් තිබෙන බව. අධිකරණ ක්‍රියා දාමය කාර්යක්ෂම කරන්න ඕනෑ. ඒක ඇත්ත. ඒ සඳහා මහාධිකරණ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ ප්‍රමාණය වැඩි කරනවා නම්, අධිකරණ පද්ධතිය පුළුල් කරනවා නම් අපි එයට එකඟ වෙනවා.

[ගරු සිසිර ජයකොඩි මහතා]

හැබැයි අපි දන්නවා, මේ රජය ආපු ගමන් අධිකරණ පද්ධතියේ විනිශ්චයකාරවරුන් පත් කිරීම පිළිබඳව කැලැල්සහගත ක්‍රියාවක් කළා කියා. ඒ තමයි, මඩකලපුව උසාවියේ කනිෂ්ඨ මහෙස්ත්‍රාත්වරයකු මහාධිකරණ විනිශ්චයකාරවරයකු බවට පත් කිරීම. ඒක තමයි නීතිය ගැන කතා කරන අපේ නීතිඥවරුන් උඩින් ඔසවා පිහිටුවපු, යහ පාලනය ගැන කතා කරන ආණ්ඩුව ලංකා ඉතිහාසයේ කරපු අන්ත දූෂිතම, අන්තිම නිර්ලජ්ජිත ක්‍රියාව. මඩකලපුව උසාවියේ මහෙස්ත්‍රාත්වරයකු, මහාධිකරණ විනිශ්චයකාරවරයකු බවට පත් කරනවා. එහෙම නම්, මේ පත් කරන මහාධිකරණ විනිශ්චයකාරවරුන් මඩකලපුවේ ආදර්ශයද දෙන්න යන්නේ? මේ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ ආදර්ශය ඒකද කියා අපි ප්‍රශ්න කරනවා. අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය ගැන කතා කරකර එතුමන්ලාගේ දුරකථන ඇමතුම්වලට සවන් දීමේ අපකීර්තිමත් ඉතිහාසය දුමින්ද සිල්වා නඩු විභාගයේදී අපි දැක්කා. විනිශ්චයකාරවරු කිව්වා, තමන්ගේ දුරකථන ඇමතුම්වලට සවන් දෙනවා, තමන්ට සමාජ ජාලා වෙබ් අඩවිවලින් පහර දෙනවා කියා. එහෙම නම්, අධිකරණ ස්වාධීනත්වය ගැන කතා කරන්න එන්නේ එවැනි මිනිස්සුද කියන ප්‍රශ්නය අපට පැන නඟිනවා.

අධිකරණ ක්‍රියා දාමය ක්‍රියාත්මක කරන්න ඕනෑ. නඩු පමාව වළක්වන්න ඕනෑ. නඩු පැවරීම් ඉක්මන් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය ආපු ගමන් සිදු කරපු බරපතළම වරද අපි දන්නවා. විදේශ විනිමය වංචා පිළිබඳ චෝදනාවක් රවි කරුණානායක හිටපු අමාත්‍යතුමාට තිබුණා. අපි කවුරුත් ඒක දන්නවා. ඊට අදාළ කරුණු අපි මේ පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. හැබැයි තාක්ෂණික වරදක් මත ඔහු නිදහස් වෙනවා. නැවත නඩු පැවරීමේ හැකියාව තබාගෙන තමයි මහාධිකරණ විනිශ්චයකාරතුමිය මෙ තීන්දුව දුන්නේ. එතුමිය පහුවදා විශ්‍රාම ගියා. ඒකට හේතුව වෙනම කතන්දරයක්. තාක්ෂණික වරද නිවැරදි කරලා, රවි කරුණානායකට විරුද්ධව විදේශ විනිමය වංචාව පිළිබඳ නඩුව නැවත පවරන්න තිබුණා. අද වන කල් නඩුවක් පවරා නැහැ. නමුත් යුක්තිය සාධාරණය ගැන කතා කරන්න එනවා. යුක්තිය සාධාරණය ගැන කතා කරන්න එන්නේ හොර තක්කඩි. රවි කරුණානායක විදේශ විනිමය වංචාව පිළිබඳ නඩුවෙන් නිදහස් වනවා පමණක් නොවෙයි, එතුමාට මුදල් ඇමතිකමත් දෙනවා. ඒක මොන තරම් නිර්ලජ්ජිත, පහත් ක්‍රියා දාමයක්ද? හොරකම් කරලා චෝදනා ලබපු, එම නඩුවේ දී තාක්ෂණික වරදක් හේතුවෙන් අධිකරණය ඉස්සරහ නිර්දෝෂී වූ තැනැත්තාට මුදල් ඇමතිකම දෙනවා. නඩු විභාගය යන අතරතුරේදියි එම තනතුර දෙන්නේ. යහ පාලනයට කඩේ ගිය අයට අද පට්ට ගහන්න තිබෙන්නේ මොකක්ද? මහින්ද රාජපක්ෂ මහත්මයාට බණින එක ඇරෙන්න ඔවුන්ට කරන්න වෙනත් දෙයක් නැහැ. තරුණයන් 60,000ක් මරපු; තමන්ගේ සහෝදරයන් 60,000ක් මරපු මිනීමරුවන්ට විරුද්ධව කතා කරන්න කොන්ද පණ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි මේ රටේ ලජ්ජා නැතිම තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලිට්රෝ ගෑස් සමාගමේ හිටපු සභාපතිට ඊයේ ඇප දීලා තිබෙනවා. ඒ කවුද? විදේශ බැංකු මං කොල්ල කාපු හොරු. ඔවුන්ට ඇප දෙනවා. විදේශ මුදල් හොරකම් කරපු ජාවාරම්කාරයන්ට ඇප දෙනවා. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ මගේ සහෝදර ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාට අද වන කල් ඇප නැහැ. ඇයි ඒ? පොදු දේපළ පනත යටතේ බන්ධනාගාරගත කළ එතුමාට ඇප ලබා දෙන්නේ නැහැ. මාසයකට වැඩි කාලයක් ඇප දෙන්නේ නැතිව එතුමා රඳවා තබා ගන්නවා. [බාධා කිරීමක්] කෝ! ඇප ලැබිලා තිබෙනවා ද? නැහැ. මෙන්න අපේ රටේ නීතිය. රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමනි, මෙන්න ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ හිටපු සභාපතිට ඇප දීලා. විදේශ බැංකුවලින් පවා මුදල් හොරකම් කරපු කෙනාට ඇප දීලා. තමුන්නාන්සේලාගේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015දී ජනාධිපතිවරණ අපේක්ෂකයා විධියට ඡන්දය ඉල්ලුවේ ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ හිටපු සභාපති සභාපතිත්වය දරන හංසයා ලකුණින්. ඒ නිසා අන්ත දූෂිතයෙකුගේ පක්ෂයකින් තමයි ජනාධිපතිතුමා ඡන්දය ඉල්ලා තිබෙන්නේ. යුක්තිය, සාධාරණය, නීතිය කඩිනම් කිරීම, ඇප නීතිය ගැන තමයි අද කථා කරන්නේ. මහ බැංකු බැඳුම්කර හොරාට තවමත් දඬුවමක් නැහැ. මම නිතරම ඒ ගැන ප්‍රශ්න කරනවා. අගමැතිතුමා සහ හිටපු මුදල් ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් චෝදනා ලබා තිබෙනවා. "Footnote" කල්ලියේ සාමාජිකයන් මුදල් ගත්ත බවට තොරතුරු ගලා එනවා. අඹ ගෙඩි තුනක් කඩපු මනුස්සයාට මේ විධියට දුක් වේදනා දෙනවා නම්, මහ පොළොව නුහුලන මහ බැංකු බැඳුම්කර අපරාධය කරපු අයවත් අධිකරණය ඉදිරියට ගේන්න. ඒ ප්‍රශ්න කොමිෂන්වලින් විතරක් විසඳන්න බැහැ. කොමිෂන්වලින් බොරු කරන්නේ. 2015 ජනවාරි 08වැනිදා කුමන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න සිංගප්පූරුවේ සිට මුදල් වියදම් කරපු කණ්ඩායම තමයි මේ. ඒ ගොල්ලන්ට තමයි මේ මුදල් ටික ගියේ.

ඔවුන් තමයි 2015 ජනාධිපතිවරණයේදී හංසයා වෙනුවෙන් මුදල් වියදම් කළේ. ඔවුන් තමයි එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට මුදල් වියදම් කළේ. ඒ නිසා ඔවුන්ට නීතිය නැහැ. දැන් අහක ඉන්න විනිශ්චයකාරවරුන්ට අපහාස කරලා, පරිභව කරලා නඩු පමාව ගැන, අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරනවා. පළමුව පරිභව කරන්න, තමුන්ගේ පිලේ ඉන්න නායකයන්ට. මේ මහ පොළොව නුහුලන වංචාව කළාට, මුලින්ම ඒ අයට පරිභව කරන්න. කවුරු වුණත් වංචාවක් කළොත් ඒක වැරැදියි. හොරකමට අපි කොහොමත් විරුද්ධයි. ඒක කවුරු කළත් අපි විරුද්ධයි. ඒ නිසා සාධාරණ වෙන්න. සරත් එන් සිල්වා මහත්මයා තමුන්නාන්සේලාගේ වේදිකාවට නැඟලා ඉන්නකම් හරි හොඳයි. එතකොට ස්වාමිනි. දැන් කියනවා, "අන්ත දූෂිතයා. ගෑනු ළමයි අමාරුවේ දාපු එකා." කියලා. අනේ අම්මේ! මේ කියන්නේ කවුද? මේවා කියන්නේ කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ටියුෂන් මාස්ටර් කෙනෙක්.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මම ටියුෂන් ගුරුවරයෙක් වීම ගැන ආඩම්බර වෙනවා. නමුත්, තමුන්නාන්සේලාට උගන්වන්න බැරිවීම ගැන මට කනගාටුවක් තිබෙනවා. තමුන්නාන්සේලාට ටියුෂන් දෙන්න පුළුවන් වුණා නම්, මේ වාගේ මෝඩ කථා කියන්නේ නැති බව මම දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගීතා කුමාරසිංහ අපේ සහෝදර මන්ත්‍රීතුමියට අද පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහිමි වෙලා තිබෙනවා. එතුමිය මේ පාර්ලිමේන්තුවේදී නිතරම කරපු ප්‍රකාශයක් තිබෙනවා. එතුමිය කියනවා, ආණ්ඩු පක්ෂයේ හිතවත් ඇමතිවරයෙක් එතුමියට දුරකථනයෙන් දිනපතා කථා කරනවා කියලා. ඒ ඇමතිවරයා දුරකථනයෙන් කථා කරලා මෙතුමියට මොනවාද කියන්නේ? මෙතුමියට කියනවා ලු, "අනේ! ඔයා ආණ්ඩුවට එන්න. නියෝජ්‍ය ඇමතිකමක් දෙන්නම්. ඔයාගේ මන්ත්‍රීකමත් රැකලා දෙන්නම්." කියලා. ඔන්න තමුන්නාන්සේලාගේ අධිකරණයේ ස්වාධීනත්වය. රෙද්ද පල්ලෙන් යනවා. එතුමිය නියෝජ්‍ය ඇමතිකම ගත්තා නම්,

එතුමියට නඩු නැහැ. අපි ඒක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කළා. අපි ඉගෙන ගත්ත මහපොළ අරමුදල වංචා කිරීම පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නඩු නැහැ. මේවා මහ පොළොව නුහුලන අපරාධ. හැබැයි, රුපියල් ලක්ෂ 7කට අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට නඩු දාලා තිබෙනවා. රුපියල් බිලියන තුනක වංචාවන් අපි හෙළි කළා. ඒවාට කට උත්තර නැහැ; කථා නැහැ. දැන් චෝදනා ඉදිරිපත් කරන අයටත් දඬුවම් ලබා දෙන්න පුළුවන් විධියක් මේ පනත් කෙටුම්පතේ තිබෙනවා මම දැක්කා. දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට චෝදනා ඉදිරිපත් කරන අයට දඬුවම් පමුණුවන්නත් මේ පනත් කෙටුම්පත හරහා ප්‍රතිපාදන දීලා තිබෙනවා. දඬුවම් පමුණුවන්න ඕනෑ හොරාටයි. නමුත්, චෝදනා කරන කෙනාට දඬුවම් පමුණුවන්නත් දැන් ප්‍රතිපාදන සලස්වා තිබෙනවා. ඒ බව මේ පනත් කෙටුම්පත කියෙව්වාම අපට පේනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
වෙලාව අඩු වෙන බව අපි දන්නවා. ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාගේ විනාඩි 12ක කාලයක් තිබෙනවා. එයින් මම විනාඩි 5ක කාලයක් ගත්තා. ඉතිරි විනාඩි 7නුත් තවත් විනාඩි 5ක කාලයක් මම ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තමුන්නාන්සේට එහෙම වෙලාවක් ගන්න බැහැ. මූලාසනයෙන් කථාවට වෙලාව වෙන් කරන්නේ. තමුන්නාන්සේව දැනුවත් කරන්නේ -

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාගේ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තමුන්නාන්සේ ඉස්සෙල්ලා අහුම්කන් දෙන්න. මමයි මෙතැන වෙලාව වෙන් කරන්නේ. ඔබතුමාට වෙන් කරලා තිබෙනවා මුලින් විනාඩි 12කුත්, තවත් විනාඩි 4කුත්. ඒ විනාඩි 16ක කාලය පස්වරු 05.03ට අවසන් වෙනවා. එතකොට ඊට අමතරව මොන මන්ත්‍රීතුමාගෙන් ද වෙලාව ගන්නේ කියන එක -

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් විනාඩි 5ක කාලයක් ලබා ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා කියන්න ඕනෑ. තමුන්නාන්සේ කියලා හරි යන්නේ නැහැ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
එතුමා ගියා. ඒක කියලා තමයි ගියේ. ඔබතුමා දැන් නේ මූලාසනයට ආවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක පාර්ලිමේන්තු ලේකම්වරුන් දැනුවත් කළාද?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
එක්සත් ජාතික පක්ෂයට බණිනකොට වෙලාව සීමා වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පොඩ්ඩක් ඉන්න. එතුමාගේ විනාඩි 4 තමයි තමුන්නාන්සේගේ නියමිත වේලාවට එකතු කරලා තිබෙන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික අනුරුද්ධ හේරත් මැතිතුමාට විනාඩි 12ක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තමුන්නාන්සේට විනාඩි 12ක් වෙන් කරලා තිබෙනවා. ඒකට අමතරව ඉන්දික අනුරුද්ධ හේරත් මැතිතුමාගේ විනාඩි 4ත් එකතු කරලා තිබෙනවා. ඒ ලබා දුන් කාලය දැන් අවසන් වෙලා තිබෙනවා. එම නිසා තමුන්නාන්සේට නියමිත කාලය දැන් අවසන්.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාගේ වෙලාවෙන් කොටසක් එතුමා ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට දුන්නු බවක් තමයි පාර්ලිමේන්තු සහකාර මහ ලේකම්තුමා කියන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
කොටසයි දුන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මට තමුන්නාන්සේත් සමඟ වාද කරන්න දෙයක් නැහැ. ඔබතුමාගේ වෙනත් මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් එතුමාට ඒ සඳහා ඉදිරිපත් වෙන්න කියන්න. නැත්නම් තමුන්නාන්සේගේ කථාව නතර කරන්න වෙනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත වේලාව අවසානයි. ඔබතුමාට වේලාව ලබා දෙන්න පුළුවන් වන පක්ෂයේ වෙනත් මන්ත්‍රීවරයෙක් ඉන්නවාද?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා විතරයි - ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක්ගේ වේලාව - අපි සහෝදරයන්, අපි විපක්ෂයේ නේ. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක්ගේ කථාවෙන් විනාඩියක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
හැබැයි, ජනතා විමුක්ති පෙරමුණට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කෙනෙක්ට වේලාව දෙන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
අපට දෙන්න බැහැ. විපක්ෂයේ අපට දෙන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා මම මෙතැන නියෝජනය කරන්නේ මූලාසනය. තමුන්නාන්සේගේ ප්‍රදර්ශනය කරන්නේ මොකක්ද කියන එක ගැන තමුන්නාන්සේ තේරුම් ගන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම ගරු කරනවා. හැබැයි, අපට ජනතා විමුක්ති පෙරමුණ ගැන ලජ්ජයි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට සුදුසු නැති වචන පාවිච්චි කරනවා, මූලාසනයට අගෞරව කරනවා. මම මූලාසනයේ ඉන්නකොට පක්ෂයක් නියෝජනය කරන්නේ නැහැ. තමුන්නාන්සේ ඒක තේරුම් ගන්න. මම තමුන්නාන්සේ ගේ හැසිරීම පිළිබඳ කනගාටු වෙනවා.

The Hon. Abdullah Mahrooff has six minutes. [බාධා කිරීමක්] List එකේ තිබෙන්නේ ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත]*

මීළඟට, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. You have eight minutes.

[අ.භා. 5.05]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මගේ මිත්‍ර මන්ත්‍රීතුමා ළමයින්ටත් ඕවා උගන්වනවා ද කියලා මම දන්නේ නැහැ. එතුමා කුණුහරුප වචන; ඉතාමත් අසභ්‍ය වචන පාවිච්චි කරනවා. 'ඔළු බක්කා, අර බක්කා, මේ බක්කා' කියනවා. මට පේන්නේ නීති ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, ටියුෂන් ක්ෂේත්‍රයත් හදන්න වෙනවා කියලායි. අපේ ගරු මන්ත්‍රීතුමා හොඳ ගරු මන්ත්‍රීතුමෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් ගොඩාක් කථා කළා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් කලින් කථා කළා, හරියට මැරිලා උපන්නා වාගේ. අපි අද පවතින තත්ත්වයට ආවේ කොයි වාගේ රටකින් ද කියන එක මේ අයට මතක නැහැ. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, එදා රටේ නීතිය වල් වැදිලා තිබුණේ. රටේ නීතිය නීති පොතට විතරයි සීමා වුණේ. එදා ක්‍රියාත්මක වෙන්නේ වෙන දෙයක්. මේක නීතිඥ මහත්තුරුන්ගේවත්, අධිකරණයේවත් වැරැද්ද නොවෙයි. දේශපාලනඥයන් නීතිය අතට ගෙන තිබුණේ. පළාතේ මන්ත්‍රීතුමා පොලීසියේ කාමරේ ඕඅයිසී වෙලා හිටියේ. ඒකට නීතිඥමහත්තුරුන්ට, විනිසුරුවරුන්ට දොස් කියලා හරියන්නේ නැහැ. එදා රට පාලනය කරපු ආණ්ඩු, දේශපාලනඥන් නීතිය අතට අරගෙන තිබුණේ. මේ කියන කථා ඇත්ත. නීතිය මකුළුදැලක් වෙලා තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රබල මිනිසුන්ට බේරෙන්න පුළුවන් අහිංසක මිනිසුන් තමයි මේවාට අහුවෙන්නේ. නමුත්, එදා තමුන්ට ඕනෑ විධියට නීතිය ක්‍රියාත්මක කළා කියලා අපි දන්නවා. තමුන්ට විරුද්ධ වෙනවා නම්; තමන්ගේ බලයට විරුද්ධ වෙනවා නම් සුදු වෑන් එකක් අරගෙන ඇවිල්ලා උස්සාගෙන ගියා. මරණ දඬුවම ක්‍රියාත්මක වුණා. නැහැ කියන්න බැහැ. ඒක අධිකරණයෙන් නොවෙයි පැනවුණේ. බලවත් දේශපාලනඥයන් මරණ දඬුවම ක්‍රියාත්මක කළා. මම හිතන්නේ ඒවා සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාට මතක නැහැ. ආයුධ පෙන්වන්න කියලා එක්කගෙන ගිහිල්ලා කියලා කී දෙනෙක් මහදී මැරුවාද? නීතිය ක්‍රියාත්මක වුණා. අපේ ගමේ මගේ ආසනයේ වතුර ඉල්ලා කෑ ගහපු අහිංසක මිනිස්සුන්ව අමු අමුවේ මහ දවල් වෙඩි තියලා මරලා දැම්මා. ඒ විධියට මරණ දඬුවම ක්‍රියාත්මක වුණා. රොෂේන් චානකව මැරුවා. හලාවත ඇන්ටනීව වෙඩි තියලා මැරුවේ මහ දවල්. නීතිය ඔන්න! මරණ දඬුවම ක්‍රියාත්මක වුණා. ඒ වෙඩි තියපු මිනිහාට මොන දඬුවම දුන්නත් තේරුමක් තිබෙනවාද, ඒ මනුෂ්‍යයා මැරුවාට පසුව. [බාධා කිරීමක්]මම කියන්නේ එහෙම කාලයක් තමයි තිබුණේ කියලා. ඔබතුමාගේ නායකයා- නීතිය තිබුණේ කොහේද? එදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නඩු අහලා රජයේ සේවකයා -සමෘද්ධි නිලධාරියාව- ගහේ බැන්දා. මේ ගොල්ලන් තමයි ගහේ බැන්දේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තමයි අධිකරණය වෙලා තිබුණේ. [බාධා කිරීමක්]ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නඩු අහලා ගහේ බැන්දා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමන්ලා එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඉස්කෝලේදී තමුන්ගේ දරුවාට දඬුවම් දුන්නා කියලා, පළාත් සභා මන්ත්‍රීවරයා ඒ ගුරුවරියව ඉස්කෝලේ ඇතුළේදීම දණ ගැස්සුවා. එහෙම තිබුණු රටක් තමයි අපට වෙනස් කරන්න දුන්නේ. අපි ඒක වෙනස් කරනවා. නඩු තීන්දු සිදු වුණේ පාලකයන්ට ඕනෑ විධියටයි. රටේ සාමාන්‍ය ජනතාවට අධිකරණය ගැන විශ්වාසයක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසාම තමයි එදා 2015 ජනවාරි 08වැනිදා යහපාලන ආණ්ඩුවක් අවශ්‍යයි කියලා මේ රටේ ජනතාව විප්ලවයක් කරලා දේශපාලන භේදයකින් තොරව සියලු ජනතාව අත්වැල් බැඳගෙන හිටපු පාලන තන්ත්‍රය වෙනස් කළේ. අපි ඒ ජනතාවගේ ඉල්ලීමට, ජනතාවගේ විප්ලවයට ඇහුම්කන් දුන්නා. ඇහුම්කන් දීලා ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් අධිකරණ පද්ධතියේ තිබෙන දූෂිතභාවය, වංචනිකභාවය නැති කරලා පිරිසිදු කරමින් එනවා. අපි ආපු ගමන්ම විනිසුරුවරයාට කෙළින් ඉඳගෙන තීන්දු ගන්න පුළුවන් විධියට, අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරින්ට දෙපයින් ඉඳගෙන කටයුතු කරන්න පුළුවන් විධියට අධිකරණ සේවා කොමිෂන් සභාව ස්ථාපිත කළේ, නීතිය පිරිසිදු කිරීමේ වගකීම ඇතිවයි. ඒ නිලධාරියාට තමන්ගේ උගත්කම, බුද්ධිය පාවිච්චි කරලා නීතිය අනුව තීන්දු තීරණ ගන්න පුළුවන් වාතාවරණය අපි හරිගස්සලා දුන්නා.

ඒ විතරක් නොවෙයි, වින්දිතයන් සහ අපරාධකරුවන් ගැන කථා කරනකොට  වැලිවේරියේ පුතාට වෙඩි තැබීම ගැන සාක්ෂි දෙන්න අම්මා එන්න භයයි. මොකද, අම්මා සාක්ෂි දෙන්න ගියා නම්  සුදු වෑන් එකක් ඇවිල්ලා අම්මාවත් උස්සාගෙන යනවා. අපි ඒවා සැලකිල්ලට අරගෙන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ගෙනැල්ලා ඕනෑම අපරාධයක වින්දිතයෙකුට, සාක්ෂිකරුවෙකුට ආරක්ෂා වෙන්න, භය නැතිව පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න, සාක්ෂිය සටහන් කරන්න පුළුවන් වාතාවරණය අපි නිර්මාණය කර දුන්නා. අද යම් වෙනසක් ඇතිවෙලා තිබෙනවා. සියයට සියයක්ම වෙනස් වෙලා කියලා මම කියන්නේ නැහැ. ආණ්ඩුවට විරුද්ධව උසාවි ගිහිල්ලා අද විපක්ෂය කොච්චර නඩු ජය ගන්නවාද? එතකොට ඇවිල්ලා කියනවා, "අධිකරණය හරි ස්වාධීනයි. අධිකරණය හොඳ තීන්දු දුන්නා. අපට ඇහුම්කන් දුන්නා." කියලා. ඒ විධියට විපක්ෂයේ අය අධිකරණ භූමියට ගිහිල්ලා කථා කරනවා. මේ ගොල්ලන්ගේ හොරු අල්ලාගෙන ගියාම, හොරකම් කරලා මේ ගොල්ලෝ අල්ලා ගෙන ගියාම ඒක දේශපාලන පළිගැනීමක්. අපි නීතියට ඇඟිලි ගැහුවේ නැහැයි කියලා මම විශේෂයෙන්ම කියනවා.

එදා අධිකරණයට යන්න කලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයකු නීතිය ඉදිරියට ගෙන යන්න පුළුවන්කම තිබුණාද? අර ගුරුවරිය දණගැස්වූ පළාත් සභා මන්ත්‍රීවරයා නීතිය ඉස්සරහට ගෙන යන්න පුළුවන්කම තිබුණාද? කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මිදුලේ නඩු අහපු ඇමතිතුමා, එයාව පොල් ගහේ බැඳලා දඬුවම් දුන්නා. අධිකරණය ඉස්සරහට ගෙන යන්න පුළුවන්කම තිබුණාද? නමුත්  අද  නඩු ඇහෙන්නත් ඉස්සරවෙලා, අපේ රජයේ ඇමතිවරු ඉල්ලා අස්වෙනවා, "හරි මම ස්වාධීනව නඩුව අහන්න අවස්ථාව දෙනවා. මගේ ඇමතිකමෙන්  මම ඉල්ලා අස්වෙනවා."කියලා. අපි එහෙම සංස්කෘතියක් නිර්මාණය කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. නීතියේ හදන්න දේවල් තිබෙන බව අපි දන්නවා. ඒ ගැන මම කාටවත් ඇඟිල්ල දික් කරන්නේ නැහැ. මේ නීති පද්ධතිය හදන්න ඕනෑ. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට හඳුන්වා දීලා නීතිය තව තවත් ශක්තිමත් කළා. අපට තව වැඩ ගොඩක් කරන්න තිබෙනවා. අපේ  ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරු ඔක්කොම එකතු වෙලා, විශේෂයෙන්ම ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා, ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ඇතුළු අපි ඔක්කොම එකතු වෙලා කරුණු සොයලා බැලුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும்  உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

කථා කරන්න පටන් ගත්තා විතරයි.

කරුණු සොයලා බලලා අපි වාර්තාවක් ඉදිරිපත් කළා. යුක්තිය පසිඳලීම සඳහා ගත වන කාලය අවුරුදු 17යි. ඒ අනුව, පුද්ගලයෙක් නඩුවක් දැම්මාම ඔහුගේ මුණුබුරාට තමයි තීන්දුව ලැබෙන්නේ. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්නය ඇතිවෙන්න හේතු මොනවාද කියලා අපි සොයලා බැලුවා. විශේෂයෙන්ම මම නීති ක්ෂේත්‍රයේ ඉන්න සියලු ප්‍රවීණයන්ට මේ අවස්ථාවේ  ස්තුතිවන්ත වෙනවා. ඒ අය මේ කාරක සභාවට ඇවිල්ලා සාක්ෂි දීලා අපිව දැනුවත් කළා. නීතිපති ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය මහත්මයා, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මහත්මයා, සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහත්මයා, පද්මසිරි ජයමාන්න මහත්මයා, සුජීව ලාල් දසනායක මහත්මයා ඇතුළු නීති ක්ෂේත්‍රයේ ඉන්න සියලු දෙනා ඇවිල්ලා ඔක්කොම අය එක හඬින් කිව්වා, "අපට අධිකරණ ක්ෂේත්‍රය වෙනස් කරන්න මීට වඩා කඩිනම් නඩු විසඳීමේ ක්‍රමයක්  අවශ්‍ය වෙනවා. නැත්නම් අහිංසක දුප්පත් මිනිස්සු මුළු ජීවිත කාලයම උසාවියේ ගෙවනවා; එයාගේ ජීවිත කාලය උසාවියේ ගත කරලා ඒත් තීන්දුව එන්නේ නැහැ, දරුවාගේ ජීවිත කාලයත් උසාවියේ ගත කරනවා; මුණුබුරාගේ ජීවිත කාලයේ තමයි උත්තරය එන්නේ." කියලා. අන්න ඒක නවත්වන්න තමයි අපේ කාරක සභාවෙන් අපි යෝජනා සමූහයක් ඉදිරිපත් කර තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ සියලු නිලධාරී මහත්වරු අපට මේක ශක්තිමත් කරන්න උදවු උපකාර කළා. විශේෂයෙන්ම අපේ ඇමතිතුමිය ඒ කෙටුම්පත අරගෙන  තීන්දු තීරණ ගන්නවා. ගරු ඇමතිතුමිය අද සම්මත කර ගන්නා පනත් කෙටුම්පත්වලටත් මේ වාර්තාවලින් අරගෙන කරුණු ඇතුළත් කර තිබෙනවා.

හොඳ, දක්ෂ ඇමතිතුමියක් අපට හම්බ වෙලා තිබෙනවා; ප්‍රායෝගික දැනුම තිබෙන ඇමතිතුමියක් අපට හම්බ වෙලා තිබෙනවා; පොළොවේ පය ගහගෙන වැඩ කරන්න පුළුවන් ඇමතිතුමියක් ඉන්නවා. එතුමිය අපේ වාර්තා ඔක්කෝම එකතු කරලා සාධාරණ පිරිසිදු රටක් හදන්න, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන යහ පාලනය මේ රටේ ස්ථාපිත කරන්න කටයුතු කරනවා. ඒ සඳහා නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ මෙම වාර්තාව ගැන සොයා බලා කටයුතු කරලා අවම වශයෙන් මාස හයක් තුළ මේක ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටින ගමන්, මේ වෙනකොට යම් කොටසක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා නම්, ඒකටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. M.L.A.M. Hisbullah. You have eight minutes.

[பி.ப. 5.13]

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உள்ளூர் அதிகாரசபைகள் (விசேட ஏற்பாடுகள்) மற்றும் நீதித் துறை சம்பந்தமான திருத்தச் சட்டமூலங்கள் தொடர்பான விவாதத்திலே கலந்துகொள்வதில் நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். உள்ளூர் அதிகாரசபைகள் தொடர்பான சட்டங்களிலே திருத்தங்களைக் கொண்டுவந்து, புதிய நடைமுறையில் தேர்தல்களை நடத்துவதற்கான ஏற்பாடுகளைச் செய்துகொண்டிருக்கின்ற சூழ்நிலையிலே, உள்ளூர் அதிகாரசபைகள் விசேட ஏற்பாடுகள் சட்டத்தி னூடாகச் சிறுபான்மைச் சமூகங்களினுடைய பிரதிநிதித்து வங்கள் பாதுகாக்கப்படக்கூடிய வகையில் அது தொடர்பான உரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

குறிப்பாக, அரசியல் கட்சிகள் அவற்றின் தேர்தல் வேட்பாளர்களைத் தெரிவுசெய்யும்போது சிறுபான்மைச் சமூகங்களினுடைய பிரதிநிதித்துவமும் அந்தந்தப் பிரதேச சபைகளிலே பிரதிபலிக்கக்கூடிய வகையில் அவர்களுக்கு நியமனப் பத்திரங்களை வழங்குவதனூடாக, எதிர்காலத்திலே "இந்தப் புதிய தேர்தல் திருத்தச் சட்டத்தினூடாகச் சிறுபான்மைச் சமூகமோ அல்லது பெரும்பான்மைச் சமூகமோ பாதிக்கப்பட்டுவிட்டது" என்று கூறுகின்ற நிலைமை ஏற்படாதவாறு பாதுகாத்துக்கொள்ள வேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே குறிப்பிட்டுக்கூற விரும்புகின்றேன்.

அம்பாறை மாவட்டத்திலே சாய்ந்தமருது பிரதேச மக்கள் தங்களுக்கென்று ஒரு பிரதேச சபையை அமைத்துத்தர வேண்டுமென்று கடந்த 25 ஆண்டுகளுக்கு மேலாகப் போராடி வருகின்றார்கள். அண்மையில் 3 நாட்கள் கடைகள் மூடப்பட்டு, வியாபாரங்கள் நிறுத்தப்பட்ட நிலையில், சகல அரச காரியாலயங்களும் பாடசாலைகளும் மூடப்பட்ட நிலையில், அவர்கள் தங்களுக்கு ஒரு பிரதேச சபையை உருவாக்கித் தருமாறு கோரி மிகப்பெரிய ஆர்ப்பாட்ட மொன்றை மேற்கொண்டார்கள். அவர்களுடைய அந்த நியாயமான கோரிக்கை அரசியல் தலைமைகளால் அங்கீகரிக்கப்பட்டது. மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள்கூட கடந்த தேர்தலின்போது அதனை உருவாக்கித் தருவதாக உறுதிமொழி வழங்கியிருந்தார். ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரசின் தலைவரும் கௌரவ அமைச்சருமான ரவூப் ஹக்கீம் அவர்கள், கௌரவ அமைச்சர் றிசாட் பதியுதீன் அவர்கள், கௌரவ அமைச்சர் பைசர் முஸ்தபா அவர்கள் உட்படப் பலர் அந்த மக்களுக்கு வாக்குறுதியை வழங்கியிருந்தார்கள். இவர்கள் தொடர்ச்சியாக வழங்கிவந்த வாக்குறுதிகளினால் அந்த மக்கள் பெரும் எதிர்பார்ப்போடு இருந்தார்கள். ஆனால், கல்முனை மாநகர மக்களுடைய எதிர்ப்பின் காரணமாக அது கைகூடவில்லை.

கல்முனை மாநகர சபையிலே இருக்கின்ற பிரச்சினைகள், சூழ்நிலைகள் என்பவற்றைக் கருத்திலெடுத்து அவர்களுடைய எதிர்காலப் பாதுகாப்புக் கருதி, கல்முனை மாநகர மக்கள் எடுத்துக்கொண்ட நியாயமான தீர்மானத்தின் அடிப்படையில், சாய்ந்தமருது பிரதேச சபைக் கோரிக்கையானது நிராகரிக்கப் பட்டுள்ளது. அதன் காரணமாக அங்குள்ள மக்கள் மனவேதனையான நிலைமையில் இருக்கின்றார்கள். இந்தச் சட்டமூலத்தின் விசேட ஏற்பாடுகள் மூலம் தங்களுக்கு ஒரு சபை கிடைக்கும் என்ற ஆவலோடும் ஆர்வத்தோடும் எதிர்பார்த்திருந்த சாய்ந்தமருது மக்கள், நுவரெலியா மாவட்டத்திலே புதிதாக நான்கு சபைகள் உருவாக்கப்பட்ட போது தங்களுக்கான சபை உருவாக்கப்படவில்லையே என்ற ஆதங்கத்துடனும் கவலையுடனும் இருக்கின்றார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எதிர்காலத்தில் மேதகு ஜனாதிபதி அவர்களின் தலைமையிலான இந்த அரசாங்கம் கல்முனை மாநகர மக்கள், சாய்ந்தமருது மக்கள் ஆகிய இரண்டு தரப்பினருடனும் கலந்துரையாடி, கருத்துக்களைக் கேட்டறிந்து அவர்களுடைய நியாயமான கோரிக்கைகளை நிறைவேற்றுவதற்கு உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும் என்று இந்தச் சபையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த 30 ஆண்டு காலத்தில் சாய்ந்தமருது மக்கள் ஒரு தனிநாட்டைக் கோருவதற்கோ அல்லது ஒரு மாகாணத்தைக் கோருவதற்கோ அல்லது ஒரு மாவட்டத்தைக் கோருவதற்கோ முயற்சிக்கவில்லை. ஆனால், இன்று உள்ளூராட்சித் தேர்தல்கள் நடக்கவிருக்கின்றது என்று அறிந்த நிலையில், தங்களுக்கு ஒரு பிரதேச சபை இல்லையே என்று அந்த முழுப் பிரதேச மக்களும் மிகக் கவலையோடும் துன்பத்தோடும் இருக்கின்றார்கள். நாங்கள் அவர்களைக் கண்டு மனவேதனை அடைகின்றோம். ஆகவே, ஏனைய பிரதேச மக்களுடைய அபிலாஷைகளுக்கு முரண்படாமல், அவர்களுடைய அபிப்பிராயங்கள் பாதிக்காத வகையில் சாய்ந்தமருது மக்களுடைய நியாயமான கோரிக்கைகள் தொடர்பில் கவனத்துக்கெடுத்து அந்தப் பிரதேசத்தின் பிரச்சினை தீர்க்கப்பட வேண்டும் என்று அந்த மக்களுக்காக இந்தச் சபையிலே குரல் கொடுப்பதில் நான் மிகவும் சந்தோஷ மடைகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எதிர்காலத்திலே ஒவ்வொரு பிரதேசத்திற்கும் பொறுப்புக்கூறக் கூடிய விதத்தில் மக்களால் தங்களுடைய உறுப்பினரைத் தெரிவுசெய்யக்கூடிய வகையில் உள்ளூர் அதிகாரசபைகள் சட்டமூலம் உருவாக்கப்பட்டிருக்கின்றது. அந்தவகையில், அந்தச் சட்டமூலத்தை நாங்கள் வரவேற்கின்றோம். எதிர்காலத்திலே ஒவ்வொரு வட்டாரத்திற்கும் ஒவ்வோர் உறுப்பினரைத் தெரிவு செய்வதனூடாக, அந்த உறுப்பினர் தன்னைத் தெரிவுசெய்த மக்களுக்குப் பதில் கூறக்கூடிய ஒரு சூழ்நிலை உருவாக வேண்டும். அதேபோன்று மாகாண சபைகளுக்குத் தொகுதி அடிப்படையிலே உறுப்பினர்களைத் தெரிவுசெய்வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. மாகாண சபைத் தேர்தலுக்கான தொகுதிகள் பிரிக்கப்படுகின்றபோது குறிப்பாக முஸ்லிம்களுடைய பிரதிநிதித்துவம் பாதிக்காத வகையிலே பிரிக்கப்பட வேண்டும். நியமிக்கப்பட்டிருக்கின்ற மாகாண எல்லை நிர்ணய ஆணைக்குழு முஸ்லிம்களுடைய பிரதிநிதித்துவம் எந்த வகையிலும் குறைக்கப்படாத சூழ்நிலையில் அவர்களுடைய விகிதாசாரத்திற்கேற்ப பிரதிநிதித்துவம் கிடைப்பதற்கு வழிவகுக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have one minute more.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
I will wind up within one minute, Sir.

ஆகவே, முஸ்லிம்களின் பிரதிநிதித்துவங்கள் குறைக்கப் படாத வகையில் மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு நடவடிக்கை எடுக்கவேண்டும். ஏனென்றால், மீண்டும் இனங்களுக்கிடையே ஒரு கசப்புணர்வு அல்லது தங்களுக்கான பிரதிநிதித்துவம் கிடைக்கவில்லை என்ற உணர்வு ஏற்படக்கூடாது.

இந்த நாடு ஒருமித்த நாடாக இருக்க வேண்டும்; எல்லோரும் ஒரு தாய் மக்களாகச் செயற்பட வேண்டும். நாங்கள் எங்களுடைய அரசியல் உரிமைகளையும் பிரதிநிதித்துவத்தையும் பாதுகாத்துக்கொண்டு பயணிக்க வேண்டிய தேவை இருக்கின்றது. இன்று நாட்டின் எதிர்கால நலன்களைக் கருத்திற்கொண்டு நாங்கள் இணைந்து செயற்படுகின்றபோதிலும், முஸ்லிம்களுடைய அரசியல் உரிமைகளைப் பாதுகாக்க வேண்டிய பொறுப்பும் கடமைப் பாடும் எங்களுடைய தலைகளிலே சுமத்தப்பட்டிருக்கின்றது. ஆகவே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாகாண சபை சம்பந்தமாக நியமிக்கப்பட்டிருக்கின்ற தொகுதி எல்லை நிர்ணய ஆணைக்குழு, ஒவ்வொரு மாவட்டத்திலும் முஸ்லிம்களின் விகிதாசாரத்திற்கு ஏற்ப அவர்களுக்குரிய பிரதிநிதிகள் தெரிவுசெய்யப்படுவதை உறுதிப்படுத்திக் கொள்ள வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ඔබතුමාට.

මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 5.21]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අධිකරණය සම්බන්ධ පනත් කෙටුම්පත් කිහිපයක් දෙවැනිවර කියවා සම්මත කරන මේ අවස්ථාවේ මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ආණ්ඩුවත් එක්ක සංසන්දනය කරන කොට, මේ රටේ අධිකරණ පද්ධතිය ගැන යම් සුබදායී විශ්වාසයක් අපට තබා ගන්න පුළුවන් කියන කථාව අද මෙතැන මතු වුණා. ඒ වාගේම අපේ අධිකරණ ඇමතිතුමියටත් අපි සුබ පතනවා. එතුමියගේ මේ කාල පරිච්ඡේදය තුළ මේ රටේ නීතිය හා නීතියේ ආධිපත්‍ය ගැන ජනතාවට තිබෙන විශ්වාසය තව-තවත් වැඩි වෙන්න ඕනෑය කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර අපේ ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කථා කළා. ඒකාබද්ධ විපක්ෂයේ ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා දැන් මෙතැන නැහැ. එතුමා නැඟිටලා ගිහිල්ලා. ඒ ගොල්ලන්ගේ කථාවල පරස්පරතාවන් තිබෙන බව අපට පෙනෙනවා. ඒ ගොල්ලන් එක වේලාවකට අධිකරණය ගැන හොඳ විධියකට කථා කරනවා; එක වේලාවකට "අපේ හිටපු මන්ත්‍රීතුමා නිදහස් කළේ නැහැ" කියලා අධිකරණය විවේචනය කරනවා. එතකොට අපට පෙනෙනවා, එතුමන්ලාගේ කථා ඉතාම පරස්පර විරෝධී බව. ඒ ගොල්ලන් එක එක වේලාවට එක එක දේවල් කථා කරන කණ්ඩායමක් හැටියට තමයි අපට පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම යහ පාලන ආණ්ඩුව බලයට පැමිණි පසුව පසුගිය කාලයේ මහින්ද රාජපක්ෂ පාලන සමයේදී මේ රටේ සිද්ධ වුණු යම් ඝාතනයක් සම්බන්ධ සිද්ධිය නැවත එළියට අරගෙන, මේ රටේ සියලු ජනතාව වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න යම් ක්‍රියාමාර්ගයකට පැමිණි බව මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ. තාජුඩීන්ගේ ඝාතනය සම්බන්ධව අපි කථා කළොත්, යහ පාලන ආණ්ඩුවේ නීතියේ සාධාරණත්වය සංකේතවත් වෙන නඩුවක් බවට අද එය පත් වෙලා තිබෙනවා. අපි කාටත් ඒකෙන් මිදෙන්න බැහැ. වළලා දමපු තාජුඩීන්ව තමයි 2015 වසරේ ජනවාරි මාසයේ ජයග්‍රහණයෙන් පසුව අපි එළියට ගත්තේ. එසේ එළියට ගත් තාජුඩීන්ට සාධාරණත්වය ඉෂ්ට කරන්න තමයි එදා අපි කථා කළේ. එදා අපේ ආණ්ඩුව එසේ පිහිටුවීමත් එක්ක, මේ රටේ සිටින සියලුම ජනතාව තාජුඩීන්ට වුණු අසාධාරණය සම්බන්ධව කථා කළා. "තාජුඩීන්ගේ සිද්ධිය ඝාතනයක් නොවෙයි, ඒක accident එකක්. ඒක මිනී මැරුමක් නොවෙයි" කියලා පසුගිය ආණ්ඩුව කාලයේ එම සිද්ධිය යට ගහලා ඒක වසා දමා තිබෙන වේලාවේ, අපේ ආණ්ඩුව බලයට පැමිණි නිසා නැවත ඒක එළියට අරගෙන, එය ඝාතනයක් කියලා සනාථ කර ගන්න අපට පුළුවන් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඝාතනයක් කියලා සනාථ වුණු තාජුඩීන්ගේ ඝාතනය ගැන නැවත අපට සැක සංකා මතු වෙලා තිබෙනවා. අපිට නොපෙනෙන හස්තයක් තාජුඩීන්ගේ ඝාතන සිද්ධිය නැවත යට ගහන්න යම් යම් ක්‍රියාදාම සිදු කරගෙන යනවා. අධිකරණ ඇමතිතුමිය මෙම ගරු සභා ගැබේ මේ අවස්ථාවේදී ඉන්නා නිසාම මේ කථාව කරන එක හොඳයි කියලා මම හිතනවා. මොකද, විශේෂයෙන්ම එම නඩුවේ ක්‍රියාදාමය ගැන බලන කොට, මම කලින් කිව්වා වාගේ නොපෙනෙන හස්තයක් මේ නඩුව තුළ ක්‍රියාත්මක වෙනවාය කියලා අපි කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, හිටපු DIG අනුර සේනානායක මහත්මයා සහ නාරාහේන්පිට පොලීසියේ OIC මහත්මයා මෙහි සැකකරුවන් හැටියට ඉදිරිපත් කරලා තිබෙන බව.

විශේෂයෙන්ම අපි දන්නවා, ඔවුන් මේ නඩුවට ඉදිරිපත් කළේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 297 වගන්තිය යටතේ කියලා. ප්‍රධාන සැකකාරයා හැටියට පසු ගිය කාලයේ මේ සමාජයේ කථාවට ලක්වුණා, හිටපු වෛද්‍ය නිලධාරි ආනන්ද සමරසේකර මහත්මයා ගැන. එතුමා මේක ඝාතනයක් නොවෙයි කියලා වෛද්‍ය වාර්තාව දුන්නා. ඒ ආනන්ද සමරසේකර මහත්මයා යටතේ වැඩ කරපු වෛද්‍යවරුන් දෙදෙනෙකු ඉන්නවා. ඒ වෛද්‍යවරුන් දෙදෙනාම ඉතාම බරපතළ කටඋත්තර ලබාදීලා තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට - CID එකට-. මේ කට උත්තර දෙන්න කියලා, ආනන්ද සමරසේකර මහත්මයා එතුමන්ලාට බලපෑම් කරලා තිබෙනවා. නමුත් ආනන්ද සමරසේකර මහත්මයාව අත් අඩංගුවට ගත්තේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඇයි, ඒ? අපරාධ නඩු විධාන සංග්‍රහයේ 297 වගන්තිය යටතේ DIG අනුර සේනානායක මහත්මයාට සහ නාරාහේන්පිට OIC මහත්මයාට මේ මරණයේ කුමන්ත්‍රණයේ කොටස්කාරයන් කියලා චෝදනා ඉදිරිපත් කරලා, අවුරුද්දකට වඩා වැඩි කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ තියාගෙන සිටියා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

හැබැයි, ආනන්ද සමරසේකර මහත්මයාට එක දවසින් ඇප දීලා යැව්වා. එහෙම වෙන්නේ කොහොමද? මොකක්ද කරන්න ඕනෑ කියලා නීතිපති දෙපාර්තමේන්තුව කිසිම උපදෙසක් CID එකට දුන්නේ නැහැ.

ගරු ඇමතිතුමියනි, 2017.10.02වෙනි දා CID එක උසාවියට වාර්තාවක් ඉදිරිපත් කළා. මොකක්ද, වාර්තාව? බොරු සාක්ෂි ඉදිරිපත් කෙරුවා කියලා 190 වගන්තිය යටතේ සහ සාක්ෂි මැකුවා කියලා 198 වගන්තිය යටතේ ආනන්ද සමරසේකර මහත්මයාට විරුද්ධව වාර්තාවක් උසාවියට ඉදිරිපත් කරලා එතුමාව අත් අඩංගුවට ගන්න නියෝගයක් ඉල්ලුවා. නියෝගය ලැබුණේ නැහැ. මොකක්ද, වුණේ? 2017.10.19වෙනි දා ආනන්ද සමරසේකර මහත්මයා දවල් 1.30ට උසාවියට ඇවිල්ලා, ඇප අරගෙන එළියට ගියා. නීතිපති දෙපාර්තමේන්තුව උසාවියට ආවේ නැහැ. CID එකෙන් නීතිපති දෙපාර්තමේන්තුවට දැන්වුවා, "අද මෙහෙම නඩුවක් තියෙනවා, මේ නඩුවට එන්න" කියලා. නීතිපති දෙපාර්තමේන්තුව නඩුවට ආවේ නැහැ; නඩුව මහහැරියා. ඇයි, ඒ? ඒක තමයි තිබෙන ගැටලුව. අපි මේ යහ පාලන ආණ්ඩුව හැදුවේ මේ රටේ නීතියේ ආධිපත්‍යය ඇති කරන්න; මේ රටේ නීතිය කාටත් සමාන කරන්න. තාජුඩීන්ගේ මරණය එළියට ගත්තේ තාජුඩීන්ට සාධාරණත්වයක් ඉෂ්ට කරන්න. නැතුව තාජුඩීන්ගේ මරණය පෙන්වා ඡන්ද එකතු කරන්න නොවෙයි, අපි තාජුඩීන්ව එළියට ගත්තේ. එහෙම නම් නීතිපති දෙපාර්තමේන්තුව එදා නඩුවට ආවේ නැත්තේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක තියාගන්න ආනන්ද සමරසේකර මහත්මයා හැම උසාවියක් ගානේම ඇප ඉල්ලාගෙන ගියා. හැම උසාවියක්ම ඇප ප්‍රතික්ෂේප කළා. මහේස්ත්‍රාත් උසාවිය කිව්වා, ඇප දෙන්න බැහැ කියලා. ඔහුව අත් අඩංගුවට ගන්නවාට විරුද්ධව ඇප ඉල්ලා ගෙන ගියා. ඇප ප්‍රතික්ෂේප කළා.

මහාධිකරණයේ තවම නඩුවක් යනවා, එතුමාට අවශ්‍ය කරන ඒ තීන්දුව තවම දුන්නේ නැහැ. එහෙම තියෙද්දී, එතුමා හැම උසාවියකටම ගිහිල්ලා ඇප ඉල්ලලා ඇප ගන්න බැරි වුණාම අන්තිමට මේකේ පුදුමය කියන්නේ එතුමාගේ නඩුව තියෙන උසාවියෙන් එතුමාට ඇප ලැබුණා. කොහොමද වැඩේ? වටේ ගිහිල්ලා, ගිහිල්ලා ඒ හැම උසාවියකින්ම ඇප ගන්න බැරි වුණා. ඔක්කෝම උසාවි ඇප දීම ප්‍රතික්ෂේප කළා. නමුත් නඩුව තියෙන උසාවියෙන් ඇප දුන්නා. එහෙම වුණේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ළඟ කට උත්තරයක් තිබෙනවා. මම එය මේ ගරු සභාවට කියවන්න ඕනෑ. මේ කට උත්තරය දුන්නේ කවුද? චන්දන රාජගුරු කියන වෛද්‍යවරයා. ඔහු මෙහෙම කියනවා:

"තමා මෙම පශ්චාත් මරණ පරීක්ෂණයෙන් ටික කලකට පසු විදේශ පුහුණුවක් සඳහා සෘතුගාලයට ගොස් වසර දෙකකට පමණ පසු දිවයිනට පැමිණි බවත්, එසේ පැමිණ සිටින විට 2015 ජනවාරි මාසයේදී නව ජනාධිපතිතුමා පත්වීමෙන් පසු මෙම තාජුඩීන්ගේ ඝාතනය සම්බන්ධයෙන් නැවත පරීක්ෂණ ආරම්භ කර ඇති බව විවිධ මාධ්‍යවලින් ප්‍රචාරය වුවත්, තමා ඒ ගැන විශේෂ අවධානයක් යොමු නොකළ බවත්, 2015 ජුනි මාසයේදී තම ජංගම දුරකථනයට වෛද්‍ය ආනන්ද සමරසේකර මහතා කථා කර තමාට තාජුඩීන්ගේ post-mortem එකට කටඋත්තර දෙන්න CID එකට එන්න කියලා තියෙනවා. ඒකට ඔහේටයි, ශ්‍රියන්තටයි එන්න කියයි. අපි ඔක්කෝම එක විධියකට කට උත්තර දෙන්න ඕනෑ. නැත්නම් ඔය ගොල්ලන්ට ලොකු ප්‍රශ්නයක් වෙයි.ඔයා ශ්‍රියන්තත් එක්ක ඇවිත් මාව හම්බ වෙන්න කියා තමාට කිව්ව බවත්, එවිට තමා, සර් මේක අපි කළේ නැහැ නේ, මේකට අපි සහාය වුණා විතරයි නේ, අපි මොකටද මේකට කටඋත්තර දෙන්නේ කියා කිව්ව විට, වෛද්‍ය සමරසේකර මහතා විසින්, රාජගුරු, තමුන් තාම සර්විස් එකේ ඉන්නවා, මම කියන විධියට වැඩ කළේ නැත්නම් තමුන්ට ලොකු ප්‍රශ්නයක් වෙයි කියා තර්ජනාත්මක ස්වරූපයෙන් කිව්ව බවත්, ඊට පසු තමා වෛද්‍ය ශ්‍රියන්ත අමරරත්නට කෝල් කරලා මේ ගැන කිව්ව විට...."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කටඋත්තරය කාගේද? වෛද්‍ය චන්දන රාජගුරුගේ. එයාගේ කටඋත්තරය දීලා තිබෙනවා. මෙහෙම කටඋත්තරයක් දීලාත් අත් අඩංගුවට ගත්තේ නැහැ. මීළඟට තිබෙනවා,- [බාධා කිරීමක්] ඒක තමයි ප්‍රශ්නය. කවුද ගන්නේ නැත්තේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -[බාධා කිරීමක්] මම මේ කියන්නේ සියලු දෙනාට දැන ගන්නයි. මොකද, අපි මේ ආණ්ඩුව හැදුවේ මේ රටේ නීතියේ ආධිපත්‍යය හදන්නයි. මේවා කරන්න නොවෙයි. කවුරුවත් ආරක්ෂා කරන්න නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මේ කටඋත්තරය දෙන්නේ අනෙක් වෛද්‍යවරයා වන ශ්‍රියන්ත අමරරත්න මහත්මයා. එතුමා කියනවා:

"මම කියන විධියට ඔය දෙන්නත් කටඋත්තර දෙන්න ඕනෑ කියලා. තාජුඩීන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ ඔහු වරින් වර පැමිණ එය නිරීක්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබා දුන් බව පවසන ලෙසත්, මරණකරුගේ ශ්වාස නාලයත්, පපු අස්ථියත්, කලවා අස්ථි දෙකත් පරීක්ෂණ කටයුතු සඳහා ලබා ගත් බව ප්‍රකාශ කරන්න කිව්ව බවත්, එවිට තමන්ලා දෙන්නාම එක් වරම 'සර් අපි ඒවා ගත්තේ නැහැ නේ, අපි ගන්නේ සාම්පල්වලට ලේ, මුත්‍රා, පිත හා ඩී.එන්.ඒ. පරීක්ෂණයට අවශ්‍ය සාම්පල් නේ' කියා පැවසූ විට, නැහැ, නැහැ එහෙම නොවෙයි, මම කියන විධියට කරන්න, ඔය දෙන්නාට ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඔය දෙන්නාත් මූලිකවයි මේක කළේ. මම කියන විධියට ඔයාලට එන්න කිව්වහම, දෙන්නාම ගිහින් එක විධියට කටඋත්තර දෙන්න, පරස්පර වෙන විධියට කටඋත්තර දෙන්න එපා කියා තමාලාට උපදෙස් දුන්න බවත්...."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා උපුටා දක්වන්නේ ඉතාම වැදගත්, ජනතා අවධානයට ලක් වෙච්ච කරුණක් ගැනයි. එම නිසා ඔබතුමා ඔය ලේඛනයේ වගකීම අරගෙන ඔය ලේඛනය සභාගත කරන්න සූදානම්ද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මම ඉතාම වගකීමෙන් මේ කාරණය කියන්නේ. මම මේ ලේඛනය **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි දීපු කටඋත්තරය.

මේ වාර්තාවේ තව තැනක තිබෙනවා:

"මේ සම්බන්ධව වෛද්‍ය ශ්‍රියන්ත අමරරත්න මහතාගෙන් දීර්ඝ ලෙස කරුණු විමසීමේදී, ඔහු වැඩි දුරටත් කියා සිටියේ, 2015 වසරේ මැද භාගය වන විට තමා රාජකාරි කරමින් සිටියේ පුත්තලම මූලික රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා ලෙස බවත්, එසේ සිටින විට 2015 ජුනි මාසයේ දින කිහිපයක්ම වෛද්‍ය ආනන්ද සමරසේකර මහතාගෙන් තමාට දුරකතන ඇමතුම් කිහිපයක් ලැබුණ බවත්, තමා ඒවාට ආන්සර් නොකළ බවත්, එයට හේතුව තාජුඩීන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය සම්බන්ධව සකස් කරන ලද වාර්තාවලට තමාට අත්සන් කිරීමට කිවූ විට, තමා එය ප්‍රතික්ෂේප කළ බවත්, නමුත් වෛද්‍ය ආනන්ද සමරසේකර මහතා යටතේ තමා විශේෂඥ අධිකරණ වෛද්‍යවරයෙකු ලෙස පත්වීම් ලබා ගැනීම සඳහා පුහුණුව ලැබූ බවත්, එසේ පුහුණුව ලැබූ බවට ඔහුගෙන් ලබා ගත යුතු වාර්තාවට ඔහු අත්සන් නොකරන බව කියා, තමාට තර්ජනය කළ බවත්, පත්වීම් ලබා ගැනීමට එම අත්සන ලබා ගත යුතු බැවින්, තාජුඩීන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධව

අංක බී 849/12 දරන කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2013.04.09වන දින ඉදිරිපත් කරන ලද වාර්තාව තමා අත්සන් කළේ අකැමැත්තෙන් බවත් ප්‍රකාශ කරන ලදී".

කවුද මේ කියන්නේ? මේ කියන්නේ ආනන්ද සමරසේකර මහත්මයා යටතේ තාජුඩීන්ගේ මරණ පරීක්ෂණයට සම්බන්ධ වුණු වෛද්‍ය නිලධාරින් දෙදෙනා. ඔවුන් CID එකට ගිහින් කටඋත්තරයක් දීලා තිබෙනවා, "ආනන්ද සමරසේකර මහත්මයා අපට බල කරනවා, අපට බලපෑම් කරනවා තාජුඩීන්ගේ මරණය සම්බන්ධව කටඋත්තරය වෙනස් කරලා දෙන්න, එහෙම කළේ නැත්නම් බලාගෙන කියලා තර්ජනය කරනවා" කියලා. එහෙම තර්ජනය කරපු ආනන්ද සමරසේකර මහත්මයා දවල් 1.30ට උසාවියට ගිහින් ඇප අරගෙන යනවා. කොහොමද එහෙම වෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකයි මම කිව්වේ මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක් කියලා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම කිව්වේ ඒකයි. එහෙම නම් මේ ආනන්ද සමරසේකර මහත්මයාට එළියට යන්න ඔක්කොමලා උදව් කරලා තිබෙනවා. මොකක් යටතේද නඩු පවරන්න ඕනෑ, කොහොමද ඉදිරිපත් කරන්න ඕනෑ කියලා නීතිපති දෙපාර්තමේන්තුව CID එකට උපදෙස් දෙන්නේ නැහැ.

සාක්ෂි මැකුවාය කියලා CID එක එතුමා උසාවියට ඉදිරිපත් කළේ, 198 වන වගන්තිය යටතේ. මේ මරණය සිදු කරන්න කුමන්ත්‍රණය කළාය, ඊට සම්බන්ධ වුණාය, මේ මරණය කරන්න සැලසුම් කළාය කියලා අනුර සේනානායක මහත්මයයි, නාරාහේන්පිට OIC මහත්මයයි අපරාධ නඩු විධාන සංග්‍රහයේ 297 වන වගන්තිය යටතේ උසාවියට ඉදිරිපත් කරන්න පුළුවන් වුණා නම්, ආනන්ද සමරසේකර මහත්මයා විතරක් 198 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරලා ඇප දෙන්න පුළුවන් විධියට කටයුතු කළේ ඇයි? ආනන්ද සමරසේකර මහත්මයා මේ නඩුවෙන් බේරලා යවන්න කිහිප දෙනෙකුට උවමනා වෙලා තිබෙනවා. අධිකරණ ඇමතිතුමියනි, නීතිපති දෙපාර්තමේන්තුවටත් එහෙම උවමනාවක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ.

පසුගිය කාලයේ අපි දැක්කා, අපේ මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධව පත් කළ කොමිසමේදී නීතිපති දෙපාර්තමේන්තුව කොයි තරම් ආවේගශීලීව, කොයි තරම් ප්‍රහාරාත්මක ලෙස කටයුතු කළාද කියලා. අපි බලාගෙන හිටියා. නමුත් තජුඩීන්ගේ ඝාතනය සම්බන්ධයෙන් එහෙම එකක් නැහැ. තජුඩීන්ගේ ඝාතනය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ඒ ආවේගශීලීත්වය - aggressiveness - නැහැ. එතැනදී තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත; මන්දගාමී ස්වභාවයක් තිබෙන්නේ. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය මේ අමාත්‍යාංශයේ වැඩ භාර ගත්තා. අපි ඔබතුමියගෙන් ඉල්ලන්නේ මේ වෙනස. නීතිය සැමට එක හා සමානව ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියලා පසු ගිය කාලයේ අපි පෙළපාළි ගියා, උද්ඝෝෂණ කළා. ඒ වෙනුවෙන් අපේ ලසන්ත වික්‍රමතුංගලා, ප්‍රගීත් එක්නැලිගොඩලා තමන්ගේ ජීවිත පූජා කළා. මේ රටේ නීතියේ ආධිපත්‍යය හදන්න ඕනෑය කියලා කියන්න ගිහිල්ලා අපි දහස් ගණනක් කඳුළු ගෑස් කෑවා. අපි ඒ ඉතිහාසය මතක් කර ගන්න ඕනෑ. මොන ලොක්කා වුණත්, මේ රටේ කවුරු වුණත්, මේ රටේ නීතියට යටත් කර ගන්න, ඒ නීතියේ ආධිපත්‍යය හදන්න තමයි අපි යහපාලන ආණ්ඩුව ගෙනාවේ. යහපාලන ආණ්ඩුව ඒ මාර්ගයේ ගමන් කළ යුතුයි. ඒක තමයි අපි සියලු දෙනාගේම බලාපොරොත්තුව. යහපාලන ආණ්ඩුව ඒ මාර්ගයෙන් පිට පනිනවා නම්, යහපාලන ආණ්ඩුව ඒකෙන් අයින් වෙනවා නම්, යහපාලන ආණ්ඩුව මිනීමරුවන් ආරක්ෂා කරන්න ඉස්සරහට එනවා නම්, ඒ මිනීමරුවන්ට මේ දැල්වලින් පැනලා යන්න ඉඩ දෙනවා නම්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව යටතේ, ඒ ඒකාධිපති සපත්තුව යටතේ දුක් විඳලා අපි හදා ගත්ත මේ ආණ්ඩුව හදා ගත්තේ මොකටද කියලා අපට දවසක හිතෙයි. අපට එහෙම හිතෙන්න දෙන්න එපා. ඒ නිසා තජුඩීන්ගේ පවුලට සාධාරණත්වය ඉෂ්ට කරන්න. ආනන්ද සමරසේකර කියන්නේ මේ නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු. ඔහු ඔක්කෝම දේවල් දන්නවා. ඒ නිසා තමයි ඔහු එක එක තැන්වලට ගිහිල්ලා හැංගි හැංගි බේරිලා ඉන්නේ. ඔහු තවම කටඋත්තර දෙන්නේ නැහැ. දැනුත් ඔහු ඔහුගේ නීතිඥ මහත්වරු මාර්ගයෙන් පණිවුඩ යවනවා. "මම අද ඉන්නේ යාපනය ඉස්පිරිතාලයේ admit වෙලා, අද මේ ඉස්පිරිතාලේ admit වෙලා ඉන්නවා, අද මට අසනීපයි, CID එකට එන්න බැහැ" කියමින් තවම එයා හැංගි හොරා සෙල්ලම් කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2015 වසරේදී අපි ඒ ඓතිහාසික ජයග්‍රහණය ලබා ගත්තේ, ඒ ඓතිහාසික විප්ලවය කළේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මේ රටේ පවුල්වාදය අවසන් කරන්නයි. ඒ වාගේම මේ රටේ සියලු දෙනාට සමානව ජීවත් වීමේ අයිතිය ලබා දෙන්නයි. අපි දැන් අලුත් වෙනසකට යනවා. අපි සියලුදෙනාටම පිළිගන්න පුළුවන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න කටයුතු කරලා තිබෙනවා. කාලයක් තිස්සේ අපි මරා ගත්තා. කාලයක් තිස්සේ අපි ඇන කොටා ගත්තා. ඒ සියලු දේවල් වෙනස් කරලා අපි සියලුදෙනාටම ශ්‍රී ලාංකිකයන් හැටියට ජීවත් වීමේ අයිතිය ලබා දිය යුතු බව පිළිගැනීම මතයි අපි මේ ව්‍යවස්ථා වෙනසට යන්න ලැහැස්ති වෙන්නේ. අපි අලුත් රටක් හදන්න අලුත් දිශාවකට ගමන් කරන මේ මොහොතේ "නීතියේ ආධිපත්‍යය" කියන දේ අපි සියලු දෙනාටම වැදගත් දෙයක්. අපේ අලුත් අධිකරණ ඇමතිතුමිය යටතේ ඒ සාධාරණත්වය ඉෂ්ට වෙයි කියලා බලාපොරොත්තු වෙමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

*අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ***ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. BIMAL RATHNAYAKE left the Chair, and THE HON. EDWARD GUNASEKARA took the Chair.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ කාලයක් ලැබී තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබී තිබෙනවා.

[අ.භා. 5.39]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ස්තුතියි.

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මගේ කථාව කරන්නට ලැබුණු මේ අවස්ථාවේදී පළමුවෙන්ම මම ඉගෙන ගත්ත මූලික කාරණයක් කියන්න ඕනෑ. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත්, මමත් එක පක්ෂයක හිටපු කාලයේ මේ පාඨය ඉගෙන ගත්තා. "Rule of law" කිව්වාට, අන්තිමට ඒක ක්‍රියාත්මක වෙන්නේ "law of the rulers" වශයෙන්. මේක මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමායි, මමයි දෙදෙනාම ඉගෙන ගත්ත පාඩමක්. නමුත් එතුමා ඒක මතක නැතිවුණා වගේ කථා කරනවා. මම නම් මොන ආණ්ඩුවේ හිටියත් දන්නවා, අපි ඉන්න ආණ්ඩුව මොකක්ද, ඒ ආණ්ඩුව යටතේ වෙන්නේ මොනවාද, මොන හේතු කාරණා මත අපි ඒ ආණ්ඩුත් එක්ක ඉන්නවාද කියලා. ලෝකයේ තිබෙන ප්‍රධානතම ප්‍රතිවිරෝධය තමයි අධිරාජ්‍යවාදය සහ ජනතාව අතර තිබෙන ප්‍රතිවිරෝධය. ඒ නිසා පමණයි අපි ආණ්ඩුත් එක්ක ඉන්නේ. අධිරාජ්‍යවාදීන්ගේ නොපනාමයට හේතු වූ ආණ්ඩු හැටියට අපි හිටපු ආණ්ඩු හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාවට පෙරළා දැමූ ආණ්ඩු හැටියටත් අපි හිටපු ආණ්ඩු හඳුනාගෙන තිබෙනවා. අන්න ඒ කාරණය උඩ පමණයි අපි අපේ ආණ්ඩු තුළ සිටියේ. මේ වෙලාවේ අපට ඒක මතක් වෙනවා.

ඊළඟට මේ රජය යටතේ පවතින තත්ත්වය ගැන බරපතළ චෝදනා පත්‍රයක් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. අපරාධ පරීක්ෂණ කටයුතු සිදුවන ආකාරය ගැනත්, ඒවා එසේ වීමට හා නොවීමට හේතු වන බලපෑම් පිළිබඳවත් ඔහු කරපු ඇඟිල්ල දිගු කිරීම සහ ඔහු කරපු සැක මුසු ප්‍රකාශ සියල්ලටම ආණ්ඩුව පිළිතුරු දිය යුතු වෙනවා. මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කරුණු සියල්ල අපි ඒ විධියටම භාරගත්තොත්, අවසාන වශයෙන් මේ ආණ්ඩුවේ පළිගැනීමට ලක්විය හැකි මේ ආණ්ඩුවේ විරුද්ධවාදීන්ට, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටින අපට යන කලදසාව කුමක් වෙයිද? මේ ආණ්ඩුව තදින්ම කළ යුතු පරීක්ෂණයක් හැටියට සලකපු එකක් ගැන, එහිදී ආණ්ඩුව ගත් ක්‍රියාවලිය ගැන ආණ්ඩුව මේ තරම් බරපතළ චෝදනාවලට ලක්වෙනවා නම්, අපට කුමන ඉරණමක් අත් වෙයිද කියා අපට හිතන්න වෙලා තිබෙනවා.

මේ රජය යටතේ -මේ රජයේ අනුග්‍රහය ඇතිව- අන්තිම දූපත්‍රා ඇතුළු සෑම පුරවැසියෙකුගෙන්ම රුපියල් ලක්ෂ ගණනක මුදලක් කොල්ල කා තිබෙනවා. මීට වඩා අපරාධයක් තවත් තිබෙනවාද? මේක සාමූහික ජාතික අපරාධයක්. ඉතින් නීතියේ ආධිපත්‍ය කෝ? මෙබඳු වූ මහා විශාල අපරාධයක් පිළිබඳව නීතියේ ආධිපත්‍ය නිහඬ වීම තමයි මට තිබෙන ප්‍රශ්නය. නීතිය කොල්ල කෑමටද නීතියෙන් අවසර දී තිබෙන්නේ? එහෙම නැත්නම් කොල්ල කෑමට විරුද්ධවද අපි නීතිය ලියා තිබෙන්නේ? එහෙම නම්, ඒ නීතියේ ආධිපත්‍යයට කුමක්ද සිදුවුණේ? ඒ නීතියේ ආධිපත්‍ය ගොළු වුණේ ඇයි? මෙන්න මේවා අද විමසමින් තිබෙන ප්‍රශ්න. නමුත් ඒ ගැන මම දිගට කථා කරන්න යන්නේ නැහැ.

මම ඊළඟට එනවා, මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව 85 දක්වා වැඩි කිරීම පිළිබඳ වූ යෝජනාවට. ඒ යෝජනාව අවශ්‍ය යෝජනාවක් බව අපි පිළිගන්නවා. මම ඒකට තව එක කාරණයක් එකතු කරන්න කැමැතියි. මහාධිකරණය ඉදිරියට යන, මුදල් නැති චූදිතයන්ට ඉතා අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ට රජයෙන් නීතිඥයෙක් දෙනවා. නමුත්, අපි කවුරුත් දන්නා ආකාරයට ඒ නීතිඥයින් කනිෂ්ඨ අය. ඇත්තටම ඒ නීතිඥයන්ට විත්තිකරුවෙක් ආරක්ෂා කරමින් පෙනී සිටීමට, නීතිය හරඹ කරමින් පෙනී සිටීමට තරම් දක්ෂතාව මඳ බව අපි කාටත් පිළිගන්න වෙනවා. අපි නීති ක්ෂේත්‍රය පිළිබඳව දන්නා ආකාරයට මම කියන්නේ, ඇත්තටම සැකකරුවෙක් කියන්නේ සැකකරුවෙක්. ඊළඟට ඔහු චූදිතයෙක්. ඇත්තටම ඔහු ඒ චෝදනාවට ලක්විය යුතු නැති පුද්ගලයෙක් නම්, ඔහුට ඒ චෝදනාවෙන් මිදෙන්නට ඔහුට තිබෙන සාධාරණ අයිතිය ඉටුකර දීමට රජයක් හැටියට අද අපි ඉටු කරන කාර්යය ප්‍රමාණවත්ද?

මහාධිකරණ විනිශ්චයකාරවරුන් වැඩි කරනවා වාගේම assigned counselsලාට; රජයෙන් පත් කරනු ලබන නීතිඥවරුන්ටත් මහාධිකරණයේ විත්තිකරුවන් ආරක්ෂා කරන්න මීට වඩා හොඳ ගාස්තුවක් ලබා දෙනවා නම් පමණයි හොඳ නීතිඥවරුන් ලබා ගන්න පුළුවන් වන්නේ. හොඳ ගාස්තු ලැබෙනවා නම් නඩු ඉල්ලා ගෙන එන්න පුළුවන්.

මා කිව යුතු තව කාරණයක් තිබෙනවා. අපේ කම්කරු උසාවි අභියාචනා නඩු යන්නේ ප්‍රථම උසාවිය හැටියට මහාධිකරණයටයි. අපි කවුරුත් දන්නවා, මහාධිකරණයේ කොපමණ නඩු සම්භාරයක් තිබෙනවාද කියලා. මේවා අතරේ තමයි කම්කරු විනිශ්චය සභා නඩුවල අභියාචනාත් විභාග වන්නේ. කම්කරු ක්ෂේත්‍රයේ නඩු; කම්කරු විෂය සම්බන්ධ නඩු ගත්තාම, විශේෂ නීති දැනුමක් අවශ්‍ය, විශේෂ නීති සම්ප්‍රදායයන් ඇති ක්ෂේත්‍රයක් කියලා මා හිතනවා. දැන් මේ කියන වාණිජ නීතිය විශේෂ දැනුමක් අවශ්‍ය නීතියක්. විහාර හා දේවාලගම් පනත නීතිය විශේෂ දැනුමක් අවශ්‍ය නීති ක්ෂේත්‍රයක්. මේ විධියට විශේෂ දැනුමක් අවශ්‍ය ක්ෂේත්‍රවලට අයත් නීති පිළිබඳව කටයුතු කරන අධිකරණයන් වෙන් වශයෙන් පත් කරන්නට සැලසුම් කර තිබීම අලුත් ප්‍රවණතාවක් හැටියට අපි කවුරුත් දකිනවා. යම් විෂයක් ගැඹුරුයි. ඒ විෂයටම ආවේණික වූ විශාල දැනුම් සම්භාරයක් තිබෙනවා. ඒ දැනුම ඇතිවයි අධිකරණමය තීරණයකට යාමට වඩා හොඳ පුළුවන්කමක් ලැබෙන්නේ. එහෙම නම් කම්කරු උසාවි අභියාචනා නඩු සම්බන්ධයෙන් පොදුවේ මහාධිකරණය ප්‍රථම අභියාචනාධිකරණය කරනවා වෙනුවට, කම්කරු සබඳතා මහාධිකරණයක් ඇති කරන්නට බැරිද? කම්කරු සබඳතා මහාධිකරණ එකක් නොවෙයි, කම්කරු සබඳතා මහාධිකරණ කිහිපයක් ඇති කරන්න බැරිද? දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරයක කම්කරු සබඳතා මහාධිකරණ එක බැගින් ඇති කරන්න බැරිද?

කම්කරු සබඳතා පිළිබඳ මහාධිකරණයන්ට පත් කරන විනිශ්චයකාරවරුන්, කම්කරු උසාවිවලම ඉන්න ඉතාම දක්ෂ, ජ්‍යෙෂ්ඨතම අධිකරණ නිලධාරින් අතරින් තෝරා ගන්නත් පුළුවන්. මා හිතන හැටියට මේ කටයුත්ත කළොත් සේවකයාට විශාල යුක්තියක් ඉටු වනවා. අභියාචනා නඩු කටයුතු කර ගෙන

යන්න හයිය තිබෙන්නේ සේවකයාට නොවෙයි, සේවායෝජකයාටයි. සේවායෝජකයන්ගේ අභියාචනා විමසා බලන අධිකරණයක සේවකයා වෙනුවෙන් නිසි යුක්තියක් ඉටු වන්නට අවශ්‍ය කරන තරමේ ඒ විෂයය පිළිබඳව දැනුමක් ඇති විනිශ්චයකාරවරුන් ඒ උසාවිවල ඉන්නවා නම් තමයි එය ඉටු වන්නේ.

කම්කරු සබඳතා පිළිබඳ දැනුම ඇති උදවිය මේ මහාධිකරණවලට පත් කරන්නය කියලා කියන්න අපට පුළුවන්කමක් නැහැ. කම්කරු සබඳතා පිළිබඳ දැනුම, පරිචය, දීර්ඝ කාලීන අත් දැකීම් ලැබූ විනිශ්චයකාරවරුන් මහාධිකරණවල විභාග වන කම්කරු උසාවි අභියාචනාවලදී සේවකයාගේ පැත්තට අයුක්තියක් නොවන්නට කටයුතු කරනවා. ඒ ආකාරයට අලුතෙන් කම්කරු සබඳතා මහාධිකරණ ඇති කරලා, - "කම්කරු සබඳතා මහාධිකරණ" වශයෙන් ඒවා නම් කරලා - කම්කරු උසාවිවල හොඳ පරිචයක් ලැබූ අධිකරණ නිලධාරින් ඒවාට පත් කිරීම තුළින් යුක්තියක් ඉටු කරන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා. හැබැයි මෙය තවත් වියදම් යන කටයුත්තක්. එක දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරයකට කම්කරු සබඳතා මහාධිකරණය බැගින් ඇති කරන්න ඕනෑ. එතකොට නම් විනිශ්චයකාරවරුන් 85 සංඛ්‍යාවට වඩා වැඩියෙන් අවශ්‍ය වන්න පුළුවන්. නමුත් මා කථා කළේ සේවකයාට වඩා හොඳ යුක්තියක් ඉටු වන්න පුළුවන් ආකාරය ගැනයි. එහෙම නැත්නම් අභියාචනයක් ඉදිරිපත් කරලා, ඒ වෙනුවෙන් විශාල දැනුම ඇති නීතිඥවරුන් ඉදිරිපත් වෙලා කරුණු කියන්න පටන් ගත්තාම, එම අධිකරණයේ සිටින, එම අභියාචනයට ඇහුම් කන් දෙන, -සවන් දෙන- විනිශ්චය කරන, විනිශ්චයකාරවරුන්ට විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඒ ප්‍රමාණයටම නොතිබුණොත්, එවැනි අවස්ථාවලදී සේවකයන්ට විශාල අයුක්තියක් වන බවයි මගේ අදහස වන්නේ.

මීළඟ කාරණය, අපි ව්‍යවස්ථා සභාවක් පත් කළා. එම ව්‍යවස්ථා සභාවෙන් ස්වාධීන කොමිෂන් සභා පත් කළා. මෙය කලක් තිස්සේ තිබුණු ඉල්ලීමක්. ස්වාධීන කොමිෂන් සභා මොනවාද කියලා කියන්න මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වන්නේ නැහැ. අපට මෙතැනදී වැඩියෙන්ම වැදගත් වන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. මේ ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන්ව තිබෙනවා. ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ස්වාධීන කොමිෂන් සභා අනිවාර්යයෙන්ම මේ පාර්ලිමේන්තුවට වග කිව යුතු වනවා. ඔවුන් මේ පාර්ලිමේන්තුවට වග කියන්නේ කෙසේද? මෙන්න මේ ප්‍රශ්නයට තවම උත්තරයක් නැහැ. පාර්ලිමේන්තුව දැනුවත් කිරීම හා අප නඟන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ව්‍යවස්ථා සභාව හෝ ස්වාධීන කොමිෂන් සභා කොයි තරම්දුරට තම කාර්ය භාරය ඉටු කර තිබෙනවාද කියන කාරණය සලකා බැලිය යුතුයි.

මෙම ප්‍රශ්නය මා නඟන්නේ මේ නිසායි. විශේෂයෙන්ම අධිකරණ සේවා කොමිෂන් සභාවට විෂයය වූ ප්‍රශ්නයක් ගැන මා විමසීමක් කළා. ඒ දිසා විනිසුරුවරයෙකුගේ ස්ථාන මාරුවක් ගැනයි. මට මතක නැහැ, එතුමා දිසා විනිසුරුවරයෙක්ද, මහාධිකරණ විනිසුරුවරයෙක්ද කියලා. එම ස්ථාන මාරුව නොමනා ස්ථාන මාරුවක් කියලා මගේ දැනුම අනුව හා මගේ මැනීම අනුව මට පෙනී ගියා. ඒ නිසා මන්ත්‍රීවරයකු හැටියට මා ඒ ගැන විමසීමක් කළා. සමහර විට මා නොදන්නා කරුණු තිබෙන්න පුළුවන්. කෙළින්ම ඒ පිළිබඳව කිසියම් ඇඟවීමක් නොකර, කිසිම චෝදනාවක් නොකර, මේ විනිශ්චයකාරතුමා මේ විධියට ස්ථාන මාරු කරන්නට යෙදුණේ ඇයි කියන ප්‍රශ්නයට පිළිතුරක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් මා අධිකරණ සේවා කොමිසමට ලියුමක් යැව්වා. නමුත් මට පිළිතුරක් ලැබුණේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට එහෙම ප්‍රශ්නයක් අහන්න අයිතියක් තිබෙනවාද, නැද්ද කියන එක අප වෙනම විසඳා ගත යුතු ප්‍රශ්නයක්. නමුත් මන්ත්‍රීවරයෙකු හැටියට - මගේ දැනීමේ හැටියට; මගේ මැනීමේ හැටියට හා මගේ අවංක උත්සාහයක් හැටියට- මා යමක් විමසා අධිකරණ සේවා කොමිෂන් සභාවට ලියුමක් යැව්වාම, එයට පිළිතුරක් එවීමට නොහැකි වීම එම කොමිසමේ වගකීම ඉටු කිරීමක්ද, එහෙම නැත්නම් වගකීම පැහැර හැරීමක්ද? ස්වාධීන කොමිෂන් සභාවකට මන්ත්‍රීවරයෙකුට ලියන්න බැරිද? ස්වාධීන කොමිෂන් සභාවකට මන්ත්‍රීවරයෙකුට පිළිතුරක් එවීමට වගකීමක් සහ බැඳීමක් නැද්ද? මේ හැම මන්ත්‍රීවරයකුම මුළු පාර්ලිමේන්තුවම නියෝජනය කරනවා. 'පාර්ලිමේන්තුවට වග කියනවා'යි කියලා තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ. මේ කාරණය ගැන පසුව මා ව්‍යවස්ථා සභාවට ලිව්වා. ව්‍යවස්ථා සභාවට ලියුමක් මඟින් දැන්වුවා, "මම මෙන්න මෙහෙම ලිව්වා, මෙන්න මගේ ලියුමේ පිටපත. මට උත්තරයක් නැහැ" කියලා. ඊට පසුව මට උත්තරයක් ලැබුණා. මම හිතන විධියට ව්‍යවස්ථා සභාව විසින් අධිකරණ සේවා කොමිසමට කිව්වා, "මේ ගැන යම් පිළිතුරක් සපයන්න"යි කියලා. එහෙම කියන්න ඇති කියලා මා හිතාගෙන ඉන්නවා. ව්‍යවස්ථා සභාව මට එහෙම කිව්වේ නැහැ.

ඊට පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මට පිළිතුරක් එවා තිබුණා. එම පිළිතුරේ තිබෙන්නේ එක් වාක්‍යයයි. එහි සඳහන් කර තිබුණා, අධිකරණ සේවා කොමිෂන් සභා නීතියේ අහවල් වගන්තිය යටතේ විනිශ්චයකාරවරුන්ගේ ස්ථාන මාරු වීම් කිරීමට අයිතියක් තිබේ කියලා. එම ස්ථාන මාරුවීම කළේ ඇයි කියලායි මම ඇහුවේ. නමුත් මට උත්තරය එවා තිබුණේ "ඇයි?" කියන එකට නොවෙයි. මම ඇසුවේ නැති ප්‍රශ්නයකට තමයි ඔවුන් උත්තර එවා තිබුණේ. ඔවුන්ට විනිශ්චයකාරවරුන්ගේ ස්ථාන මාරුවීම් කරන්න බලයක් තිබෙනවාද කියලා මා ඇහුවේ නැහැ නේ. නමුත් මට දන්වා එවුවේ, "මේ වගන්තිය යටතේ මාරු කිරීමට බලයක් තිබේ" කියායි. අහපු ප්‍රශ්නයට නොවෙයි ඔවුන් උත්තර එවා තිබුණේ. මම ආපසු ව්‍යවස්ථා සභාවට මේ කාරණය ගැන සඳහන් කරලා ලියුමක් යැව්වා, "මේ බලන්න, මම යවපු ලියුමේ තිබෙන ප්‍රශ්නයට එතුමන්ලා එවපු උත්තරය. මේ අනුව ව්‍යවස්ථා සභාව මෙයට මැදිහත් වන්න" කියලා. ඊළඟට, ව්‍යවස්ථා සභාව මට දන්වා එවා තිබෙනවා, "මේවා ගැන අපට මැදිහත් වෙන්න බැහැ. අපි හුඟක් දුරට මේ ගැන කල්පනා කර බැලුවා. මේක ස්වාධීන කොමිෂන් සභාවක්. ස්වාධීන කොමිෂන් සභාවක් නිසා අපට මැදිහත් වෙන්න බැහැ" කියලා.

මම මැදිහත් වෙන්න කියන්නේ ස්ථාන මාරුව නවත්වන්නට නොවෙයි. මම මැදිහත් වෙන්න කියන්නේ මේ ස්ථාන මාරුව දුන්නේ ඇයිද කියන එක ගැන මම මතු කරලා තිබෙන ප්‍රශ්නයට උත්තරයක් ගන්නට. ඒ ප්‍රශ්නයට උත්තරය වෙන්නේ මොකක්ද? මෙන්න මේ මේ කරුණු නිසා ස්ථාන මාරු කිරීමට අපට සිද්ධ වුණා කියන එක. නමුත් ඒක නොවෙයි කියලා එවලා තිබෙන්නේ. එම නිසා මම හිතනවා මේ ස්වාධීන කොමිෂන් සභාවල ස්වාධීනත්වයේ සීමාවත්, මේ ස්වාධීන කොමිෂන් සභා පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන අයිතියත් අතර නිවැරදි මායිම අපි හඳුනා ගන්නට ඕනෑ කියලා. පාර්ලිමේන්තුවට අයිතියක් නැද්ද මේ කොමිෂන් සභාවලින් යම් යම් කරුණු කාරණා දැන ගන්නට? එසේ දැන ගන්නට අයිතියක් තිබෙනවා නම් ස්වාධීන කොමිෂන් සභාවලට අයිතියක් තිබෙනවාද ඒ පිළිබඳව හේතු දැක්වීමකට වඩා තමන්ට තිබෙන බලය මේකයි කියලා හුදු ප්‍රකාශයක් කරන්නට.

මම මේකෙන් නැවතිලා නැහැ. මම තවම දන්නේ නැහැ කිසිම වාර්තාවක් ගැන අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මේ පාර්ලිමේන්තුවට දුන්නු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුවට වග කියන්නට ඕනෑ. පාර්ලිමේන්තුව මඟින් අපියි

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කළේ. එහි නිල බලයෙන් පත් වෙන අය සහ පාර්ලිමේන්තුවෙන් පත් කරන අය සිටිනවා, අපේ ඡන්දයෙන් පත් කරලා යවපු අය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට විනාඩි 18ක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, දැන් ඒවා ඉවරයි. තව විනාඩි 2යි තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වේගයෙන් කාලය ගෙවී ගොස් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ඔබතුමා දිගට කථා කළානේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ කථාවේ අග කොටසට එන්නට ඔබතුමාගේ අනුග්‍රහයක්වත් ලබා දෙන්න පුළුවන්ද බලන්න. බලන්න, දෙන්න කියලා කිව්වා නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, බලමු.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ඊළඟට කියන්නට හදන්නේ මෙයයි. මම අපේ අධිකරණ ඇමතිතුමියට ලියුමක් යැව්වා. එතුමිය සුපුරුදු කාරුණික ආකාරයට පිළිතුරක් එව්වා. ඒ ගැන ස්තුතියි. ඔබතුමිය කියලා තිබෙන්නේ "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක්. මට ඕකට මැදිහත් විය නොහැක."කියලා. මම ඇහුවේ මෙයයි. හිටපු මන්ත්‍රී රාජිව් විජේසිංහ මහත්මයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලියුමක් යවලා, ප්‍රකාශයකුත් දීලා තිබුණා. ඒ, අගමැතිතුමාට රුපියල් මිලියන 65ක් දෙන්නට විජේසූරිය කියලා පුද්ගලයෙක් ගෙදරටම ගිහින් චෙක් පතකින් ඒක දුන්නා කියලා රාජිව් විජේසිංහ මහත්මයාට කිව්වාය; රාජිව් විජේසිංහ මහත්මයා ඒ තොරතුර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දුන්නාය; ඒ ගැන ප්‍රකාශයකුත් ගත්තාය, ඉන් පසුව වෙච්ච දෙයක් නැත කියලා. ඒ තොරතුර මට රාජිව් විජේසිංහ මහත්මයා එව්වාම මම අපේ ඇමතිතුමියට ලියුමක් යැව්වා මේ ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මොනවාද කරන්නේ කියලා පොඩ්ඩක් බලන්න කියලා. එතුමිය මට කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියපු දේමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තලතා අතුකෝරල අමාත්‍යතුමිය.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අවසානයේ ඔබතුමියගේ වේලාවේදී උත්තර දෙනවාද?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
විනාඩියක් දෙන්න ගරු මන්ත්‍රීතුමා. අපේ වැඩිහිටි, අපි සලකන, අපි ගරු කරන, මහත්මා දේශපාලනය කරන මහත්මයෙක් හැටියට -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කියන්න, කියන්න. උත්තරය කියන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මගේ Ministry එකෙන් ලියුමක් යැව්වා එතුමාට. ඒක වරදක් නැහැ නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, නැහැ. ඔබතුමියගේ ලියුම විතරයි සැනසීම. ඒකත් නාවානම් මට මොකුත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමිය අපි කාටත් සැනසීමක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියාගෙන ආපු කාරණය මෙයයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වේවා, කුමන ස්වාධීන කොමිෂන් සභාවක් වේවා මේ පාර්ලිමේන්තුවටයි ඒ අය වග කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පාර්ලිමේන්තුවේ අයිතියේ සීමාව මොකක්ද, ඒ උදවියගේ බලයේ සීමාව මොකක්ද? මේක නීතියේ ආධිපත්‍යයද, බලයේ ආධිපත්‍යයද? මේ දෙකෙන් කුමක්ද කියා අපි හැමෝම නැවත විමසා බැලිය යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ වේලාව අවසානයි. වැඩිපුර තත්පර 30ක් ගන්න කෝ. තව තත්පර 30කින් අවසන් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමාට සහයෝගය දෙමින් මම අවසන් කරනවා.

මම මේ කිව්වේ ඉතා වැදගත් කාරණා දෙකක්. අපි මේවාට අවධානය යොමු කර මේවා බේරා ගත්තේ නැත්නම් අන්තිමට පාර්ලිමේන්තුවේ බලය hijack කරනවා. දැනටමත් පාර්ලිමේන්තුවේ බලය hijack කරලා තිබෙනවා, යම් යම් නිලධාරින්ගේ බලය. අපි දැන් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ මහා විලාපය අහගෙන හිටියා නේ. මොකක්ද ඒ විලාපය? පාර්ලිමේන්තුවේ බලය hijack කරලා. මේ තත්ත්වයට ඉඩ දෙන්නට එපා. අපි පාර්ලිමේන්තුවේ බලයේ සීමාව හදා ගනිමු. අපි හැම කෙනාටම නීතිය සමානයි කිව්වාට ඒකේ අන්තිම අර්ථය - [බාධා කිරීමක්] මම මේකත් කියලා අවසන් කරන්නම්. නීතිය හැම කෙනාටම එක සමානය කිව්වාට එක් එක් අයට වියදම් කළ හැකි මුදල අනුවයි එය සමාන වෙන්නේ. සමහරුන්ට වැඩියෙන් සමානයි, අනෙක් අයට අඩුවෙන් සමානයි. මේ තමයි පන්ති භේදයෙන් යුත් සමාජය තුළ නොවැළැක්විය හැකි කාරණය. නීතියේ නොවෙයි ආධිපත්‍ය, අධිපතියන්ගේ බලයටයි නීතිය යටත් වෙන්නේ. මෙසේ කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

[අ.භා. 6.00]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 වර්ෂයේ ජනවාරි 8වැනිදාත්, අගෝස්තු 17වැනිදාත් අපට ජන වරමක් ලැබුණු බව අපි කවුරුත් දන්නවා. නොයෙක් කාරණා නිසා මේ රට ඉතා අසරණ තත්ත්වයකට පත් වන විට, මේ රට බේරා ගන්න අපේ රටේ ජනතාව ඒ අවස්ථාව අපට ලබා දුන්නා. එහෙම ලබා දුන්නේ අපේ රටේ ආර්ථික තත්ත්වය නිසා වෙන්න පුළුවන්; එහෙම නැත්නම් වෙනත් කාරණා නිසා වෙන්නත් පුළුවන්. මේ මොන කාරණාවේදී වුණත් යහ පාලන ආණ්ඩුවට මේ ජයග්‍රහණය ලබා දුන් අවස්ථාවේ, නීතියේ ස්වාධීනත්වය; නීතියේ ආධිපත්‍යය රැක ගන්නවාය කියන කාරණය ගැන අපි රටේ ජනතාව තුළ ලොකු බලාපොරොත්තුවක් ඇති කළා. එදා එක පවුලක්; එක පිරිසක්; එක ආණ්ඩුවක් තිබුණේ. ඒ අයට එක නීතියකුත්, සාධාරණව ජීවත් වන සාමාන්‍ය ජනතාවට තව නීතියකුත් තිබුණාය කියන එක කවුරුත් පිළිගත් කාරණයක්. පසුගිය ආණ්ඩුවට හිතවත් අය, මැති ඇමතිවරුන් විතරක් නොවෙයි, ප්‍රාදේශීය සභා නියෝජනය කළ මන්ත්‍රීවරුන් වුණත් නීතිය අතට ගෙන ක්‍රියා කරපු ආකාරය අපි දැක්කා. මේ පෙරළිය ඇති කරන්න අන්න ඒ කාරණය ප්‍රධානම හේතුවක් වුණා; මේ දැවැන්ත පෙරළිය ඇති කරන්න, "නීතිය වල් බිහිවීම" ප්‍රධානම හේතුවක් වුණා. අන්න එවැනි අවස්ථාවකදී අපට ලොකු වග කීමක් තිබෙනවා එය නිවැරදි කරන්න. ඒ වාගේම, නීතියට යම් සාධාරණයක් ඉටු වී, පසුගිය කාලයේ ඇති වූ දේවල් නැවත මේ රටේ ඇති නොවන ආකාරයට කටයුතු සිදු වේවිය කියා ජනතාව තුළත් ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා. එහි ප්‍රගතියක් තිබෙන බව යම් ආකාරයකින් අපට දකින්න පුළුවන්.

අද මේ කථා කරන, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මම වැරදි දෙයක් කළත්, මා වෙනුවෙන් නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා. මේ වන විට මැති-ඇමතිවරුන්, -කැබිනට් අමාත්‍යවරුනුත්- නීතියට ගරු කරන ආකාරය අපි දැක තිබෙනවා; ඇතැම් ඇමතිවරුන්ට යම් චෝදනා ලක් වෙලා තිබෙන අවස්ථාවේ ඇමතිකම් අත් හැරිය ආකාරය අපි දැක තිබෙනවා. පසුගිය කාලයේ මැති-ඇමතිවරයෙක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්වත් කටඋත්තරයක් ලබා ගන්න පොලීසියකට ගෙන්වා ගන්න බැරි වුණා. ඒකයි ඇත්ත. දැන් එහි යම් ප්‍රගතියක් තිබෙනවා. නමුත්, අපේ බලාපොරොත්තු සියයට සියයක් ඉටු වෙලා තිබෙනවාද කියන එක ප්‍රශ්නාර්ථයක්. අපේ රටේ ජනතාව ඇතුළුව අපි ලොකු බලාපොරොත්තුවකින් ඉන්නවා මේ වැඩ පිළිවෙළ හරියටම ක්‍රියාත්මක වෙයි කියලා. ස්වාධීනව කටයුතු කරන ඇමතිවරියක් අමාත්‍යාංශයට අලුතින් පත් වුණු නිසා, සාධාරණව ක්‍රියා කරමින්, මේ ක්‍රියාදාමය මීට වඩා වේගවත්ව කර මේ කටයුතු ඉටු කරයි කියන බලාපොරොත්තුව මෙතුමිය නිසා අපට අලුතින් ලැබුණා. අපට අවශ්‍ය වන්නේ අධිකරණ සංඛ්‍යාව වෙනස් කරන්න හෝ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කරන්න නම්, සාධාරණය ඉටු කිරීම සඳහා එයට අවශ්‍ය නීති පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඒ කටයුතු ඉක්මනින් සිදු කළ යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ චෝදනා විතරක් නොවෙයි, සාමාන්‍ය පුද්ගලයෙකුට ඉඩමක ගැටලුවක් විසඳා ගන්න අවශ්‍ය වුණොත් ඒ වෙනුවෙන් අවුරුදු දහයක් හෝ අවුරුදු පහළොවක් ගත වනවා නම්; මිනීමැරුම් චෝදනාවකට අවුරුදු විස්සක්, අවුරුදු විසිපහක් ගත වනවා නම්, මේ වෙනුවෙන් නීතිය හරියටම ඉටු වෙලා තිබෙනවාද කියන එක ප්‍රශ්නාර්ථයක්. අපට අවශ්‍යයි මේ වෙනුවෙන් අප ලබා ඇති ප්‍රගතිය තවත් වේගවත් කරන්න; අප ලබා තිබෙන ප්‍රගතිය තුළින් තවදුරටත් අපේ බලාපොරොත්තු වෙත ඉදිරියට ගමන් කරන්න. මේ වෙනුවෙන් අපේ ඇමතිතුමිය ප්‍රධාන අමාත්‍යාංශය වැඩි උනන්දුවක් දක්වමින් කටයුතු කරනවා.

අප ඕනෑම තැනකට ගියාම ජනතාව අහන්නේ, "මේ හොරු ටික අල්ලන්නේ කවදාද; මේ හොරු අල්ලලා සාධාරණයක් වෙන්නේ කවදාදද; මේ හොරු ටික කොහොමද ඉක්මනින් ඇප ලබා ගන්නේ?" කියන කාරණායි. මම විශේෂයෙන් මේ කාරණය සඳහන් කරන්නේ, මේ රටේ යහ පාලන ආණ්ඩුවක් හැදීමේ ප්‍රධානතම හේතුවක් බවට පත් වුණේ සාධාරණය ඉටු කරයි යන බලාපොරොත්තුව ජනතාව තුළ ඇති නිසායි. මේ අය වෙනුවෙන් සාධාරණව පරීක්ෂණයක් කරන්නයි. සරත් ෆොන්සේකා මැතිතුමාව සිරගත කළ විධියට සිරගත කරන එක නොවෙයි ජනතාවගේ බලාපොරොත්තුව.

සමහර අය ඒ වාගේ කටයුත්තක් කරන කල් බලාගෙන ඉන්නත් පුළුවන්. නමුත් අපි ඉල්ලන්නේ ඒක නොවෙයි. අපි ඉල්ලන්නේ, සාධාරණ කාලයක් අරගෙන, සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලායි. පසු ගිය ආණ්ඩු පක්ෂයේ හිටපු මැති ඇමතිවරුන්ගේ නඩු කල් යන්නේ මාස හයකින්; හතකින්; අටකින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මේ විධියට තුන්, හතර වතාවක් නඩු කල් ගියාම කාල සීමාව අවසන් වෙනවා. ඒ අවශ්‍ය කාල සීමාවන් පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වලා, සාධාරණ ලෙස මේ පරීක්ෂණ කරලා ඉතා ඉක්මනින් මේ රට වෙනුවෙන්, මේ රටේ ඡන්දය දුන් ලක්ෂ 62ක් ජනතාව වෙනුවෙන් ඉටු කරන්න කියන ඒ ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයකුයි තිබෙන්නේ.

[பி.ப. 6.05]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான்கு நிமிடங்களையாவது எனக்குப் பெற்றுக் கொடுத்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். நீதி அமைச்சின்கீழ் வரும் சட்டத் திருத்தங்கள், அதேபோல உள்ளூராட்சி அதிகாரசபைகள் (விசேட ஏற்பாடுகள்) சட்டம் என்பன இன்று இந்தச் சபையிலே விவாதத்திற்கு எடுக்கப்பட்டிருக்கின்றன. இந்தச் சபையிலே மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் பைசர் முஸ்தபா அவர்கள் பிரசன்னமாக இருக்கின்ற இவ்வேளையிலே, நுவரெலியா மாவட்ட நாடாளுமன்ற உறுப்பினர் என்ற வகையிலே இந்த ஒருசில நிமிடங்களையும் அவருக்கு நன்றி தெரிவிக்கப் பயன்படுத்திக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த இரண்டு வருடங்களாக நுவரெலியா மாவட்டத்தின் பிரதேச சபைகளை அதிகரிக்க வேண்டும் என்ற கோரிக்கைகளை தமிழ் முற்போக்குக் கூட்டணியின் சார்பாகக் நாங்கள் இதே பாராளுமன்றத்திலே முன்வைத்து பல உரைகளை ஆற்றியிருக்கின்றோம். அவற்றை அமைச்சர் அவர்கள் தொடர்ச்சியாகச் செவிமடுத்து வந்திருக்கின்றார். மிக முக்கியமாக ஒரு விடயத்தை நான் இங்கு சொல்ல வேண்டும். அதாவது, பிரதேசச் சபைகள் சட்டத்தைத் திருத்த வேண்டும் என்ற ஒரு பிரேரணையை நான் முன்வைத்தவேளை, "நான் பாராளுமன்ற உறுப்பினராக வருவதற்குக் கண்டி மாவட்டத்தில் வாழ்கின்ற இந்திய வம்சாவளி மக்களின் வாக்குகளும் பயன்பட்டிருக்கின்றன" என்று அவர் தானாகவே முன்வந்து சொன்னதை நன்றியுடன் நினைவுகூருகின்றேன். மிகுந்த போராட்டங்களுக்கு மத்தியில் நுவரெலியா மாவட்டத்தின் உள்ளூராட்சிச் சபைகளைக் குறிப்பாக அம்பகமுவ மற்றும் நுவரெலியா ஆகிய பிரதேசச் சபைகளை மும்மூன்றாக அதிகரித்து, ஆறாக உயர்த்துவதற்கு எங்களுக்கு இயலுமாயிருந்தது. அதற்காக அமைச்சர் பைசர் முஸ்தபா அவர்களுக்குத் தமிழ் முற்போக்குக் கூட்டணியின் சார்பாகவும் நுவரெலியா மாவட்ட நாடாளுமன்ற உறுப்பினர் என்ற வகையிலும் நன்றியைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

அதேநேரம் நுவரெலியா பிரதேச சபையையும் அம்பகமுவ பிரதேச சபையையும் அதிகரிப்பது மட்டும் எங்களது கோரிக்கை அல்ல என்பது அமைச்சர் அவர்களுக்குத் தெரியும். வலப்பன, கொத்மலை, ஹங்குராங்கெத்த ஆகிய பிரதேசங்களில் இருக்கக்கூடிய பிரதேச சபைகளும் சுமார் ஓர் இலட்சத்துக்கும் அதிகமான சனத்தொகையைக் கொண்டிருக் கின்றன. ஆகவே, நாங்கள் அவை தொடர்பான அதிகரிப்பையும் கோரி நின்ற நேரம், சாய்ந்தமருது போன்ற பிரதேசங்களில் பிரதேச சபையை நிறுவுவது தொடர்பில் சர்ச்சைக்குரிய சூழ்நிலைகள் ஏற்பட்டதன் காரணமாக, இந்தத் தருணத்தை விட்டுக்கொடுத்து நுவரெலியா, அம்பகமுவப் பிரதேசச் சபைகளை மாத்திரம் அதிகரிப்பதற்கு ஒத்துக்கொண்டோம். அமைச்சர் அவர்களே, நீங்கள் எவ்வாறு நுவரெலியாவுக்கும் அம்பகமுவவுக்கும் நியாயத்தைப் பெற்றுக் கொடுத்தீர்களோ, அதேபோன்று வலப்பன, கொத்மலை, ஹங்குரான்கெத்த பிரதேச மக்களுக்கும் நியாயம் பெற்றுக் கொடுப்பீர்கள் என்று அவர்கள் எதிர்பார்க்கின்றார்கள்.

வலப்பன மற்றும் கொத்மலைப் பிரதேச அபிவிருத்தி இணைப்புக் குழுத் தலைவராக நானும் தெரிவுசெய்யப் பட்டிருக்கின்றேன். நேற்று எங்களது கூட்டம் நடைபெற்றபொழுது கொத்மலை பிரதேசச் சபைக் கட்டடத்தைத் திருத்தியமைப்பது பற்றி விடயம் பிரஸ்தாபிக்கப்பட்டது. ஏனென்றால் உறுப்பினர்களின் எண்ணிக்கை அதிகம். நாங்கள் பிரதேச இணைப்புக் குழுவிலே அது சம்பந்தமாக அதிகமாகப் பேச வேண்டியிருக்கின்றது. இந்தப் பிரதேசத்தில் இரண்டு சபைகளே அமைந்துள்ள நிலையில், இந்தச் சபைக் கட்டத்தை விஸ்தரிப்பதற்கு மாறாக, இன்னும் ஒரு பிரதேசச் சபையை அங்கு உருவாக்குகின்ற வாய்ப்புக்களை ஏற்படுத்த வேண்டும். அது அந்த மக்களின் நீண்ட காலக் கோரிக்கையாகும். எனவே, அமைச்சர் அவர்களே, உங்களது அமைச்சுப் பதவிக் காலத்திலே, நல்லாட்சிக் காலத்திலே நுவரெலியா மாவட்ட மக்களுக்குச் சென்று சேர வேண்டிய நியாயமான தீர்வு, முழுமையான தீர்வாக அமைய வேண்டும்; உங்களுக்கும் அந்த அபிலாஷை இருக்கின்றது. அதுகுறித்து வாழ்த்துக்களையும் நன்றிகளையும் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 6.09]

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුව විසින් සම්මත කළාම පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වීමේ සියලු බාධක ඉවත් වෙලා, පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට හැකියාවක් ලැබෙනවා. පළාත් පාලන මැතිවරණය අවුරුදු ගණනාවක් පමා වීමට ප්‍රධාන හේතුවක් වුණේ, සීමා නිර්ණය කටයුතු. එම නිසා සීමා නිර්ණය කටයුතු කිරීම ඉතාම පරිස්සමෙන් කළ යුතු කාරණයක් වෙනවා. ගරු අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්න නිසා මගේ සීමිත කාලයේදී මා මෙම කාරණය ප්‍රකාශ කරන්න කැමැතියි.

පළාත් සභා පනත යටතේ සීමා නිර්ණය කිරීමට කමිටුවක් පත් කරලා ඒ සම්බන්ධයෙන් දැන්වීම් පළ කරලා තිබෙනවා. මෙහිදී පැන නැඟෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, අපේ සීමා නිර්ණය කමිටුව ඔවුන්ගේ දැන්වීම පරිදි සීමා නිර්ණය කරන්න සූදානම් වෙලා ඉන්නේ 1987දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරන ලද සභික සංඛ්‍යාවට සමානවයි. එතකොට 1987දී නිශ්චය කරන ලද සභික සංඛ්‍යාව 2017දී ඒ ප්‍රමාණයෙන්ම ගත්තාම ජනගහන වර්ධනයත් එක්කම යම් කිසි ආකාරයක අපහැදිලි තත්ත්වයක් මතු වෙනවා. එම නිසා මා කැමැතියි, ගරු අමාත්‍යතුමාගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරන්න.

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ තුන්වැනි වගන්තිය අනුව මැතිවරණ කොමිසම විසින් නැවත වරක් සභික සංඛ්‍යාව ඒ පළාත්වල ජනතාවගේ ජනගහනය අනුව තීරණය කරලා ගැසට් කිරීමෙන් අනතුරුව සීමා නිර්ණය කිරීම යෝග්‍යයි කියලා මා ප්‍රකාශ කරනවා. මන්ද කියනවා නම්, 2011 තමයි අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජන සංගණනයක් ඇති වුණේ. 2001 සංගණනයෙන් පසුව මැතිවරණ කොමසාරිස්වරයා මේ පළාත් සභා මන්ත්‍රීවරුන් සංඛ්‍යාව නිශ්චය කරමින්, 2003 වර්ෂයේදී

ගැසට් පත්‍රයක් නිකුත් කළා. එහිදී 1987 නිශ්චය කරන ලද සංඛ්‍යාවට වඩා වැඩි වුණා. නමුත් උතුරු, නැඟෙනහිර පළාත්වල සංගණනය නියමිත පරිදි සිදු නොවුණු නිසා 2004 පාර්ලිමේන්තු පනතක් ගෙනැල්ලා, මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණය අත්හිටෙව්වා; නිෂේධනය කළා. එවැනි තත්ත්වයක් තිබෙනවා. පළාත් සභා පනත යටතේ සීමා නිර්ණය කිරීමට පෙර, 2011 ජන සංගණනය අනුව වර්තමාන ජන අනුපාතය පාදක කරගෙන, එක් එක් පළාත්වල මන්ත්‍රී සංඛ්‍යාව නිශ්චය කරන තීරණය ගෙන සීමා නිර්ණය කිරීම සුදුසුයි කියලා මා ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය. ඔබතුමිය විනාඩි පහකින් කථාව අවසන් කරන්න වෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඇයි, ඒ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාත් කථා කරන්න තිබෙනවා.

[අ.භා. 6.12]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ සම්බන්ධවත් කටයුතු කරන්න අපේ ගරු අගමැතිතුමාගේ මැදිහත්වීමෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවක් පත් කර තිබෙනවා. නීති කටයුතුවල ප්‍රමාදය වළක්වන්න අවශ්‍ය සංශෝධන කරලා, ඒ කටයුතු කඩිනමින් අවසන් කරන්න අවශ්‍ය වැදගත් යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව එම කමිටුවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාටත්, කමිටුවේ අනිකුත් සියලුම සාමාජිකයන්ටත්, ඒ සඳහා සහාය දැක්වූ සියලුදෙනාටත් මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මේ සංශෝධන මීට පෙර ඉදිරිපත් කළ ඒවායි. ඒවා ගැන විස්තර කරන්න ගියොත් සැහෙන කථා කරන්න වෙනවා. ඒ නිසා මා වැඩිදුර ඒ ගැන කථා කරන්නේ නැහැ.

විමල් වීරවංශ මැතිතුමා මේ අවස්ථාවේ මෙම ගරු සභාවේ නොසිටීම ගැන මා කනගාටු වෙනවා. මොකද එතුමා විශේෂයෙන්ම සඳහන් කළා, අපරාධ වැළැක්වීමේ ආඥාපනතට ගෙන එන සංශෝධනත්, අධිකරණ සංවිධාන පනතට ගෙන එන සංශෝධනත්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ආඥාපනතට ගෙන එන සංශෝධනත් ගෙනැත් තිබෙන්නේ වෙන වෙන අයගේ අවශ්‍යතා වෙනුවෙන් බව. මා හිතන විධියට සමහර වෙලාවට එතුමාට ඒ ගැන අවබෝධයක් නැතිව ඇති. එතුමා දෙමළ ඩයස්පෝරාවක් ගැන කථා කළා. ඒ අයට පහසුකම් සලසන්න කියාත් කිව්වා. විනිශ්චයකාරවරුන් වැඩි කිරීම පිළිබඳවත් විවේචනයක් තිබුණා. දෙපැත්තෙන්ම හොඳ කරුණුත් ඉදිරිපත් වුණා වාගේම, වැඩකට නැති සමහර කරුණුත් කියැවුණා. ඒ ගැන නම් මම කනගාටු වෙනවා.

1978 අධිකරණ සංවිධාන පනතට අනුව මහාධිකරණ විනිශ්චයකාරවරු 16යි පත් කර තිබෙන්නේ. දැන් අවුරුදු 40කට පසුව මේ අවශ්‍යතාව 110ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. රටේ ජනගහනය වැඩි වෙනකොට, අධිකරණමය කටයුතුවල ප්‍රමාණය වැඩි වෙනකොට, ඒ හැම කාරණයක්ම සලකා බලා ඒවාට අවශ්‍ය විධියට කටයුතු නොකළොත්, මේ නීතිමය කටයුතු ප්‍රමාද වීම අපට කවදාවත් වළක්වා ගන්න බැරි වෙනවා. අපි මේ අනික් හැම කරුණක්ම පැත්තකින් තියමු. අහිංසක මිනිස්සු මොන තරම් කාලයක්, ශ්‍රමයක්, මුදලක් විතරක් නොවෙයි, තමන්ගේ සම්පූර්ණ සෙස්තම මේ සමහර ප්‍රමාදවීම් නිසා නැති කරගන්නවාද කියන එක මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාම පිළිගන්නා කාරණයක්. මහාධිකරණ විනිශ්චයකාරවරු සංඛ්‍යාව 75 සිට 85ක් දක්වා වැඩි කරන්න අපේ ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා කර තිබුණත්, අප ඊටත් ටිකක් එහාට ගිහින් තව 25ක් වැඩි කරලා ඒ ප්‍රමාණය 110ක් දක්වා වැඩි කරනවා. ඒ විතරක් නොවෙයි, අද උදේ මම ඇමති මණ්ඩලයට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක් මඟින් තවත් විශේෂිත ත්‍රිපුද්ගල අධිකරණ තුනක් පිහිටුවන්නත් යෝජනා කළා. ඒ සඳහා අනුමැතියත් ලැබී තිබෙනවා. යුගයේ අවශ්‍යතාව බලලා අප මේ හැම එකක්ම කරන්න ඕනෑ.

අපරාධ වැළැක්වීමේ ආඥාපනත 1926දී හදපු එකක්. එදාට වඩා අද වැරැදි සහ අපරාධ විශාල ප්‍රමාණයක් සිද්ධ වෙනවා. ඒ කොච්චරද කිව්වොත්, අප අද ඉන්න නව තාක්ෂණයත් එක්ක සමහර වෙලාවට ඒ පැත්තෙන් සිදුවන වැරැදි පවා හඳුනාගත් වැරැදි බවට පත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් එදා ඒ උපලේඛනයේ තිබුණු ආකාරයට ඇඟිලි සලකුණු ගැනීම -ඕනෑම විත්තිකාරයෙකුගෙන් එයාගේ නඩුවට ඉදිරිපත් වෙන්න ඉස්සර වෙලා ඇඟිලි සලකුණු ලබාගන්නවා.- අද මේ සංශෝධනය සම්මත වීමෙන් පසුව පනත් 17ක වැරැදි සම්බන්ධයෙන් ලබාගන්නවා. විශේෂයෙන්ම දණ්ඩනීති සංග්‍රහය යටතේ වරදවල් 45ක් පමණ ඒ යටතට විතරක් එනවා. අවුරුදු 90කට විතර ඉස්සර වෙලා වුණු දෙයක් සම්බන්ධයෙන් අද අප මේ නීති සංශෝධනය කළේ නැත්නම් මොකද වන්නේ? සමහර අය ඒ ගැන නොයෙකුත් විවේචන කරන්න පුළුවන්. ඉදිරියේදී අපට තව ගොඩක් සංශෝධන ගේන්න සිද්ධ වෙයි කියා මම නම් හිතනවා.

ඒ විතරක් නොවෙයි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන විහිළු සපයන්නෙකු මෙන් මන්ත්‍රීතුමෙක් කථා කළා. එතුමා ඒ පනත් කෙටුම්පතේ තිබෙන වැදගත්කම ගැන කථා නොකර, දේශපාලන වේදිකාවක කථා කරනවා වාගේ මේ ගරු සභාවේ කථා කළා. අපි දන්නවා, අද දවස වන විටත් සමහර නඩුවලට සාක්ෂිකරුවන් හැටියට ඉදිරිපත් වෙන්න ඉන්න අයට, වින්දිතයන් හැටියට ඉදිරිපත් වෙන්න ඉන්න අයට, තමන්ගේ ආරක්ෂාව පිළිබඳව, තිබෙන වෙනත් ගැටලු පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ රටින් පිට වෙලා ඉන්න අයත් ඉන්නවා. අපි ඒ අය ගැන කථා කරද්දී, ඇතැම් අය කථා කරන්නේ දෙමළ ඩයස්පෝරාවක් ගැනයි. නමුත්, ඒ අය ශ්‍රී ලාංකිකයින් හැටියට සලකා කථා කළා නම් අපි සන්තෝෂ වනවා. ඒ විධියට රටින් යන්න සිද්ධ වුණු ඕනෑම ජාතියක මනුෂ්‍යයකු ඉන්න පුළුවන්. ඒ අයගේ සාක්ෂිය ඒ රටවල තිබෙන තානාපති කාර්යාලවල ඉන්න අපේ විදේශ නියෝජිතයන් හරහා ලබා ගන්නත්, ඒ අයගේ අයිතිය ආරක්ෂා කිරීමටත් මේ පනත් කෙටුම්පතින් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

මේ හැම කාරණාවක් සම්බන්ධයෙන් වාගේම විශේෂ අවධානය යොමු කළ යුතු තවත් කරුණක් අද ඉදිරිපත් වුණා. එනම්, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් බොහොම ආවේගශීලීව කරුණු ඉදිරිපත් කළා. මා මේ වෙලාවේ වගකීමක් ඇතිව කියනවා, ඒ සම්බන්ධයෙන් අධිකරණය පැත්තෙන් හෝ අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන යම් දෙපාර්තමේන්තුවකින් -මට කියන්න බැහැ, මොකක්ද කියන එක.- යම් අතපසුවීමක් වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් සොයා බලා ඒ තත්ත්වය නිවැරදි කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවායි කියන එක. පොලීසිය භාර ඇමතිතුමා එක්කත් කථා කරලා ඒ අවශ්‍ය කටයුතු කරනවායි කියන එක වගකීමක් ඇතිව මා මේ වෙලාවේ මතක් කරනවා. මා දැන් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ගෙන්වාගෙනත් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළා.

අපේ මේ හැම කටයුත්තක් සඳහාම අප අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමන්ලා, තුමියන්ලා ඇතුළු සියලුමදෙනා විශාල සහයෝගයක් ලබා දෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවත් එහෙමයි. ඒ විතරක් නොවෙයි, මේ සංශෝධන ඉදිරිපත් කරන්න අවශ්‍ය කටයුතු කළ සියලුදෙනාට මගේ ස්තුතිය පුද කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිපුර විනාඩියක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 6.20]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**

(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)

(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස වන විට උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, පුදුකුඩිඉරිප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවල ජනතාව විශාල ජයග්‍රහණයක් ලබා තිබෙනවා කියායි මම හිතන්නේ. මොකද, අද අපේ රටේ බොහෝ උදවිය ලාංකික චින්තනයක් ගැන කථා කළත්, 2011 පටන් එම ප්‍රදේශවල ජනතා මතය විමසීමක් සිදු වුණේ නැහැ. ඊට හේතුව, යම් කෙනකු උසාවියට ගිහිල්ලා, "බිම් බෝම්බ තිබෙන නිසා ඒ බලප්‍රදේශවල මැතිවරණයක් පැවැත්වීමේ වාතාවරණයක් නැහැ"යි කියලා තීන්දුවක් ලබා ගැනීමයි. ඉන්පසුව ඒ අතුරු තීන්දුව නිසා දිගින් දිගටම ඒ ප්‍රදේශවල මැතිවරණය තියන්න බැරි වුණා.

අද බොහෝ උදවිය පළාත් පාලන මැතිවරණය ප්‍රමාදවීම ගැන කථා කරනවා. හැබැයි, උතුරු ප්‍රදේශයේ 2013 වර්ෂයේ පටන් පළාත් පාලන ආයතන රාශියකට අයත් බලප්‍රදේශ තුළ මැතිවරණ නොපැවැත්වූ බව මා මේ සභාවට මතක් කරන්න කැමැතියි. ඒ නිසා මේ අවස්ථාවේදී අපි උතුරේ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා, පුදුකුඩිඉරිප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙකේ ජනතාවටත් මැතිවරණයකදී ඒ ගොල්ලන්ට අවශ්‍ය කරන ජනතා නියෝජිතයන් පත් කර ගන්න අවස්ථාවක් ලබා දෙනවා.

අද ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා මට චෝදනා කළා, මේ ගැසට් පත්‍රය ගැන. I forwarded the Gazette (Extraordinary) Nos. 2043/56 and 2043/57 to the Government Printer on the 2nd of November, 2017.

අද සෝදුපත් 1,000ක් පමණ අපේ අමාත්‍යාංශය භාර දීලා තිබෙනවා පරීක්ෂා කරන්න. මේවායේදී ඇඟිල්ල දිගු කරන්න ලේසියි. හැබැයි, යම් කර්තව්‍යයක් කරන කොට එය වග කීමකින් කරන්න සිදු වනවා. ඒ විතරක් නොවෙයි. නුවරඑළියේ ජනතාව දිගින් දිගටම කළ ඉල්ලීම මත අඹගමුව සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා දෙකට තව ප්‍රාදේශීය සභා හතරක් එකතු කර තිබෙනවා.

මා හිතන්නේ එය කඳුකරයේ සහ ඒ බල ප්‍රදේශයේ ජනතාව ලැබූ ජයග්‍රහණයක්. හැබැයි ඒ ජයග්‍රහණය ලැබුණේ එකමුතුභාවයෙන්. ගරු මනෝ ගනේෂන් ඇමතිතුමා, ගරු දිගම්බරන් ඇමතිතුමා, ගරු තොණ්ඩමන් මන්ත්‍රීතුමා ඇතුළු ඒ බල ප්‍රදේශයේ සියලුම දේශපාලන පක්ෂ නායකයන් මගේ අමාත්‍යාංශයට පැමිණ සාකච්ඡා කරලා ඒ උදවියට සාධාරණය ඉෂ්ට කරන්නට කටයුතු කළා.

නැඟෙනහිර පළාතේ සමහර මුස්ලිම් මන්ත්‍රීවරු අද මට චෝදනා කළා. මම අඹගමුව, නුවරඑළිය ප්‍රාදේශීය සභාව බෙදීමට කටයුතු කළා. හැබැයි සයින්දමරුදු ප්‍රාදේශීය සභාව ලබා දුන්නේ නැහැ කියා. රජයේ කටයුතු කරනකොට සියලුදෙනාගේම අවශ්‍යතාවත්, ජනහඬටත් ඇහුම්කන් දීලා තමයි අපි තීන්දු තීරණ ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම ගරු අගමැතිතුමා සයින්දමරුදු ප්‍රදේශයට ප්‍රාදේශීය සභාවක් ලබා දෙනවාය කියා පොරොන්දු වුණා. අපි ඒ කර්තව්‍යය කරනකොට ඒ ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය ඉල්ලුවා, කල්මුණේ මහ නගර සභාව සභා හතරකට කඩන්නටය කියා. මට නඟපු චෝදනාව නිසා මම වගකීමකින් කියන්නට ඕනෑ, ඒ බලප්‍රදේශවල දේශපාලන අධිකාරියේ එකමුතුභාවය නැති නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ කියන එක.

I would like to say that the Muslim community has too many Chiefs and not enough Indians in the Eastern Province. There are more leaders than followers. So, I appeal to the political leadership of the East to unite together in common issues in solving problems. Because of the division, now I am being accused that I took action to subdivide Pradeshiya Sabhas of Ambagamuwa and Nuwara Eliya but not to declare Sainthamaruthu as a Pradeshiya Sabha. Even tomorrow, if, by a united front, there is agreement that they want a separate Pradeshiya Sabha for Sainthamaruthu, I am willing to do so. But, if we are to divide the Kalmunai Municipal Council into four Pradeshiya Sabhas, I have to consult the TNA as well. When I took steps to declare Sainthamaruthu as a Pradeshiya Sabha, I wrote to the TNA and got their consensus. This is a Government by consensus. So, I consulted the Hon. Prime Minister and His Excellency the President and they requested me to have a consultative process before giving four Pradeshiya Sabhas. Therefore, I appeal to the political parties in the East, especially the political parties that represent the Muslim community, to unite with regard to this common issue - "unity is strength" - and I believe it is time that you all work together.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

Hon. Minister, please wind up in a minute.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**

(மாண்புமிகு பைசர் முஸ்தபா)

(The Hon. Faiszer Musthapha)

සායින්දමරුදු ජනතාව එතැනින් උද්ඝෝෂණය කරනවා. කල්මුණේ ජනතාව එතැනින් උද්ඝෝෂණය කරනවා. ජනතාව

අතර බෙදීමක් ඇති වෙනවා. මම ඉතාම බැගෑපත් ලෙස නැඟෙනහිර මුස්ලිම් දේශපාලන අධිකාරියෙන් ඉල්ලා සිටින්නේ ඒ බෙදීම නැති කරන්න, එකතුවෙලා මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කියලායි. අන්තිමට සායින්දමරුදු ජනතාව හා කල්මුණේ ජනතාව අතර යුද්ධයක් ඇති කරන එක දේශපාලනය නොවෙයි කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ ඉතිරි වැඩ කොටස කර ගෙන යාමට කාලය දීර්ඝ කර ගැනීම සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු තලතා අතුකෝරල මහත්මිය]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon.(Mrs.) Thalatha Atukorale.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (1978 අංක 2 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 2.- (1978ஆம் ஆண்டின் 2ஆம் இலக்கச் சட்டத்தின் 4ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 2. - (*Amendment of section 4 of Act, No. 2 of 1978.*)

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

" 1 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' අඩු නොවන්නා වූ ද, එකසිය දහයකට වැඩි නොවන්නා' ;"

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
### குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்
ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන)

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු තලතා අතුකෝරල මහත්මිය ]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Mrs.) Thalatha Atukorale.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
[THE HON. PRESIDING MEMBER *in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற் றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## குற்றச்செயல்களைத் தடுத்தல் (திருத்தம்) சட்டமூலம்
## PREVENTION OF CRIMES (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු තලතා අතුකෝරල මහත්මිය ]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Mrs.) Thalatha Atukorale.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
[THE HON. PRESIDING MEMBER in the Chair.]

***1 සිට 8 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 8ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 8 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
## உள்ளூர் அதிகாரசபைகள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
## LOCAL AUTHORITIES (SPECIAL PROVISIONS) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු ෆයිසර් මුස්තාපා මහතා ]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு பைசர் முஸ்தபா]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Faiszer Musthapatha.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 2 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

### 3 වන වගන්තිය.- (ඡන්ද පැවැත්වීම සඳහා ආරම්භ කළ යුතු පියවර.)
வாசகம் 3.- (தேர்தல்கள் நடாத்துவதற்காகத் தொடங்கப்பட வேண்டிய நடபடிகள்.)
CLAUSE 3. - (*Steps to be commenced for holding of elections.*)

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

Sir, I move,

(1) "In page 2, leave out all words in line 32 and insert:
'Ordinance shall be published on such date as the Election Commission' " ; and

(2) "In page 3, leave out all words in line 1and insert:
'may determine by Order published in the Gazette, and such' ".

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මහතා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

Sectoral Oversight Committee එකේ suggestions මා ඇතුළත් කර තිබෙනවා. ඒ අනුව ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාගේ යෝජනාත් ඇතුළත් කර තිබෙනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමා එකඟ වූ පරිදි මගේ සංශෝධන ඇතුළත් කර තිබෙනවාද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔව්, ගැටලුවක් නැහැ. මා ඔබතුමාගේ සංශෝධන ඇතුළත් කර තිබෙනවා.

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, ordered to stand part of the Bill.*

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

***උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Schedule ordered to stand part of the Bill.*

***පූර්විකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*முன்னுரை சட்டமூலத்தின் பகுதியாக பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Preamble ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

## දෘශ්‍ය කලාවේදී විශේෂ උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දීම
## கட்புலக்கலை விசேட பட்டதாரிகளுக்கு ஆசிரியர் நியமனங்களை வழங்கல்.
## TEACHING APPOINTMENTS FOR VISUAL ARTS SPECIAL DEGREE HOLDERS

[අ.භා. 6.34]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"සමාජයක සංස්කෘතික සංවර්ධනයේදී චිත්‍ර කලාවට කළ හැකි කාර්යභාරය සුවිශේෂී වේ. ඒ නිසා බොහෝ රටවල ප්‍රාථමික අධ්‍යාපනයේ සිට චිත්‍ර විෂය අනිවාර්ය කර ඇත.

රටේ වැඩිම පාසල් ප්‍රමාණයක් තිබෙන සහ වැඩිම සිසු දරුවන් ප්‍රමාණයක් සිටින බස්නාහිර පළාතේ පවා පාසල්වල චිත්‍ර ගුරුවරුන්ගේ පුරප්පාඩු රාශියක් පවතී. එහි අනෙක් බේදවාචකය වන්නේ සෞන්දර්ය, කැලණිය හා ශ්‍රීපාලි යන විශ්වවිද්‍යාලවලින් දෘශ්‍ය කලාවේදී විශේෂ උපාධි ලබාගත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති උපාධිධාරීන් කණ්ඩායම් ගණනාවක් රැකියා විරහිතව සිටීමයි; ඔවුන් සතු විශේෂ හැකියාව නිකරුණේ නාස්තිවීමට ඉඩ හැර තිබීමයි.

මෙම ගැටලුව සම්බන්ධයෙන් විශේෂයෙන් 2015/2016 දෘශ්‍ය කලා විශේෂ උපාධිධාරීන් බස්නාහිර පළාත් බලධාරීන් සමඟ සාකච්ඡා වට ගණනාවක් සිදු කළත් මෙතෙක් විසඳුමක් ලැබී නොමැත. මෙම දෘශ්‍ය කලා විශේෂ උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දී බස්නාහිර පළාතේ පාසල්වල පවතින චිත්‍ර කලා ගුරු හිඟය මඟ හරවා ගැනීමට කඩිනම් පියවර ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැටලුව හදිසියේ පැන නඟින්නේ මෙන්න මේ කාරණාව නිසායි. 2016 ඔක්තෝබර් මාසයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිසම පුවත් පත් දැන්වීමක් පළ කරනවා, බස්නාහිර පළාතේ තිබෙන පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා ගුරු විභාගය පැවැත්වීමට. ඒ අනුව, 2017 අප්‍රේල් 30වන දා එම ගුරුවරුන් තෝරාගැනීමේ තරග විභාගය පවත්වනවා. ඒ තරග විභාගයේදී ගණිතය, තොරතුරු තාක්ෂණය, චිත්‍ර, බටහිර සංගීතය, ඉංග්‍රීසි භාෂාව ආදි සියලු විෂයයන් සම්බන්ධයෙන් සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පොදුවේ පවත්වන අභියෝගතා පරීක්ෂණයකට සහ සාමාන්‍ය දැනීම පරීක්ෂණයකට එම උපාධිධාරීන්ට මුහුණ දෙන්න සිද්ධ වනවා. ඒ අනුව එම විභාගයට ඉදිරිපත් වූ දෘශ්‍ය කලා විශේෂවේදී උපාධිධාරීන් 110දෙනා අතරින් ඒ අභියෝගතා පරීක්ෂණය සහ සාමාන්‍ය දැනීම පරීක්ෂණය සමත් වන්නේ 27දෙනෙක් පමණයි. ගරු අමාත්‍යතුමනි, ඒ කියන්නේ, ඉන් සමත් වී තිබෙන්නේ සාමාන්‍ය විභාගයකදී සමත් විය යුතු ප්‍රතිශතයටත් වඩා ඉතාම අඩු ප්‍රතිශතයක් -සියයට 24.5ක්- කියන එකයි. එතරම් අඩු උපාධිධාරීන් පිරිසක් තමයි සමත් වන්නේ. ඒ නිසාම මේ ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ පීඨාධිපති මහාචාර්ය එම්.ආර්. පොඩිනිලමේ මහතා බස්නාහිර පළාත් මහ ඇමතිතුමාට ලියනවා, "මෙවර බස්නාහිර පළාත් ගුරු පුරප්පාඩු සඳහා පැවති පරීක්ෂණයේදී අප සිසුන්ට මුහුණ දීමට සිදුව ඇත්තේ අදාළ විෂයට කිසිසේත්ම සම්බන්ධ නොවන විෂය කරුණු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකටය" කියා. ඒ වාගේම, මේ කරුණම පිළිබඳව බස්නාහිර පළාත් අධ්‍යාපන ඇමතිවරයාට ලිපියක් ඉදිරිපත් කරන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා සඳහන් කරනවා, "...මෙහිදී අවුරුදු 04ට අධික කාලයක්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා විශේෂවේදීන් ලෙස උපාධිය ලබා ගන්නා මෙම පිරිස චිත්‍ර විෂය සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ දී පොදුවේ අනෙකුත් විෂයයන්ට සමගාමීව පවත්වන විභාගයක් පැවැත්වීමෙන් චිත්‍ර විෂය හදාරා ඇති මෙම උපාධිධාරීන්ට අසාධාරණයක් සිදුව ඇතැයි හැඟේ" කියා. මා ඔබතුමාගේ දැනගැනීම සඳහා එම ලිපි දෙකම **සභාගත*** කරනවා, ගරු අමාත්‍යතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චිත්‍ර විෂය සඳහා ගුරු පත්වීමක් ලබා ගැනීමට ඔවුන් කොතරම් කඩ ඉම් ප්‍රමාණයක් පසු කරන්න ඕනෑද? ඔබතුමා දන්නවා, සාමාන්‍ය වෛද්‍යවරයකු වන්න නම් කළ යුතු දේ. අපොස (උසස් පෙළ) විභාගය සමත් වෙලා වෛද්‍ය විද්‍යාලයේ විභාගය සමත් වුණාට පසුව වෛද්‍යවරයකු වන්න පුළුවන්. ඒ වාගේම, අපේ අනෙකුත් උපාධිධාරින්ටත් මෙතරම් කඩ ඉම් ප්‍රමාණයක් නැහැ. මේ උපාධිධාරින්, මුලින්ම ශිෂ්‍යයන් ලෙස අපොස (උසස් පෙළ) විභාගය සමත් වෙලා, චිත්‍ර කලාව හා සම්බන්ධ ප්‍රායෝගික පරීක්ෂණයක් සමත් වෙලා තමයි විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්නේ. විශ්වවිද්‍යාලයේ විභාගය සමත් වෙලා විශ්වවිද්‍යාල උපාධිය ලබා ගත්තාට පසුව ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා ඔවුන්ට ගුරු විභාගයකටත් ලියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ගුරු විභාගයේ තිබෙන ගැටලුව තමයි, මෙවර පැවැති ඒ විභාගයේ ප්‍රතිඵලවලින් නිරූපණය කරන්නේ.

අනෙක් පැත්තෙන්, බස්නාහිර පළාතේ මේ වන විට චිත්‍ර කලා ගුරු පුරප්පාඩු 100කට ආසන්න ප්‍රමාණයක් පවතිනවා, ගරු අමාත්‍යතුමනි. පාසල්වලට ගිහින් බැලුවොත්, චිත්‍ර විෂයයට ගුරුවරයෙක් ඉන්නවා. හැබැයි විද්‍යාව, ගණිතය උගන්වන්න විද්‍යා උපාධිධාරින් ඉල්លුවාට සිංහල සාහිත්‍ය උගන්වන්න කලා උපාධිධාරින් ඉල්ලුවාට සමහර පාසල්වල චිත්‍ර කලාව උගන්වන්නේ අනෙකුත් විෂයයන් උගන්වන ගුරුවරුන්.

බුද්ධාගම උගන්වන ගමන්, සිංහල උගන්වන ගමන්, එහෙම නැත්නම් තවත් විෂයයක් උගන්වන ගමන් චිත්‍ර උගන්වන්නත් ගුරුවරු යොමු කරලායි තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම ගත්තොත්, චිත්‍ර කලාව සඳහා පවතින ගුරු පුරප්පාඩු ප්‍රමාණය නිශ්චිතව ගණනය කරලාත් නැහැ. මේ පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ ඇමතිවරුන් එක්කත්, බලධාරින් එක්කත් සාකච්ඡා කරන කොට ඔවුන් කියන්නේ, "බස්නාහිර පළාතේ සිටිය යුතු මුළු ගුරු ප්‍රමාණය ඉන්නවා." කියලායි. ඒක ඇත්ත. සමහර විට ගුරු අතිරික්තයකුත් තිබෙනවා. නමුත්, විෂයානුබද්ධව ගත්තොත් ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒ නිසා චිත්‍ර කලාවේ ඉගැන්වීම සඳහා චිත්‍ර කලා උපාධිධාරින්ගේ හිඟයක් පවතිනවා. මෙහෙම තිබියදී තමයි දැන් මේ ශිෂ්‍යයන්ට ගුරු පත්වීම් ලබා දීම සඳහා අමතර විභාගයකුත් තියලා තිබෙන්නේ. ඒ විභාගයේ ප්‍රතිඵල අනුව පෙනෙනවා, ඔවුන් සමත් වෙච්ච උපාධිය සහ ඒ විභාගය අතර කිසිම සම්බන්ධයක් නැහැ කියලා. එහෙම තිබියදී මේ අයට ගුරු පත්වීම් ලබා ගැනීම සඳහා දැඩි බාධා දාලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඇත්තටම අවුරුදු 4ක් දෘෂ්‍ය කලා විශේෂ උපාධිය හදාරපු සිසුන් තමයි මේ ඉන්නේ. ඔවුන් තමන්ගේ කැමැත්තෙන් ගුරු පත්වීම් ලබා ගෙන ගුරුවරුන් විධියට සේවය කිරීම සඳහා ඉදිරිපත් වෙද්දී, ඔවුන්ට විවිධාකාරයෙන් බාධක යොදලා ඔවුන් ගුරු සේවයට පැමිණීම වළක්වන එක ඇත්තටම සුදුසු නැහැ. මේ පිළිබඳව සාකච්ඡා වට ගණනාවක් තිබුණා. ඒ උපාධිධාරින් බස්නාහිර පළාතේ මහ ඇමතිවරයා එක්කත් සාකච්ඡා වට ගණනාවක් පවත්වා තිබෙනවා. අධ්‍යාපන ඇමතිවරයා එක්කත් සාකච්ඡා කළා. නමුත්, මේ තාක් හරි හමන් විසඳුමක් ලැබිලා නැහැ. අවසාන වශයෙන් මමත් මැදිහත් වෙලා බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා එක්කත් සාකච්ඡාවක් කළා. ආණ්ඩුකාරවරයාගේ මැදිහත්වීම සම්බන්ධයෙන් යම්කිසි අගය කිරීමක් තිබෙනවා. කෙසේ නමුත්, තවමත් සුදුසු පරිදි මේ ප්‍රශ්නයට උත්තරයක් ලැබිලා නැහැ. චිත්‍ර කලා උපාධිධාරින් අවුරුදු 4ක් තිස්සේ මේ විෂය ප්‍රගුණ කර තිබෙනවා. ඔවුන් දැන් පාසල්වලට ගිහිල්ලා ඒ පාසල්වල තිබෙන චිත්‍ර කලා පුරප්පාඩු පිළිබඳව ලේඛන සකස් කරලා අපට ගෙනැත් දීලා තිබෙනවා. මේ ලේඛන අනුව ගත්තත්, පාසල් 100ක පමණ පුරප්පාඩු පවතිනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන ගමන්, මම ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් පිළිතුරකුත් බලාපොරොත්තු වෙනවා. 2015-2016 කණ්ඩායම තමයි මෙහිදී විශේෂයෙන්ම අසාධාරණයට ලක් වෙලා තිබෙන්නේ. මොකද, ඊට පස්සේ ඔවුන්ගේ වයස් සීමා ඉක්මවා යනවා.

ගරු ඇමතිතුමනි, ඇත්තටම මෙතැන වෙලා තිබෙන ප්‍රශ්නය මෙයයි. මේ විභාගය පැවැත්වූයේ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් සඳහායි. පුරප්පාඩු ප්‍රමාණයට වඩා අයදුම්කරුවන් අඩු වුණා නම්, ඒ විභාගය පවත්වන්න ඕනෑත් නැහැ. නමුත්, විශ්වවිද්‍යාල ගොඩක් පවතින්නේ බස්නාහිර පළාතේ නිසා අනෙක් පළාත්වල ඉන්න අයත් සමහර විට මේ විභාගයට ලියනවා කියලා ඔබතුමා දන්නවා. ඒ නිසා තමයි මෙවැනි විභාගයක් පවත්වන්න සිද්ධ වුණේ. ඒ නිසා කඩිනමින් මැදිහත් වෙලා මෙන්න මේ උපාධිධාරින් සඳහා යම් සාධාරණ විසඳුමක් ලබා දෙන්න කියලා අපි යෝජනා කරනවා. ඒ වාගේම, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා මැදිහත් වෙච්ච ආකාරයට ඒ විසඳුම ලබාදීම කඩිනම් කරන්න කියලාත් මම ඔබතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලා සිටින්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම සහ කරුණු ඉදිරිපත් කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 6.42]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා දරුවන් පිළිබඳව ජාතික මට්ටමින් හිතලා ගෙනෙන ලද එම විශිෂ්ට යෝජනාව මා මේ අවස්ථාවේදී ස්ථිර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1984 වර්ෂයේදී තමයි අපි උපාධිධාරි ගුරුවරු විධියට අපේ දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයකට ස්ථාපන සේවය යටතේ දරුවන් වෙනුවෙන් ගුරුවරයකු වශයෙන් වැඩ කටයුතු කරන්න ගියේ. ඒ පිළිබඳව මා ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ. 1984 වර්ෂයේ උපාධිධාරින් බඳවා ගැනීමේදී මෙහෙම කිසිදු තරග විභාගයක් අපි අපේ පැත්තෙන් දැකලා තිබුණේ නැහැ. උපාධිය සම්බන්ධ කරගෙන තමයි ඒ බඳවා ගැනීම් කළේ. ඒ බඳවා ගැනීම් කරලා ගුරු විද්‍යාලවලින් අපට සති තුනක සේවාස්ථ පුහුණුවක් දුන්නා. ගරු ඇමතිතුමනි, අපි ඒ පුහුණුවේදී විවිධාකාර ක්ෂේත්‍ර ප්‍රගුණ කළා. දරුවන් හඳුනා ගන්නේ කොහොමද? දරුවන්ට ළං වන්නේ කොහොමද? දරුවන්ගේ ආර්ථික, සාමාජික, සංස්කෘතික අවශ්‍යතා මොනවාද? දරුවන් යහ මඟ යවන්නේ කොහොමද කියලා අපට ඉගැන්වූවා. ඒ වාගේම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ හරහා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

ඒ දරුවන් ඉදිරියට ගැනීමට අවශ්‍ය සියලු කරුණු කාරණා සති තුනක් ඇතුළත අපට කෙටියෙන් ඉගැන්වූවා. විශ්වවිද්‍යාලවලින් අපි අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් ඉගෙන ගෙන තිබුණා. ඒ විධියට අපට ගුරු පත්වීම් දුන්නා. පත්වීම් දුන්නාට පස්සේ අපි අදාළ දිස්ත්‍රික්කවලට ගියා.

අපි ඒ අදාළ දිස්ත්‍රික්කවලට ගියාම තමයි අපට තේරුම් ගන්නට පුළුවන් වුණේ, රටේ සියලු දරුවන්ට අධ්‍යාපනයේ සම අවස්ථාවන් තිබෙනවා කියලා බලධාරින් මහා ලොකුවට පම්පෝරි ගහමින් කියන කථා මිථ්‍යාවක් බව. 1984 අවුරුද්දේ උපාධිධාරි ගුරු පත්වීමක් ලබලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඳලා අතිදුෂ්කර මොනරාගල දිස්ත්‍රික්කයට ගියාට පසුව තමයි පළමුවෙනි වතාවට අපි ඒක තේරුම් ගත්තේ. ගරු ඇමතිතුමනි, ඒ පාසලේ උගන්වන විෂයයන් අතර අපි උපාධියට කරපු කිසිම විෂයක් තිබුණේ නැහැ. ඒ නිසා ඉගෙන ගෙන උගන්වන්න අපට සිදු වුණා. "ගුරුවරයෙක්" කියලා කියන්නේ එවැනි කෙනෙක්. "ගුරුවරයා" කියලා කියන්නේ, ඉගෙන ගෙන උගන්වන කෙනෙක්. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා දවසක් හරි පාසලකට ගිහිල්ලා මේ ගුරු වෘත්තියේ යෙදුණා නම්, දරුවන් වෙනුවෙන් ඇප කැපවීම් කළා නම්, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතාව පිරිමහන්න අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කරලා ගුරුවරු ගන්නවා මිසක්, ඒ ක්‍රමවේදයන් බැහැර කරලා දරුවන් අනාථ කරන ක්‍රියාමාර්ගවලට පෙලඹෙන්නේ නැහැයි කියන එක මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "චිත්‍ර කර්මය" කියන ක්ෂේත්‍රය ජාතික මට්ටමේ තිබෙන විශාල පුරප්පාඩු රාශියකින් සංයුක්ත වූ ක්ෂේත්‍රයක්. ඒ නිසා සරල ක්‍රමවේදයක් උපයෝගී කරගෙන මේ පුරප්පාඩුවලට ගුරුවරුන් බඳවා ගැනීම කරනවා නම් පමණයි ඒ අයට එම අවස්ථාවන් උදා වෙන්නෙත්; දරුවන්ට සේවයක් කරන්න හැකිවෙන්නෙත්. ඒ නිසා ජාතියේ දූ දරුවන්ට යහපතක් කරන්න පාලකයන්ට -අධ්‍යාපන බලධාරින්ට, මැති ඇමතිවරුන්ට- සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, යුක්තියේ සාධාරණත්වයේ නාමයෙන් ඒ දරුවන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න කියලා අපි ඔවුන්ගෙන් ඉල්ලීමක් කරනවා. මේකෙන් ගොඩ යන්න තිබෙන එකම අවස්ථාව මේ සඳහා ඉතාමත් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම කියලායි මා විශ්වාස කරන්නේ.

අපි අහලා තිබෙනවා, "ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමථ" කියලා. මෙන්න මේ කියමන අනුව හැම කෙනෙක්ම හැම දෙයකටම සමත් වෙන්නේ නැහැ. එම නිසා විවිධ ක්ෂේත්‍රයන් ගැන යම් ප්‍රමාණයක අවබෝධයක් තිබෙන්න පුළුවන්කම තිබෙනවා. නමුත් එක දෙයක් සම්බන්ධයෙන් විශේෂ හැකියාවක් හැමෝටම තිබෙනවා. ඒක ප්‍රගුණ කරන්න ඕනෑ. අපි ඒකට කියනවා විශේෂ ප්‍රාගුණ්‍ය කියලා. මේ විශේෂ ප්‍රාගුණ්‍ය විෂය බද්ධව තිබෙන අයට අපි මේ අවස්ථාව සලසා දිය යුතුයි. ඒ විධියේ සුදුසු ක්‍රමයක් සකස් කරලා ඒ අයට අවස්ථාව සැලසුවොත් විතරයි මේ උපාධිධාරින්ට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ කියලා යි අපි විශ්වාස කරන්නේ. විවිධ උපාධිධාරින් ගුරුවරුන් වශයෙන් බඳවා ගැනීමේ දී ගුරු සේවා ව්‍යවස්ථාව අනුව තරග විභාගයක් පැවැත්වීම අනිවාර්යය වේ නම් අපි ඒක ගැන ගැටලුවක් මතු කරන්නේ නැහැ. නමුත් අපි තේරුම් ගත යුතුයි, මේක සරල වෙන්න ඕනෑ; මේක ගැළපෙන්න ඕනෑ; මේක විෂය බද්ධ වෙන්න ඕනෑ කියන එක.

අපි විශ්වාස කරන විධියට මේ චිත්‍ර කර්මය පිළිබඳ උපාධිධාරින්ට උගන්වන්න පුළුවන්කම තිබෙන්නේ චිත්‍ර කර්මය ගැන පමණයි. ඒ අයට වෙන වෙන විෂයන් පිළිබඳ තිබෙන අවබෝධය සහ හැකියාව අඩුයි. එම නිසා රට පුරාම පුරප්පාඩු රාශියක් තිබෙනවා නම්, ඒකෙන් අසාධාරණයට ලක් වෙන දරුවන් වෙනුවෙන් එම ගුරුවරුන්ගේ පත් කිරීම ඉතාමත්ම අත්‍යවශ්‍ය වෙනවා. එහෙම නම් ඉතින් මේ චිත්‍රකර්මය, ගණිතය වැනි විෂයන් බිහි වෙන්න ඕනෑ නැහැ නේ. ඒක තමයි සමාජ අවශ්‍යතාව. ඒ සමාජ අවශ්‍යතාව තේරුම් අරගෙන තිබෙනවා නම්, අනිවාර්යයෙන්ම ඒ කටයුත්තට අවශ්‍ය ක්‍රමවේදයක් බලධාරින් විසින් සකස් කළ යුතුයි කියන එකයි මගේ එකම තර්කය වන්නේ. ඒ අය බඳවා ගැනීමේ තරග විභාගයක් තිබෙනවා නම්, ඒකට අවශ්‍ය ප්‍රශ්න පත්‍ර ලිහිල් කරන්න ඕනෑ. විෂය බද්ධ කරුණු එයට ඇතුළත් කරන්න ඕනෑ. එතකොට තමයි එම ගුරුවරුන්ට තමන්ගේ විෂයට අදාළ කරුණු කාරණාවලට එම තරග විභාගයේ දී; පරීක්ෂණයේ දී මුහුණ දීලා ප්‍රවීණතාවක් ලබා ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

එහෙම වුණොත් පමණයි, ඒ ගුරුවරුන්ගේ බලාපොරොත්තු ඉෂ්ට වන්නේ. ඒ බලාපොරොත්තු ඉෂ්ට වනවාය කියන්නේ ඒ අයගේ සේවය බලාපොරොත්තුවෙන් ඉන්න ලක්ෂ ගණනක් දූ දරුවන්ගේ හැකියාවන් තවතවත් වර්ධනය වෙනවාය කියන එකයි. ඒ නිසා ඔය ඵලමොට්ටල තර්ක ඉදිරිපත් කරන්නේ නැතිව මේ පිළිබඳව විශේෂයෙන් මැදිහත් වෙලා; කල්පනා කරලා; ඉතා ඉක්මනින් සරල ක්‍රමවේදයක් සකස් කරන්න කියලා ඉල්ලා සිටියා. මේ ජාතික අවශ්‍යතාව වෙනුවෙන් ඒ අයගේ දැනුම උරා ගෙන, මේ දරුවන්ට සේවය කරන්න ඒ අයට අවස්ථාව සැලසෙන පරිදි සරල ක්‍රමවේදයක් සකස් කරලා, ඒ දරුවන් ඉක්මනින් සුවපත් කරන්නය කියලා මේ මොහොතේ මා අධ්‍යාපන අමාත්‍යවරයාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ඇමතිතුමා.

ගරු ඇමතිතුමනි, මෙය සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් නිසා මමත් ඒ කාරණය සමඟ එකතු වෙන්න කැමැතියි. විහාරමහා දේවි උද්‍යානය අසල පාරේ චිත්‍ර අඳින අයගේ චිත්‍ර වෙළෙඳ පොළක් තිබෙනවා. ඔබතුමා පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා හැටියට ඔවුන්ට එම වෙළෙඳපොළ පවත්වගෙන යාම සඳහා සුදුසු හොඳ ස්ථානයක් ලබා දෙන්න ඔබතුමාට පුළුවන් නම් හොඳයි. දැන් මේ වැහි කාලය නිසා ඒවා පාරේ තියාගෙන විකුණන්නත් බැහැ. විශ්වවිද්‍යාලයෙන් පිටවෙලා එම ස්ථානයේ ඉඳගෙන චිත්‍ර අඳින අයත් ඉන්නවා. චිත්‍ර අඳින වෙනත් අයත් එහි ඉන්නවා. හුඟක් වෙලාවට අපි දකිනවා, ෆේස් බුක් වාගේ මාධ්‍ය ජාලවලත් එහෙම මේ ගැන කියලා තිබෙනවා. ඒ නිසා ඒ අයට හොඳ තැනක් හදලා දෙන්න පුළුවන් නම්, අපේ සංචාරක ව්‍යාපාරය ඇතුළු හැම දේටම එය හොඳයි කියලා මම හිතනවා.

[අ.භා. 6.50]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස සම්බන්ධයෙන් මම දැනටමත් කටයුතු කර තිබෙනවා. ඒගොල්ලන්ට යම් බලපත්‍රයක් දීමටත් නගර සභාවෙන් කටයුතු කර ගෙන යනවා. වැහි කාලයේ දී ඒගොල්ලන්ට නොයෙක් ප්‍රශ්න මතු වෙනවා. ඒ සම්බන්ධයෙනුත් අපි ඒ උදවියත් එක්ක සාකච්ඡා කරමින් පවතිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න ආණ්ඩුකාරතුමා සහ මහ ඇමතිතුමා හමු වෙලා වහාම රැස්වීමක් කැඳවනවා. මමත් ඒකට සහභාගි වෙනවා. අපි දැක තිබෙනවා කලා උපාධිධාරින්ට නොයෙක් ප්‍රශ්න තිබෙන බව. ඒ උදවිය උපාධිය සමත් වෙනවා. ඊට පස්සේ තරග විභාග තිබෙනවා. නමුත් විභාගයේ දී ප්‍රශ්න අහන්නේ ඒ විෂයයට අදාළව නොවෙයි. මම ඔබතුමන්ලා දෙදෙනා එක්කම එකඟ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ අවාසනාවට වාගේ පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා හැටියට සෞඛ්‍ය, අධ්‍යාපනය, වාරිමාර්ග පිළිබඳව ඕනෑම පළාත් සභාවක තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් උත්තර දෙන්න මට වගකීමක් තිබෙනවා. හැබැයි, මම හිතන විධියට මේ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා ප්‍රතිපත්ති තීන්දුවක් ගන්න ඕනෑ. දේශපාලනඥයන් හැටියට අපට මේ රටේ දූ දරුවන් එක්ක සෙල්ලම් කරන්න බැහැ. ඒ කියන්නේ තරග විභාගයකට ලියන කොට දරුවන් සහ දෙමවුපියන් ඉතාමත් පීඩාකාරී තත්ත්වයකට පත් වෙනවා. යම් කිසි දරුවෙක් උපාධියක් ලබා ගත්තා නම්, ඒ දරුවාට රැකියාවක් ලබා දෙන්න රජයක් හැටියට අපට වගකීමක් තිබෙනවා. අද අපි එම උපාධිධාරින් වෙනුවෙන් නොයෙකුත් ක්ෂේත්‍රවල තරගකාරී විභාග පවත්වනවා. අපේ දොස්තර මහත්තයා වාගේ වෛද්‍ය උපාධියක් ලැබුවා නම් ඒ ප්‍රශ්නය නැහැ. අද කලා උපාධියක් ලබා ගැනීම තුළින් සමාජයේ ලොකු ප්‍රශ්න ඇති වෙනවා. මම දැකලා තිබෙනවා, කලා උපාධිය ලබා ගත් දරුවන් මගේ අමාත්‍යාංශවල KKS තනතුරු ඉල්ලා ගෙන එනවා. මම හිතන විධියට රජයක් හැටියට මේ සම්බන්ධයෙන් පුළුල් කතිකාවක් අවශ්‍යයි. ඒ වාගේම අපි මේ පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන Oversight Committee එකේ මේ ගැන තවදුරටත් සාකච්ඡා කරන්න ඕනෑ. මේක බස්නාහිර පළාත් සභාවට පමණක් සීමා වූ ප්‍රශ්නයක් නොවෙයි. රටේ ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්. අද දින ඉදිරිපත් කර තිබෙන මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතා කාලීනයි. මේ ප්‍රශ්නයට අපි ක්ෂණික විසඳුමක් ලබා ගත යුතුයි කියන එක මම පිළිගන්නවා. ඒ බල ප්‍රදේශයේ public service එක භාරව ඉන්නේ ආණ්ඩුකාරයාය කියලා අපි දන්නවා. ඒ නිසා ආණ්ඩුකාරතුමා සහ මහ ඇමතිතුමා සමඟ අධ්‍යාපන ඇමතිතුමාටත් සහභාගි වෙන්න කියමු. මම මේකට උත්තර දුන්නාට හරයාත්මක උත්තරයක් දෙන්න මට බැහැ. අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීන්දු ගන්නේ මම නොවෙයි. ජාතික මට්ටමෙන් සහ පළාත් සභාවෙන් එක තීන්දුවක් ගත යුතුයි. කලා උපාධිධාරින් සම්බන්ධයෙන් රජය මීට වඩා හොඳ ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතුය කියන එකයි මගේ විශ්වාසය.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමාගේ ප්‍රවේශය මම අගය කරනවා. මම හිතන විධියට අද මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශය යම් කිසි පිළිතුරක් සකස් කළා.

ඇත්තටම එම පිළිතුර එම උපාධිධාරින්ට යම් කිසි ආකාරයක බලාපොරොත්තුවක් තබා ගන්න පුළුවන් එකක් බවට පත් වෙයි කියලා මම හිතුවා. මොකද, දැන් වනවිට සාකච්ඡා වට ගණනාවක් පවත්වා තිබෙනවා. ඇත්තටම මැතිවරණය පැවැත්වීම ප්‍රකාශයට පත් කළොත් එහෙම - ඔබතුමා එය ප්‍රකාශයට පත් කරනවා. - මෙම ප්‍රශ්නය තවත් කල් යනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමනි, අපි ලබන සඳුදා නැත්නම් අඟහරුවාදා ආණ්ඩුකාරතුමා හමු වෙලා, අධ්‍යාපන ඇමතිතුමා එක්කත් මේ ගැන කථා කරමු. අපට මේ දූ-දරුවන්ගේ අධ්‍යාපනය එක්ක සෙල්ලම් කරන්න බැහැ. ඒ නිසා මැතිවරණය පැවැත්වීමට කලින් අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගනිමු. අපි ප්‍රායෝගික විසඳුමකට යමු. අපි තුන්දෙනා ගිහින් ආණ්ඩුකාරතුමා හමු වෙමු. අපි අධ්‍යාපන ඇමතිතුමාටත් එම සාකච්ඡාවට ආරාධනා කරමු.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, අපි මේ උපාධිධාරින් සියලුදෙනාත් එක්කාසු කරගෙන බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමතිතුමා, පළාත් රාජ්‍ය සේවා කොමිසම සහ ආණ්ඩුකාරතුමා එක්ක සාකච්ඡා කළා. එතැනදී එතුමන්ලා පොරොන්දු වුණා, බස්නාහිර පළාතේ තිබෙන පුරප්පාඩු ප්‍රමාණය ගණනය කරලා, නොවැම්බර් මස 30 වැනි දාට පෙර එම පුරප්පාඩුවලට මෙම උපාධිධාරින් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරනවා කියලා. එහෙම කරන්න නම් මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් පුවත් පත් දැන්වීම් පළ කර තිබෙන්න ඕනෑ. නමුත් එහි ප්‍රමාදයක් තිබෙනවා. මේ විධියට තමයි මෙම ප්‍රශ්නය දිගින් දිගට ඇදි-ඇදී ඉස්සරහට ආවේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමනි, මට මේ සම්බන්ධයෙන් පළාත් සභාවෙන් වාර්තාවක් ලබා ගැනීමට කාලයක් ලැබුණේ නැහැ. ඊයේ තමයි අද දින සභාව කල් තැබීමේ යෝජනාවට මෙවැනි ප්‍රශ්නයක් ගැන කථා කරනවා කියලා මට සහභාගිවීමට උපදෙස් ලැබුණේ. ඒ නිසා මම පොරොන්දු වෙනවා, ඒ සම්බන්ධයෙන් ඔබ දෙදෙනා එක්ක සාකච්ඡා කරලා ප්‍රායෝගික විසඳුමකට යන්න. ඒ කියන්නේ කථාවට පමණක් සීමා නොවුණු, ප්‍රායෝගික විසඳුමකට අපි යමු. අපි අධ්‍යාපන අමාත්‍යාංශයට සහ ආණ්ඩුකාරතුමාට අද හෙටම දුරකථනයෙන් කථා කරලා මේ ගැන සාකච්ඡා කරමු. නැත්නම් ඔබතුමාගේ කාලයත්, මගේ කාලයත් වැය කරගෙන අපි දිගින් දිගටම සාකච්ඡා කරන එක තමයි වෙන්නේ. හැබැයි, මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම තීන්දුවක් ලබා ගත යුතුයි කියන මතය උඩ තමයි අපි ඉන්නේ.

මම අද සභාව කල් තැබීමේ යෝජනාවට සහභාගි වුණාට, මට අවශ්‍ය කරන දත්ත පළාත් සභාවෙන් සපයා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමා ළඟ තිබෙන දත්තත් මට ලබා දෙන්න. මම පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිතුමා එක්ක සාකච්ඡා කරන්නම්. ඊට පසුව අපි පුළුවන් තරම් ඉක්මනින් තීන්දුවකට එමු, ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.56ට, අද දින සභා සම්මතිය අනුව, 2017 නොවැම්බර් මස 09 වන බ්‍රහස්පතින්දා අ.භා. 3.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 6.56 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2017 நவம்பர் 09, வியாழக்கிழமை பி.ப. 3.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.56 p.m. until 3.00 p.m. on Thursday, 09th November, 2017, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.